# දහම් පාසල

## 9 ශ්‍රේණිය



ශ්‍රී ලංකා ජනරජයේ පරිත්‍යාගයක් වූ
මෙම පොත නිසි ලෙස පරිහරණය කර
සහෝදර සිසුවෙකුට පිරිනැමීම සඳහා
අවසානයේ ආපසු භාරදීම ඔබේ යුතුකම
වන්නේය.

## උපදේශක මණ්ඩලය

අතිපූජ්‍ය ගන්තුනේ අස්සජි මහානායක ස්වාමීන් වහන්සේ
අතිපූජ්‍ය තිරිකුණාමලේ ආනන්ද මහානායක ස්වාමීන් වහන්සේ
ආචාර්ය, පූජ්‍ය වැලමිටියාවේ කුසලධම්ම නායක ස්වාමීන් වහන්සේ
මහාචාර්ය, බෙල්ලන්විල විමලරතන අනුනායක ස්වාමීන් වහන්සේ
ශාස්ත්‍රපති, පූජ්‍ය ගෝණදූවේ ගුණානන්ද ස්වාමීන් වහන්සේ
ආචාර්ය, පූජ්‍ය තුඹුල්ලේ සීලක්ඛන්ධ නායක ස්වාමීන් වහන්සේ
පූජ්‍ය දික්වැල්ලේ තිස්ස නායක ස්වාමීන් වහන්සේ
පූජ්‍ය මැදගම ධම්මානන්ද ස්වාමීන් වහන්සේ
බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් - නිමල් කොටවලගෙදර මහතා
බෞද්ධ කටයුතු කොමසාරිස් - එච්.එන්. කුමාරි මහත්මිය

## සංස්කරණය හා මුද්‍රණ කටයුතු සම්බන්ධීකරණය

ව්‍යාපෘති නිලධාරි, කේ.එස්. අශෝක මංජුල බණ්ඩාර මහතා

## පරිගණක පිටු සැකැස්ම

සංවර්ධන නිලධාරි, ආර්.වී.එස්.පී. විජේවර්ධන මහතා

## මුද්‍රණය

ඩිජිස්කෑන් සිකියුර් ප්‍රින්ට් සොලූෂන්ස් (පුද්ගලික) සමාගම

**ශ්‍රී ලංකා ජනාධිපති**
**இலங்கை சனாதிபதி**
President of Sri Lanka

## අතිගරු ජනාධිපතිතුමාගේ පණිවිඩය

අධ්‍යාපනය මගින් කෙනෙකුට තමා තුළ ඇති හැකියාවත්, ශක්තියත් මතුකොට ගෙන ගුණාත්මකව හා සාර්ථකව ඉහළ තලයකට ගමන් කිරීමේ හැකියාව ලැබේ. ගුණ නැණ බෙලෙන් යුතු දරුවෙකු බිහි කිරීමට පාසලෙන් පමණක් ලබාගන්නා අධ්‍යාපනය ප්‍රමාණවත් නොවන බව තර්කයෙන් තොරව පිළිගත යුතු සත්‍යයකි. එබැවින් දරුවාගේ ජීවිතය යහමගට යොමු කිරීමේ කේන්ද්‍රීය ස්ථානය වන්නේ දහම් පාසලයි.

තම දරුවාට දහම් අධ්‍යාපනය ලබාදීම දෙමාපියන් සතු සුවිශේෂී වගකීමකි. තම දරුවා උගතෙකු, දක්ෂයෙකු පමණක් නොව සාරධර්ම හා ගුණ දහමින් හෙබි සදාචාර සම්පන්න පුද්ගලයෙකු කිරීමට පියවර ගැනීම ද දෙමාපියන්ගෙන් ඉටුවිය යුතු වටිනා කාර්යභාරයකි.

යහපත් සමාජයක් උදෙසා 1895 දී උදාර සත්පුරුෂයින්ගේ පුරෝගාමීත්වයෙන් ඇරඹුණ දහම් පාසල් සේවාවෙන් එදා මෙදා තුර සමාජයට දායාද කර දුන් දරු පරපුර අප රටේ අගනා වස්තුවකි. සමාජයට වැඩදායි දරු පරපුරක් තැනීමෙහි ලා ලාභ අපේක්ෂාවෙන් තොරව තම කාලය හා ශ්‍රමය ස්වෙච්ඡාවෙන් කැප කරන සමස්ත දහම් පාසල් ගුරු පරපුරට අප සියලුදෙනාගේ ම ප්‍රණාමය හිමිවිය යුතු ය. යහ ගුණ වැඩීමට අමතරව භාවනාව තුළින් දරුවාගේ විනය සහ පෞරුෂත්වය වැඩීම දහම් පාසල තුළින් සිදුවන තවත් සුවිශේෂී කර්තව්‍යයකි.

ආදරණීය දුවේ, පුතේ, දහම් දැනුම ලබාගැනීම උදෙසා ඔබ වෙත පිරිනැමෙන මෙම අගනා කෘතිය හොඳින් පරිශීලනය කොට ලබන දහම් දැනුම ඔබේ ජීවිතය ඔපවත් කර ගැනීමටත්, ඔබට ජීවන මග හමුවන විවිධ දුක් ගැහැට උපේක්ෂාවෙන් විමසා ජයග්‍රහණය කරා ළඟාවීමටත් හේතුවේවායි ඉත සිතින් ප්‍රාර්ථනය කරමි !

තෙරුවන් සරණයි !

මෛත්‍රීපාල සිරිසේන.
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
අතිගරු ජනාධිපති.

2015 මාර්තු මස 16 වැනි දින

## ගුරුභවතුන්ගේ අවධානය සඳහා

මෙය දහම් පාසල් නවවන ශ්‍රේණියට නියමිත පාඨ ග්‍රන්ථයයි. මෙහි පාඩම් විසි නවයකි. පාලි සහ අභිධර්ම පාඩම් කිහිපයක් ඇතුළත්ය.

මෙහි දැක්වෙන සියලු පාඩම් ජීවිතයට ප්‍රයෝජනවත් වන පරිදි ප්‍රායෝගිකව ඉගැන්වීම අපේක්ෂිතය. විශේෂයෙන්ම චරිත කතා ඇසුරෙන් මතු කර ගත හැකි ආදර්ශ සිසුන්ට පෙන්වා දීම අවශ්‍යය. පාලි ගාථා හා කවි නිවැරදි උච්චාරණයෙන් යුතුව ගායනා කිරීමට හුරු කිරීමත් අවශ්‍යය. දිනපතා විනාඩි කිහිපයක් භාවනා පුහුණු කිරීමත් කළ යුතු අතර ඒ පිළිබඳ පුහුණුවක් ද ලබා දිය යුතුය.

ඉගැන්වීම සඳහා පන්තියට යාමට පෙර ඒ,ඒ දිනයට නියමිත පාඩම හොඳින් කියවා පූර්ව සූදානමක් ඇති කර ගැනීම අවශ්‍යය. එමෙන්ම මීළග සතියේ දී ඉගෙනීමට ඇති පාඩම පිළිබඳව සිසුන් දැනුවත් කිරීම වඩාත් ප්‍රතිඵලදායක විය හැකිය. විශේෂයෙන්ම පෙළ පොතේ පාඩම් අවසානයේ දක්වා ඇති ක්‍රියාකාරකම්වල නිරතවීමට සිසුන්ට මගපෙන්වීමක් හා ඒ පිළිබඳ පසු විපරමක් කිරීමට ද යොමුවන්න.

මෙම පාඨ ග්‍රන්ථයට පදනම් කරගෙන ඇති නිපුණතා හා එක් එක් නිපුණතා සඳහා සකස් කර ඇති පාඩම් මෙසේය.

| *නිපුණතාව* | *පාඩම්* |
|---|---|
| **නිපුණතාව 01** | **01** |
| **නිපුණතාව 02** | **02,03,14,15,27,28,29** |
| **නිපුණතාව 03** | **04,16** |
| **නිපුණතාව 04** | **05,06,07,17,18,19,30,31,32** |
| **නිපුණතාව 05** | **08,09,20,33,34** |
| **නිපුණතාව 06** | **10,35** |
| **නිපුණතාව 07** | **21** |
| **නිපුණතාව 08** | **22,36** |
| **නිපුණතාව 09** | **11,23** |
| **නිපුණතාව 10** | **12,13,24,25,26,37,38,39** |

**දහම් පාසල් අධ්‍යාපනයේ පරමාර්ථය හා ඉහත නිපුණතා ඒ,ඒ පාඩම තුළින් ඉටුවන පරිදි ඉගැන්වීමේ විවිධ ක්‍රම හා ශිල්පීය ක්‍රම යොදාගනිමින් පාඩම් සැලසුම් කර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සාර්ථකව පවත්වාගෙන යාම ඔබගේ වගකීමකි.**

**තෙරුවන් සරණයි.**

| පටුන | පිටුව |
|---|---|


පළමු වාරය

| | |
|---|---|
| 01. තෙරුවන් හැඳින ගනිමු | 1 |
| 02. බුදු සිරිතේ අවසන් විසිපස් වස | 5 |
| 03. අංගුලිමාල මහරහතන් වහන්සේ | 15 |
| 04. මව්පිය දූ දරු යුතුකම් | 20 |
| 05. බුදුකුරු දම් හුරුකර ගනිමු | 24 |
| 06. රතන සූත්‍රය | 30 |
| 07. දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යය | 37 |
| 08. නීරෝගි දිවියට සුවදායී නින්දක් | 40 |
| 09. අටලෝ දහමට මුහුණ දෙමු | 43 |
| 10. පොළොන්නරු ශාසන ඉතිහාසයෙන් බිඳක් | 50 |
| 11. බෞද්ධ විහාරයක අංග | 55 |
| 12. පාලි 01 - සිල් ඉල්ලීමේ වාක්‍යය | 59 |
| 13. පාලි 02 - දහම් ගුණ පාඨය | 62 |

දෙවන වාරය

| | |
|---|---|
| 14. අනුබුදු මිහිඳු මහරහතන් වහන්සේ | 65 |
| 15. බුදු සිරිතේ ආදර්ශ | 69 |
| 16. මතින් මිදී අපිත් මුදවමු අන් අයත් | 78 |
| 17. අනුන්ට උපකාර කරමු | 82 |
| 18. මෙත් සුතුරෙන් ගුණදම් තුනක් | 88 |
| 19. පටිච්ච සමුප්පාදය | 91 |
| 20. භාවනාවේ ප්‍රභේද හා බෞද්ධ භාවනාවේ සුවිශේෂත්වය | 95 |
| 21. වසල ගති දුරලමු | 101 |
| 22. දැහැමිව ධනය උපයමු | 105 |
| 23. පන්සලෙන් සිදුවන සේවා | 109 |
| 24. පාලි 03-සඟ ගුණ පාඨය | 115 |
| 25. පාලි 04-සඟ සතු කිරීමේ වාක්‍ය හා බුදුරදුන් කමා කරවා ගැනීමේ ගාථාව | 120 |
| 26. අභිධර්මය 1 - රූප | 124 |

තෙවන වාරය

| | |
|---|---|
| 27. බුදු ගුණ සුවඳ | 131 |
| 28. පැවිදි පඬි මිණි පහන් | 136 |
| 29. ශ්‍රේෂ්ඨ බෞද්ධ අධිරාජයා | 147 |
| 30. දිවි මගට දැහැමි උපදෙස් | 151 |
| 31. රතන සූත්‍රයෙන් හෙළිවන තෙරුවන් ගුණ | 157 |
| 32. පුනර්භවය | 160 |
| 33. කාලයෙන් ඵල ලබමු-පව්ටු මිතුරන් ඇසුරු නොකරමු | 164 |
| 34. චාගානුස්සති භාවනාව හැඳින ගනිමු | 168 |
| 35. පොළොන්නරුවේ අපේ උරුමය | 172 |
| 36. දැහැමි පාලනයට බොදු පිළිවෙත් දෙකක් | 180 |
| 37. පාලි 05 - දෙවියන්ට පින්දීමේ ගාථා | 185 |
| 38. පාලි 06 - ආශිර්වාද ගාථා | 189 |
| 39. අභිධර්මය 2 - නිබ්බාන | 193 |

# 01. පාඩම

## තෙරුවන් හැඳින ගනිමු

බුද්ධ, ධම්ම, සංඝ යන රත්න තුන තෙරුවන් ය. ඒ තුන රුවන් යනුවෙන් හැඳින්වෙන්නේ ඇයි? අප රත්න ලෙස හඳුන්වන්නේ දුර්ලභ වූ වටිනා සම්පත්ය. රන්, රිදී, මුතු, මැණික් ආදිය දුර්ලභ නිසා වටිනා සම්පත් ලෙස පිළිගෙන ඇත. බුද්ධ, ධම්ම, සංඝ රත්න තුන ලෝකයේ අතිශය දුර්ලභය. හැම කාලයක ම බුදුරජාණන් වහන්සේලා පහළ නොවෙති.



"කලකිනි බුදු කෙනෙකුන් උපදින්නේ" යනුවෙන් සඳහන් කොට ඇත්තේ එබැවිනි. ලෝකයේ දාර්ශනිකයන්, ලේඛකයන් ආදී විවිධ ශ්‍රේෂ්ඨ පුද්ගලයෝ පහළ වෙති. එහෙත් බුදුරජාණන් වහන්සේට සමාන වූවෙකු හෝ උසස් වූවෙකු පහළ වී ඇත. පහළ වන්නේ ද නැත. බුදුරජාණන් වහන්සේ දේශනා කළ පරිදිම මෙලොව හෝ දෙලොව හෝ බුදුරජාණන් වහන්සේට සමාන උතුමෙකු නැත. එනිසාම බුදුරජාණන් වහන්සේ උතුම් රත්නයකි.



ධර්මය රත්නයක් ලෙස හඳුන්වනු ලබන්නේ ඇයි? ලෝකයේ විවිධ පුද්ගලයන් පළකළ අදහස් ඇත. ජීවිතය සහ ලෝකය ගැන විවිධ දාර්ශනික අදහස් පළ වී තිබේ. එහෙත් තථාගතයන් වහන්සේ විසින් දේශනා කරන ලද ධර්මය ඉක්මවා යන දහමක් වෙනත්

පුද්ගලයෙකුගෙන් ඉදිරිපත් වී නොමැත. බුද්ධ වචනයට අනුවම ශාක්‍ය මුනීන්ද්‍රයන් විසින් දේශනා කරන ලද ධර්මයට සමාන දහමක් නැත. එහි මුල - මැද - අග යහපත්ය. එය කවර පුද්ගලයෙකුට වුව ද විමසා බලා අත් දැකිය හැකි දහමකි. ඒ දහම දේව භාෂිතයක් නොවේ. ආර්ය පර්යේෂණයෙන්ම අනාවරණය කර ගනු ලැබූවකි. ලෝකයේ වෙනත් කිසිදු දහමකට දෙවෙනි නොවන, එමෙන්ම සමාන නොවන ශ්‍රේෂ්ඨ දුර්ලභ වටිනා උතුම් දහමක් බැවින් ධර්මය රත්නයක් ලෙස හැඳින්වෙයි.

බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද ධර්ම රත්නය අනුගමනය කිරීමෙන් ශ්‍රේෂ්ඨත්වයට පත් පිරිස සංඝ රත්නයයි. එනම් සෝවන්, සකදාගාමී, අනාගාමී, අරහත් යන මාර්ග ඵලයන්ට පත් උතුමන්ය. වෙන කිසිදු ශාසනයක මෙම මාර්ග ඵලවලට පත් පුද්ගලයන් නොමැති බව බුදුරජාණන් වහන්සේ දේශනා කොට ඇත. ආර්ය සංඝයා රත්න නාමයෙන් හැඳින්වෙන්නේ එබැවිනි.

මෙම ශාසනික රත්න තුන තවදුරටත් විස්තරාත්මකව හඳුනා ගනිමු.

බුදුරජාණන් වහන්සේගේ චරිතය මෙන්ම උතුම් ගුණ සමුදාය ද මෙහි දී හඳුනා ගැනීම අතිශයින්ම වැදගත් වේ. ඉතිපිසො... පාඨයෙහි බුදුගුණ නවයක් සඳහන් වෙයි. බෝසත් උපතේ පටන් සම්බුද්ධ පරිනිර්වාණය තෙක් වූ බුදු සිරිත විමසා බලන විට බුද්ධ චරිතයේ ශ්‍රේෂ්ඨත්වය මැනවින් අවබෝධ කර ගත හැකිය. බුදු වී පන්සාලිස් වසක් ලෝකවාසීන් කෙරෙහි අපරිමිත කරුණාවෙන් දිවා රෑ නොතකා දහම් දෙසමින් හා ඔවුන්ට පිහිට වෙමින් අති උදාර වූ මෙහෙයක් බුදුරජාණන් වහන්සේ ඉටු කළ සේක. දෙව් මිනිසුන් ඇතුළු ලෝකවාසීහු බුදු සිරිත ආදර්ශයට ගැනීමත්, ධර්මය අසා ජීවිතය හැඩගස්වා ගැනීමත් නිසා නිවනින් සැනසීමේ මග හෙළිකර ගත්හ.

බුදු උපත ඇති කාලයක වුවත් නැති කාලයක වුවත් ධර්මය පවතී. බුදුරජාණන් වහන්සේ විසින් කරනු ලබන්නේ එම ධර්මය සොයාගෙන, අවබෝධ කරගෙන, දේශනා කිරීමයි. උන් වහන්සේ

පිරිනිවන් පෑ කල සිය ශාස්තෘවරයා ලෙස සැලකිය යුත්තේ ද ධර්ම විනය දෙක බව දේශනා කොට ඇත. බුදුරජාණන් වහන්සේගේ ගුරු තනතුරට උන් වහන්සේ විසින් පත් කරගනු ලැබුවේ ධර්මය දකින්නා බුදුරජාණන් වහන්සේ දකින බව ද දේශනාවේ සඳහන්වේ. එය රෝගියෙකුට බෙහෙතක් හා සමානය.

"ධම්මෝ හවේ රක්ඛති ධම්මචාරි"

යන ගාථා පාඨයට අනුව ධර්මයට අනුව ජීවත් වෙන්නාට ධර්මයෙන්ම ආරක්ෂාව සැලසෙන බව සඳහන්වේ. සම්බුද්ධ ධර්මය තරම් උතුම් දහමක් ලොව නොමැත. ධර්ම දානය සියළු දානයන් ජයග්‍රහණය කරන බව සඳහන් "සබ්බ දානං ධම්ම දානං ජිනාති" යන ගාථා පාඨයෙන් පැහැදිලි වෙයි. ධර්මයේ ගුණ හයක් පිළිබඳව "ස්වාක්ඛාතෝ භගවතා ධම්මෝ ....." යනාදී පාඨයෙහි දැක්වේ. ධර්මය පිළිබඳ අවබෝධය ලබා දෙලොව දියුණුව සලසාගෙන නිවනින් සැනසීමට අපි ක්‍රියා කරමු.



බෞද්ධයින් සරණ යන තෙවන රත්නය සංඝ රත්නයයි. සංඝ යන වචනයේ තේරුම සමූහය යි. මෙහිදී මාර්ග ඵල ලාභී සංඝ සමූහයා අදහස් වෙයි. ගිහි ගෙයින් නික්මී පැවිදිව තම විමුක්තිය සහ මහ ජනතාවගේ විමුක්තිය වෙනුවෙන් උන්වහන්සේලා ක්‍රියා කරති. මහා සංඝ රත්නය බුදුරජාණන් වහන්සේ ආදර්ශයට ගෙන ආදර්ශවත් චරිතයකින් යුතුව ලෝක සත්වයා සුමගට ද යොමු කරවති. දෙලොව යහපත සඳහා මග කියා දෙන මහා සංඝ රත්නය

සතු වූ සුවිශේෂී ගුණ නවයක් "සුපටිපන්නෝ භගවතෝ සාවක සංඝෝ " යනාදී පාඨයෙන් කියවෙයි. උන්වහන්සේලාගේ චරිත මෙන්ම ගුණධර්මයන් ද ආදර්ශයට ගෙන දිවි මග සාර්ථක කර ගනිමු.

තෙරුවන් සහ තෙරුවන්ගේ ගුණ හැඳින එම ගුණ ආදර්ශයට ගෙන ක්‍රියා කොට උතුම් ඵල නෙළා ගැනීමට උත්සාහ ගනිමු.

**ක්‍රියාකාරකම්**

1. තෙරුවන් උතුම් රත්න ලෙස හැඳින්වන්නේ ඇයි?
2. බුද්ධ ධම්ම සංඝ රත්න තුනෙහි ගුණ නම් කර දක්වන්න.
3. තෙරුවන් හඳුනාගෙන ක්‍රියා කිරීමෙන් ලැබිය හැකි ප්‍රතිඵල කවරේදැයි ලියා දක්වන්න.
4. තෙරුවන් විෂයෙහි ඔබ කරන බුහුමන් මොනවාද?

**පුහුණුවට**

සුඛෝ බුද්ධානං උප්පාදෝ
සුඛා සද්ධම දේසනා
සුඛා සංඝස්ස සාමග්ගි
සමග්ගානං තපෝ සුඛෝ

බුදුරුවන් ඉපදීම සැපතකි
සද්ධර්ම දේශනාව සැපතකි
සංඝයාගේ සමගිය සැපතකි
සමගි වූවන්ගේ සීලය සැපතකි

බුදුවරු පහල වීම ද මේ ලොව සැපය
සදහම් දෙසීම ද ඒ තරමට සැපය
මහ සග රුවන තුළ ඇති සමගිය සැපය
සමගිය තුළින් ඇතිවන තපස ද සැපය

## 02. පාඩම

## බුදු සිරිතේ අවසන් විසිපස් වස

බුදුරජාණන් වහන්සේ අවසන් විසිපස් වසර තුළදී ද දෙව් මිනිසුන්ගේ සුවය සඳහා මහගු සේවයක් ඉටුකළ සේක. විසි එක්වන වස් කාලයේ සිට හතලිස් හතරවන වස් කාලය දක්වා සැවැත්නුවර ජේතවනාරාමයේ සහ සැවැත්නුවර පූර්වාරාමයේ වස් විසූ උන්වහන්සේ හතලිස් පස්වන අවසන් වස් කාලය ගත කළේ විශාලා නුවර අසල වූ බේලුව ගමේය. සෑම වසරක ම වස් කාලය අවසන් වීමෙන් පසු පාගමනින් හා සෘද්ධියෙන් දෙව් මිනිසුන් වෙත වැඩම කරමින් ඔවුන්ට යහපත උදාකළ සේක.

රාජවංශයෙන් පැවිදි වූ බුදුරදුන් කෙරෙහි මහ ජනතාව ඉමහත් ගරු සැලකිලි දක්වන්නට වූහ. දෙව්දත් තෙරුන් හා අන්‍යාගමික පිරිස් මෙය නොඉවසූහ. ඔවුහු බුදුරදුන්ට විවිධ බාධා ඇති කරන්නට වූහ.

ලෞකික ධ්‍යාන පමණක් ලබාසිටි දෙව්දත් තෙරුන්ට සෝවන් ආදී මාර්ග ඵල කිසිවක් ලබා ගැනීමට නොහැකිවිය. මගධ රාජ්‍යයේ රජකම් කළ බිම්බිසාර රජුගේ පුත් අජාසත්ත පහදවාගෙන පියා මරා රජවන ලෙස උපදෙස් දුන්නේය. තමා බුදුරදුන් නසා බුදු බවට පත්වන බව ප්‍රකාශ කළේය. නොමග ගිය අජාසත් රජු පියා මරා රජ වූයේය. පසු කලෙක බුදුබණ ඇසීමෙන් පසු තමා කළ වරදෙහි බරපතලකම රජුට වැටහිණි.

බුදුරදුන් නැසීම සඳහා දෙව්දත් තෙර නොයෙකුත් උපක්‍රම යෙදීය. එක් අවස්ථාවක දුනුවායන් යෙදවීය. සම්බුදුරදුන් සමීපයට ගිය දුනුවායෝ බණ අසා තෙරුවන් සරණ ගියහ. ගිජ්ඣකූට පර්වත පාමුල වඩිමින් සිටින විට එම පර්වතයේ සිටි දෙව්දත් මහ ගලක් පෙරලීය. අතරමග ගලක හැපී එම ගල බුදුරදුන්ගේ හිසට නොවැටිණි. ගල් පතුරක් පමණක් වැදී උන්වහන්සේගේ ලේ

සෙලවිණි. පසුව නාලාගිරි ඇතුට රා කළ දහසයක් පොවා බුදුරදුන් නැසීමට එවීය. බුදුරදුන්ගේ මහා කරුණාව ඉදිරියේ දණින් වැටුණු එම ඇතු බුදුරදුන්ට නමස්කාරය කළේය.

සම්බුදුරදුන්ට සතුරුකම් කිරීමෙන් ඵලක් නොවන බව සිතූ දෙව්දත් තෙර උන්වහන්සේ වෙත ගොස් කල් ගෙවීය. එහෙත් ටික දිනක් ගිය පසු අලුත මහණ වූ භික්ෂූන් 500 නමක් තම බසට හරවා ගනිමින් සංඝභේදය නම් ආනන්තරීය පාපකර්මය ද සිදුකරනු ලැබිය. බුදුරජාණන් වහන්සේ පසුව අගසව් දෙනම යවා නොමග ගිය භික්ෂුන් 500 දෙනා නැවත කැඳවා ගත්හ. මෙලෙස දෙව්දත් තෙර කෙතරම් තමන්ට සතුරුකම් කළ ද බුදුරදුන් ඒ සැමවිටම නොසැලී අනුකම්පාවෙන් මෛත්‍රී කළ සේක.

## අන්‍යාගමිකයන්ගේ විරුද්ධ ක්‍රියා

බුදුරදුන්ගේ මහා කරුණාව කෙරෙහි පැහැදුණු අන්‍යාගමික බොහෝ පිරිස් බණ අසා තෙරුවන් සරණ ගියහ. එයින් ලාභ සත්කාර අඩුවන බව දුටු තීර්ථකයන් ඇතුළු අන්‍යගමික නායකයෝ උන්වහන්සේ අප්‍රසාදයට පත් කිරීමට නොයෙක් උපක්‍රම යෙදූහ.

සුන්දරී නම් රූමත් පරිබ්‍රාජිකාව මරා දෙව්රම් වෙහෙර පොකුණ අසල දමා එය බුදුරදුන් හා බුද්ධ ශ්‍රාවකයින් කළ බවට චෝදනා කෙරිණි. එම මරණය අන්‍යාගමික තීර්ථකයන්ගේ ක්‍රියාවක් බව පසුව හෙළිවිය. එවිට බුදුරදුන් පිළිබඳ මහ ජනතාවගේ ප්‍රසාදය වැඩි වන්නට විය. තවත් වරෙක චිංච නම් මානවිකාව යොදවා බුදුරදුන්ට අපහාස කිරීමට ඔවුහු උත්සාහ ගත්හ. ඇය දර මිටියක් කුසේ බැඳ දරු ප්‍රසූතියකට ළංවී ඇති කාන්තාවක මෙන් සැරසී බුදුරදුන් ඉදිරියට ගොස් මහ ජනතාවට ඇසෙන්නට උන්වහන්සේට අපහාස කළාය. එම මොහොතේම ඇය කුසේ බැඳ සිටි දර මිටිය කඩාගෙන බිමට වැටුණේය. එහිදී මහ ජනතාව ඇයට අවමන් කොට එතැනින් එළවා දැමීය. ඒ තුළින් ද බුදුරදුන්ගේ කීර්ති රාවය තව තවත් පැතිරී යන්නට විය.

## අසරණයන්ට සරණ වීම

බුදුරජාණන් වහන්සේ අසරණ ජනතාව වෙනුවෙන් අවසන් විසිපස් වසරේදී ඉමහත් සේවාවක් ඉටුකළ සේක. තමන් වෙත එන ඕනෑම

අසරණයකුට පිහිට වූහ. එමෙන්ම දුර ඈත පළාත්වල සිටින අසරණ ජනයා වෙත වැඩම කර පිහිට වූහ.

එක්තරා ගොවියකු කුඹුර සීසෑම, වැපිරීම, වල් නෙලීම, ආදිය කරන සෑම අවස්ථාවකදීම බුදුරදුන් එම ස්ථානයට වැඩම කොට ගොවියා සමග සුහදව කතාබහ කළේ ඔහුට අනාගතයේ විපතක් වූ විට ද පිහිට වීමේ අරමුණෙනි. එම කුඹුරෙහි අස්වැන්න ලැබුණු පසු බුදුරදුන්ට ද කොටසක් දීමට එම ගොවියා පොරොන්දු වී සිටියේය. එහෙත් මහ වැස්සක් වැසීම නිසා පැසී තිබුණු කුඹුර මුළුමනින්ම විනාශ විය. එම විපත දිවැසින් දුටු බුදුරදුන් ගොවියාගේ නිවසට වැඩම කොට අධික බලාපොරොත්තු තබාගත් විට ඒවා සුන්වීම ශෝකයට හේතුවන බව පැහැදිලි කරමින් ධර්මය දේශනා කළහ. එය අසා සැනසීමට පත් ගොවියා සෝවාන් ඵලයට ද පත්විය.

වයසට ගිය පසු දරුවන් විසින් නිවසින් පිටමත් කරනු ලැබූ සැවැත්නුවර අසරණ බමුණු පියෙකුට නැවතත් දරුවගේ සැලකිලි ලැබීමට බුදුරජාණන් වහන්සේ උපක්‍රමශීලීව අවස්ථාව සැලසූහ. බමුණාට තම දරුවන් නොසලකන බව සඳහන් ගාථා පෙළක් උගන්වා ඒවා දරුවන් සහිත මහ පිරිස් සිටින ස්ථානවල ගායනා කිරීමට සැලැස්වීය. එය ඇසූ ඔහුගේ දරුවෝ ඉතා ලැජ්ජාවට පත්වී තම පියාණන් නිවෙස්වලට කැඳවා ගෙන ගොස් ඇප උපස්ථාන කළහ.

සැවැත්නුවර ආනන්ද නමින් මසුරු සිටුවරයෙක් ජීවත් විය. ඔහු මියගොස් සැඩොල් කුලයේ අංග විකල දරුවෙකු වී ඉපදුනේය. ජීවත් වීමට ක්‍රමයක් නොවූ නිසා සිඟමන් යදින්නට විය. ඒ අනුව තමා පෙර සිටි සිටු මාළිගයට ද ආවේය. එහි සිටි මූලසිරි නම් සිටු පුත්‍රයාගේ සේවකයෝ ඔහුට පහර දී කසල ගොඩකට දැමූහ. ඒ දුටු බුදුරජාණන් වහන්සේ මහා කරුණාවෙන් එතැනට වැඩම කොට මූලසිරි අමතා "මේ සැඩොල් දරුවා ඔබගේ මියගිය පියාය" යනුවෙන් හඳුන්වා දුන්හ. පෙර ආත්මයේ සඟවා තිබූ නිධාන සැඩොල් දරුවා ලවාම පෙන්වූහ. එහිදී මූලසිරි සිටු පුත්‍රයා බුදුබණ අසා තෙරුවන් සරණ ගියේය.

වරදට හසුවූ නිවැරදි ගොවියෙකුට ද බුදුරජාණන් වහන්සේ පිළිසරණ වූහ. සොරු කණ්ඩායමක් රාත්‍රී කාලයේ ගෙයක් බිඳ

ගොවියෙකුගේ කුඹුරක් ලඟ ගසක් මුලට ගොස් මුදල් බෙදා ගත්හ, ඉන් එක් මුදල් පොදියක් රැගෙන යාමට ඔවුන්ට අමතක විය. කුඹුරට පැමිණි ගොවියා ඒ පිළිබඳ කිසිවක් නොදැන කුඹුරේ වැඩ කළේය. කුඹුරේ කාසි පොදිය දුටු බුදුරදුන් ''ආනන්ද සර්පයෙක්, ආනන්ද සර්පයෙක් දුටුවාද ?" යැයි විමසූහ. ''එසේය. ස්වාමීනි, දුටුවෙමි" ආනන්ද තෙරණුවෝ පැවසූහ. මොහොතකින් රාජභටයන් පැමිණ මුදල් පොදියත් ගොවියාත් රජමැදුරට ගෙන ගොස් දඬුවම් කිරීමට සූදානම් විය. එහිදී බුදුරදුන් මැදිහත් වී රජුට සත්‍ය කරුණු පහදා දී ගොවියා බේරාගනු ලැබීය.

දිනක් බුදුරදුන් සුන්දරික නදී තීරයේ ගසක් මුල වැඩ සිටියහ. එහි සිටි සුන්දරික භාරද්වාජ නම් බමුණෙකු ගිනි දෙවියන්ට කිරිබත් පූජා කොට ඉතිරි වූ කිරිබත් පිදීම සඳහා බමුණෙකු සොයද්දී බුදුරදුන් හමුවිය. උන් වහන්සේගෙන් ජාතිය හා ගෝත්‍රය විමසීය. එවිට බුදුරජාණන් වහන්සේ ''බමුණ, දන්දීම සඳහා ජාති ගෝත්‍ර විමසීමෙන් ඵලක් නැත. සීලාදී ගුණ ධර්ම ගැන විමසා දන්දීමෙන් යහපත් ප්‍රතිඵල ලැබේ" යැයි දේශනා කළ සේක. එහිදී බුදුරදුන් දෙසූ ධර්මය අසා සුන්දරික භාරද්වාජ බමුණා පැවිදිව අර්හත් ඵලයට ද පත්විය.

මහමග දී ළමයින් පිරිසක් ගැරඬියෙකුට පහර දුන් අවස්ථාවේදී බුදුරදුන් එතැනට වැඩම කොට සෑම සත්වයෙකුම දඬුවමට හා මරණයට බිය බවත් තමන් උපමා කොටගෙන සත්ව හිංසාවෙන් වළකින ලෙසත් අවවාද කරමින් දම් දෙසූහ. ඒ අසා එම දරුවෝ සෝවාන් ඵලයට පත්වූහ.

අදින්නපුබ්බක නම් මසුරු සිටුවරයාගේ පුත් මට්ටකුණ්ඩලී රෝගී දරුවාට මරණාසන්න මොහොතේ බුදුරදුන් වැඩම කොට දෙව්ලොව යාමට මග සැලසූහ. සැවැත්නුවර ඡත්ත මාණවක කුමාරයාට තිසරණ සරණ යාමට සලස්වා මරණින් පසු දෙව්ලොව යාමට බුදුරජාණන් වහන්සේ මග පෙන්වා දුන්හ. පූතිගත්ත තිස්ස තෙරුන්ට හා උදරාබාධයකින් පෙළුණු භික්ෂූන් වහන්සේ නමකට උන්වහන්සේ සියතින්ම උපස්ථාන කළ සේක.

## අසරණ කාන්තාවන්ට පිහිටවීම

සම්බුදුරජාණන් වහන්සේ අසරණ කාන්තාවන්ට ද පිහිට වූ සේක. උරුවෙල් දනව්වේ ගයා පෙදෙසෙහි බමුණු නිවසක දාසියක ලෙස කටයුතු කළ රජ්ජුමාලාවට පිහිටවීම එක් නිදසුනකි. එම නිවසේ බමුණාගේ ලේලිය කිසිදු අනුකම්පාවකින් තොරව ඇයට පහර දුන්නාය. එය ඉවසිය නොහැකි තැන කැලයට ගොස් ගෙල වැළලා ගෙන සියදිවි හානිකර ගැනීමට සූදානම් වෙද්දී බුදුරජාණන් වහන්සේ එතැනට වැඩම කොට ''රජ්ජුමාලා දියණියනි, දිවි හානිකර නොගන්න. මාවෙත එන්න" යැයි කථා කොට ධර්මය දේශනා කළහ. ඇය තුළ මෛත්‍රී සිතිවිලි පහළ වී සෝවාන් ඵලයට පත්වූවාය.

කුමාර කාශ්‍යප මාතාව, කිසාගෝතමී, පටාචාරා ආදී අසරණ කාන්තාවන්ට ද බුදුරජාණන් වහන්සේ සරණ වූ සේක. බුදුරජාණන් වහන්සේ දිනක් ගිජ්ඣකූට පර්වතයට වැඩම කළහ. අජාසත් රජු ලිච්ඡවි රාජ්‍යය ආක්‍රමණය කිරීමට සූදානම් වී සුනීධ හා වස්සකාර යන ඇමතිවරුන් දෙදෙනා බුදුරදුන් වෙත යැවීය. එහිදී බුදුරජාණන් වහන්සේ ආනන්ද තෙරුන් අමතා ලිච්ඡවී රජදරුවන් සප්ත අපරිහානීය ධර්මය රකිනතාක් කල් කිසිවෙකුට යටත් කරගත නොහැකි බව පැහැදිලි කරමින් සප්ත අපරිහානීය ධර්මය දේශනා කළහ.

## පරිනිර්වාණ සමයට ළංවීම

බුදුරජාණන් වහන්සේ සතලිස් පස් වසක්ම ලෝක සත්වයාගේ හිතසුව පිණිස කටයුතු කරද්දී අසූවියට පත් වූ සේක. උන්වහන්සේ භික්ෂු සංඝයා පිරිවරාගෙන අතරමග හමුවන භික්ෂු භික්ෂුණී උපාසක උපාසිකා යන සිව්වනක් පිරිසට දහම් දෙසමින් පාගමනින් වැඩම කළහ. ඒ යන අතරමග විශාලා මහනුවර අම්බපාලි නම් නගර ශෝභිනියක් වූවාය. ඇයට ද උන්වහන්සේ පිළිසරණ වූ සේක. ඇය තම අඹ උයන බුදුරදුන්ට පූජා කොට මහා දානයක් දී බුදු බණ අසා පැවිදිව රහත් ඵලයට පත් වූවාය. බුදුරජාණන් වහන්සේ අවසන් වස් කාලය ගත කළේ විසල් පුරයට නුදුරු බේලුව ගමෙහි ය. එහිදී ලෝහිත පක්ඛන්දිකා නම් රෝගය වැළඳුණු අතර උන්වහන්සේ එම රෝගය අධිෂ්ඨාන බලයෙන් යටපත් කරගත්හ. දිනක් බුදුරජාණන්

වහන්සේ ආනන්ද තෙරුන් අමතා "ආනන්ද, මම දැන් අසූවයස් ගතවූ මහල්ලෙක්මි. මගේ ශරීරය දිරාගිය කරත්තයක් බඳුය. එය තව දුරටත් පවත්වා ගත හැක්කේ චිත්ත ශක්තියෙනි." යනුවෙන් වදාළහ. වැඩි දුරටත් අනුශාසනා කළ උන් වහන්සේ ආනන්ද, මා ළඟ ගුරු මුෂ්ටියක් ඉතිරිව නැත. මම වටහාගත් ධර්මය භික්ෂු සංඝයාට නොසඟවා දේශනා කොට ඇත්තෙමි. භික්ෂු සංඝයාට අවසාන වශයෙන් දේශනා කිරීමට ඉතිරි කර ගත් දෙයක් මා ළඟ නැත. ආනන්ද, තමාම පිහිට කොට ගෙන තමාම සරණ කොට ගෙන ධර්මය පිහිට කොටගෙන ධර්ම සරණ කොට ගෙන ජීවත් වන්නැයි" වදාළහ.

සැවැත්නුවර දී භික්ෂු සංඝයා ඇමතූ බුදුරජාණන් වහන්සේ තව සිව් මසකින් පිරිනිවන්පානා බව දේශනා කළහ. එය ඇසූ බොහෝ භික්ෂූහු හඬන්නට වූහ. රහතන් වහන්සේලා සංවේගය පළ කළහ. ඒ අතර සිටි ධම්මාරාම තෙරණුවෝ බුදුරදුන් ජීවමානව සිටියදීම රහත් වෙමියි සිතා භාවනා කළහ. එසේ ප්‍රතිපත්ති පිරීම අගයමින් උන්වහන්සේට ප්‍රශංසා කළහ. සැරියුත් මුගලන් අගසව් දෙනමගේ පිරිනිවීම සිදුවූයේද මෙකලය. උන්වහන්සේලා ආදාහනය කරවා චෛත්‍ය ඉදිකරවීම බුදුරජාණන් වහන්සේ ලබා දී ඇති ශ්‍රේෂ්ඨ ආදර්ශයකි.

රජගහ නුවරින් උක්කවේල නියම් ගමටත් එතැනින් චාපාල චේතිය වෙතත් වැඩම කළහ. එහිදී ආනන්ද තෙරුන් ඇමතූ බුදුරජාණන් වහන්සේ "ඡන්ද, චිත්ත, වීරිය, වීමංසා යන සතර ඍද්ධිපාද වැඩූ බුදුවරයෙකුට අවශ්‍ය නම් ආයු කල්පයක් හෝ ඊට වැඩි කාලයක් ජීවත්විය හැකිය. තථාගතයන් වහන්සේ ද සතර ඍද්ධිපාද වඩා ඇත්තාහ." යැයි තුන් වරක් ප්‍රකාශ කළහ. බුදුරදුන්ට ආයු කල්පයක් වැඩ සිටීම සඳහා ආරාධනා කිරීමට ආනන්ද තෙරුන්ට කල්පනා නොවීය. තව තුන් මාසයකින් පිරිනිවන්පාමියි අධිෂ්ඨාන කරගත් බුදුරජාණන් වහන්සේ ඒ බව ආනන්ද තෙරුන්ට දැන්වූහ. කලින් වදාළ වචන සිහිකළ ආනන්ද තෙරණුවෝ "භාග්‍යවතුන් වහන්ස, බොහෝ දෙව් මිනිසුන්ගේ හිතසුව පිණිස ආයු කල්පයක් වැඩ සිටින සේක්වායි" ආරාධනා කළහ. "ආනන්ද දැන් එයට කල් ඉක්ම ගොස් ඇත. තථාගතයන් වහන්සේ ආයු සංස්කාරය අත්හළහ" යි ආනන්ද තෙරුන්ගේ ඉල්ලීම ප්‍රතික්ෂප කළහ.

විශාලා මහනුවර කූටාගාර ශාලාවට වැඩම කළ බුදුරදහු ආනන්ද තෙරුන් ලවා එතැනට භික්ෂූන් රැස් කර වූහ. එහිදී මෙසේ වදාළහ. " **මහණෙනි, මා අවබෝධ කොටගෙන දේශනා කළ ධර්මය මැනවින් ඉගෙන ලෝක සත්වයාගේ හිතසුව පිණිස කටයුතු කරන්න. තථාගතයන් වහන්සේ තව තුන් මසකින් පිරිනිවන් පානා සේක. සියලු සංස්කාර ධර්ම නැසෙන සුළුය. නොපමාව කුසල් දහම් රැස් කිරීමෙහි යෙදෙන්න"**

එසේ අවවාද කොට විශාලා මහනුවරින් පිටත් වූ බුදුරජාණන් වහසේ නැවත විශාලාව දෙස හැරී, "**ආනන්ද, මේ මගේ අවසාන විශාලා නුවර දැකීමයි. නැවත විශාලාව නොදකිනු ඇත**" යනුවෙන් ප්‍රකාශ කොට නික්ම භණ්ඩ ගාමයට වැඩම කළහ. එහිදී භික්ෂූන්ට සීල සමාධි ප්‍රඥා යන ත්‍රිශික්ෂාවේ අනුසස් වදාරා හත්ථි ග්‍රාමය, අම්බ ග්‍රාමය, ජම්බු ග්‍රාමය පසු කොට භෝග නගරයට වැඩම කොට එහි විසූ භික්ෂූන් වහන්සේලාට "**සතර මහාපදේස**" දේශනා කළහ. ඉන් පසු වැඩම කළේ පාවා නුවරටය. එහි විසූ චුන්ද කර්මාර පුත්‍රයා බුදුරදුන්ට දානය පිළිගැන්වීය. එය උන් වහන්සේ වැළඳූ අන්තිම දානය විය. එම දානයට සකසා තිබූ සූකර මද්දව නම් ආහාරය වැළඳීමෙන් ලෝහිත පක්ඛන්දිකා රෝගය නැවත වර්ධනය විය. බුදුරදුන්ට එම රෝගය යටපත් කරගත්තේ චිත්ත ශක්තියෙනි. සුජාතා උපාසිකාව දුන් කිරිපිඬු දානයත් චුන්ද කර්මාර පුත්‍රයා දුන් අන්තිම දානයත් බුදු සසුනේ සමාන ආනිසංස ඇති දාන දෙක බව උන්වහන්සේ එහිදී දේශනා කළ සේක.

පාවා නුවරින් කුසිනාරා නුවර බලා වැඩම කරන බුදුරදුන්ට ක්ලාන්ත ගතියක් දැනුණි. ගසක් මුල වැඩහිඳි උන්වහන්සේ ආනන්ද තෙරුන් ලවා පැන් ගෙන්වා ගෙන වැළඳූ සේක. එම අවස්ථාවේ පුක්කුස නම් මල්ල රාජ පුත්‍රයා බුදුරදුන් වෙත පැමිණ බණ ඇසීය. අනතුරුව ඔහු අත වූ රන්වන් පැහැති වස්ත්‍ර දෙකෙන් එකක් බුදුරදුන්ටත් අනෙක ආනන්ද තෙරුන්ටත් පුදා එතැනින් පිටත් විය.

බුදුරදුන් ආනන්ද තෙරුන් සමඟ කුකුත්ථා නදියට බැස නා පැන් වැළඳූහ. පසුව හිරණ්‍යවතී නදියෙන් එතෙර වී කුසිනාරා නුවර මල්ල රජ දරුවන්ගේ උපවර්තන සල් උයනට වැඩම කළහ. එහිදී

බුදුරජාණන් වහන්සේ ආනන්ද තෙරුන්ට "ආනන්ද, මට හරිම **වෙහෙසයි. ක්ලාන්ත ගතියක් දැනෙනවා. මේ සල්ගස් දෙක අතර උතුරට හිස තබා සැතපෙන්නට ආසනයක් පිළියෙල කරන්න."** යනුවෙන් වදාළහ. ඒ අනුව ආනන්ද තෙරණුවෝ ආසනයක් පැනවූහ. බුදුරජාණන් වහන්සේ එම පිරිනිවන් මංචකයෙහි වම් ශ්‍රී පාදය දකුණු ශ්‍රී පාදය මත තබා දකුණු ඇලයෙන් සිංහ සෙය්‍යාවෙන් සැතපුණු සේක. බුදුරදුන් පිරිනිවන් පෑමෙන් පසු දැක වැඳ සංවේග උපදවාගත යුතු ස්ථාන සතරක් එහිදී ආනන්ද තෙරුන්ට උන්වහන්සේ දේශනා කළහ. එනම් බුදුන් උපන් තැන, බුදුවූ තැන, දම්සක් පැවතුම් සූත්‍රය දේශනා කළ තැන සහ පිරිනිවන් පෑ තැනය.

එහිදී එම සල්ගසේ අකාලයේ පිපුණු සල්මල් තථාගත ශරීරයට වැටෙන්නට විය. දෙවියෝ සහ බ්‍රහ්මයෝ පැමිණ පරසතු මදාරා කුසුම් බුද්ධ ශරීරය මත ඉස්සාහ. දිව්‍ය පංච තූර්ය නාද වන්නට විය. සම්බුදුරදුන්ගේ පිරිනිවීම ඉවසා දරාගත නොහැකිව ආනන්ද තෙරණුවෝ කඳුළු සැලූහ. බුදුරදුහු ආනන්ද තෙරුන් කළ සේවය අගය කරමින් සැනසූහ.

එදින රාත්‍රියේ සම්බුදුරදුන් පිරිනිවන් පානා බව අසා මල්ල රජ දරුවෝ සිය පවුල්වල ඥාතීන් සමග පැමිණ හඬා වැළපෙමින් වැඳ පුදා ගත්හ. සුභද්‍ර නම් පරිබ්‍රාජකයෙක් පැමිණ පැනයක් විමසීම සඳහා බුදුරදුන් හමුවීමට අවශ්‍ය බව ආනන්ද තෙරුන්ට පැවසීය. බුදුරදුන් වෙහෙසට පත්ව ඇති බැවින් එම ඉල්ලීමට ආනන්ද තෙරණුවෝ ඉඩ නොදුන්හ. එහෙත් බුදුරදුන්ගේ නියමය පරිදි සුභද්‍ර බුදුරදුන් හමුවී තම පැනය විමසා සැක දුරුකර පැවිදිව උපසම්පදාව ලබා රහත් බවට ද පත්වූයේ ය. බුදුරදුන්ගේ අන්තිම ශ්‍රාවකයා මෙම සුභද්‍ර රහතන් වහන්සේ ය.

**"මහණෙනි, බුදුන් දහම් සඟුන් කෙරෙහි ධර්මය කෙරෙහි යම් සැකයක් ඇත්නම් මගෙන් විමසන්න. මා කෙරෙහි ගෞරවය නිසා ප්‍රශ්නයක් ඇසිමට කෙනෙකුට නොසිතේ නම් යහළු නමක් මාර්ගයෙන් හෝ විමසන්න."** යැයි බුදුරදුහු පැවසූහ. එහෙත් උන්වහන්සේගෙන් කිසිවෙකු ප්‍රශ්න විමසුවේ නැත.

"හන්දදානි භික්ඛවේ ආමන්තයාමි වෝ, වයධම්මා සංඛාරා අප්පමාදේන සම්පාදේථ" **"මහණෙනි, දැන් ඔබ අමතමි. හේතු ප්‍රත්‍යයෙන් හටගත් සියලු සංස්කාර ධර්මයෝ නැසෙන සුළු වෙති. අප්‍රමාදීව කුසල් දහම් රැස් කරගන්න"** යැයි බුදුරජාණන් වහන්සේ අන්තිම බුද්ධ වචනය ප්‍රකාශ කළහ.

සමාපත්තිවලට සමවැදුණු සම්බුදුරජාණන් වහන්සේ වෙසක් පුන් පොහෝදින රාත්‍රියෙහිදී පිරිනිවන් පා වදාළ සේක. මල්ල රජ දරුවෝ සත් දිනක් සම්බුද්ධ ශ්‍රී දේහයට පූජෝපහාර දැක්වූහ. ශ්‍රී දේහය කපු පුළුනින් වෙලා රන් දෙනක තැන්පත් කොට මකුට බන්ධන නම් ස්ථානයේ සඳුන් සෑයක් නිර්මාණය කර ආදාහන පූජෝත්සවය සංවිධානය කළහ. ඒ සක්විති රජෙකු ආදාහනය සිදු කරන පරිද්දෙනි. මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ වැඩම කොට ගෞරව දැක්වීමෙන් පසු ආදාහන කටයුතු සිදු කෙරිණි. එම මොහොතේ නොරහත් භික්ෂූන් වහන්සේලා හඬා වැළපුනහ. රහතන් වහන්සේලා සංවේගය පළ කළහ. දිව්‍ය බ්‍රහ්මයෝ ද මල් ඉසිමින් ශෝක වන්නට වූහ.

**ක්‍රියාකාරකම්**

1. දෙව්දත් තෙරුන් බුදුරදුන්ට කළ සතුරුකම් මොනවාද?

2. අන්‍යාගමිකයන් බුදුරදුන්ට නින්දා අපහාස කළ අවස්ථා දෙකක් හඳුන්වා දෙන්න.

3. අවසන් විසිපස් වසර තුළ බුදුරදුන් විසින් පිහිට වූ අසරණයන් නම් කර ඉන් තිදෙනෙකුට පිහිට වූ අයුරු විස්තර කරන්න.

4. බුදුරදුන් පිරිනිවීමෙන් පසු දැක වැඳ සංවේග උපදවාගත යුතු ස්ථාන 4 නම් කරන්න.

5. බුදු සසුනේ සමාන ආනිසංස ඇති දාන දෙක නම් කරන්න.

6. අන්තිම බුද්ධ වචනය කට පාඩමින් පන්තියට ඉදිරිපත් කරන්න.

7. බුදුරදුන් පිරිනිවන් පා වදාළ අවස්ථාව චිත්‍රයට නගන්න.

## පුහුණුවට

නිමකොට අසූ වසරක ආයුස ගමන
පලකොට ලොවට දහමින් පැවසූ කරුණ
කුසිනාරා නුවර උයනෙන් නිම කෙරුණ
සම්බුදු සමිඳු වෙසඟෙදී පිරිනි වින

දෙව් මිනිසුන්ගෙ වැඳුමට පිං කෙතක් වෙලා
පිරිනිවනට වැඩියෙ අමරස දම් බෙදලා
නිම කළ නොහැක බුදු හිමිගේ ගුණ ගයලා
වඳිනෙමි දණ නමා මුනි සිරිපා සිඹලා

## 03. පාඩම

# අංගුලිමාල මහරහතන් වහන්සේ

වැරදි නිවැරදි කරගත් අයෙකුට යහපත් පුද්ගලයෙකු විය හැකිය යන්න බුදු දහමේ සඳහන් වැදගත් ඉගැන්වීමකි. එය සනාථ කරන චරිතයක් ලෙස අංගුලිමාල මහ රහතන් වහන්සේගේ චරිතය හැඳින්විය හැකිය.

කොසොල් රජුගේ පුරෝහිතයා වූ ගග්ග නම් බමුණාගේත් මන්තානි නම් බැමිණියගේත් පුතා අහිංසක නම් විය. දෙමව්පියෝ ඔහු ශිල්ප ශාස්ත්‍ර ඉගෙනීමට තක්ෂිලා නුවර දිසාපාමොක් ඇදුරුතුමා වෙත බාර කළහ. මුලදී අහිංසක කුමරා ඇදුරුතුමාගේ ප්‍රියතම ශිෂ්‍යයා විය. සෙසු ශිෂ්‍යයෝ ඊට ඊර්ෂ්‍යා කළහ. ඔවුහු ගුරුතුමා වෙත ගොස් අහිංසක ගැන බොරු කියා බිඳවූහ.

අහිංසක කුමරු කෙරෙහි ද්වේශයක් ඇතිකරගත් දිසාපාමොක් ඇදුරුතුමා ඔහු නැසීමට උපායක් කල්පනා කළේය. මිනිසුන් දහසක් ඝාතනය කොට ගුරු පූජාවක් කළයුතු බව පැවසීය. ඇදුරුතුමා මින් අපේක්ෂා කළේ මිනිසුන් මරමින් යනවිට කවර අයෙකුගේ හෝ අතින් අහිංසක මිය යනු දැකීමයි.

මිනිසුන් මැරීමේ එල විපාක නොදත් අහිංසක කුමරා ගුරු බස පිළිගත්තේය. කඩුවක් අතින් ගෙන වන ගත වී එහි සැඟ වී සිට මහ මග යන එන මිනිසුන් මැරීය. රාත්‍රී ගම්වලට ඇතුළු වී ගෙවල්වල නිදාසිටි මිනිසුන් ඝාතනය කළේය. මරණ සංඛ්‍යාව දැන ගැනීමට එක් මළ මිනියකින් එක් ඇඟිල්ලක් බැගින් කපා අමුණා කරේ දමා ගත්තේය. ඇඟිලි මාලයක් දැරූ බැවින් අංගුලිමාල නමින් ප්‍රසිද්ධ විය. ගුරු පූජාව පැවැත්වීමේ අරමුණින් ඔහු මිනිසුන් 999 ක් මරා ගෙල වටා ඇඟිලි අමුණාගෙන තිබුණි. ඇඟිලි දහස සම්පූර්ණ වීම සඳහා තව එක් මිනිසෙකු මැරීමේ අරමුණින් ඇවිදින්නට විය.

ගම්වල සිටි මිනිස්සු අංගුලිමාලට බියෙන් නගරයෙහි වූ කොසොල් රජ මාළිගාවට ගොස් ''රජතුමනි, මිනීමරන අංගුලිමාලගෙන් අපව මුදා ගන්න'' යැයි ඉල්ලා සිටියහ.

කොසොල් රජු හමුදා භට පිරිස් සමග අංගුලිමාල අත්අඩංගුවට ගැනීමට සූදානම් විය. එම පුවත අංගුලිමාලගේ මවට ආරංචි වූයේය. ඇය දරු සෙනෙහසින් තම පුතා බේරා ගැනීමට ඔහු සිටින වනය බලා පිටත් වූවාය.

බුදුරජාණන් වහන්සේ උදෑසන මහා කරුණා සමාපත්තියට සමවැදී බුදු ඇසින් ලොව දෙස බලන කල්හි අංගුලිමාලට සිදුවීමට යන තත්වය දුටුසේක. ඔහු ඇඟිලි දහස සම්පූර්ණ කර ගැනීමට තව මොහොතකින් තම මව මරනු ඇත. එයින් ආනන්තරීය පාප කර්මය සිදුකොට අපාගත වේ. ඔහු ඉන් වළක්වා ගැනිම සඳහා බුදුරදුන් එම වනයට වඩින විට ''අංගුලිමාල මිනිමරුවා ඉන්න වනයට වඩින්න එපා'' යැයි ජනතාව පැවසූහ. එහෙත් බුදුරජාණන් වහන්සේ අංගුලිමාල සොයා වැඩම කළහ.

සම්බුදුරදුන් වඩිනු දුටු අංගුලිමාල උන්වහන්සේ ඝාතනය කොට ඇඟිල්ල කපා ඇඟිලි දහස සම්පූර්ණ කර ගැනිමට සිතුවේය. කඩුව ඔසවාගෙන උන්වහන්සේ වෙත දිව ගියේය. තමන් වහන්සේ වෙත ළංවිය නොහැකි වනසේ අධිෂ්ඨාන කරගත් බුදුරජාණන් වහන්සේ සන්සුන් ගමනින් වැඩම කළහ. ඔහු බුදුරදුන් පසුපස වේගයෙන් ගියද උන්වහන්සේ වෙත ළංවිය නොහැකි විය. වෙහෙසට හා කෝපයට පත් අංගුලිමාල මෙසේ කීය. ''මහණ, ඔහොම නවතිනු'' එවිට බුදුරජාණන් වහන්සේ ''අංගුලිමාල, මම නැවති සිටිමි. ඔබ නවතින්න'' යැයි සන්සුන්ව පැවසූහ.

බුදුරදුන්ගේ එම ප්‍රකාශය අංගුලිමාලට මහත් ප්‍රහේලිකාවක් විය. උන්වහන්සේ ඇමතූ අංගුලිමාල ''මහණ, ඔබ ගමන් කරමින් නැවතී සිටින බව කියයි. නැවති සිටින මට නවතින ලෙස කියයි. මෙහි තේරුම කුමක්ද?'' එවිට බුදුරජාණන් වහන්සේ ''අංගුලිමාලය, මම සත්ව හිංසාව ඇතුළු පාපකාරී ක්‍රියා නොකරන මෛත්‍රිය, කරුණාව ආදී ගුණධර්මවල පිහිටා සිටින බැවින් නැවතුනේ වෙමි. ඔබ අනුන්ට හිංසා කිරීම ආදී පාපකාරී ක්‍රියා කරන හෙයින් නොනැවතුනේ වෙයි'' යනුවෙන් කරුණු පැහැදිලි කළහ.

එම බුදු වදන් ඇසූ අංගුලිමාලට නුවණැස පෑදුනි. කඩුව සහ ඇඟිලි මාලය පසෙක දැමූ ඔහු බුදුරදුන් ළඟ වැද වැටී ''ස්වාමීනි, මට පිහිට වෙන්න'' යැයි ප්‍රකාශ කොට පැවිදි බව ඉල්ලා සිටියේ ය. එහිදී හෙතෙම පැවිදි උපසපන් කරනු ලැබීය. දරුණු පුද්ගලයින් දමනය කිරීම නම් වූ පුරිසධම්ම සාරථී ගුණයෙන් යුතු බුදුරජාණන් වහන්සේ අංගුලිමාල තෙරුන් ද සමඟ ජේතවනාරාමයට වැඩම කළහ.

කොසොල් රජු සේනාව සමඟ අංගුලිමාල ඇල්ලීමට පිටත්ව යන විට දෙව්රම් වෙහෙරට ද ගොස් බුදුරදුන්ට වැඳ යන ගමන ගැන පැවසීය. එවිට බුදුරජාණන් වහන්සේ ''මහරජ, අංගුලිමාල පැවිදි වුණොත් ඔබ කරන්නේ කුමක්දැයි" විමසූහ. "භාග්‍යවතුන් වහන්ස, සෙසු ස්වාමීන් වහන්සේලාට දක්වන ගරු සැලකිලි උන්වහන්සේටත් දක්වන්නෙමි" යි රජු පැවසිය. එහිදී බුදුරජාණන් වහන්සේ එතැන සිටි අංගුලිමාල තෙරුන් රජුට පෙන්වූහ. රජු බියෙන් වෙලා ගියේය. එවිට බුදුරදුහු රජු අමතා ''දැන් කුරා කුහුඹුවෙකුටවත් මොහුගෙන් විපත් නොපැමිණේ" යැයි දේශනා කළහ. කොසොල් රජු අංගුලිමාල තෙරුන්ට වැඳ ගරු සැලකිලි දක්වා පිටත්ව ගියේය.

අංගුලිමාල පැවිදි වුවත් කලක් යන තුරු ජනතාවගේ අප්‍රසාදය හා බිය පැවතුණි. උන්වහන්සේ පිඬුසිඟා වඩින විට ඇති බියෙන් දොරවල් වසාගත්හ. තවත් පිරිස් හිරිහැර කරන්නට ද සැරසුණහ. පසුව එම තත්වය වෙනස් විය.

භාවනාවට සිත යොමු කළ ද අංගුලිමාල තෙරුන්ට පෙර කළ මිනිස් ඝාතන සිහියට නැගෙන්නට විය. බුදුරජාණන් වහන්සේ ඒවා දුරු කළහ. විදසුන් වැඩූ අංගුලිමාල තෙරණුවෝ අර්හත් ඵලයට පත් වූහ. එම අවස්ථාවේ උන්වහන්සේ මෙසේ උදන් ඇණුහ.

යෝ ච පුබ්බේ පමජ්ජිත්වා
පච්ඡා සෝ නප්පමජ්ජති
සෝ ඉමං ලෝකං පභාසේති
අබ්භා මුත්තෝව චන්දිමා

''යමෙක් පළමුව ප්‍රමාදීව කටයුතු කර පසුව අප්‍රමාදීව කටයුතු කරයි ද ඔහු වළාකුලින් මිදුණු සඳක් මෙන් මේ ලෝකය ආලෝකවත් කරයි.''

අංගුලිමාල තෙරුන් දේශනා කළ අංගුලිමාල පිරිත දරුවන් සිටින ගැබිණි මව්වරුන්ට ඉමහත් ආශිර්වාදයකි. බුදුරදුන්ගේ නියමය පරිදි එකල ගැබිණි මවකට උන්වහන්සේ එම පිරිත දේශනා කොට ඇත. ඉන් පසු ගැබිණි මව සුවසේ දරුවා බිහිකළාය. එය දැනගත් සෙසු ජනතාව අංගුලිමාල තෙරුන්ට මහත් ගරු සරු දක්වන්නට විය. වර්තමානයෙහිද ගැබිණි මව්වරු මහා සංඝරත්නය ලවා අංගුලිමාල පිරිත දේශනා කරවාගෙන ආශිර්වාද ලබා ඉතා පහසුවෙන් දරුවන් බිහි කරති.

### අංගුලිමාල කතා පුවතින් ගතහැකි ආදර්ශ

1. ඉගෙනීමට දක්ෂ සිසුන්ට ඊර්ෂ්‍යා නොකර එම දක්ෂතා වැඩි දියුණු කරගැනීමට උදව් කිරීම.
2. ඉගෙනීමට දක්ෂ සිසුවාගෙන් අනෙක් සිසුන් උදව් උපකාර ලබාගැනීම.
3. ගුරුවරයා වැරදි අවබෝධයක සිටීනම් සිසුන් විසින් සත්‍ය වටහාදීම.
4. ගුරු සිසු දෙපක්ෂයම ඉතා සමගියෙන් ක්‍රියා කිරීම.
5. වැරදි කළ පුද්ගලයෙකු සුමගට යොමු වූ විට ඔහුට කිසිවිටෙකත් උපහාස නොකර ගරු සැලකිලි දැක්වීම.
6. වැරදි කරුවෙකු වැරදි අත්හැරි විට ඔහු වැරදි කරුවෙකු නොවන බව සිතීම.
7. වැරදි කරන පුද්ගලයෙකු එම වැරදි වලින් මුදවා ගැනීමට උත්සාහ කිරීම.

### ක්‍රියාකාරකම්

1. අංගුලිමාල කුමරුගේ මව සහ පියා නම් කරන්න.
2. අහිංසක අංගුලිමාල වූයේ කෙසේද?
3. බුදුරදුන් අංගුලිමාල දමනය කළ අයුරු පැහැදිලි කරන්න.
4. අංගුලිමාල තෙරුන්ගේ චරිතයෙන් ගතහැකි ආදර්ශ 05 ක් ලියන්න.
5. අංගුලිමාල දමනය චිත්‍රයට නගන්න.

6. යෝ ච පුබ්බේ පමජ්ජිත්වා යන ගාථාව හා තේරුම කටපාඩම් කර පන්තියට ඉදිරිපත් කරන්න.

පුහුණුවට

වලාකුළින් මිදුණ සඳක්
අහස එළිය කරන ලෙසින්
පමා බවින් මිදුණු කෙනෙක්
මුළු ලෝකෙම එළිය කරයි

## 04. පාඩම

## මව්පිය දූ දරු යුතුකම්

නිවසේ සිටින දෙවිවරු දෙදෙනෙකි. ඒ මව සහ පියා ය. නිවසේ සිටින බ්‍රහ්මයෝ දෙදෙනෙකි. ඒත් මව සහ පියා ය.

දෙමව්පියන් හඳුන්වන ඉහත නම් අනුව ඔවුන් සමාජයේ කෙතරම් උසස් උතුම් දෙදෙනෙක් ද යන්න පහසුවෙන් වටහා ගත හැකිය. මවක් දරුවෙකු කුස පිළිසිඳ ගත් දා පටන් ඒ දරුවාගේ සුවය වෙනුවෙන් වෙහෙසෙයි. ඒ දරුවා මෙලොවට බිහිවූ දා සිට කිරි පොවා පෝෂණය කිරීමට, කවා පොවා නාවා පිරිසිදු කිරීමට, තම පණමෙන් දරුවා රැක ගැනීමට මවක් අපමණ ලෙස දුක් මහන්සි වෙයි. පියා ද එබඳුම වූ ගුණයෙන් යුතු වන්නේය. තම දහදිය වගුරුවා වෙහෙස මහන්සි වී මිල මුදල් ආහාරපාන සපයා ගෙන එනුයේ දූ දරුවන්ගේ අනාගත දිවිය සාර්ථක කිරීම සඳහාය. තම දරුවන් අනාගතයේ සැපත් පුරවැසියන් වනු දැකීම සෑම මවකගේ මෙන්ම පියෙකුගේ ද අපේක්ෂාවයි.

පළමුවෙන්ම දරුවන්ට හොඳ නරක කියා දී යහමඟට යොමු කරන ආචාර්යවරුන් නිසා මව්පියන් "පුබ්බාචරිය" නමින් හඳුන්වා ඇත. මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ෂා යන සිවු බඹ විහරණයෙන් යුතුව දරුවන් හදාවඩා ගන්නා නිසා මව්පියන් බඹුවෙන් හඳුන්වා ඇත.

### මව්පිය යුතුකම්

හිරු ලෝකයට එළිය ආලෝකය දෙන්නා සේ දරුවන්ට ජීව ගුණය දෙන නිසා දෙමව්පියෝ නැගෙනහිර දිශාවට උපමා කෙරෙති. මිනිසුන්ගේ උතුම් මිතුරා දරුවන් යැයි බුදුරජාණන් වහන්සේ දේශනා කර ඇත. මව්පියන්ගේ පිළිගැනීම ද එයයි. මව්පියෝ එසේ සිතා තම ඇස දෙක සේ දරුවන් රැක බලා ගැනීමට සුහුසුලු වෙති. නිරතුරුවම යහපත ප්‍රාර්ථනා කරති. බුදුරදුන් සිගාලෝවාද

සූත්‍රයේදී මව්පියන් දරුවන්ට ඉටුකළ යුතු යුතුකම් පහක් හඳුන්වාදී ඇත.

1. දරුවන් පාප ක්‍රියාවලින් මුදවා ගැනීම (පාපා නිවාරෙන්ති)
2. දරුවන් යහපත් ක්‍රියාවල යෙදවීම (කල්‍යාණේ නිවේසන්ති)
3. දරුවන්ට හොඳින් ඉගැන්වීම (සිප්පං සික්ඛාපෙන්ති)
4. සුදුසු ආවාහ විවාහ කරදීම (පතිරූපේන දාරෙන සංයෝජෙන්ති)
5. සුදුසු කල දායාද පවරා දීම (දායජ්ජං නිය්‍යාදෙන්ති)

පස් පව්, දස අකුසල් ආදියෙන් වළක්වා සමාජය අගයන යහපත් ක්‍රියාවල දරුවන් යෙදවීමට මව්පියන් නොගන්නා උත්සාහයක් නැත. හොඳ නරක දෙක මැනවින් වටහා දී නරක ක්‍රියාවලින් වැළැක්වීමටත් යහපත් ක්‍රියාවල යෙදවීමටත් ඔවුහු නිරතුරුවම ක්‍රියා කරති. යහපත් ක්‍රියාවන් සිදු කිරීමෙන් මෙලොව සහ පරලොව වශයෙන් ලබන යහපත් ප්‍රතිඵල පෙන්වා දෙන අතරම නරක යහළුවන් ඈත් කර යහපත් සත්පුරුෂ යහළුවන් ඇසුරු කිරීමට ද උපදෙස් දෙති. සමාජයේ ප්‍රියශීලී ජීවිතයක් ගතකිරීමට නම් සෑම දරුවෙක්ම අනුන්ගේ නින්දාවට අපහාසයට ලක්වන ක්‍රියාවන් නොකළ යුතුය.

දරුවන්ගේ අධ්‍යාපන කටයුතු කෙරෙහි සැලකිලිමත් වන මව්පියෝ පොත්පත්, ඇඳුම් පැළඳුම්, ආහාර පාන සපයා දී හොඳ අධ්‍යාපනයකට යොමු කරති. පාසල් යැවීම, දහම් පාසල් යැවීම, වෘත්තිය පුහුණු පාඨමාලා හැදෑරීමට යොමු කරවීම තුළින් යහපත් අනාගතයක් දරුවන්ට උදාකර දීමට වෙහෙසෙති. හොඳින් ඉගෙන උසස් විභාගවලින් ජය ලබා සමාජයේ උගත් ගුණවත් පුරවැසියන් වනු දැකීම මව්පියන්ගේ අපේක්ෂාවයි.

තම ජීවිතයේ ආලෝකය උදාකළ මව්පියන්ගේ ගුණ සුවඳ සත්පුරුෂ වූ දරුවන්ට නිරතුරුව දැනෙයි. තම දිවිමග සාර්ථක කර ගැනීමට මගපෙන්වූ, ඊට ආශිර්වාද කළ මව්පියන් අමතක කිරීම කලගුණ නොදන්නා අසත් පුරුෂ දරුවන්ගේ ලක්ෂණයයි. ඒ නිසා අප කිසි විටෙකත් මව්පිය ගුණ අමතක නොකළ යුතුය. අසත්පුරුෂ දරුවන් නොවිය යුතුය.

දූ දරුවන් විසින් මව්පියන්ට ඉටුකළ යුතු උපකාර පහක් දේශනා කොට ඇත.

1. මව්පියන් පෝෂණය කිරීම (භතෝ නේ භරිස්සාමි)
2. මව්පියන්ගේ සියලු කටයුතු ඉටුකරදීම (කිච්චං නේසං කරිස්සාමි)
3. මව්පියන්ගේ සිරිත් විරිත් හා කුල පරපුර රැක ගැනීම ( කුලවංසං ඨපෙස්සාමි)
4. මව්පියන් දුන් දායාද රැක ගැනීම (දායජ්ජං පටිපජ්ජාමි)
5. මව්පියන් මිය ගිය පසු පිං අනුමෝදන් කිරීම (පේතානං කාලකතානං දක්ඛිණං අනුපදස්සාමි)

සත්පුරුෂ දූ දරුවෝ තමන්ට හැකි සෑම අවස්ථාවකදීම මව්පියන්ට සැලකීමට වගබලා ගනිති. තමන්ට රැකියාවක්, උසස්වීමක්, වැඩිපුර මුදලක් ලද විගස මව්පියන්ට වටිනා තෑගි බෝග ද පිරිනමති. වයසට පත් තම දෙමව්පියන්ට ආහාරපාන සකස් කර දීම, ඇඳුම් පැලඳුම් ගෙනැවිත් දීම කරති. දෙමව්පියන්ට දොස් කීම, ඔවුන්ට හිංසා පීඩා කිරීම, බැණ වැදීම, පහර දීම, නිවසින් එළවා දැමීම සත්පුරුෂ දරුවන්ගේ සිරිත නොවේ.

මව්පියන් සිදුකරගෙන ආ ආගමික වතාවත් ඇතුළු ජාතික, සංස්කෘතික, සාමාජික සිරිත් විරිත් කඩ නොකොට ඉදිරියට පවත්වා ගෙන යාම ද දූ දරුවන්ගේ සිරිත වේ. එමෙන්ම මව්පියන්ගෙන් උරුම වූ වස්තුව නාස්ති කර නොදැමිය යුතුය. ඒවා යහපත් අර්ථවත් ක්‍රියා සඳහා පමණක් යෙදවීම සත්පුරුෂ දූ දරුවන්ගේ වගකීමයි.

මව්පියෝ සැමදා ජීවත් නොවෙති. යම් දවසක මිය යනු ඇත. මිය යන තුරු ඔවුන්ට සැලකීම දූ දරුවන්ගේ යුතුකමක් සේම මිය ගිය පසුව ද මතක වස්ත්‍ර පූජා කිරීම, අවසන් කටයුතු ගෞරවයෙන් සිදුකිරීම, දන් පැන් දීම, ධර්ම දේශනා පැවැත්වීම ආදි පිංකම් කිරීම ද සත්පුරුෂ දූ දරුවන්ගේ සිරිත වේ. එබඳු කළ ගුණ සලකන සත්පුරුෂ දරුවන් වීමට අපිත් උත්සාහ දරමු.

ඇතැම් පවුල්වල බොහෝ සේ මව්පිය දූ දරු යුතුකම් හා වගකීම ගිලිහී ගොස් ඇති අයුරු පෙනේ. එය සමාජ පරිහානියට ද හේතු වී ඇත. සත්පුරුෂ දරුවෝ අධ්‍යාපනය ලබා ගුණ නුවණින් සපිරුණු

කල්හි දෙමව්පියන් තුළ පවතින අඩුපාඩුකම් ද මෛත්‍රී සිතින් පෙන්වා දී නිවැරදි කරති. එය ද දූ දරුවන් සතු එක්තරා යුතුකමකි.

දහැමි ප්‍රඥාවන්ත සමාජයක් බිහිවීමට මෙන්ම යහපත් මාපිය දූ දරු සබඳතාවක් ගොඩනගා ගැනීමට මව්පියගෙන් දරුවන්ටත් දරුවන්ගෙන් මව්පියන්ටත් ඉටුවිය යුතු අන්‍යෝන්‍ය උපකාර බෙහෙවින් හේතුවේ. අන්‍යෝන්‍ය උපකාර හොඳින් හඳුනාගෙන අපි ඒවා මැනවින් සම්පූර්ණ කිරීමට උත්සාහවත් වෙමු.

**ක්‍රියාකාරම්**

1. බුදු දහමේ දැක්වෙන මව්පියන් හැඳින්වෙන විශේෂිත නාම ලියා දක්වන්න.
2. මව්පියන් දරුවන්ටත් දරුවන් මව්පියන්ටත් කළ යුතු අන්‍යෝන්‍ය උපකාර වගු ගතකර දක්වන්න.
3. ඔබ නිවසේදී දෙමව්පියන්ට ගරු බුහුමන් සහ උපකාර කරන අවස්ථා ලියන්න.
4. මව්පියන් ඔබට කරන උපකාර පැහැදිලි කරන්න.
5. මව්පිය දූ දරු සබඳතාව කඩවීමෙන් ඇතිවිය හැකි තත්වය ඔබට සිතෙන අයුරින් පැහැදිලි කරන්න.

**පුහුණුවට**

බ්‍රහ්මාති මාතාපිතරෝ
පුබ්බාචරියාති වුච්චරේ
ආහුනෙය්‍යාච පුත්තානං
පජාය අනුකම්පකා

මව්පියෝ බ්‍රහ්මයෝය.
මුල් ගුරුවරුන්ය.
දරුවන්ගේ සත්කාර ලැබීමට සුදුසුය.
දරුවන්ට අනුකම්පා කරන්නෝය.

## 05. පාඩම

## බුදුකුරු දම් හුරුකර ගනිමු

එදා පොහෝ දිනයයි. අපේ දහම් පාසලේ සියලුම ළමයි සුදුවතින් සැරසී සිල් සමාදන් වීමට පන්සලට පැමිණියහ. උදෑසන අටසිල් සමාදන් වී හීල් දානය ගත් පසු අපි ධර්ම දේශනාවට සවන් දීම සඳහා සූදානම් වුනෙමු. ධර්මාසනය වෙත වැඩම කළ ස්වාමීන් වහන්සේ එදින මාතෘකා කරගත්තේ පහත සඳහන් ගාථාවයි.

දාන සීලං ච නෙක්ඛම්මං - පඤ්ඤා විරියේන පංචමං
ඛන්ති සච්චමධිට්ඨානං - මෙත්තුපෙක්ඛාතිමේ දස

බුදුරජාණන් වහන්සේ බුදුවීමට පෙර මහ බෝසත් අවධියේ පිරූ බුදුකුරු දම් බුද්ධ කාරක ධර්ම හෙවත් පාරමිතා ධර්ම මේ ගාථාවෙන් කියැවෙයි. ඒවා නම්,

1. දාන පාරමිතාව
2. සීල පාරමිතාව
3. නෙක්ඛම්ම පාරමිතාව
4. පඤ්ඤා පාරමිතාව
5. විරිය පාරමිතාව
6. ඛන්ති පාරමිතාව
7. සච්ච පාරමිතාව
8. අධිට්ඨාන පාරමිතාව
9. මෙත්තා පාරමිතාව
10. උපෙක්ඛා පාරමිතාව

දානාදී මේ ගුණ ධර්ම දහය පාරමිතා බවට පත්වීම සඳහා ඒවා. සපුරා ගත යුතු ආකාරය ස්වාමීන් වහන්සේ මෙසේ අපට විස්තර කර දුන්හ.

දරුවනි, බෝසත්වරයෙකු පාරමිතා පුරන්නේ සම්මා සම්බුදු බව, පසේ බුදුබව හෝ රහත් බුදුබව යන තුන් බුදුබවෙන් එකක් අරමුණු

කරගෙනයි. මේ උදාර අරමුණක් පෙරටු කරගෙන දානාදී ගුණධර්ම සම්පූර්ණ කරන විට විශේෂ ලක්ෂණ පහක් ඒ සඳහා සම්බන්ධ වෙනවා. එය මෙහෙමයි සඳහන් වෙන්නේ, "තණ්හා මාන දිට්ඨිහි අනුපහතා, කරුණූපායකෝසල්ල පරිග්ගහීතා" කියලා ඒ ලක්ෂණ පහත දැක්වේ.

1. තණ්හාවෙන් තොරබව
2. මානය නැතිබව
3. දිට්ඨියෙන් තොර බව
4. කරුණාවෙන් යුක්ත බව
5. නුවණින් යුක්ත බව යි. හැම පාරමිතාවක් සම්බන්ධයෙන් ම මේ ලක්ෂණ පහ එකතුවිය යුතුයි.

දරුවනි, අපි මේ කරුණ තේරුම් ගැනීම සඳහා දානය පාරමිතාවක් බවට පත්වන ආකාරය නිදසුනක් වශයෙන් සොයා බලමු. නොයෙක් අය දන්දෙන්නේ නොයෙක් අරමුණු ඇතිව. සමහරු මෙලොව ප්‍රසිද්ධිය බලාපොරොත්තුවෙන් දන් දෙනවා. සමහරු ලාභ ප්‍රයෝජන බලාපොරොත්තු වෙනවා. තවත් අය පරලොව දිව්‍ය සැප සම්පත් පතනවා. මේ අරමුණු දන්දීමෙන් ඉටුකර ගන්න පුළුවන්. ඒත් බුදුවීමේ අරමුණ එයින් ඉටුවන්නේ නැහැ. ඒ නිසා ඒ දීම පාරමිතාවක් වන්නේ නැහැ. මේ ආකාරයට දීමේදී ලාභාදිය බලාපොරොත්තුව හෙවත් තණ්හාව මිශ්‍ර වෙලා තියෙනවා. තව කෙනෙක් අනිත් අයට වඩා ඉහළින් දන් දෙන්න සිතනවා. එතැන ඇත්තේ මානයයි. පාරමිතාවක් වන්න මානයෙනුත් තොර විය යුතුයි. කෙනෙකුට හිතෙන්න පුළුවන් දන්දීමෙන් පමණක් නිවන් දකින්න බුදුවෙන්න පුළුවන් කියලා. එතැන තියෙන්නේ වැරදි දැකීමක්. එයයි දෘෂ්ඨියෙන් හෙවත් මිථ්‍යා දෘෂ්ඨියෙන් යුක්ත බව කියන්නේ.

මේ කෙලෙස්වලින් බැහැර වෙලා කරුණාවෙන් යුක්ත වෙලා දන් දිය යුතුයි. කරුණාව යනු අනුන්ගේ දුක අපහසුකම් දැකලා ඒවායින් ඔවුන් මුදවා ගැනීමට ඇති වුවමනාවයි. අනිත් කරුණ ප්‍රඥාව, නුවණ හෙවත් උපාය කුසලතාව යි. මෙතැන දී නුවණ කියන්නේ දන්දීමේ සැබෑ අවශ්‍යතාව තේරුම් ගැනීම. දන්දීමේ ආනිසංශ තේරුම් ගැනීමය කියන්නත් පුළුවන්. ඒ විදිහට දානයක් දුන්නොත් පමණයි එය පාරමිතාවක් වන්නේ.

බෞද්ධයන් කවුරුත් බලාපොරොත්තු වෙන්නේ විමුක්තිය ලැබීමට, නිවන් දැකීමට, නිවන් දැකිය හැක්කේ බුදු, පසේබුදු, මහරහත් යන තුන් ආකාරයෙන් එකකින්. බෞද්ධයන් වන අප හැම දෙනාම බුදුබව සඳහා උත්සාහ කරන අය. ඒ නිසා බෝසත් අය විය යුතුයි. අප කවුරුත් පාරමිතා පිරිය යුතුයි. දානාදී ගුණධර්ම පාරමිතා බවට පත්වන ආකාරය තේරුම් ගෙන සිටිය යුත්තේ එබැවින්.

ඉන් පසු ස්වාමීන් වහන්සේ, පාරමිතා දහය දීර්ඝ වශයෙන් විස්තර කර දුන්නා. ඒ විස්තරයේ ප්‍රධාන කරුණු පමණක් මෙසේය.

1. දාන පාරමිතාව

තමන් සතු දෙයක් තම අයිතිය අතහැර අනුන්ට දීම දානයයි. තමන්ට වඩා සිල්වත් ගුණවත් අයට පූජාවක් වශයෙන් දීම පූජා බුද්ධියෙන් දෙන දානයකි. වෙනත් කෙනකුට අසරණකම ගැන සලකා අනුග්‍රහයක් වශයෙන් දීම අනුග්‍රහ බුද්ධියෙන් දෙන දානයකි.

ලබන්නාට ප්‍රයෝජනවත් වන, ලබන්නාට යහපතක් සිදුවන ඕනෑම දෙයක් දන්දීමට පුළුවන. තමන්ට අයත් බාහිර දේවල් දීම ආමිස දානය යි. ආහාරපාන, ඇඳුම්, උපකරණ, නිවාස ආදිය එයට අයත් වේ. තම ශරීරාංග මෙන් ම තම ජීවිතය ද දන්දීමට බුදුබව පතන උතුමෝ පෙළඹෙති. වෙහෙස මහන්සි වී අනුනට උපකාර කිරීම ශ්‍රමදානය වන අතර අනුන්ගේ ජීවිතය ගළවා ගැනීම, අනුන් මරණයෙන් බේරා ගැනීම අභය දානය යි. අනුන්ගේ දියුණුවට, විශේෂයෙන් ආධ්‍යාත්මික දියුණුවට හේතුවන කරුණු කියාදීම ධර්ම දානයයි. බුදුබව පතා දෙන දානය දාන පාරමිතාවයි.

2. සීල පාරමිතාව

සිතා මතා කය වචනය සංවර කර ගැනීම සීලය නම් වේ. ශික්ෂා පද සමාදන් වී ඒවා ආරක්ෂා කර ගැනීම සංවරවීම සඳහා අනුගමනය කරන ක්‍රමයයි. ඒ මගින් වැරදි හැසිරීමෙන් වෙන්වීම හෙවත් විරමණය ද, යහපත් හැසිරීම් පුරුදු පුහුණු වීම හෙවත් සමාදානය ද යන දෙඅංශයම සම්පූර්ණ වේ. ගිහියාගේ නිත්‍ය සීලය පංච සීලයයි. විශේෂ දිනවල දී බෞද්ධයා අටසිල්, ගිහි දසසිල් වැනි

උසස් සීලයක පිහිටීම ද කරයි. සිල් පද අඛණ්ඩව රැක ගනිමින් සීලය පාරමිතාවක් බවට පත් කර ගත හැකිය.

### 3. නෙක්ඛම්ම පාරමිතාව

නෙක්ඛම්ම හෙවත් නෛෂ්ක්‍රම්‍යය යනු අරමුණුවලට දැඩි සේ නො ඇලී ඉන්ද්‍රිය සංවර කර ගැනීමයි. ඇස, කන, නාසය, දිව, කය යන ඉන්ද්‍රියන් පහට ගොදුරු වන රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ යන අරමුණු මගින් මිනිසා ආස්වාදයක් ලබයි. ඒ ආස්වාදය අතහැර දැමීම නොව කළයුත්තේ ඒ සඳහා දැඩි ආසාවක් හෙවත් තණ්හාවක් ඇති කර නොගෙන ඉන්ද්‍රිය සංවර කර ගැනීමයි. ආශාව සම්පූර්ණයෙන් පාලනය කරගෙන සියල්ල අතහැර දැමීමෙන් නෙක්ඛම්ම පාරමිතාව සපුරා ගත හැකිය. එසේ කිරීමට අපහසු වුවද ආශාව අඩු කර ගන්නා පමණට අසහනයට භාජනය නොවී තෘප්තිමත් ජීවිත ගත කළ හැකිය.

### 4. ප්‍රඥා පාරමිතාව

ප්‍රඥාව හෙවත් නුවණ, බුද්ධත්වය අරමුණු කරගෙන දියුණු කර ගැනීම පඤ්ඤා පාරමිතාවයි. සියලු සංස්කාර හෙවත් ලෝකයට අයත් සියලු දෑ අනිත්‍ය බවත්, අනිත්‍ය දෙයට ඇලුම් කිරීම දුකට හේතුවන බවත් තේරුම්ගෙන බුද්ධිමත් ව කල්පනා කරමින් හොඳ - නරක, කුසලාසල වෙන් කොට හැඳින ගෙන ක්‍රියා කිරීමෙන් ප්‍රඥාව පාරමිතාවක් බවට පත්වේ.

### 5. විරිය පාරමිතාව

අකුසල් දහම් බැහැර කිරීමේ කුසල් දහම් දියුණු කර ගැනීමේත් උත්සහාවත් වීම බෝසත් වන පුරන්නාගේ ස්වභාවය යි. හමුවන බාධක මැඩගෙන, පසු නොබැස අරමුණු කරා ළගාවීම එලෙසින් සිදුවේ. කවර කාර්යයක් වුවද ඉටු කර ගැනීමට වීර්යය හෙවත් උත්සාහය අවශ්‍යය.

## 6. ඛන්ති පාරමිතාව

ඛන්ති හෙවත් ක්‍ෂාන්ති යනු ඉවසීමයි. බුදුබව පතා ඉවසීම පුරුදු කිරීම ඛන්ති පාරමිතාවයි. කුසගින්න, ලෙඩරෝග වැනි ශාරීරික වේදනා ද, සීතල උෂ්ණත්වය වැනි ස්වාභාවික තත්ත්වයන් ද, රළු පරුෂ වචන ගැරහුම් වැනි මිනිස් ක්‍රියා ද යනා දී කවර දුෂ්කරතාවක් බාධාවක් අපහසුතාවක් වුවද ඉවසා සිටීමේ ශක්තියයි.

## 7. සච්ච පාරමිතාව

බොරු නොකීම හා ඇත්ත කතා කිරීමයි. අනුන් නොරැවටීම හා අවංක වීම මෙයින් සිදුවේ. බෝසත් උතුමන් අතින් පාරමිතා පුරන කාලයේ දී යම් යම් වැරදි සිදු වූණත් කිසිදු අවස්ථාවක බොරුවක් නම් නොකී බව සඳහන් වේ. ඒ එය එතරම්ම වරදක් නිසාය.

## 8. අධිට්ඨාන පාරමිතාව

අරමුණ ඉටුකර ගන්නා තෙක් පසු නොබැස කැප වී ක්‍රියා කිරීම අධිෂ්ඨානය නම් වේ. කවර කාර්යයක දී වුව ද සාර්ථකත්වය ලැබීම සඳහා අරමුණක් තබා ගෙන ඒ කරා යෑමේ අධිෂ්ඨානයෙන් ක්‍රියා කිරීම අත්‍යවශ්‍යය. බුදුබව සඳහා එසේ ක්‍රියාකිරීම අධිට්ඨාන පාරමිතාවයි.

## 9. මෙත්තා පාරමිතාව

සියලු සතුනට එක සේ හිතමිතුරු සිත පැතිරවීම මෛත්‍රිය නම් වේ. කිසිදු භේදයකින් තොරව සැමට යහපත සැලසීම බෝසතුන්ගේ සිරිත ය. මිනිසුන් අතර ඇති සියලු ගැටුම් අසමගිකම් අවසන් කළ හැකි ගුණධර්මයකි මෛත්‍රිය.

## 10. උපෙක්ඛා පාරමිතාව

උපේක්ෂාව යනු මධ්‍යස්ථ බවයි. කිසිවෙකුට හෝ කිසිවකට විශේෂ පක්ෂපාතී බවක් හෝ අකමැත්තක් නැතිව මැදිහත්ව ක්‍රියා කිරීමයි. අටලෝ දහමින් කම්පා නොවීම ද එහි ම ලක්ෂණයකි.

බුද්ධ කාරක ධර්ම හෙවත් දස පාරමිතාවලට අයත් ගුණධර්ම පුරුදු පුහුණු කරන තැනැත්තා ආත්මාර්ථයටත් වැඩියෙන් පරාර්ථය ගැන සිතන්නෙකි. මේ ගුණ දහම් බුදුවීමේ අරමුණ ඉටු කර ගැනීමට පමණක් නොව සාමකාමී යහපත් දියුණු සමාජයක් බිහි වීමට ද හේතු වේ. එනිසා කුඩා කල සිට අපි ද පාරමී දම් පිරීමට උනන්දු වෙමු.

**ක්‍රියාකාරකම්**

1. පාරමිතා 10 නම්කර ඒවා කෙටියෙන් හඳුන්වන්න.
2. දානාදී ගුණධර්ම පාරමිතාවන් වීම සඳහා තිබිය යුතු විශේෂ ලක්ෂණ කවරේද?
3. යහපත් සමාජයක් ගොඩ නගා ගැනීම සඳහා මේ ගුණධර්ම හේතුවන්නේ කෙසේද?
4. "සෑම බෞද්ධයකුම බෝසතෙකි. එනිසා බුදුකුරුදම් හුරු කරගත යුතුය." ඔබ ශිෂ්‍යයකු වශයෙන් එය කරන්නේ කෙසේදැයි විස්තර කරන්න.

**පුහුණුවට**

දානං සීලං ච නෙක්ඛම්මං - පඤ්ඤා විරියේන පංචමං
ඛන්ති සච්චමධිට්ඨානං - මෙත්තුපෙක්ඛා'තිමේ දස

## 06. පාඩම

## රතන සූත්‍රය

ආරක්ෂක පිරිත් සූත්‍රයක් ලෙසින් භාවිත කෙරෙන රතන සූත්‍රය ඛුද්දක නිකායට අයත් ග්‍රන්ථ දෙකකම ඇතුළත් වේ. එම ග්‍රන්ථ නම් ඛුද්දක පාඨය හා සුත්ත නිපාතය යි. එමෙන්ම පිරිත් පොත් වහන්සේ ඇතුළත් තුන් සූත්‍රයෙන් එකකි. රතන සූත්‍රය දේශනා කිරීමට හේතු වූ සිදුවීම ද එම සූත්‍රයෙහි ඇති තෙරුවන් ගුණ පිළිබඳව ද අපි අවබෝධයක් ඇති කර ගනිමු.

බුද්ධ කාලයේ වජ්ජි රාජධානියේ අගනුවර වූයේ විශාලා මහනුවරයි. දුර්භික්ෂ භය, රෝග භය, අමනුෂ්‍ය භය යන තුන් බියකින් එහි ජනතාව පීඩාවට පත්විය. මෙම තුන් බිය දුරු කර ගැනීමට සාකච්ඡා පැවැත් වූ වජ්ජි රජ දරුවෝ මගධයේ බිම්බිසාර රජුට ද දන්වා බුදුරජාණන් වහන්සේ වැඩම කරවා ගැනීමට කටයුතු සැලසූහ. බුදුරජාණන් වහන්සේ වැඩමවීමත් සමගම මහ වැසි වසින්නට විය. එමඟින් නගරය පවිත්‍ර වූයේය. ආනන්ද හිමියන් ලවා රතන සූත්‍රය සජ්ඣායනා කරවමින් නුවර වටා පිරිත් පැන් ඉසීමට සලස්වන ලදි.

රතන සූත්‍රය වර්තමානයේදී ද අපට ආරක්ෂව හා ආශිර්වාදය ලබා දෙන පිරිත් සූත්‍රයක් ලෙස පිළිගැනේ. එය සජ්ඣායනා කිරීමෙන් බුද්ධ, ධම්ම, සංඝ යන තෙරුවන්හි ආශිර්වාදය හා ආරක්ෂාව ලැබීමෙන් අපට ඇතිවන බිය හා තැති ගැනීම දුරුකරගත හැකිය. ඒ නිසා එය පාඩම් කර තෙරුවන් ගුණ හැඳිනගෙන අපිත් නිතර සජ්ඣායනා කිරීමට පුරුදු වෙමු.

1. යානීධ භූතානි සමාගතානි
   භුම්මානි වා යානිව අන්තලික්ඛෙ
   සබ්බෙව භූතා සුමනා භවන්තු
   අථෝපි සක්කච්ච සුණන්තු භාසිතං

2. තස්මාහි භූතා නිසාමේථ සබ්බේ
මෙත්තං කරෝථ මානුසියා පජාය
දිවා ච රත්තෝ ච හරන්ති යේ බලිං
තස්මාහි නේ රක්ඛථ අප්පමත්තා

3. යං කිඤ්චි විත්තං ඉධ වා හුරං වා
සග්ගේසු වා යං රතනං පණීතං
න නෝ සමං අත්ථි තථාගතේන
ඉදම්පි බුද්ධේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

4. ඛයං විරාගං අමතං පණීතං
යදජ්ඣගා සක්‍යමුනී සමාහිතෝ
න තේන ධම්මේන සමත්ථි කිඤ්චි
ඉදම්පි ධම්මේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

5. යං බුද්ධ සෙට්ඨෝ පරිවණ්ණයී සුචිං
සමාධිමානන්තරිකඤ්ඤමාහු
සමාධිනා තේන සමෝ න විජ්ජති
ඉදම්පි ධම්මේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

6. යේ පුද්ගලා අට්ඨ සතං පසත්ථා
චත්තාරි ඒතානි යුගානි හොන්ති
තේ දක්ඛිණෙය්‍යා සුගතස්ස සාවකා
ඒතේසු දින්නානි මහප්ඵලානි
ඉදම්පි සංඝේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

7. යේ සුප්පයුත්තා මනසා දළ්හේන
නික්කාමිනෝ ගෝතම සාසනම්හි
තේ පත්තිපත්තා අමතං විගය්හ
ලද්ධා මුධා නිබ්බුතිං භුඤ්ජමානා
ඉදම්පි සංඝේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

8. යථින්දඛීලෝ පඨවිං සිතෝසියා
චතුබ්භි වාතේහි අසම්පකම්පියෝ
තථූපමං සප්පුරිසං වදාමි
යෝ අරිය සච්චානි අවෙච්ච පස්සති
ඉදම්පි සංඝේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

9. යේ අරිය සච්චානි විභාවයන්ති
ගම්භීර පඤ්ඤේන සුදේසිතානි
කිඤ්චාපි තේ හොන්ති භුසප්පමත්තා
න තේ භවං අට්ඨමං ආදියන්ති
ඉදම්පි සංඝේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

10. සහාවස්ස දස්සන සම්පදාය
තයස්සු ධම්මා ජහිතා භවන්ති
සක්කාය දිට්ඨී විචිකිච්ඡිතඤ්ච
සීලබ්බතං වාපි යදත්ථි කිඤ්චි
චතුහපායේහි ච විප්පමුත්තෝ
ඡ චාභිඨානානි අභබ්බෝ කාතුං
ඉදම්පි සංඝේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

11. කිඤ්චාපි සෝ කම්මං කරෝති පාපකං
කායේන වාචා උද චේතසා වා
අභබ්බෝ සෝ තස්ස පටිච්ඡාදාය
අභබ්බතා දිට්ඨ පදස්ස වුත්තා
ඉදම්පි සංඝේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

12. වනප්පගුම්බේ යථා ඵුස්සිතග්ගේ
ගිම්හාන මාසේ පඨමස්මිං ගිම්හේ
තථූපමං ධම්මවරං අදේසයි
නිබ්බානගාමිං පරමං හිතාය
ඉදම්පි බුද්ධේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

13. වරෝ වරඤ්ඤූ වරදෝ වරාහරෝ
අනුත්තරෝ ධම්මවරං අදේසයි
ඉදම්පි බුද්ධෙ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

14. ඛීණං පුරාණං නවං නත්ථි සම්භවං
විරත්ත චිත්තා ආයතිකේ භවස්මිං
තේ ඛීණ බීජා අවිරුළ්හිච්ඡන්දා
නිබ්බන්ති ධීරා යථායං පදීපෝ
ඉදම්පි සංඝේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

15. යානීධ භූතානි සමාගතානි
භුම්මානි වා යානිව අන්තලික්ඛේ
තථාගතං දේව මනුස්ස පූජිතං
බුද්ධං නමස්සාම සුවත්ථි හෝතු

16. යානීධ භූතානි සමාගතානි
භුම්මානි වා යානිව අන්තලික්ඛේ
තථාගතං දේව මනුස්ස පූජිතං
ධම්මං නමස්සාම සුවත්ථි හෝතු

17. යානීධ භූතානි සමාගතානි
භුම්මානි වා යානිව අන්තලික්ඛේ
තථාගතං දේව මනුස්ස පූජිතං
සංඝං නමස්සාම සුවත්ථි හෝතු

**සිංහල අනුවාදය**

1. පොළොවෙහි හෝ අහසෙහි හෝ වාසය කරන යම් භූතයෝ මෙහි රැස් වී සිටිද්ද, ඒ අමනුෂ්‍යයෝ හැම දෙනෙක් ම සතුටු සිත් ඇත්තෝ වෙත්වා, තවද මා කියන දේ හොඳින් අසත්වා !

2. අමනුෂ්‍යයෙනි, තෙපි සියල්ලෝම මාගේ බස අසන්න, මනුෂ්‍යයන්ට මෛත්‍රී කරන්න. රෑ, දවල් දෙකෙහි ඔබට පුද පූජා පවත්වන මිනිසුන් නොපමාව ආරක්ෂා කරන්න.

3. මෙලොව හෝ වෙනත් ලොවක හෝ දිව්‍ය ලෝකවල යම් උතුම් රත්නයක් ඇද්ද, තථාගත රත්නයට වඩා උතුම් රත්නයක් ඒ කිසි තැනක නැත. බුදුරදුන් කෙරෙහි මේ උතුම් රත්න භාවය පවතී. මෙය සත්‍යයකි. මේ සත්‍ය බලයෙන් සෙත් වේවා!

4. එකඟ වූ සිත් ඇති ශාක්‍ය මුනීන්ද්‍රයන් වහන්සේ කෙලෙස් නැති කරන, රාග නැති කරන අමෘත වූ යම් නිර්වාණ ධර්මයක් දේශනා කළ සේක් ද ඒ ධර්මයට සමාන අන් කිසිවක් නැත. ඒ ධර්මයෙහි ප්‍රණීත වූ රත්න භාවය කරණ කොට සෙත් වේවා!

5. ශ්‍රේෂ්ඨ වූ බුදුරජාණන් වහන්සේ යමක් පිරිසිදු යැයි වර්ණනා කළ සේක්ද, යම් ආර්ය මාර්ගයක් කල් නොයවා විපාක දෙන සමාධි යයි කී සේක් ද, ඒ සමාධිය හා සමාන අන් කිසිවක් නැත. ධර්මයෙහි මේ උතුම් රත්න භාවයෙන් හා සත්‍ය බලයෙන් සෙත් වේවා!

6. යම් පුද්ගලයෝ අට දෙනෙක් සත් පුරුෂයන් විසින් ප්‍රශංසා කරන ලද්දාහුද, ඔවුහු යුග වශයෙන් සතර දෙනෙක් වෙති. බුද්ධ ශ්‍රාවක වූ උන් වහන්සේලා දක්ෂිණාව පිළිගැනීමට සුදුස්සෝ වෙති. උන් වහන්සේලාට දුන් දෙය මහත් ඵල වෙයි. සංඝයා කෙරෙහි මේ උතුම් රත්නභාවය පවති. ඒ සත්‍යයෙන් සෙත් වේවා!

7. යමෙක් බුදු සසුනේ හොඳින් සිල් රකිමින්, ස්ථිර සිත් ඇතිව, සියලු කාමයන්ගෙන් වෙන්ව, තමන් පැමිණිය යුතු නිවනට පැමිණ නිවන් සැප අනුභව කෙරේ ද, සංඝයා කෙරෙහි මේ උතුම් රත්නභාවය පවතී. ඒ සත්‍යයෙන් සෙත් වේවා!

8. පොළොවෙහි සිටුවන ලද ඉන්ද්‍ර ඛීලය සතර දිගින් හමන සුළඟින් නොසෙල්වෙන්නා සේ ආර්ය සත්‍ය මනා කොට දුටු සත් පුරුෂ සංඝයා ද කිසිවකින් කම්පා නොවේ. මේ ශ්‍රේෂ්ඨ රත්නභාවය සංඝයා කෙරෙහි පවති. ඒ සත්‍යයෙන් සෙත් වේවා!

9. යමෙක් ගැඹුරු නුවණ ඇති බුදුරදුන් විසින් මනාකොට දේශනා කරන ලද ආර්ය සත්‍ය අවබෝධ කර ගනිත් ද කිසි ලෙසකින් ඒ සෝවන් පුද්ගලයෝ බොහෝ ප්‍රමාද වූවත් අටවෙනි උත්පත්තියක් ලබා නොගනිති. සංඝයා කෙරෙහි මේ උතුම් රත්නභාවය පවති. ඒ සත්‍යයෙන් සෙත් වේවා!

10. සෝවන් පුද්ගලයෝ ඒ මගට පිවිසීමත් සමගම ආත්ම දෘෂ්ඨිය, සැකය, සීල හා ව්‍රත පිළිබඳ අනෙක් විශ්වාස ද යන සංයෝජන ධර්ම තුන ප්‍රහීණ කළාහු වෙති. සතර අපායෙන් ද සවැදෑරුම් බරපතල පව් කිරීමෙන් ද නිදහස් වූවෝ වෙති. ආර්ය සංඝයා කෙරෙහි මේ උතුම් රතනභාවය පවති. ඒ සත්‍යයෙන් සෙත් වේවා !

11. සෝවන් පුද්ගලයා කයින්, වචනයෙන් හා සිතින් පවක් කෙරේ ද ඔහු එය සඟවන්නේ නැත. කළ වරද සැඟවීම නිවන් දුටු සෝවන් පුද්ගලයාගේ සිරිත නොවේ. සංඝයා කෙරෙහි මේ උතුම් රත්නභාවය පවති. ඒ සත්‍යයෙන් සෙත් වේවා !

12. ග්‍රීෂ්ම ඍතුවෙහි ප්‍රථම මාසයෙහි පිපිණු මල් ඇති වන ලැහැබක් යම් සේ බබළා ද එසේම ස්කන්ධ, ධාතු, ආයතන වැනි නානාවිධ පුෂ්ප ජාති වලින් පිරිපුන් නිවන් මගට පමුණුවන උතුම් ධර්මය බුදුරජාණන් වහන්සේ දේශනා කළ සේක. ඒ බුදුරදුන් කෙරෙහි මේ උතුම් රත්නභාවය පවති. ඒ සත්‍යයෙන් සෙත් වේවා !

13. උතුම් වූ, උතුම් බව දන්නා වූ, උතුම් බව දෙන්නා වූ, උතුම් බවට පමුණුවන, තමන්ට වඩා උත්තමයෙක් නැත්තා වූ බුදුරජාණන් වහන්සේ උතුම් වූ ධර්මය දෙසූ සේක. ඒ කෙරෙහි මේ උතුම් රතනභාවය පවති. ඒ සත්‍යයෙන් සෙත් වේවා !

14. පෙර කර්මයන් ගෙවී ගොස් ඇති, අලුත් කර්ම හට ගැනීමක් ද නැති, අනාගත භවයන් ගැන නොඇලුණු සිත් ඇති, නැවත ඉපදීමක් නැති කළ වැඩෙන ආශාවන් නැති, ඒ ධෛර්ය සම්පන්න රහතන් වහන්සේ මේ පහන මෙන් නිවී යති. ඒ සංඝයා කෙරෙහි මේ උතුම් රතනභාවය පවති. ඒ සත්‍යයෙන් සෙත් වේවා !

15. පොළොවෙහි හෝ අහසෙහි හෝ වාසය කරන යම් භූතයෝ මෙහි රැස් වී සිටිත් ද ඒ අපි හැමදෙනාම දෙව් මිනිසුන් විසින් පුදන ලද තථාගත නම් වූ බුදුරජාණන් වහන්සේට නමස්කාර කරමු. සෙත් වේවා!

16. පොළොවෙහි හෝ අහසෙහි හෝ වාසය කරන යම් භූතයෝ මෙහි රැස් වී සිටිත් ද ඒ අපි හැමදෙනාම දෙව් මිනිසුන් විසින් පුදන ලද තථාගත නම් වූ ධර්මයට නමස්කාර කරමු. සෙත් වේවා!

17. පොළොවෙහි හෝ අහසෙහි වාසය කරන යම් භූතයෝ මෙහි රැස් වී සිටිත් ද ඒ අපි හැමදෙනාම දෙව් මිනිසුන් විසින් පුදන ලද තථාගත නම් වූ සංඝයාට නමස්කාර කරමු. සෙත් වේවා!

**ක්‍රියාකාරකම්**

1. රතන සූත්‍රය දේශනා කිරීමේ නිදාන කථාව ලියන්න.
2. රතන සූත්‍රය පන්තියේදී සියලු දෙනා එක්ව සජ්ඣායනා කරන්න.
3. රතන සූත්‍රයේ දැක්වෙන ගාථා ඇසුරෙන් පහත වගුව සම්පූර්ණ කරන්න.

| | |
|---|---|
| බුදුගුණ දැක්වෙන ගාථා ගණන | |
| දහම් ගුණ දැවෙන ගාථා ගණන | |
| සඟ ගුණ දැක්වෙන ගාථා ගණන | |

**පුහුණුවට**

නිවසේදී රතන සූත්‍රය කටපාඩම් කරන්න. එය පන්තියේ දී කියන්න.

# 07. පාඩම

## දුක්ඛ නිරෝධය ආර්ය සත්‍යය

බුදුරජාණන් වහන්සේ ඇසළ පුන් පොහෝ දා බරණැස් නුවර ඉසිපතනාරාමයේදී පස්වග මහණුන්ට ධම්මචක්කපවත්තන සූත්‍රය දේශනා කළ සේක. එය බුදුරදුන්ගේ පළමු දම් දෙසුමයි. එම සූත්‍රයේ ඇතුළත් ප්‍රධාන ඉගැන්වීම චතුරාර්ය සත්‍යයයි.

1. දුක්ඛ ආර්ය සත්‍යය (දුක පිළිබඳ උතුම් සත්‍යය)
2. දුක්ඛ සමුදය ආර්ය සත්‍යය (දුක ඇතිවීමේ හේතුව පිළිබඳ උතුම් සත්‍යය)
3. දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යය (දුක නැති කිරීම පිළිබඳ උතුම් සත්‍යය)
4. දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා ආර්ය සත්‍යය (දුක නැති කිරීමේ මාර්ගය පිළිබඳ උතුම් සත්‍යය)

යනු එම ආර්ය සත්‍ය සතරයි.

මෙයින් දුක්ඛ ආර්ය සත්‍යය හා දුක්ඛ සමුදය ආර්ය සත්‍යය මීට පෙර ශ්‍රේණිවලදී ඉගෙන ගෙන ඇත. දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යය පිළිබඳ දැන් අපි ඉගෙන ගනිමු.

### දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යය

තණ්හාව නැති කිරීම දුක්ඛ නිරෝධය නම් වේ. තණ්හාව නැති කිරීමෙන් දුක නැති වේ. ඒ සඳහා අප උත්සාහ කළ යුතුය.

කඳින් පැළවෙන ගසක් මුල තිබියදී එම ගස කපා දැමුවහොත් නැවත ලියලයි. තණ්හාව සහමුලින්ම දුරු නොකළහොත් දුක නැවත හට ගනියි. ගස මුලින්ම උදුරා දැමූ විට නැවත හට නොග නියි. එමෙන්ම තණ්හාව ද සහමුලින්ම දුරු කිරීමෙන් නැවත දුකක් ඇති නොවෙයි.

බුද්ධ දේශනාවට අනුව,

හේතුං පටිච්ච සම්භූතං - හේතු භංගා නිරුජ්ඣති
හේතුවෙන් හට ගත් දෙය - හේතුව නැතිවීමෙන් නැතිවෙයි

ඒ අනුව තණ්හාව හේතුකොට ගෙන දුක හටගනී. තණ්හාව දුරු කිරීමෙන් දුක ද නැතිවේ. යනුවෙන් තේරුම් ගත යුතුය.

දම්සක් පැවතුම් සූත්‍රයේ දුක්ඛ නිරෝධය හෙවත් දුකින් මිදීම විස්තර වන්නේ මෙම වචන වලිනි.

1. තණ්හාය අසේස විරාග නිරෝධො (තණ්හාව ඉතිරි නොවන සේ නැති කිරීම)
2. චාගෝ (තණ්හාව දුරු කිරීම)
3. පටිනිස්සග්ගෝ (තණ්හාව බැහැර කිරීම)
4. මුත්ති (තණ්හාවෙන් මිදීම)
5. අනාලයෝ (තණ්හාව පිළිබඳ ඇල්මක් නොවීම)

එනිසා අපි තණ්හාව ටිකෙන් ටික දුරු කරගෙන සැනසීම ලඟා කරගන්නේ කෙසේදැයි නිදසුන් කිහිපයකින් බලමු.

සම්පත් අධික ලෙස ගොඩගසා ගන්නා පුද්ගලයා ද තණ්හාව නිසා දුක් වේදනාවට පත්වේ. තම ධනය සොර සතුරන් ගැනීම, ස්වාභාවික විපත්වලට පත්වීම, ධනය විනාසවීම ආදියට බියෙන් හා සිත් වේදනාවෙන් පසුවෙයි. ඔහුට දුකින් මිදීමක් සැහැල්ලු බවක් සැනසීමක් ලැබෙන්නේ එම ධනය පිළබඳ ආශාව අඩුකර ගන්නා පමණටය. එම නිදසුන් අනුව දුකට හේතුවන තෘෂ්ණාව දුරු කිරීම සැනසීමට හේතුවන බව පැහැදිලි වේ.

අමිල පාසල් ශිෂ්‍යයෙකි. හෙතෙම නිවසේ සුරතලේට බලු පැටියෙකු ඇති කළේය. අමිල පාසල් යන විට බලු පැටියාද ටික දුරක් යයි. පාසල ඇරී එන විට පෙර මගට එයි. දැන් අමිලට බලු පැටියා නැතිව බැරිය. බලු පැටියාට ද එසේමය. කලක් ගතවන විට එම සුරතලාට කුෂ්ට රෝගයක් සෑදුණි. ලොම් හැලී අවලස්සන විය. අමිල තම සුරතලාට රෝගයක් වැළඳීම ගැන මුලදී දැඩි ලෙස දුකට පත්විය. එහෙත් පසුව සුරතලා පිළිබඳව ඇති අධික ආශාව ක්‍රමෙන් දුරුවන්නට විය. ඒ නිසා ඔහුට පෙර පැවති දුක ඇති නොවීය.

ඇස, කන, නාසය, දිව, ශරීරය යන පසිඳුරන් සමග රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ යන අරමුණු ගැටීමෙන් තණ්හාව ඇතිවේ. තෘෂ්ණාවෙන් යුතු පුද්ගලයා දිව්‍ය, මනුෂ්‍ය ලෝකවල ඉපිද ලබන සුවය තාවකාලිකය. තණ්හාව දුරු කිරීමෙන් ලබන සුවය දුක්ඛ නිරෝධය නිර්වාණය නම් වේ. එය,

1. රාගක්ඛය  (රාගය නැති වීම)
2. දෝසක්ඛය (ද්වේශය නැති වීම)
3. මෝහක්ඛය (මෝහය නැති වීම)

යන නම් වලින් හැඳින්වෙයි.

තණ්හාව සහමුලින්ම දුරු කිරීමෙන් ලබන දුක්ඛ නිරෝධය හෙවත් නිවන ලෝකෝත්තර වූ පරම සුවයකි. අපිත් දුක්ඛ නිරෝධය නම් වූ නිවන් සුවයට පත්වීමට උත්සාහ කරමු.

**ක්‍රියාකාරකම්**

1. ආර්ය සත්‍ය සතර ලියා දක්වන්න.
2. දුක්ඛ නිරෝධය යනු කුමක්ද?
3. නිර්වාණය ලබා ගැනීමට අප විසින් කළ යුත්තේ කුමක්ද?
4. නිර්වාණය හැඳින්වෙන යෙදෙන යෙදුම් තුනක් ලියන්න.

**පුහුණුවට**

යථාපි මූලේ අනුපද්දවේ දළ්හේ
ඡින්නෝපි රුක්ඛෝ පුනරේව රූහති
ඒවම්පි තණ්හානුසයේ අනූහතේ
නිබ්බත්තති දුක්ඛමිදං පුනප්පුනං

මුල හොඳට ඇති කල
කැපූ ගස ලියලන සේ
දුරු නොකළ විට ආශා
ඇති වේ යළිත් ඒ දුක්

ඇතිතෙක් ආශාව අප වෙත දුක එනවා
එය නැති කළොත් සැනසුම වෙත ළං වෙනවා
සව් කෙලෙසුන් නසා නිවතින් සැන සෙනවා
සිව්සස් දහමෙ එය මැනවින් පැවසෙනවා

## 08. පාඩම

# නීරෝගි දිවියට සුවදායී නින්දක්

දහම් පාසලේ අපේ පන්තිය භාර සුමේධ හාමුදුරුවෝ පන්තියට වැඩම කොට නාම ලේඛනය ලකුණු කිරීමෙන් අනතුරුව "කෝ, සුදේශ්, අද දහම් පාසලට පැමිණ නැහැ. ගිය සතියේ ආවෙත් නැහැ. ඔහු ගැන දන්න ළමයෙක් පන්තියේ ඉන්නවාදැ යි විමසූහ.

ළහිරු නැගිට "හාමුදුරුවනේ. එයා ඉන්නේ අපේ පැත්තේ සති දෙකක් විතර ලෙඩ වෙලා රෝහලේ ඉන්නේ" යැයි පැවසීය. එකෙණෙහිම සුදේශ්ගේ පියා පන්තිය අසලට පැමිණියේය. සුමේධ හාමුදුරුවෝ ඔහු වෙත ගොස් කතා කළහ. නැවත පන්තියට වැඩි උන් වහන්සේ ප්‍රකාශ කළේ සුදේශ් අසනීපවී ඇත්තේ දිනපතා රාත්‍රි කාලයේ අධික ලෙස නිදිවැරීම නිසා බවයි.

කායික නීරෝගි බව ඇති කර ගැනීම සඳහා නිදා ගැනීම අවශ්‍ය බවත් අනවශ්‍ය ලෙස නිදිවැරීම බොහෝ රෝගයන්ට හේතුවන බවත් සඳහන් කරමින්, එහිදී සුමේධ හිමියන් කළ හරවත් අනුශාසනාවේ සාරාංශය මෙසේය.

"ආරෝග්‍ය පරමා ලාභා" යනුවෙන් නීරෝගී කම උතුම් ලාභයක් ලෙස බුදුරජාණන් වහන්සේ දේශනා කොට ඇත. කායික නීරෝගී බව මානසික සැනසීමට ද හේතුවේ. ශරීරයට නිතර රෝග වැළඳේ. යහපත් සෞඛ්‍ය පුරුදු තුළින් නීරෝගීකම ඇතිකර ගත හැකිය. එම සෞඛ්‍ය පුරුදු අතර දිනකට රාත්‍රි කාලයේ පැය පහක හෝ හයක පමණ කාලයක් නිදා ගැනීම සුදුසුය. එකම යන්ත්‍රයක් එක දිගට ක්‍රියාත්මක කොට තැබීමෙන් ඉතා ඉක්මනින් දෝෂ හටගනී. එමෙන්ම පුද්ගලයෙකු එක දිගට නොනිදා කය මනස වෙහෙසා වැඩ කිරීම ද විවිධ දෝෂ හා රෝග හට ගැනීමට හේතුවේ. භෞතික යන්ත්‍රයක් දිගු කලක් පරිහරණය කිරීමට නම් ක්‍රියාත්මක වන අතරතුරදී විවේකය ලබාදිය යුතුය. ඒ තුළින් ඉදිරි කාර්ය සඳහා අවශ්‍ය ශක්තිය නිපදවා ගනී. මිනිසා වැඩ කිරීමේදී විවේක කාලයක්

ලබා ගන්නේ මහන්සිය විඩාව නිවා නැවත වැඩ කිරීමට ශක්තිය ඇතිකර ගැනීම සඳහාය.

දවසේ වැඩ කළ පුද්ගලයා රාත්‍රි කාලයේ නින්ද ලබා ගැනීම තුළින් පසු දිනයේ වැඩ කිරීමට ශක්තිය උපදවා ගනී. බුදුරදුන්ගේ කාලයේ වැඩසිටි චක්ඛුපාල තෙරණුවෝ ඉතා ඉක්මනින් රහත් ඵලය ලබා ගැනීම සඳහා නිදි වර්ජිතව භාවනා කළහ. රහත් ඵලය ලැබුණත් නිදි වර්ජිතව ක්‍රියා කිරීමෙන් ඇස් දෙකම රෝගී වී අන්ධ භාවයට පත්වූහ. බුදුරජාණන් වහන්සේ සෑම දිනකම රාත්‍රි නියමිත කාලයේ සැතපුණු සේක. භික්ෂූන් වහන්සේලාට ද ප්‍රමාණවත් කාලයක් සැතපීමට අනුදැන වදාළහ.

වෛද්‍ය මතය අනුව ළමා, තරුණ, වැඩිහිටි වශයෙන් නිදාගත යුතු කාල සීමා වෙනස්ය. රෝගයක් වැලඳුණු පසු විවේක ගැනීමට හා නිදා ගැනීමට වැඩි කාලයක් යෙදවීමට සිදු වේ. ඇතැම් අලස පුද්ගලයෝ දවසෙන් වැඩිකාලයක් නිදා ගැනීමට පුරුදුව සිටිති. ඒ තුළින් ඔහුට තම වැඩ අතපසුවීම, රෝග හට ගැනීම, කායික මානසික ශක්තිය දුර්වලවීම, නින්දාවට ලක්වීම, ආර්ථික හා සමාජ පරිහානිය ලඟාවීම යන විපාකයන්ට මුහුණදීමට සිදුවේ. එම නිසා වැඩියෙන් නිදාගැනීම ද පරිහානියට හේතුවේ.

ඇතැමුන් නිදිවර්ජිතව පහත සඳහන් දේවල් සඳහා අනවශ්‍ය ලෙස කාලය ගත කරති. සංගීත ප්‍රසංග නාට්‍ය හා චිත්‍රපට නැරඹීම, මුහුණු පොත, අන්තර් ජාලය, වෙබ් අඩවි හා රූපවාහිනී වැඩසටහන් නැරඹීම, එමෙන්ම මත්ද්‍රව්‍ය භාවිතය, සූදුව, හිස් වචන කථා කිරීම හා විනෝද ගමන්යාම ආදී දේට ද දිනපතා නොනිදා කාලය ගතකරන අවස්ථා ඇත. බෞද්ධ මතය හා වෛද්‍ය මතය අනුව ඇස් රෝග, හිසේ කැක්කුම, සමේ රෝග, මුහුණ අවපැහැගැන්වීම ආදී තත්වයන්ට මුහුණ දීමට නිදිවර්ජිතයන්ට සිදුවේ.

බුදුරජාණන් වහන්සේ භික්ෂූන් වහන්සේලාට ජාගරියානුයෝගය නමින් නිදිවරා භාවනා කරන ක්‍රමයක් හඳුන්වා දී ඇත. ඒ පමණ දැන නිදි වර්ජිතව භාවනා කොට මාර්ග ඵල ලබා ගැනීම සඳහාය. එලෙස අත්‍යවශ්‍ය වූ යහපත් ක්‍රියාවන් සඳහා නිදිවර්ජිතව සිටීමට සිදුවන අවස්ථා ද තිබේ. තම නිවසේ සිදුවන පිරිත් පිංකමකදී පිරිත් ඇසීම, මංගල හෝ අවමංගල අවස්ථාවක, විභාගයකට පෙනී සිටීම

සඳහා පාඩම් කිරීම, මව්වරුන් තම දරුවන්ගේ අවශ්‍යතා ඉටුකිරීම, ආරක්ෂක නිලධාරීන් තම රැකියා අවශ්‍යතා සපුරාලීම, පැල් රකින ජනයා තම හේන් කුඹුරු වන සතුන්ගෙන් ආරක්ෂා කර ගැනීම යනු එවැනි අවස්ථා කිහිපයකි.

ඉහත සඳහන් අවස්ථාවන්හි නිදිවැරීමෙන් සිදුවන්නේ තමන්ට හා අනුන්ට යහපතකි. එවැනි අවස්ථාවලදී නිදිවැරීම අවශ්‍ය බව ද වටහා ගත යුතුය. සෞඛ්‍ය සම්පන්න නීරෝගී දිවියක් සඳහා රාත්‍රී කාලයේ පැය පහක හෝ හයක පමණ සුව නින්දක් ලබා ගැනීම අවශ්‍යය. ඒ තුළින් වැය වූ ශක්තිය නැවත වර්ධනය වේ. විඩාව සංසිඳේ. පසුදා අවදි වූ පසු කයට හා මනසට ප්‍රබෝධයක් ඇතිවේ. නැවතත් ජවසම්පන්න ලෙස වැඩ කිරීමේ ශක්තිය ඇතිවේ. හිස රුදාව ඇස් රුදාව ආදී ලෙඩ රෝග ඇති නොවේ. කායික හා මානසික නීරෝගී බව ඇතිවේ.

එම නිසා අනවශ්‍ය දේට නිදිවැරීමෙන් වැළකී සිටීමටත් ඇතැම් අවශ්‍යතා සඳහා නිදිවැරීමටත් නිරෝගී දිවියක් සඳහා උචිත කාලයක් සුව නින්දක් ලබා ගැනීමටත් අපි පුරුදු වෙමු.

**ක්‍රියාකාරකම්**

1. ඇතැමුන් නිදිවරා කරන අනවශ්‍ය දේ මොනවාද?
2. අනවශ්‍ය ලෙස නිදි වැරීමේ ආදීනව ලියා දක්වන්න.
3. නිදිවැරිය යුතු අවස්ථා ද ඇත. එවන් අවස්ථා 05 ක් සඳහන් කරන්න.
4. නිතර නිදා ගැනීමට පුරුදුවීම තමන්ගේ හානියට හේතුවන අයුරු පැහැදිලි කරන්න.
5. අධික ලෙස නිදිවැරීමෙන් චක්ඛුපාල තෙරුන්ට සිදුවූයේ කුමක්ද?
6. සුවදායී නින්ද තුළින් අපට ලැබෙන ප්‍රතිඵල 5 ක් ලියන්න.

**පුහුණුවට**

බුදු හිමි වැඩිය මගමය පිය ඔස වන්නේ
යම් කිසි කෙනෙකු දිව රෑ සතුටින් ඉන්නේ
නිවැරදි ක්‍රියාවෙන් නිරතුරු පසු වන්නේ
සුවසේ නිදා ගෙන සුවසේ පුබු දින්නේ

## 09. පාඩම

# අටලෝ දහමට මුහුණ දෙමු

"හාමුදුරුවනේ, පසුගිය අවුරුදු දෙකේදීම දහම් පාසලේ සිසු නිපුණතා ඇගයීම්වලදී දහම් දැනුම ඇගයීමට ඉදිරිපත් වූ මම පළමුවෙනි ස්ථානය ලබා ගත්තා. මේ අවුරුද්දේ තුන් වෙනියා. මට හරිම වේදනාවක් දැනෙනවා." යැයි කියමින් නිමාශා දහම් පාසලේ ප්‍රධානාචාර්ය ස්වාමීන් වහන්සේ ඉදිරියේ හඬන්නට වූවාය.

මෙම අවස්ථාවේ ම එතැනට පැමිණි අකිල, "හාමුදුරුවනේ, කථික සිසු නිපුණතා ඇගයීමේදී ගිය සැරේ මම පස් වෙනියා. ඒ වුනාට මේ පාර පළවෙනියා. මට ගොඩාක් සතුටුයි " යැයි කීවේය.

පසුගිය සතියේ පැවැත්වූ එම ඇගයීමට ඉදිරිපත් වූ ශිෂ්‍ය ශිෂ්‍යාවෝ තමන් ලැබූ ජයග්‍රහණ හා පරාජයන් පිළිබඳ ප්‍රධානාචාර්ය හිමියන්ට එලෙස ප්‍රකාශ කළහ. ඇතැම් ශිෂ්‍ය ශිෂ්‍යාවන් සතුටින් ද තවත් පිරිසක් අසතුටින් ද සිටිනු උන් වහන්සේ දුටුවහ. ජය හා පරාජය ලැබුණු පසු කම්පාවට හෝ උද්දාමයට පත් නොවී එය සම සේ විඳ දරාගත යුතු බව පැහැදිලි කරමින් ප්‍රධානාචාර්ය ස්වාමීන් වහන්සේ අට ලෝ දහම පිළිබඳ අනුශාසනාවක් දහම් පාසලේ උදේ රැස්වීමේ දී පැවැත්වූහ. එම අනුශාසනාව සාරාංශ වශයෙන් මෙසේය.

මෙලොව ජීවත්වන අප සියලු දෙනාටම අට ලෝ දහමට මුහුණ දීමට සිදුවේ. අංගුත්තර නිකායේ අට්ඨක නිපාතයේ අටලෝ දහම පිළිබඳ මෙසේ දැක්වෙයි.

**ලාභෝ, අලාභෝ අයසෝ, යසෝ ච**
**නින්දා, පසංසා ච සුඛං ච දුක්ඛං**
**ඒතේ අනිච්චා මනුජේසු ධම්මා**
**අසස්සතා විපරිනාම ධම්මාති**

ඒ අනුව ලෝක ධර්ම අටකි.

| | | | |
|---|---|---|---|
| 1. ලාභ | 2. අලාභ | 3. යස | 4. අයස |
| 5. නින්දා | 6. ප්‍රශංසා | 7. සැප | 8. දුක් |

දුප්පත් පොහොසත්, උගත් නූගත්, උසස් පහත්, බාල මහලු සෑම අයෙකුට ම මෙම ධර්මතාවන්ට මුහුණ දීමට සිදුවේ.

### ලාභ - අලාභ

ලාභය යනු ලැබීමයි. අලාභය නම් නොලැබීම හෝ අහිමි වීමයි. මිළ මුදල්, යාන වාහන, නිවාස, දරු සම්පත්, තෑගි බෝග ආදිය ලැබේ. තවත් විටෙක ඒවා අහිමි වී යයි. එය ලෝක ස්වභාවයයි.

බුදුරදුන්ට වේරංජා නුවර වස් විසූ කාලයේ දානය ලැබුණේ නැත. තවත් අවස්ථාවක කොසොල් රජු අසදෘස මහා දානයක් පිරිනැමීය. එමෙන්ම වෙනත් රජවරු සිටුවරු මහ දන් පූජා කළහ. නොලැබුණ විට කම්පා නොවූ උන් වහන්සේ ලැබෙන විට උද්දාමයට පත් නොවූහ. පෙර පිං මහිමය නිසා සීවලී තෙරුන්ට නිරතුරුව මහ දන් ලැබිණි. එහෙත් ලෝසක තෙරුන්ට කුස පිරෙන්නට ආහාරයක් ලබා ගැනීම අපහසු විය.

මහා ධනවත් හැණවත් සිටුවරයෙකු වූ අනේපිඬු සිටුවරයා පසු කලෙකදී දුප්පතෙකු විය. මහා සැප සම්පතින් වැජඹුණු කොසොල් රජුට අසු වියෙහි දී මිය යාමට සිදුවූයේ පාළු අම්බලමකදී ය.

### යස - අයස

යස නමින් හඳුන්වන්නේ පරිවාර සම්පත්තියයි. එය කීර්තිය නමින්ද හැඳින්වෙයි. පරිවාර සම්පත්තිය නැතිකම අයස යි. අපකීර්තිය යනු ද එයයි. මොහු ශ්‍රේෂ්ඨ පුද්ගලයෙකි. සිල්වතෙකි. ගුණවතෙකි. පරිත්‍යාගශීලියෙක් කියා සමාජයේ පුද්ගලයෝ උසස් පුද්ගලයන්ට ගරුසරු දක්වති. ඔහු වටා පිරිස් එකතු වෙති. තවත් විටෙක මොහු පහත් පුද්ගලයෙකි. දුසිල්වතෙකි. දුර්ජනයෙකි, මසුරෙකි. ලෝභයෙකි, ගුණමකුවෙක් කියා සමහරු අපකීර්තියට පත්කරති. මෙම තත්වයන් දෙකටම මුහුණ දීමට අපට සිදුවේ.

සේල බමුණා වැනි අන්‍ය ආගමිකයෝ බුදු ගුණ වර්ණනා කරමින් කීර්ති ඝෝෂා පැවැත්වූහ. බුදුරදුන්ගේ කීර්තිය මිනිස් ලොව පමණක් නොව දිව්‍ය හා බ්‍රහ්ම ලෝකවල ද පැතිර ගියේ ය. දහස් සංඛ්‍යාත පිරිස් එම කාලවලදී බුදුරදුන් වටා එකතු වූහ. ඇතැම් අවස්ථාවල අප සමඟ සිටින පිරිස් විවිධ හේතු නිසා අප හැර යති. ඔවුහු දොස් කියති. එවිට අපකීර්තියට පත් වීම සිදු වේ.

## නින්දා - ප්‍රශංසා

නින්දා යනු ගැරහුම් ලැබීමයි. ප්‍රශංසා යනු ගුණ කීමයි. අප අතින් යම් වරදක් වූ විට ඇතැම්හු බැණ වදිති. යහපත් දේ කරන විට ප්‍රශංසා කරති. ඇතැම් යහපත් දේ කරන විට ද බැණ වදිති. ඒ ඊර්ෂ්‍යා සිතින් යුක්තවයි. ඒවා ඉවසීමට අපි පුරුදු වෙමු.

සම්බුදුරදුන්ට ද විවිධ අය නින්දා කළහ. චිංචා මාණවිකාව, මාගන්ධියා බැමිණිය, සුන්දරී පරිබ්‍රාජිකාව වැනි කාන්තාවන් නිසා එසේ නින්දා ලැබුණි. ඇතැම් බමුණෝ මුඩු මහණ, වසලය යනුවෙන් ප්‍රකාශ කළහ. සුප්පබුද්ධ රජු ද නොයෙක් අවස්ථාවල හිරිහැර කළේය. රණබිමේදී සතර දිගින් අවුත් ඇඟට වදින ඊතල පහරවල් ඉවසන හස්ති රාජයකු සේ බුදුරජාණන් වහන්සේ ඒ සියලු නින්දා අපහාස ඉවසූ සේක.

රජවරු සිටුවරු දෙව් බඹුන් ඇතුළු බොහෝ පිරිස් උන්වහන්සේට ප්‍රශංසා ද කළහ. සේල බමුණා බුදුරදුන් ඉදිරියේ ගුණ ගායනා කළේය. එහෙත් ඒ කිසිවකින් උද්දාමයට පත් නොවූහ.

## සැප - දුක්

සැප යනු ශරීරයට හා මනසට දැනෙන සුවයයි. දුක යනුවෙන් හැඳින්වෙන්නේ ශරීරයට හා මනසට ඇතිවන දුක් වේදනාවයි. මෙලොව ජීවත්වන සෑම අයෙකුටම විටෙක සැපයක් ද තවත් විටෙක දුකක් ද ඇතිවෙයි.

දෙව්දත් තෙරුන් ගිජුකුළු පව්ව මුදුනේ සිට පෙරළු ගලෙන් කැබැල්ලක් පතුලේ වැදීම නිසා බුදුරදුන්ට වෙදකම් කිරීමට සිදුවිය. පිරිනිවන් පෑමට ආසන්න කාලයේදී බුදුරදුන්ට ලෝහිත පක්ඛන්දිකා රෝගය වැළඳීම නිසා පීඩාවට පත්විය. උන් වහන්සේ ඒ සියල්ල ඉවසා දරා ගත්හ.

බුදුරජාණන් වහන්සේට සුව පහසු ආරාම, රසවත් ප්‍රණීත ආහාර පාන නොඅඩුව ලැබුණි. එයින් කිසිවිටෙකත් උද්දාමයට පත් නොවූ හ. අෂ්ට ලෝක ධර්මය පිළිබඳ කම්පා නොවී ක්‍රියා කිරීමේ බුදු ගුණය තාදි ගුණය නමින් හැඳින්වේ. අප හමුවට එන කරදර අභියෝග ජය ගැනීමේදී ඉවසීමෙන් හා නොසැලෙන මනසින් ක්‍රියාකළ යුතු බව බුදු සිරිත තුළින් පැහැදිලි වේ. බුද්ධ දේශනාව අනුව ඉහත අෂ්ට ලෝක ධර්මයම අනිත්‍යය. එය වටහාගෙන ක්‍රියා කිරීමෙන් එදිනෙදා කටයුතු සාර්ථක කර ගැනීමටත් අභියෝගවලට මුහුණ දීමටත් හැකියාව ලැබේ.




ලෝකයේ සදාතනික දහමක් වන අටලෝ දහමට මුහුණ දීමට අප සැම දෙනාටම සිදුවෙයි. කලෙකදී කීර්ති ප්‍රශංසා ලබන්නා තවත් කලෙකදී නින්දා අපහාස ලබයි. ගොවියා තම හේන් කුඹුරු සරු වූ විට සතුටු වෙයි. නිසරු වූ විට දුක් වෙයි. වෙළෙන්දා ලාභ ලැබුණු විට සතුටු වෙයි. අලාභ වූ විට දුකට පත්වෙයි.

තම අපේක්ෂා ඉටුවන විට සතුටුවීම හා අපේක්ෂා ඉටු නොවූ විට දුක්වීම මනුෂ්‍ය ස්වභාවයයි. එමෙන්ම අනුන් වෙනුවෙන් සේවය

කරන පුද්ගලයන්, සමාජ සේවකයන් වැනි අයට ද නින්දා අපහාස විඳීමට සිදුවන අවස්ථා බහුල ය. ඒවා ඉවසා දරා ගැනීම තුළින් ඔවුන්ට ඉදිරි කටයුතු සාර්ථක කරගත හැකිය.

පාසලේ හා දහම් පාසලේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට දඬුවම්, පරාජ, අපහාස විඳීමට සිදුවේ. සාහිත්‍ය තරග, සිසු නිපුණතා ඇගයීම්, දහම් දැනුම තරග, ක්‍රීඩා තරග ආදියෙන් පරාජයට පත් වූ පසු නැවත උනන්දුව හා පුහුණුවීම තුළින් ජයග්‍රහණ ලබාගත හැකිය. විභාග අසමත් වූ විට නැවත උනන්දු වීමෙන් එම විභාග සමත් වේ. ජයග්‍රහණ කළ පුද්ගලයා පසුව උනන්දු නොවීම හා පුහුණුවීම් නොකිරීමෙන් පරාජයට පත් වේ. කලින් පරාජිතයා නැවත ජයග්‍රහණ ලබාගනී. එක් වසරෙක ඉතා ඉහළින් සමත් වූ ශිෂ්‍යයා තවත් වසරෙක ඉගෙනීම් කටයුතු කෙරෙහි උනන්දුව අඩු වූ විට විභාගය අසමත් වේ.

රූපවාහිනිය, පරිගණකය, ජංගම දුරකථනය, අන්තර් ජාලය, මුහුණු පොත, පුවත්පත් ආදී සන්නිවේදන මාධ්‍ය තුළ අනුන් මානසික වශයෙන් පීඩාවට ලක් කෙරෙන ඡායාරූප, වීඩියෝ හා වාර්තා පළවෙයි. ඇතැමුන් ඒවා සිදු කරන්නේ විනෝදයට ය. නැතහොත් ඊර්ෂ්‍යාවෙන් යුතුව අනුන් අපහසුතාවට පත්කරනු සඳහා ය. ඇතැමුන් අනුන්ට බොරු පොරොන්දු දී මුලා කොට විවිධ දේ ලබා ගන්නා අවස්ථා ද ඇත. එවැනි අවස්ථාවලදී නොසැලී සිටීමටත් බුද්ධිමත්ව එම අවස්ථාවන්ට මුහුණ දීමටත් හැකිනම් අපගේ දියුණුවට බාධා ඇති නොවේ.

කොතැනක සිට හෝ අප කරන ක්‍රියාව නිවැරදි නම් ඉන් අනුන් සතුටු වන්නම් කීර්ති ප්‍රශංසා හිමිවෙයි. අප කරන ක්‍රියාව තවත් කෙනෙකුට නුරුස්සයි නම් නින්දා අපහාස විඳීමට සිදුවෙයි. නිත්‍ය වශයෙන් මෙලොව ප්‍රශංසා ලැබීම හෝ නින්දා ලැබීම සිදු නොවේ. කැරකෙන ගැල් රෝද සේ මෙලොව ජීවත් වන පුද්ගලයාට වරින් වර අෂ්ට ලෝක ධර්මයට මුහුණ පෑමට සිදුවෙයි. මංගල සූත්‍රයේ ඇති,

ඵුට්ඨස්ස ලෝක ධම්මේහි
චිත්තං යස්ස න කම්පති

යන බුද්ධ දේශනාව අනුව අටලෝ දහමින් සිත කම්පා නොකර ගැනීම මංගල කරුණකි. ඕනෑම පුද්ගලයෙකුට යහපත් ක්‍රියාවක් කිරීමෙන් කීර්ති ප්‍රශංසා ලැබිය හැකිය. එහෙත් ඉන් උද්දාමයට පත්ව ක්‍රියා කිරීම සුදුසු නොවේ. එමෙන්ම නින්දා අපහාස දඬුවම් ලැබීමේදී ශෝකවීම හා කම්පාවීම ද සුදුසු නැත. ඒ සෑම විටම අකම්පිතව ඉවසීමෙන් ක්‍රියා කිරීමෙන් ගැටලු විසඳා ගැනීමටත් අභියෝග ජය ගැනීමටත් හැකියාව ලැබේ.

**ක්‍රියාකාරකම්**

1. තාදි ගුණය යනු කුමක්ද?
2. අටලෝ දහම නම් කර ඒවායේ තේරුම පිළිවෙළින් ලියන්න.
3. බුදුරදුන් අටලෝ දහමට මුහුණ දුන් අවස්ථා 5 ක් ලියන්න.
4. ඔබ ලැබූ අත්දැකීම් අනුව පහත වගුව සම්පූර්ණ කරන්න.

| අටලෝ දහමේ කරුණ | ඔබ ලද අත්දැකීම | ක්‍රියා කළ ආකාරය |
|---|---|---|
| ලාභ | | |
| අලාභ | | |
| යස | | |
| අයස | | |
| නින්දා | | |
| ප්‍රශංසා | | |
| සැප | | |
| දුක | | |

**පුහුණුවට**

1. ඵුට්ඨස්ස ලෝක ධම්මේහි
   චිත්තං යස්ස න කම්පති
   අසෝකං විරජං ඛේමං
   ඒතං මංගලමුත්තමං

(මංගල සූත්‍රය)

2. සේලෝ යථා ඒකඝනෝ
වාතේන න සමීරති
ඒවං නින්දා පසංසාසු
න සමිඤ්ජන්ති පණ්ඩිතා (ධම්ම පදය)

සණ ගල් පව්ව සුළගට නොම සෙලවෙන්නේ
එම ලෙද නැණවතා ලෝදම් ඉවසන්නේ
නින්දා පසංසා එකලෙස විඳගන්නේ
ඉඳුකිළ සේම නොසැලී සැමදා ඉන්නේ

## 10. පාඩම

## පොළොන්නරු ශාසන ඉතිහාසයෙන් බිඳක්

ථෙරවාදී බුදු සසුන ලක්දිව පිහිටුවන්නේ දේවානම්පිය තිස්ස රජතුමා අනුරාධපුර රාජධානියේ රජකම් කරන වකවානුවේදීය. එතැන් සිට රජවරුන්ගේ නොමඳ අනුග්‍රහය ලද බුදු සසුන ලක්දිව පුරා ව්‍යාප්ත විය. හතරවන මිහිඳු රජුගේ යුගයෙන් පසු අනුරාධපුර රාජධානියට එළඹෙන්නේ පරිහානි කාලයකි. සොලී, කේරල, කර්ණාටක ආදී පරසතුරු ආක්‍රමණ නිසා අවුරුදු හැත්තෑවක පමණ කාලයක් ලක් රජයට හා ශාසනයට උරුම වූයේ සංවේග ජනක තත්වයකි. ධර්ම විනය පිළිබඳ විවිධ මතවාද ගොඩනැඟිනි. එකම සඟපරපුර මහාවිහාර, අභයගිරි, ජේතවන වශයෙන් නිකාය තුනකට බෙදී තිබුණි. මේ තත්වය යටතේ ශාසනයට නිසි මඟ පෙන්වීමක් නොවුණි. සමහර භික්ෂූන් ජීවත්වීම සඳහා සසුනට නොගැළපෙන ක්‍රියාවන්ට යොමුවුණි. මේ අනුරාධපුර යුගයේ අවසාන භාගයේ බුදු සසුනේ පැවති තත්වයයි.

මේ සංවේග ජනක තත්වය මගහැරුනේ මහ විජයබාහු හෙවත් පළමුවන විජයබාහු රජතුමා පරසතුරන්ගෙන් රට බේරාගෙන පොළොන්නරු රාජධානිය පිහිටුවීමෙන් පසුවය. ආරම්භක වකවානුවේදී ප්‍රමුඛත්වය දුන්නේ විනාශ වී ගිය රට ගොඩනැඟීමට හා අඩාල වූ ජන ජීවිතය සමෘද්ධිමත් කිරීමටය. මේ කටයුතු සඳහා ටික කලක් ගත වූ නිසා භික්ෂූන් වහන්සේලාට අවශ්‍ය ප්‍රත්‍ය පහසුකම් ආදිය සපයා දීමට අතපසු වුනි. බුරුම රට අනුරුද්ධ රජතුමාගේ උදව් ඇතිව රට ගොඩනැංවූ විජයබාහු රජතුමා ඉන් අනතුරුව යොමුවූයේ ශාසනයේ දියුණුව ඇති කිරීමටය. ඒ සම්බන්ධව ගත් ක්‍රියාමාර්ග කිහිපයකි.

- භික්ෂූන් වහන්සේලාට ත්‍රිපිටකය පුරුදු පුහුණු කරවීමට පහසුකම් සැලසීම
- ධර්ම ශාස්ත්‍ර නගා සිටුවීම සඳහා ත්‍රිපිටක ව්‍යාඛ්‍යාන ලිවීම

- ධර්මය කියාදෙන්නන්ට හා ධර්ම ග්‍රන්ථ රචනා කරන්නන්ට විවිධ සංග්‍රහ කිරීම
- රජතුමා ද ධර්ම ග්‍රන්ථ ලිවීම
- භික්ෂූන් වහන්සේට අවශ්‍ය ප්‍රත්‍ය පහසුකම් නොඅඩුව සපයාදීම
- දළදා පුද පූජා නැවත ආරම්භකර ශක්තිමත්ව පවත්වාගෙන යාමට අවශ්‍ය කටයුතු සැලසීම
- භික්ෂූන් වහන්සේලා හා ශාසන චාරිත්‍ර පිළිබඳ බලවත් ලැදියාවකින් ක්‍රියාකිරීම
- විහාර වත් පිළිවෙත් චාරිත්‍ර කඩ කළ තම බිසව ද මාළිගාවෙන් බැහැරකර ලාභසත්කාර පවත්වා භික්ෂූගෙන් සමාව ඉල්ලීමට නියම කිරීම
- පොළොන්නරුව අනුරාධපුර ආදි ප්‍රදේශවල පමණක් නොව ශ්‍රීපාදය වැනි දුර බැහැර ප්‍රදේශවල පිහිටුවා තිබූ සිද්ධස්ථාන දියුණුවට කටයුතු කිරීම

මෙවැනි ක්‍රියාමාර්ග නිසා සසුනේ ඇති වූ පුනරුද්දීපනය හේතු කොට ගෙන රජකෙනෙකු පත්කිරීමේදී පවා මහා සංඝරත්නයෙන් විමසා කටයුතු කිරීමට යොමු වී ඇත. නමුත් විජයබාහු රජතුමාගේ පාලන කාලය අවසාන භාගයේදී වික්‍රමබාහු ඈපාණන් සමඟ ආරවුලක් හටගත්තේය. එය බුදුසසුනේ පිරිහීමට බලපෑවේය. වික්‍රමබාහු රජවූ පසු බුදු සසුනට එල්ල වූ තර්ජන මෙසේය.

- රජතුමා තුණුරුවන් සතු ධනය පැහැරගෙන යුද භටයන්ට දීම
- විදේශවලින් පැමිණි යුද භටයන්ගේ වාසස්ථාන බවට පොළොන්නරුවේ විහාරස්ථාන පත්කිරීම
- විනාශකාරී තත්වය නිසා මහතෙරවරුන් පාත්‍රා ධාතුව හා දන්ත ධාතුව රැගෙන රුහුණු රටට පලායාම

මෙම වියවුල්කාරී තත්වය සන්සිඳෙන්නේ ගජබාහු රජු රජකමට පත් වූ පසුවය. ඔහු මහා සංඝරත්නයෙන් විමසා කටයුතු කළ රජ කෙනෙකි. මේ නිසා මහා සංඝරත්නයේ මැදිහත්වීම මත රජවරු අතර නැවත සිදු නොවීමට සාම ගිවිසුම් පවා ඇතිකර ගෙන තිබේ.

පොළොන්නරු යුගයේදී නැවත බුද්ධ ශාසනයේ පුනරුදයක් ඇතිවන්නේ මහා පරාක්‍රමබාහු රජ සමයේදීය. එතුමාට දේශීය හා විදේශීය සතුරන්ගෙන් රට මුදාගැනීමට දැඩි වෙහෙසක් දැරීමට සිදුවිය. පෙර සිටි යම් යම් රජවරුන්ගේ ක්‍රියාකලාප නිසා ශාසනය තුළ ද තිබුණේ ව්‍යාකූල තත්වයකි. භික්ෂූන් අතර වැරදි පිළිවෙත් බහුලවිය. අසමඟිය වර්ධනය විය. සමඟිව පොහොය පවුරුණු කටයුතු පවා සිදුනොවීය. මේ තත්වය දැනගත් රජතුමා ශාසන මාමක ප්‍රතිපත්ති ගරුක සිල්වත් භික්ෂූන් වහන්සේලා සමඟ සාකච්ඡා කර උන්වහන්සේලාගේ උපකාරය ඇතිව ශාසනශෝධනය කිරිම යොමු විය.

දිඹුලාගල කාශ්‍යප මහතෙරුන් වහන්සේ වැනි සිල්වත් ගුණවත් මහතෙරවරු ශාසන ශෝධනය හා නිකාය සමගිය ඇතිකිරීමට රජතුමාට උපකාරී වූහ. බොහෝ කලක් බුදුසසුන පිරිසිදුව පවත්වාගෙන යාම සඳහා ශාසන කතිකාවතක් ද මහ තෙරවරුන්ගේ ප්‍රධානත්වයෙන් සකස් කර ඇත. පොළොන්නරු කතිකාවත හෙවත් පරාක්‍රමබාහු කතිකාවත යනුවෙන් මෙය හැඳින්වේ. මෙම වකවානුවේදී ශාසන දියුණුව ප්‍රකට කෙරෙන සිද්ධීන් කිහිපයකි.

- සංඝරාජ පදවිය හා ථෙර, මහා ථෙර සම්මුති ඇතුළු ශාසනික තනතුරු ප්‍රදානය කිරීම
- බෞද්ධ ග්‍රන්ථ සුලභකිරීම තුළින් බෞද්ධ ජනයාගේ ගුණ නුවණ වර්ධනයට කටයුතු සැලසීම
- බුරුම රජතුමා සමග ආගමික සම්බන්ධතා සහ මිත්‍ර සම්බන්ධතා තහවුරු කරගැනීම
- රාජ්‍ය පාලකයාට අදාළව උපදෙස් හා අවවාද අනුශාසනා දීමට තරම් මහා සංඝයා වහන්සේ ප්‍රබල තත්ත්වයකට පත්කිරීම
- බුරුම භික්ෂූන් වහන්සේලා ඉගෙනීම් කටයුතු සඳහා ලක්දිවට වැඩම කරවීම
- උත්තරාජීව නම් බුරුම මහතෙරුන්වහන්සේගේ ශිෂ්‍ය චප්පට සාමණේරයන් වහන්සේ ලක්දිවට වැඩමවාගෙන විත් ඉගෙනීමට අවස්ථාව සලසාදීම
- ඉගෙනීමෙන් පසු මෙහිදී උපසම්පදාව ලැබූ චප්පට හිමියන් තම රටට ගොස් සීහල සංඝ නමින් නිකායක් පිහිටුවීම

මහා පරාක්‍රමබාහු රජුගෙන් ඇරඹෙන සසුනේ දියුණුව මීළඟට රජවන දෙවෙනි විජයබාහු රජුගේ සමයේදී තව තවත් වර්ධනය වේ. පාලි භාෂාවේ විශාරදයෙකු වන මේ රජතුමා බුරුමයත් ලංකාවත් අතර ශාසනික සම්බන්ධය තහවුරු කළේ පාලි සංදේශ මඟිනි. සාහසිකයෙකු විසින් දෙවන විජයබාහු රජතුමා මරාදමනු ලැබීය. යලිත් උදාවූයේ සංවේග ජනක තත්වයකි. රට තුළ අවුල් වියවුල් වැඩුණි. ශාසනයේ පරිහානියට මෙම අහිතකර තත්ත්වය බලපෑවේය.

මෙම තත්ත්වය වෙනස් වුයේ නිශ්ශංකමල්ල රජතුමා රජබවට පත් වූ පසුවය. රට එක්සත් කර වසර නවයක් පමණ රජකම් කළ ඔහු සසුන්ගේ දියුණුවට කළ කටයුතු කීර්ති ශ්‍රී නිශ්ශංක ශිලා ලේඛනයේ සඳහන්වේ.

- වැරදි පිළිවෙත් දැරුවා වූ භික්ෂූන් සසුනෙන් බැහැර කර ශාසන ශෝධනයක් කිරීම
- මනාව පිළිවෙත් රකින භික්ෂූන් වහන්සේලාගේ හිතසුව පිණිස එම භික්ෂූන් වහන්සේලාගේ කිට්ටුවර ඥාතීන්ට සංග්‍රහ කිරීම
- දිවයින පුරා ගොඩනගා තිබූ වෙහෙර විහාර රාශියක් ප්‍රතිසංස්කරණය කිරීම

නිශ්ශංකමල්ල රජතුමාගෙන් පසු පොලොන්නරුව රාජධානිය කොටගෙන රාජ්‍යත්වයට පත්වන්නේ මහා පරාක්‍රමබාහු රජතුමාගේ දේවිය වූ ලීලාවතී රැජිනයි. අවස්ථා තුනක් රජබවට පත්වන ඇයගේ පාලන වකවානුවේ මුල් භාගයේදී දහම් පොත්පත් ලිවීම ආදිය සිදුවී ඇත. පසුව ඇති වූ මාඝ ආක්‍රමණයෙන් රජරට පමණක් නොව රුහුණු රට පවා ඉදිකළ වෙහෙර විහාර වැනසුනි. විහාර සන්තක දේපල පැහැර ගැණුනි. ධර්ම පොත්පත් ගිනි තබා භික්ෂූන් වහන්සේලාට පවා පීඩා ඇති කෙරුණි. මහා ශාසනික හා ජාතික පරිහානියක් මාඝගේ සේනාව සිදුකළේය. ඒ නිසාම පොලොන්නරුව රාජධානිය බිඳ වැටුණි.

මේ අන්දමට අනුරාධපුර සමයෙන් ඇරඹෙන ලාංකේය බුද්ධ ශාසනය එම වකවානුවේ අවසාන භාගයේදී පරිහානි තත්ත්වයකට පත්වෙයි. පසුව පොලොන්නරු රාජධානිය බිහිකරන පළමු

විජයබාහු රජු ශාසනය ද පුනරුත්ථාපනය කර සුරක්ෂිත කිරීමට ක්‍රියාකරයි. ඔහුගේ ඇවෑමෙන් පසු නැවතත් අභාග්‍ය සම්පන්න තත්ත්වයකට මුහුණ පාන බුදු සසුන මහා සංඝරත්නයේ උපකාරය ඇතිව මහා පරාක්‍රමබාහු රජතුමා නැවත ගොඩනංවයි. ඉන්පසු නැවතත් පිරිහීමට ලක්වූ බුදුසසුන කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල රජු දවස නැවත නගාසිටුවයි. අවසානයේ ලීලාවතී රැජිනගේ වකවානුවේදී සිදුවන ආක්‍රමණය නිසා ශාසනයට යහත් වූ විපතක් අත්වේ. මේ අනුව වරෙක දීප්තිමත්ව බබලමින් තවත් වරෙක පරිහානියට පත්වෙමින් බුදු සසුන පොළොන්නරු රාජධානි සමයේ පැවතියේය. කෙසේ වෙතත් ශාසනික පරිහානිය සිදු වූ සැම විටම ශ්‍රේෂ්ඨ නරපතීන් හා ධර්ම විනයධර භික්ෂූන් වහන්සේලා එකතු වී නැවත පුනරුත්ථාපනය කිරීම ලක්දිව බුදුසසුන තුළ දැකිය හැකි ඓතිහාසික ලක්ෂණයකි.

### ක්‍රියාකාරකම්

1. පළමුවන විජයබාහු රජතුමා බුදුසසුනේ දියුණුවට ගත් ක්‍රියාමාර්ග මොනවාද?
2. වික්‍රමබාහු රජු සසුනට සිදුකළ අනර්ථකාරී ක්‍රියා නම් කරන්න.
3. පරිහානියට පත් බුද්ධ ශාසනය නගා සිටුවීමට මහා පරාක්‍රමබාහු රජතුමා ගත් ක්‍රියාමාර්ග මොනවාද?
4. පොළොන්නරු යුගයේදී බුරුම රට සමග මහා ආගමික මිතුරුකමක් පැවතුනි. මෙම අදහස තහවුරු කිරීමට සාක්ෂ්‍ය ලෙස ඉතිහාසගත සිදුවීම් තුනක් දක්වන්න.

# 11. පාඩම

## බෞද්ධ විහාරයක අංග

ගිය සතියේ අපේ පන්තියට පැමිණි සමිත හාමුදුරුවෝ විහාරස්ථානයක දක්නට ලැබෙන අංග මොනවාදැයි අපෙන් විමසූහ. අප දුන් පිළිතුරු සමිත හාමුදුරුවෝ කළු ලෑල්ලේ පිළිවෙළින් ලියා දැක්වූහ. ඒ මෙසේය,

1. දාගැබ් වහන්සේ
2. බෝධීන් වහන්සේ
3. බුදු මැදුර
4. ධාතු මන්දිරය
5. ධර්ම ශාලාව
6. සංඝාරාම කුලුන
7. සංඝාවාසය
8. සීමා මාලකය
9. පුස්තකාලය
10. මලසුන් ගෙවල්
11. සක්මන් මළුව

පසුව සමිත හාමුදුරුවන් විසින් එක් එක් විහාර අංගය පිළිබඳ අපට හඳුන්වා දුන්නේ මෙසේය.

### 1. දාගැබ් වහන්සේ

විහාරස්ථානයක ප්‍රධානම පූජනීය වස්තුව දාගැබ් වහන්සේයි. එය වෙහෙර වහන්සේ, චෛත්‍ය රාජයාණන්, ශාරීරික චෛත්‍යය ආදී නම්වලින් හැඳින්වේ. එම පූජනීය වස්තුව තුළ බුදුරදුන්ගේ ශාරීරික ධාතු තැන්පත් කර ඇති බැවින් එයට ප්‍රධාන තැනක් හිමිවේ. පන්සලේ උස් භූමියක පිහිටා තිබෙන දාගැබ් වහන්සේ වටා ප්‍රාකාරයක් ද ඉදිකර ඇත. මල්, පහන්, සුවඳ දුම්, ආදී පූජා භාණ්ඩ තැන්පත් කිරීම සඳහා ආසනයක් ද ඇත. එය හැඳින්වෙන්නේ මල්

අසුන කියාය. දාගැබ වටා ඇති මිදුල සෑ මළුවයි. මළුව වටා ඇය ප්‍රාකාරයට සම්බන්ධ කර තොරණ ද ඉදිකරනු ලැබේ.

## 2. බෝධීන් වහන්සේ

විහාරස්ථානයක ඇති පූජනීය වස්තු අතර දෙවැන්න බෝධීන් වහන්සේය. ත්‍රිවිධ චෛත්‍යයන්ගෙන් වර්තමානයෙහි පාරිභෝගික චෛත්‍යය ලෙස සැලකෙන්නේ බෝධීන් වහන්සේය. ඊට හේතුව බෝසතුන් බුදුවීම සඳහා සෙවණ සලසා ගැනීමෙන් ද සතියක් පුරා විමුක්ති සුවයෙන් ගත කිරීමෙන් ද අනිමිස ලෝචන පූජාවෙන් ද පරිභෝග කිරීමයි. බෝ සමිඳුන්ගේ ආරක්ෂාවට සහ අලංකාරය සඳහා බෝමළුව වටා ප්‍රාකාරයක් ඉදිකරනු ලැබේ. පූජා භාණ්ඩ තැන්පත් කිරීම සඳහා ඉදිකෙරෙන කුටිය හැඳින්වෙන්නේ මල් ආසනය නමිනි. ඇතැම් විහාරස්ථානයක බෝ සමිඳු වටා රන් ආලේපිත වැටක් ඉදිකර ඇත. බෝධීන් වහන්සේට ගෞරවය පිණිස ඉදිකෙරෙන එයින් ආරක්ෂාව හා අලංකාරය ද ඇති වේ. බෝධීන් වහන්සේ වටා ඇති බිම බෝ මළුවයි. එහි සුදු වැලි අතුරා ඇත. පහන් දැල්වීම සඳහා පහන් වැටක් ඉදිකරනු ලැබේ.

## 3. බුදු මැදුර

බුදුරජාණන් වහන්සේ වැඩ හිඳිනා කුටිය බුදු මැදුරයි. බුදු පිළිමය බුදුරජාණන් වහන්සේ උදෙසා ඉදිකළ වස්තුවක් බැවින් ''උද්දේසික චෛත්‍යය'' නම් වේ. ඇතැම් විහාර මන්දිරවල බුදුරදුන් දෙපස සැරියුත් මුගලන් අගසව් දෙනමගේ පිළිම ද ඉදිකර ඇත. බුද්ධ චරිතයේ අවස්ථා සහ ජාතක කථා ආදිය සිතුවම් හා මූර්ති මගින් නිරූපණය කර තිබේ. බුදු පිළිම හිටි පිළිම, ඉඳි පිළිම, සැතපෙන පිළිම යනුවෙන් යනුවෙන් ආකාර තුනකට නිර්මාණය කර තිබේ.

## 4. ධාතු මන්දිරය

ඇතැම් විහාරස්ථානවල ධාතු මන්දිර ඉදි කොට ඇත, දාගැබ මෙන් ධාතු මන්දිරය ද ඉදි කරන්නේ උස් තැනක යි. සර්වඥ ධාතූන් වහන්සේත් ඇතැම්විට රහතන් වහන්සේලාගේ ධාතූන් මෙහි තැන්පත් කොට ඇත.

## 5. ධර්ම ශාලාව

බුදු බණ දෙසන බුදු බණ අසන බුදු බණ සාකච්ඡා කරන ශාලාව ධර්ම ශාලාවයි. පන්සලේ සිදු කෙරෙන බොහෝ ආගමික හා සාමාජික කටයුතුවල දී ධර්ම ශාලාව යොදා ගැනේ. පොහෝදාට උපාසක උපාසිකාවන් සිල් සමාදන් වන්නේ ධර්ම ශාලාවේ ය. දහම් පාසල පවත්වන්නේ ද එහිය. බණ පිරිත් ඇසීමට පන්සලට පැමිණෙන්නෝ ධර්ම ශාලාවේ බිම හිඳ ගනිති. පොදු රැස්වීම්, උත්සව පැවැත්වීමට ද ධර්ම ශාලාව යොදා ගන්නේ.

## 6. සණ්ටාර කුලුන

සණ්ටාව සවිකර ඇති කුලුන සණ්ටාර කුලුනයි. බුදුරදුන් උදෙසා ශබ්ද පූජා පැවැත්වීමට සණ්ටාරය උපයෝගී කර ගැනේ. ගම් වැසියන්ට පණිවිඩ ලබා දීමට ද සණ්ටාරය නාද කෙරේ. මල් පූජා, බෝධි පූජා, පිරිත් දේශනා ආදී පිංකම් ආරම්භ කරන අවස්ථාවලදී සණ්ටාරය නාද කෙරේ. ඇතැම් සිද්ධස්ථානයන්හි ඉතා අලංකාර සණ්ටාර කුළුනු ඉදිකර ඇත.

## 7. සංඝාවාසය

භික්ෂූන් වහන්සේගේ ලැගුම් ගෙය සංඝාවාසයයි. මූලික අවශ්‍යතා වන චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලන්පස යන සිවුපසය අතරින් සේනාසන යන්නට සංඝාවාසය අයත් වේ. එය ගල් ගෙයක් හෝ දෙපළ, සතරපතළ ගෙයක් හෝ තට්ටු ගෙයක් විය හැකිය.

## 8. සීමා මාලකය

පොහොය කිරීම, උපසම්පදා කිරීම, කඨින චීවර පැවරීම ආදී භික්ෂූන් වහන්සේගේ විනය කර්ම සඳහා ඉදි කොට ඇති ස්ථානය සීමා මාලකය නම් වේ.

## 9. පුස්තකාලය

භික්ෂූන් වහන්සේටත් ගමේ ලොකු කුඩා සැම කෙනෙකුටමත් ධර්ම ශාස්ත්‍ර ඥානය ඇති කර ගැනීමට උපකාර වන පොත්, සඟරා, පුවත්පත් තබා ඇති ගොඩනැගිල්ල පුස්තකාලය නම් වේ.

## 10. මලසුන් ගෙය

සම්බුද්ධ පූජාව සඳහා ගිලන්පස ආදි පූජා ද්‍රව්‍ය සකස් කිරීම සඳහා මලසුන් ගෙය ඉදිකොට ඇත. සැදැහැ සිතින් සකසන මල්, පහන්, ගිලන්පස ආදිය ත්‍රිවිධ චෛත්‍යය වෙත වැඩම කෙරෙන්නේ මලසුන් ගෙයි සිටය.

## 11. සක්මන් මළුව

භික්ෂූන් වහන්සේට සක්මන් භාවනා කිරීම සඳහා සක්මන් මළුව සකසා ඇත. එහි සුදු වැලි ඇතිරීම සම්ප්‍රදායයි. ඇතැම් සක්මන් මළුවල එක් කෙළවරක ආසනයක් ද අනෙක් කෙළවරේ ඇට සැකිල්ලක් ද දක්නට තිබේ. ඇට සැකිල්ල ශරීරයේ සැබෑ ස්වරූපය මෙනෙහි වීම සඳහාය. ආසනය වෙහෙස වූ විට වැඩ හිදීම පිණිසය.

## ක්‍රියාකාරකම්

1. ත්‍රිවිධ චෛත්‍යය නම් කර එම ස්ථාන වන්දනා කරන ගාථා සොයා ලියන්න.
2. ත්‍රිවිධ චෛත්‍යය වන්දනා කරන අනුපිළිවෙළ ලියන්න.
3. ඉහත විහාර අංග 11 අතරින් ඔබගේ විහාරස්ථානයේ තිබෙන විහාර අංග නම් කරන්න. එම විහාර අංග 11 ට වඩා වෙනත් විහාර අංග ඇත්නම් ඒවා ද වෙනම ලියන්න.
4. ඔබගේ විහාරස්ථානයේ ඇති විහාරාංග අතුරින් ඔබ කැමති එකක් චිත්‍රයට නගන්න.

# 12. පාඩම

## පාලි 1

## සිල් ඉල්ලීමේ වාක්‍යය

(අ) ඕකාස අහං භන්තේ තිසරණේන සද්ධිං පඤ්චසීලං
ධම්මං යාචාමි අනුග්ගහං කත්වා සීලං දේථ මේ භන්තේ

දුතියම්පි අහං භන්තේ තිසරණේන සද්ධිං පඤ්චසීලං
ධම්මං යාචාමි අනුග්ගහං කත්වා සීලං දේථ මේ භන්තේ

තතියම්පි අහං භන්තේ තිසරණේන සද්ධිං පඤ්චසීලං
ධම්මං යාචාමි අනුග්ගහං කත්වා සීලං දේථ මේ භන්තේ

ඉහත සිල් ඉල්ලීමේ වාක්‍යය දුතියම්පි - දෙවනුව ද තතියම්පි - තෙවනුවද වශයෙන් නිවැරදිව තෙවරක් ශබ්ද නගා කියවීම බෞද්ධ සම්ප්‍රදාය යි. ඊට පසුව පදයෙන් පදයට අර්ථය කියන්නට සහ ලියන්නට හැකි වන පරිදි අර්ථාවබෝධය ලැබිය යුතුය. අර්ථාවබෝධය සඳහා මෙසේ පද පිළිවෙළ අනුව අර්ථය දැනගතයුතු වේ.

**(ආ) සිල් ඉල්ලීමේ වාක්‍යයේ පද පිළිවෙළ හැඳින ගනිමු**

**ඕකාස අහං භන්තේ තිසරණේන සද්ධිං පඤ්චසීලං ධම්මං යාචාමි, භන්තේ මේ අනුග්ගහං කත්වා සීලං දේථ දුතියම්පි ............... තතියම්පි ................**

**එහි තේරුම දැනගනිමු**

අවසර ස්වාමීනි, මම තිසරණය සහිත පන්සිල් ඉල්ලමි. ස්වාමීනි, මට අනුග්‍රහ කොට සිල් දෙන්න.

දෙවනුවද ස්වාමීනි, මම තිසරණය සහිත පන්සිල් ඉල්ලමි. ස්වාමීනි, මට අනුග්‍රහ කොට සිල් දෙන්න.

තෙවනුව ද ස්වාමීනි, මම තිසරණය සහිත පන්සිල් ඉල්ලමි. ස්වාමීනි, මට අනුග්‍රහ කොට සිල් දෙන්න.

**(ඇ) පාලි පදවල තේරුම දැන ගනිමු :**

ඕකාස - අවසරයි
අහං - මම
භන්තේ - ස්වාමීනි
තිසරණේන - තිසරණය, තුන් සරණය
සද්ධිං - සමඟ
පඤ්චසීලං ධම්මං - පංචශීල ධර්මය (පන්සිල්)
යාචාමි - ඉල්ලමි
අනුග්ගහං කත්වා - අනුග්‍රහ කොට
සීලං - ශීලය
මේ - මට
දේථ - දෙන්න, දෙනු මැනවි
දුතියම්පි - (දුතියං + අපි - දුතියම්පි) දෙවනුව ද
තතියම්පි - (තතියං + අපි - තතියම්පි) තෙවනුව ද

**(ඉ) සරල පාලි වාක්‍ය ගොඩ නගන්නට ඉගෙන ගනිමු.**

ඉහත සඳහන් සිල් ඉල්ලීමේ වාක්‍ය ඇසුරෙන් සරල වාක්‍ය ගොඩනැගිය හැකිය. පහත සඳහන් වගුව තුළින් පද ගැළපීමෙන් වාක්‍ය රටා දෙකක් නිර්මාණය කර ගනිමු.

වගුව 1 වාක්‍ය රටා 1

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| ඕකාස | අහං<br>මයං | භන්තේ | තිසරණේන සද්ධිං | පඤ්ච<br>ආජීවට්ඨමක<br>අට්ඨංග<br>දස | සීලංධම්මං | සීලංධම්මං<br>යාචාම |

වගුව II වාක්‍ය රටාව II

| | | | | | |
|---|---|---|---|---|---|
| භන්තේ | ත්වං<br>තුම්හේ | මේ<br>නෝ | අනුග්ගහං<br>කත්වා | සීලං | දේහි<br>දේථ |

**(ඊ) ක්‍රියාකාරකම්**

1. සිල් ඉල්ලීමේ වාක්‍යය නිවැරදිව කියන්න.
2. ඉහත වගු I හා II ඇසුරින් වාක්‍ය 05 ක් ගොඩනගන්න.
3. **පාලියට නගන්න.**

I. අවසර ස්වාමීනි, මම තිසරණය සහිත අටසිල් ඉල්ලමි. ස්වාමීනි, මට අනුග්‍රහ කොට සිල් දෙන්න.
II. ස්වාමීනි, ඔබ වහන්සේ මට අනුග්‍රහකොට සිල් දෙන්න.

**අලුත් වචන**

අහං - මම
මයං - අපි
ත්වං - ඔබ
තුම්හේ - තෙපි, නුඹලා, ඔබලා
මේ - මට
නෝ - අපට
යාචාමි - ඉල්ලමි
යාචාම - ඉල්ලමු
දේහි - දෙන්න (දෙහි)
දේථ - දෙන්න (දෙහු)

# 13. පාඩම

## පාලි 02

## දහම් ගුණ පාඨය

(අ) ස්වාක්ඛාතෝ භගවතා ධම්මෝ සන්දිට්ඨිකෝ අකාලිකෝ ඒහි පස්සිකෝ ඕපනයිකෝ පච්චත්තං වේදිතබ්බෝ විඤ්ඤූහී

ධර්ම රත්නයේ ගුණ සිහිකිරීමේ දී ඉහත පාඨය ශබ්ද නගා නිවැරදිව කියවීම අවශ්‍ය වේ. ඊට පසුව පදයෙන් පදයට අර්ථය කියන්නට සහ ලියන්නට හැකි වන පරිදි අර්ථාවබෝධය ලැබිය යුතු වේ. අර්ථාවබෝධය සඳහා පද පිළිවෙළ දැනගතයුතු වේ.

**(ආ) දහම් ගුණ පාඨයේ පද පිළිවෙළ හැඳින ගනිමු.**

භගවතා ධම්මෝ ස්වාක්ඛාතෝ, සන්දිට්ඨිකෝ, අකාලිකෝ, ඒහි පස්සිකෝ, ඕපනයිකෝ, විඤ්ඤූහී පච්චත්තං වේදිතබ්බෝ,

**එහි තේරුම දැන ගනිමු.**
භාග්‍යවතුන් වහන්සේ විසින් (දේශනා කරන ලද)

I. (මේ ධර්මය) මනාව දේශනා කරන ලද නිසා ස්වාක්ඛාත නම් වේ.

II. (මේ ධර්මය) තමා විසින් ම දැකිය යුතු බැවින් ද සන්දිට්ඨික නම් වේ.

III. (මේ ධර්මය) කල් නොයවා විපාක ගෙන දෙන නිසා අකාලික නම් වේ.

IV. (මේ ධර්මය) මෙහි එන්න. පැමිණ මේ ධර්මය බලන්න. යන ආකාරයට කීමට සුදුසු නිසා ඒහි පස්සික නම් වේ.

V. (මේ ධර්මය) භාවනා කොට තම තමාගේ සිතට පමුණුවා ගතයුතු නිසා ඕපනයික නම් වේ.

VI. (මේ ධර්මය) නුවණැති අය තම තමන් විසින් ම අවබෝධ කළයුතු නිසා විඤ්ඤූහි පච්චත්තං වේදිතබ්බ නම් වේ.

(ඇ) පාලි පදවල තේරුම් දැන ගනිමු.

ස්වාක්ඛාතෝ - මනාව දේශනා කරන ලද්දේ ය.
භගවතා - භාග්‍යවතුන් වහන්සේ විසින්
ධම්මෝ - සද්ධර්මය
සන්දිට්ඨිකෝ - තමා විසින් ම දැකිය යුත්තේ ය.
අකාලිකෝ - කල් නොයවා විපාක ගෙන දෙන්නේ ය.
ඒහිපස්සිකෝ - 'මෙහි එව, මේ ධර්මය බලව' යන ආකාරයට කීමට සුදුසු ය.
ඕපනයිකෝ - තමාගේ සිතට පමුණුවා ගැනීමට සුදුසු ය.
පච්චත්තං - තම තමා වෙන වෙන ම
වේදිතබ්බෝ - දත යුතු ය.
විඤ්ඤූහි - පණ්ඩිතයන් විසින්, නුවණැත්තන් විසින්

(ඉ) සරල පාලි වාක්‍ය ගොඩනගන්නට ඉගෙන ගනිමු.

ඉහත සඳහන් දහම් ගුණ පාඨය ඇසුරෙන් සරල පාලි වාක්‍ය ගොඩනැගිය හැකිය. පහත සඳහන් වගු තුළ ඇති පද ගැලපීමෙන් වාක්‍ය රටා දෙකක් නිර්මාණය කර ගනිමු.

වගුව 1 වාක්‍ය රටාව 1

| | | | | |
|---|---|---|---|---|
| තේන | භගවතා | දේසිතෝ | ධම්මෝ | ස්වාක්ඛාතෝ<br>සන්දිට්ඨිකෝ<br>අකාලිකෝ<br>ඒහිපස්සිකෝ<br>ඕපනයිකෝ<br>පච්චත්තං වේදිතබ්බෝ |

වගුව II වාක්‍ය රටාව I

| | | |
|---|---|---|
| ස්වාක්ඛාතෝ | | |
| සන්දිට්ඨිකෝ | | |
| අකාලිකෝ | භගවතා | ධම්මෝ |
| ඒහිපස්සිකෝ | | |
| ඕපනයිකෝ | | |
| පච්චත්තං වේදිතබ්බෝ | | |

(ඊ) ක්‍රියාකාරකම්

1. දහම් ගුණ පාඨය නිවැරදිව ශබ්ද නගා කියන්න.
2. ඉහත වගු 1 හා II ඇසුරින් පාලි වාක්‍ය 10 ක් ගොඩනගන්න.
3. මේවාට තේරුම් ලියන්න.

ස්වාක්ඛාතෝ ..................................................
සන්දිට්ඨිකෝ ..................................................
අකාලිකෝ ..................................................
ඒහි පස්සිකෝ ..................................................
ඕපනයිකෝ ..................................................
පච්චත්තං වේදිතබ්බෝ ..................................................

## 14. පාඩම

# අනුබුදු මිහිඳු මහරහතන්වහන්සේ

පොසොන් පුර පොහොය සිරිලක් වැසියන්ට ඉතා වැදගත් දිනයකි. ඒ අනුබුදු මිහිඳු මහරහතන් වහන්සේ මෙරටට වැඩම කළ දිනය හෙයිනි. ඒ නිමිති කරගෙන ලක්වැසියෝ විවිධ පිංකම් සිදුකරති. එලෙස අනුබුදු මිහිඳු මාහිමි ගුණ සිහි කරනුයේ උන්වහන්සේ ලක්වැසියන්ට සිදුකළ අනුස්මරණීය මෙහෙවර නිසාය.

බුදුරජාණන් වහන්සේ දේශනා කළ උතුම් සද්ධර්මය ලක්වැසියන්ට හඳුන්වා දෙන ලද්දේ අනුබුදු මිහිඳු මහ රහතන් වහන්සේ විසිනි. දඹදිව රජකම් කළ ධර්මාශෝක රජතුමා සහ විදිසා නගරයේ විදූ දේවි නම් සිටු දේවිය උන් වහන්සේගේ මව්පියෝ වූහ. සංඝමිත්තා තෙරණිය සොහොයුරිය වූවාය.

මහින්ද හෙවත් මිහිඳු කුමරා විසි හැවිරිදි වියේදී මොග්ගලීපුත්ත තිස්ස මහ රහතන් වහන්සේන්ගේ උපාධ්‍යායත්වයෙන් හා මහා දේව මහ රහතන් වහන්සේගේ ආචාර්යත්වයෙන් පැවිදි වූහ. උන් වහන්සේ පැවිදිවීමත් උපසම්පදාවීමත් රහත් වීමත් සිදුවූයේ එකම දිනකදීය.

ධර්මාශෝක රජුගේ අනුග්‍රහයෙන් තුන්වන ධර්ම සංගායනාව පැවැත්වීමෙන් පසු විදේශ රටවලට ධර්මදූත පිරිස් පිටත්කර යැවීම සිදුවිය. රජුගේ නොදුටු මිත්‍රයෙකු වූ දෙවනපෑතිස් රජු රජකම් කළ ලක්දිවට ද ඒ අනුව ධර්ම දූත පිරිසක් පිටත් කර යැවීමට තීරණය විය. ඒ සඳහා තෝරා ගැනුනේ තිස්දෙහැවිරිදි වියේ පසුවූ මිහිඳු මහ රහතන් වහන්සේ ය.

සම්බුද්ධ වර්ෂ 236 වැන්නෙහි උදාවූ පොසොන් පුර පසළොස්වක පොහෝදා අනුබුදු මිහිඳු මහ රහතන් වහන්සේ ඉට්ඨිය, උත්තිය, සම්බල, භද්දසාල යන රහතන් වහන්සේලා ද සුමන සාමණේරයන් වහන්සේ ද භණ්ඩුක නම් අනාගාමී උපාසක තුමා ද සමග අනුරාධපුර මිහින්තලාවට වැඩම කළහ.

දෙවනපෑතිස් රජු එකල පැවති සිරිත අනුව නැකැත් කෙළිය සඳහා මිහින්තලා කඳු ප්‍රදේශයේ මුව දඩයමෙහි නිරත වෙමින් සිටියේය. මිහිඳු මහ රහතන් වහන්සේ ''තිස්ස, තිස්ස'' යැයි රජු ඇමතූහ. තමන්ගේ නම කියා අමතන්නේ කවුදැයි විමතියට පත් රජු වටපිට බැලීය. මිහින්තලා කඳු මුදුනෙහි වැඩහුන් අනුබුදු මිහිඳු මාහිමියෝ

සමණාමයං මහාරාජ - ධම්ම රාජස්ස සාවකා
තවෙව අනුකම්පාය - ජම්බුදීපා ඉධාගතා

''මහරජ අපි ධර්මරාජ වූ බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවක ශ්‍රමණයෝ වෙමු. ඔබ කෙරෙහි අනුකම්පාවෙන් දඹදිව සිට මෙහි පැමිණියෙමු.'' යනුවෙන් දේශනා කළහ.

දුනු හී පසෙක දැමූ රජු අනුබුදු මිහිඳු මාහිමි සමීපයට පැමිණියේය. රජුගේ බුද්ධි මට්ටම මැන බැලීමටත් රජු සමග සුහදත්වය ගොඩනගා ගැනීමටත් උන්වහන්සේ ප්‍රශ්නාවලි දෙකක් විමසූහ. එය අඹ ප්‍රශ්නය හා ඥාති ප්‍රශ්නය නමින් හැඳින්වේ. රජු එයට බුද්ධිමත්ව පිළිතුරු දුන්නේය. උන්වහන්සේ රජුගේ බුද්ධි මහිමය වටහා ගත්හ.

රජු ඇතුළු පිරිසට මිහිඳු මහ රහතන් වහන්සේ චූල්ලහත්ථිපදෝපම සූත්‍රය දේශනා කළහ. ඔවුහු එය අසා තෙරුවන් සරණ ගියහ. රජමැදුරට වැඩම කළ අනුබුදු මිහිඳු මහ රහතන් වහන්සේ කාන්තාවන් ඇතුළු රජමැදුරේ පිරිසට විමානවත්ථු, ප්‍රේතවත්ථු දේශනා කළහ. එහි ඇතුළත් කථා පුවත් ඇසීමෙන් ඉක්මනින් කර්ම හා විපාක තේරුම් ගැනීමට ඔවුන්ට හැකිවිය. බාල පණ්ඩිත සූත්‍රය සහ දේවදූත සූත්‍රය ද දේශනා කළ මිහිඳු මාහිමියෝ කර්මයන්ගේ මෙලොව පරලොව විපාක පැහැදිලි කර දුන්හ.

දේවානම්පිය තිස්ස රජු මහමෙව්නා උයන පූජා කළ පසු එහි විහාර, ආරාම, ගොඩනැගිලි ඉදිකළේ අනුබුදු මිහිඳු මාහිමියන්ගේ උපදෙස් පරිදිය. අනුලා දේවිය ඇතුළු කාන්තාවන් 500 ක් පැවිදි වීමට කැමැත්ත ප්‍රකාශ කළ පසු සංඝමිත්තා තෙරණිය සිරිලකට වැඩම කරවා පැවිදි වීමට අවස්ථාව සලසා දුන්නේ උන්වහන්සේය.

මිහිඳු මහ රහතන් වහන්සේ සිරිලකට වැඩම වූ පසු පෙර පැවති ගස්, ගල් පර්වත වන්දනා වෙනුවට බෝධි වන්දනා, චෛත්‍ය වන්දනා, බුද්ධ ප්‍රතිමා වන්දනා ක්‍රම බිහිවිය. මළවුන් හා දෙවියන් පිදීම වෙනුවට ඔවුන්ට පිං අනුමෝදන් කිරීමේ සිරිත් ඇතිවිය. ශ්‍රී ලාංකේය බුදු සසුන සුරක්ෂිත කිරීම සඳහා ලංකාවේම තරුණයන් පැවිදි කොට භික්ෂු සමාජයක් බිහි කළේය. අරිට්ඨ ඇමතියා පැවිදි වීමත් සමග එම ශ්‍රී ලාංකීය භික්ෂු පරපුර බිහිවිය. උන්වහන්සේලා ත්‍රිපිටකය හොඳින් ඉගෙන ලක්වැසියාගේ හිතසුව පිණිස දේශනා කළහ.

අනුබුදු මිහිඳු මහ රහතන් වහන්සේගේ උපදෙස් පරිදි සිරිලකට වැඩම කළ සංඝමිත්තා තෙරණිය රැගෙන ආ ශ්‍රී මහා බෝධි දක්ෂිණ ශාඛාව මහමෙවුනා උයනේ රෝපණය කෙරිණි. ඉන් හටගත් අෂ්ටඵල බෝධි හා දෙතිස් ඵල බෝධි සිරිලක විහාරස්ථානවල රෝපණය කිරීම සිදුවිය. මහා විහාරය ඉදිවන්නට විය. භික්ෂු විනය කර්ම කරන සීමා මාලක ද සකස් කෙරිණි. ලාංකීය භික්ෂූහු ත්‍රිපිටකයට සිංහල භාෂාවෙන් අටුවා පොත් සකස් කළහ. සාහිත්‍ය කෘති රචනා විය.

මිහින්තලාවෙන් ඇරඹුණු අනුබුදු මිහිඳු මාහිමියන්ගේ සදහම් මෙහෙවර තුළින් ලක්වැසියන්ගේ හදවත දහමින් පෝෂණය වන්නට විය. සම්බුදු දහම ආරක්ෂා කර ගැනීම, දහමට අනුව ජීවත්වීම, හා දැහැමි රාජ්‍ය පාලනයක් ගෙනයාම කෙරෙහි ලක්වැසි ජනතාව ඉමහත් උනන්දුවක් දැක්වූහ. සම්බුදු දහම, භික්ෂු සමාජය හා සංස්කෘතිය ආරක්ෂාකර ගැනීම සඳහා දිවිහිමියෙන් ක්‍රියා කරන ජනතාවක් බිහිවිය. මිහිඳු මහ රහතන් වහන්සේ අපට දෙවන බුදුවරයෙක් වන නිසා අනුබුදු නම් වන සේක.

ශ්‍රී ලාංකේය බුදු සසුනේ දියුණුවට මහඟු මෙහෙයක් කළ අනුබුදු මිහිඳු මහ රහතන් වහන්සේ උත්තිය රජ සමයෙහි පිරිනිවන් පා වදාළ සේක. උන්වහන්සේ පිරිනිවන් පැවද එදා උදාකළ දහම් ආලෝකය අද දක්වා පැතිරරෙමින් පවතී.

**අනුබුදු මිහිඳු මාහිමි චරිතයෙන් අපට ගතහැකි ආදර්ශ.**

1. මව්පියන්ගේ යහපත් අරමුණු ඉටුකිරීම වෙනුවෙන් කැපවීම.
2. තරුණ වියෙහිදීම චාම් සරල දිවියකට හුරුවීම.

3. තමන්ට පැවරෙන වගකීම් නිසිලෙස ඉටුකිරීම
4. අනුන්ගේ යහපත වෙනුවෙන් ක්‍රියා කිරීමට හුරුපුරුදු වීම
5. තමන් ආරම්භ කළ ක්‍රියාව ප්‍රතිඵල ලැබෙනතුරු කරගෙන යෑම
6. අනුන්ගේ දියුණුව වෙනුවෙන් කාලය ධනය ශ්‍රමය කැපකිරීම
7. බුදු සසුනේ දියුණුව හා සමාජයේ දියුණුව වෙනුවෙන් කැපවී ක්‍රියාකිරීම

**ක්‍රියාකාරකම්**

1. අනුබුදු මිහිඳු මහරහතන් වහන්සේගේ මව්පියන් ගේ නම් ලියන්න.
2. මිහිඳු මහ රහතන් වහන්සේ අනුබුදු යනුවෙන් හඳුන්වන්නේ ඇයිදැයි පැහැදිලි කරන්න.
3. අනුබුදු මිහිඳු මහරහතන් වහන්සේ සිදුකළ සේවා හඳුන්වා දෙන්න.
4. මිහිඳු මාහිමි චරිතයෙන් ගතහැකි ආදර්ශ 05 ක් ලියන්න.
5. සමණාමයං මහා රාජ ..... යන ගාථාව හා තේරුම ලියා කටපාඩම් කොට පන්තියට ඉදිරිපත් කරන්න.
6. මිහිඳු මහ රහත් වහන්සේ ලක්දිවට වැඩම කළ අවස්ථාව චිත්‍රයට නගන්න.

**පුහුණුවට**

| | |
|---|---|
| අනුබුදු මිහිඳු සමිඳුන් බිඳහැර | අඳුර |
| නුවණැස මිහිර ලැබඳුනි දහමින් | අමර |
| බුදුරැස් දහර විහිදූ හෙළ දිව | පවර |
| දුසිරිත් දුරු කරයි ඒ අරහත් | සිවුර |

# 15. පාඩම

## බුදු සිරිතේ ආදර්ශ

ශාන්ති නායක බුදුරජාණන් වහන්සේ අසමසම ගුණ සමුදායකින් යුතු වූ සේක. අසරණ සරණ ගුණය, ගිලානෝපස්ථානය, යථාවාදී තථාකාරී බව, සමානාත්මතාව සහ සහජීවනය යන ගුණාංග ඒ අතර සුවිශේෂ වේ.

**අසරණ සරණ ගුණය**

සෑම දිනකම උදෑසන අවදි වී මහා කරුණා සමාපත්තියට සමවැදී එයින් නැගී සිට ලෝවැසියන් දෙස බුදු ඇසින් බැලීම බුදුරදුන්ගේ සිරිතය. ඒ අනුව අසරණයන් සොයා වැඩම කරන උන් වහන්සේ මහා කරුණාවෙන් හා මෛත්‍රියෙන් යුතුව ඔවුන්ට පිහිට වෙති.

සුනීත, සෝපාක, පටාචාරා, කිසාගෝතමී, රජ්ජුමාලා, වරදට හසුවූ නිවැරදි ගොවියා, දරුවන්ගේ පිහිට නොලද මහලු පියා බුදුරදුන් සරණ වූ අසරණයන් කීහිප දෙනෙකි. ඒ අතරින්,

1. සුනීත
2. සෝපාක
3. පටාචාරා
4. කිසාගෝතමී

යන අසරණයන්ට බුදුරදුන් පිහිට වූයේ කෙසේදැයි අපි සොයා බලමු.

**■ සුනීතට පිහිටවීම**

රජගහනුවර සුනීත යනු බමුණු දහම අනුව පහත් යැයි සම්මත සැඩොල් කුලයේ තරුණයෙකි. එනිසා ඔහුට සමාජයේ කිසිවෙකු සැලකුවේ නැත. නගරයේ කසළ ඇද වීථි ශුද්ධ පවිත්‍ර කිරීම ඔහුගේ රැකියාව විය. දිනක් සුනීත පාරේ කසළ කදක් ගෙන යමින් සිටින විට මහා කාරුණික බුදුරජාණන් වහන්සේ ඒ දෙසට වැඩම කළහ.

බියට හා තැති ගැනීමට පත් වූ සුනීත කසළ කද පසෙකින් තම පාරෙන් ඉවත් විය. සුනීත ළගට වැඩම කළ බුදුරදුහු,

"සුනීත ඔය දුක්බර ජීවිතයෙන් මිදෙන්න. ඔබ පැවිදිවෙන්න කැමතිදැයි" විමසූහ. එය ඇසූ ඔහු පුදුමයට හා ඉමහත් සතුටට පත් වී මෙසේ කීය. "ස්වාමීනී, මා වැනි කසළ අදින සැඩොල් කුලයේ අයත් පැවිදි කර ගන්නවාද? ඔබ වහන්සේ මා පැවිදි කරගන්නේ නම් මම ඉමහත් සතුටට පත්වෙමි."

සම්බුදුරදුහු සුනීත ආරාමයට කැඳවාගෙන ගොස් පැවිදි කළහ. නොබෝ දිනකින් සුනීත හාමුදුරුවෝ සියලු කෙලෙස් නසා අරහත් ඵලයට පත්වූහ.

## ■ සෝපාකට පිහිටවීම

රජගහනුවර සැඩොල් කුලයක උපන් සෝපාක ඉමහත් දුක් විඳි දරුවෙකි. මාස හතරක් ගතවෙද්දී පියා මිය ගියේය. මව වෙනත් පුරුෂයෙකු හා විවාහ වූවාය. එම සුළු පියා සෝපාකට නිතර බැන්නේය. පහර දුන්නේය. සෝපාක වයස හත්වෙනි වියට පත් වූ අතර දුව පැන සෙල්ලම් කරන කාලය උදාවිය. දිනක් මල්ලී සමඟ කලහයක් හට ගත්තේය. ඒ දැක කෝපයට පත් සුළු පියා මව ඉදිරියේම සෝපාකට පහර දුන්නේය. ඔහු කෑගසා හඬන්නට විය. පසුව ඔහු මවට නොපෙනෙන ලෙස මහ කැලයේ සොහොනකට ගෙන ගොස් ලනුවකින් අත්දෙක එක් කොට බැඳ ඒ ලනුවෙන්ම මළ මිනියකට තද කොට බැඳ දමා සුළුපියා ගෙදර ගියේය.

සෝපාක බියෙන් හා වේදනාවෙන් කෑගැසුවේය. ඒ ඇසෙන තෙක් මානයේ කිසිවෙක් නොවිය. දිවැසින් ඒ දුටු බුදුරජාණන් වහන්සේ මහා කරුණාවෙන් සෝපාක ළගට වැඩම කළහ. බිය දුරු කොට මළ මිනියට බැඳ තිබූ බැමි ලිහා ආරාමයට කැඳවා ගෙන ගියහ. පැවිදි කොට රහත් ඵලය ලබන්නට මඟ සැලසූහ.

■ පටාචාරාවට පිහිටවීම

සැවැත් නුවර සිටු දියණියක වූ පටාචාරාව නොසිතූ අයුරින් සිදුවූ විපත් රැසකට මුහුණදුන් කාන්තාවකි. දිනක් තම සැමියා සමඟ පළමු දරුවා ද රැගෙන දෙවන දරුවා බිහි කිරීමට මව්පියන් වෙත යමින් සිටියාය. අතර මගදී දරුවා ලැබෙන්නට යන බව ඇයට දැනුණි. සැමියා ඇය වැස්සෙන් ආවරණය කර ගැනීමට කොළ අතු ටිකක් කඩාගෙන ඒමට අසල වූ කැලය ඇතුළට ගියේය. එහිදී සර්පයෙකු දෂ්ට කර ඔහු මරණයට පත්විය. එම රාත්‍රියේදීම පටාචාරාවට දෙවෙනි දරුවා ලැබිණි. සැමියා මළ බව දැනගත් ඈ තැවෙමින් දරු දෙදෙනා සමඟ සැවැත්නුවර බලා පිටත් වූයේ මව්පියන් වෙත යන අදහසිනි.

අතරමග ගඟකින් එතෙර වීමේදී එක් දරුවෙකු උකුස්සෙක් ඩැහැගෙන ගියේය. අනෙක් දරුවා ගඟේ ගසාගෙන ගියේය. සැමියාත් දරු දෙදෙනාත් අහිමි ඈ දරාගත නොහැකි ශෝකයෙන් මහ හඬින් කෑගැසුවාය. හඬමින් වැළපෙමින් මව්පියන් වෙත යද්දී ඇයට දැනගන්නට ලැබුන්නේ පෙරදින ඇද හැළුණු මහා වැස්සෙන් නිවස කඩාවැටී මවත් පියත් සොහොයුරාත් මියගොස් ඇති බවයි. එම තිදෙනා දර සෑයක දැවෙන අයුරු ද දැක ගන්නට ලැබිණි. ඇයගේ ශෝකය දෙගුණ තෙගුණ විය. ඇඳිවත ද නොමැතිව උමතු වූ තැනැත්තියක් මෙන් ඒ මේ අත යන්නට වූවාය.

පටාචාරාව පෙර පිනකට මෙන් බුදුරදුන් වැඩසිටි දෙව්රම් වෙහෙරට ආවාය. ඇයගේ ස්වභාවය දුටු බොහෝ දෙනා බුදුරදුන්වෙත යාම වැළැක්වීමට උත්සාහ ගත්හ. එහෙත් බුදුරජාණන් වහන්සේ ඇයට තමන් වෙත පැමිණීමට ඉඩ සලසා දුන්හ.

"පටාචාරාවනි, සිහිය උපදවා ගන්න" යැයි බුදුරදුහු වදාළහ. එහි සිටි කිසිවෙකු විසින් දෙන ලද වස්ත්‍රයක් හැඳගත් ඇයට බුදුරජාණන් වහන්සේ ධර්ම දේශනා කළහ. හැඬීම වැළපීම නතර විය. භික්ෂුණී ආරාමයකට ගිය ඈ පැවිදි වී සියලු කෙලෙසුන් නසා රහත් තෙරණියක වූවාය. එයද බුදුරදුන්ගේ මහා කරුණාවේ ප්‍රතිඵලයකි.

## ■ කිසාගෝතමීයට පිහිටවීම

සැවැත්නුවර දුගී පවුලක විසූ කිසාගෝතමී නම් කාන්තාවට එක් පුත්‍රයෙක් විය. ඇය එම එකම දරුවාට දැක්වූයේ ඉමහත් සෙනෙහසකි. එහෙත් වූයේ නොසිතූ සිදුවීමකි. එනම් හදිසියේ ඇති වූ රෝගයකින් පුතා මරණයට පත්වීමයි. පුතු මළ බව ඇයට නොසිතුණි. ඈ දරුවා ද රැගෙන දුටු දුටු අයගෙන් බෙහෙත් ඉල්ලමින් තැන තැන ඇවිදින්නට වූවාය. එහෙත් කිසිවෙකුගෙන් පිහිටක් නොලැබිණි.

ඉමහත් ශෝකයෙන් හඬමින් වැළපෙමින් දරුවා රැගෙන ගමන් කරන කිසාගෝතමීයට ඇතැම්හු විහිළු කළහ. නුවණැති පුද්ගලයෙක් "දියණියෙනි, ඔබේ පුතුට බෙහෙත් දියහැකි වෛද්‍යවරයා බුදුරජාණන් වහන්සේය. සැවැත්නුවර ජේතවනාරාමයට ගොස් බෙහෙතක් අසා ගන්නැයි" කීය. බුදුරදුන් වෙතට ගිය ඇයට කිසිවකු නොමළ ගෙදරකින් අබ ටිකක් ගෙන එන ලෙස උන්වහන්සේ වදාළේ සත්‍ය තේරුම් ගැනීමට සැලසීමක් වශයෙනි. ඒ අනුව ඇය අබ ගෙනෙන්නට ගියාය. සෑම ගෙදරකම අබ තිබිණි. එම නිවෙස්වල මිය ගිය ප්‍රමාණය කිව නොහැකි තරම්ය. කිසාගෝතමීයට සත්‍යය වැටහිණි. සෑම අයෙකුම කවර මොහොතක හෝ මියයන බව තේරුම් ගත්තාය. පුතාගේ මළකඳ සොහොනට ගෙන ගොස් දමූ කිසාගෝතමීය බුදුරදුන් වෙත ගොස් "ස්වාමීනී, මට අබවලින් ඵලක් නැත. මට පිහිටවනු මැනවැයි " කීවාය. එහිදී බුදුරදුහු කිසිවෙකුට කිසිවෙකු මරණයෙන් මුදවා ගත නොහැකි බව පෙන්වා දෙමින් ධර්මය දේශනා කළහ. ඇය එම ධර්මය අසා පැවිදි වී රහත් වූවාය.

## ගිලානෝපස්ථානය

උතුම් ලාභය නීරෝගී බවයි. බුදුරජාණන් වහන්සේ කෙලෙසුන්ගෙන් රෝගී වූවන් හා කායික රෝගවලින් පීඩා වූවන් සුවපත් කිරීමට ක්‍රියාකළ සේක. බුදුදහම පිළිපදින්නා රෝගීන්ට උපස්ථාන කරන්නෙකු විය යුතු බව සඳහන්වේ. රෝගීන්ට උපස්ථාන කිරීමෙහි වැදගත්කම දේශනා කළා පමණක් නොව උන්වහන්සේ සියතින්ම ඔවුන්ට උපස්ථාන කළහ.

1. පූතිගත්ත තිස්ස තෙරුන්ට උපස්ථාන කිරීම
2. උදරාබාධයකින් පෙළුණු භික්ෂු නමකට උපස්ථාන කිරීම

සැවැත් නුවර තිස්ස නමින් තෙරනමක් විය. උන් වහන්සේගේ ශරීරය පුරා ගෙඩි සැදී වණ වී ඉතා පිළිකුල් සහගත තත්වයට පත්විය. එනිසා උන් වහන්සේ පූතිගත්ත තිස්ස තෙරුන් නමින් ප්‍රසිද්ධ වූහ. රෝගී තත්වය වැඩිවෙත්ම මුලින් උපස්ථාන කළ භික්ෂූහු එම තෙරුන් හැර ගියහ.

බුදුරජාණන් වහන්සේ උදැසන බුදු ඇසින් ලොව දෙස බලන කල්හි පූතිගත්ත තිස්ස තෙරුන් දක්නට ලැබිණි. බුදුරජාණන් වහන්සේ උන්වහන්සේ වැඩ සිටින ආරාමයේ ගිනිහල් ගෙයට වැඩම කොට ආනන්ද තෙරුන්ගේ ද සහාය ඇතිව සැලියක් සෝදා වතුර උණු කළහ. තිස්ස තෙරුන් ඔසවා ගෙනවිත් ගිනිහල් ගෙයින් තැබූහ. සිවුරු සෝදා වේලෙන්නට සලස්වා තෙරුන්ගේ ශරීරය අතුල්ලමින් නැවූහ. අනතුරුව සිදුකළේ වේළුණු සිවුර පෙරවීමයි. එම අවස්ථාවේ ජීවිතයේ අනිත්‍ය බව පැහැදිලි කරමින් බුදුරදුන් ධර්මය දේශනා කළහ. ඒ අසා පූතිගත්ත තිස්ස තෙරණුවෝ රහත් ඵලයට පත්වී පිරිනිවන්පෑහ.

බුදුරදුන් වැඩසිටි සමයෙහි ආරාමයක උදරාබාධයකින් පෙළුණු භික්ෂූන් වහන්සේ නමක් විසීය. නැගිටගත නොහැකිව මළමූත්‍ර ගොඩෙහිම සිටි උන්වහන්සේට උපස්ථාන කිරීමට කිසිවෙකු ඉදිරිපත් වූයේ නැත. සම්බුදුරජාණන් වහන්සේ විහාර චාරිකාවෙහි යෙදෙන විට එම තෙරුන්ගේ සුවදුක් විචාළහ. එවිට උන් වහන්සේ පැවසුවේ ''මම මීට පෙර කිසිවෙකුට උපස්ථාන කළේ නැහැ. එනිසා මටත් කිසිවෙකු උපස්ථාන කරන්නේ නැහැ." යනුවෙනි. එම අවස්ථාවේ බුදුරජාණන් වහන්සේ ආනන්ද තෙරුන් ලවා වතුර ගෙන්වා ගෙන ඇඟ සෝදා ඇඳක ඔසොවා තැබූහ. භික්ෂූන් ඇමතූ බුදුරජාණන් වහන්සේ "මහණෙනි, ඔබට උපස්ථාන කිරීමට මවෙක් පියෙක් නැත. එනිසා අන්‍යෝන්‍ය වශයෙන් උපස්ථාන හා උදව් උපකාර කරගන්න. ගිලනුන්ට උපස්ථාන කිරීමට හුරුපුරුදු වන්න " යැයි අනුශාසනා කළහ.

**යථාවාදී තථාකාරී බව**

දේශනා කරන ආකාරයට ක්‍රියා කිරීමත් ක්‍රියා කරන ආකාරයට දේශනා කිරීමත් බුදුරදුන්ගේ යථාවාදී තථාකාරී සහ

යථාකාරී තථාවාදී ගුණයයි. අනුන් නොරැවටීම හා දේශනා, එලෙසින්ම ඉටුකිරීම බුදුවරුන්ගේ චරිත ලක්ෂණයයි.

ප්‍රථම ධර්ම දූත පිරිස අමතා ලෝ සතුන්ගේ හිතසුව පිණිස දහම් චාරිකාවේ යෙදෙන ලෙස අනුශාසනා කළ අතර උන්වහන්සේ ද දහම් දෙසීම සඳහා උරුවෙල් දනව්ව බලා වැඩම කළසේක.

අන් අයට මව්පිය උපස්ථානයේ අගය දේශනා කළ බුදුරජාණන් වහන්සේ සුද්ධෝධන රජතුමාට හා මාතෘ දිව්‍ය රාජයාට ධර්ම දේශනා කළේ එම බුදු වදන ක්‍රියාවට නගමිනි.

ගිලානෝපස්ථානයේ වටිනාකම දේශනා කළ උන්වහන්සේ පූතිගත්ත තිස්ස වැනි රෝගී තෙරවරුන්ට සියතින්ම උපස්ථාන කළහ. ඉවසීමේ ගුණයෙහි වැදගත්කම ලොවට පෙන්වා දුන් උන්වහන්සේ දේවදත්ත, අක්කෝස භාරද්වාජ, චිංචාමාණවිකා, මාගන්ධියා ආදී අයගේ නින්දා අපහාස ඉවසූ සේක.

එමෙන්ම උදය බමුණාට වූ පොරොන්දුව අනුව දොළොස්වෙනි වස් කාලය ඉතා දුෂ්කරතා මැද වේරඤ්ජා නුවර ගතකළ සේක.

සෑම බුදු වදනක්ම තමන් වහන්සේ ද අනුගමනය කරමින් ලොවට දුන් ආදර්ශය ඉතා අගනේය. එම බුදු ගුණය දියුණුවට හේතු වේ.

**සහජීවනය**

සහජීවනය යනු සමගියෙන් හා සහයෝගයෙන් එකට ජීවත්වීමයි.

සමවායෝ ඒව සාධු (සමගියම යහපති)
සමග්ගාහෝථ මා විවදථ (සමගිවන්න වාද විවාද නොකරන්න.)
යනුවෙන් බුද්ධ දේශනාවේ සඳහන්වේ.

බුදුරජාණන් වහන්සේ තම ශ්‍රාවකයන් මෙන්ම අන්‍යාගමිකයන් සමඟ ද සුහදත්වයෙන් ක්‍රියාකළ සේක. ජෛන ආගමේ උපාලි ගෘහපතියා බුදුරදුන් සමඟ වාද කිරීමට පැමිණියේය. එහෙත් බුදු බණ ඇසූ පසු පැහැදීමට පත්ව "තෙරුවන් සරණ ගිය උපාසකයෙකු ලෙස සලකන්න" යැයි ඔහු බුදුරදුන්ට ආරාධනා කෙළේය. "ඔබ

බෞද්ධ උපාසකයෙකු වුවත් ඔබේ පැරණි ශාස්තෘවරයාට දැක්වූ ගරු සැලකිලි පුද සත්කාර අඩු නොකරන්න." යැයි බුදුරජාණන් වහන්සේ ඔහුට වදාළහ.

ඇතැම් අවස්ථාවල ජෛන, ආජීවක, පරිබ්‍රාජක යනාදී අන්‍යාගමික ආශ්‍රමවලට වැඩම කොට ඔවුන් සමග ද බුදුරදුන් සුහද සංවාද පවත්වා ඇත. සෝණදණ්ඩ බමුණා සහ සකුළුදායි පරිබ්‍රාජකයා බුදුරදුන්ගේ දේශනා ප්‍රශංසාවට ලක්කොට ඇත.

සමානාත්මතාව

සමානාත්මතාවය යනු සියලු දෙනාටම සමානව සැලකීමයි. ජාති කුල පක්ෂ උස් මිටි කළු සුදු භේද බුදු දහම ප්‍රතික්ෂේප කර ඇත. බුදුරජාණන් වහන්සේ මිනිසා ඇතුළු සියලු සත්වයාටම එක හා සමාන ලෙස මෛත්‍රිය හා කරුණාව දක්වූහ.

වධකේ දේවදත්තම්හි
චෝරේ අංගුලිමාලකේ
ධනපාලේ රාහුලේ චේව
සබ්බත්ථ සම මානසෝ

බුදුරදුන්ට සතුරුකම් කළ දේවදත්තටත් මිනී මරමින් සිටි දරුණු අංගුලිමාලටත් තමන් වහන්සේ නැසීමට ආ ධනපාල හස්තියාටත් පුතු වූ රාහුල කුමරාටත් දැක්වූයේ එක හා සමාන මෛත්‍රිය බව ඉහත ගාථාවෙන් ප්‍රකට වේ. දුප්පත් පොහොසත් උස් පහත් භේද නොසැලකූ උන් වහන්සේ පිඩුසිඟා වැඩියේ ගෙපිළිවෙළිනි. රජ මැඳුරටත් දුගී පැළටත් වැඩම කළ සේක. භික්ෂු භික්ෂුණී උපාසක උපාසිකා යන සිව්වනක් පිරිසට තනතුරු හා වගකීම් පැවරීමේදී උස් පහත් භේද නොසලකා දක්ෂතා අනුව සුදුසුසාට සුදුසු තැන පිරිනැමූ සේක.

ආධ්‍යාත්මික ගුණධර්ම ඉහළින් අගය කළ බුදුරජාණන් වහන්සේ බමුණන් හඳුන්වා දී තිබූ කුල භේදය විවේචනය කළහ. ගංගාවලින් ගලා එන ජලය මුහුදට වැටුණු පසු ලුණු රසයෙන් යුතුවේ. එමෙන්ම

කවර වර්ණයකට කවර ජාතියකට අයත් පිරිසක් වුවද බුදු සසුනේ පැවිදි වූ පසු සියලු දෙනාම ශාක්‍ය පුත්‍රීය ශ්‍රමණ යන නාමයෙන් හඳුන්වා ඇත.

එදා සමාජයේ බමුණු දහම අනුව ඉතා පහත් තත්වයකට කාන්තාව පත් වී සිටියාය. එහෙත් බුදුරජාණන් වහන්සේ ඇයට භික්ෂුණියක, උපාසිකාවක, මවක, බිරිඳක වශයෙන් සමාජයේ ඉහළ ගරුත්වයක් ලබා දුන්හ.

ඉහතින් දක්වා ඇති බුදුරදුන්ගේ අසරණ සරණ ගුණය, ගිලානෝපස්ථානය, යථාවාදී තථාකාරී බව, සමානාත්මතාව, සහජීවනය යන ගුණාංග ආදර්ශයට ගෙන අපි එම ගුණාංගවලින් අපගේ ජීවිතය සාර්ථක කර ගනිමු.

**ක්‍රියාකාරකම්**

1. බුදුරදුන් සරණ වූ අසරණයන් නම් කොට ඉන් තිදෙනෙකුට පිහිට වූ අවස්ථා විස්තර කරන්න.

2. බුදුරදුන් සියතින්ම ගිලනුන්ට උපස්ථාන කොට ඇති අවස්ථා දෙකක් පැහැදිලි කරන්න.

3. යථාවාදී තථාකාරී ගුණය යනු කුමක්දැයි සඳහන් කොට බුදු සිරිතේ එම ගුණය ප්‍රකට වන අවස්ථා ලියන්න.

4. බුදුරදුන් අන්‍යාගමිකයින් සමග සහජීවනයෙන් ක්‍රියා කළ බවට නිදසුන් දෙකක් දක්වන්න.

5. සමානාත්මතාව අනුව බුදුරදුන් ක්‍රියා කොට ඇති අවස්ථා දෙකක් විස්තර කරන්න.

6. බුදුරදුන් අසරණයෙකුට පිහිට වූ අවස්ථාවක් චිත්‍රයට නගන්න.

## පුහුණුවට

රසයෙන් උතුම් කොට ඇති දම් රස මුසුව
බව දුක නසන්නට එයමය ඇති ඔසුව
යහපත් නැණවතා පාපෙට නොම අසුව
දහමෙහි ඇලෙයි ලොව්තුරු බුදු හිමි දෙසුව

## 16. පාඩම

# මතින් මිදී අපිත් මුදවමු අන් අයත්

බුදුරජාණන් වහන්සේ ඉසිපතනාරාමයෙහි වැඩ වෙසෙන සමයෙක දිනක් වැහැරීගිය සිරුර ඇති, වැරහැලි ඇඳගත් දුක්බර මුහුණුවලින් යුත් මහලු යුවලක් එහි පැමිණ සිටිනු දක්නට ලැබිණි. පුරුදු පරිදි ඔවුන් පැමිණියේ භික්ෂූන් වහන්සේලා දානය වළඳා පාත්‍රවලින් ඉවත ලන ඉඳුල් ලබාගෙන කුසගිනි නිවාගනු පිණිස ය. ඒ තරම් අසරණ තත්වයට වැටී සිටියේ කෝටි එකසිය හැටක ධනයක් උරුමව, අලංකාර සිටු මැඳුරක, කසි සළු හැඳ, රන් රිදී අබරණ පැළඳ, සුවපහසු අසුන්වල හිඳ, රසමසවුලෙන් යුත් බොජුන් අනුභව කළ අඹුසැමි යුවලකි. ඔවුන් දෙස බලා බුදුරජාණන් වහන්සේ වදාළේ මුල සිට ම බුද්ධිමත්ව ගිහි ජීවිතය සැලසුම් කර ගත්තේ නම් නගරයේ පළමු පෙළ සිටු පවුලක් වීමටත්, පැවිදි වූයේ නම් මාර්ග ඵල ලාභීන් වීමටත් ඉඩ තිබුණු බවයි. සේසත ම නැති වී මේ තරම් අසරණ භාවයට ඔවුන් පත්වූයේ පුරුෂයා දැඩි ලෙස මත්වතුරට ඇබ්බැහි වූවකු නිසා ය.

සම්පත් විනාශ වීමට බලපාන කරුණු අතර මත්ද්‍රව්‍ය භාවිතය ද එකකැයි දැක්වෙන බුද්ධ දේශනාව සනාථ කෙරෙන කතා පුවතකි ඉහත සඳහන් වූයේ. මත්ද්‍රව්‍ය භාවිතයේ ආදීනව හයක් සිගාලෝවාද සූත්‍රයෙහි සඳහන් වෙයි. ඇස් පනාපිටම සම්පත් විනාශවීම එකක් පමණකි. අනෙක් ඒවා නම් කලකෝලාහල ඇතිවීම, ලෙඩරෝග බහුලවීම, අපකීර්තියට පත්වීම, විලිබිය නැතිවීම සහ නුවණැස දුබලවීම ය. මෙම බුදු වදන අපට කියා දෙන්නේ මත්ද්‍රව්‍ය භාවිතය නිසා ආර්ථික පරිහානිය, සමාජ පරිහානිය, සෞඛ්‍ය පරිහානිය. සදාචාර පරිහානිය හා බුද්ධි පරිහානිය සිදුවන බවයි. අපේ නිත්‍ය සීලය වන පන්සිල්වලට සුරාව ඇතුළු මත් ද්‍රව්‍යයන්ගෙන් වැළකීම ඇතුළත්ව තිබෙන්නේ ඉහත සඳහන් පරිහානීන්ගෙන් වැළකීමේ වගකීම තම තමන් වෙත ම පැවරෙන බැවිනි.

දහම් පොත්වල සුරා, මේරය හා මජ්ජ යන නම්වලින් දැක්වුණු මත්වන දේ අද දියර, පෙති, කරල්, ගුලි, කුඩු, දුම්වැටි ආදී විවිධ පුද්ගලයාට හෝ සමාජයට ස්වරූපයන්ගෙන් සමාජයට පැමිණේ. ඒ කිසිවක් භාවිතයෙන් පුද්ගලයාට හෝ සමාජයට සිදුවන යහපතක් නැත. පරිහානියක්ම ය සිදුවන්නේ. මත් වතුර බී, මත් කුඩු උරා, මත් පෙති, මත් ගුලි ගිලදමා, දුම්වැටි උරා ධනවත් වූවකු, සෞඛ්‍ය සම්පන්න වුවද, කීර්තිමත් වූවකු අපට දැනගන්නට නැත. ඒවා නිසා ධනයෙන් පිරිහුණු, සෞඛ්‍යය පිරිහුණු, චරිතයෙන් පිරිහුණු, නුවණින් පිරිහුණු අය අපි දැක ඇත්තෙමු. එබන්දන් ගැන අසා ඇත්තෙමු.

වෛද්‍යවරුන් පෙන්වා දෙන පරිදි මත් වතුරෙහි ඇති විෂ විශේෂයෙන්ම බලපාන්නේ අක්මාවට හා මොළයට ය. දුබල වූ අක්මාව පළමුව ඉදිමී පසුව අක්‍රීය වේ. ලේ වමනය කර මොළය අක්‍රිය වී සිහි මූර්ඡාවට පත්ව අවසානයේ මරණය සිදුවේ. ජීවත්ව සිටියදීම කල්පනා ශක්තිය දුබලවන්නේ මොළයේ සෛල, මද්‍යසාරය නිසා විනාශ වන බැවිනි. හදවතට ද ආමාශයට ද මත්ද්‍රව්‍යවලින් වන හානිය අතිවිශාලය. ස්නායු හා මාංශ පේශි දුබලවීමට ද මද්‍යසාරය බලපායි. මත්කුඩුවලට ගංජාවලට ගොදුරු වූවෝ මානසිකව ද රෝගී වෙති. දුම්වැටි නිසා පිළිකා රෝගයට ගොදුරුව අපමණ දුක් විඳින්නෝ වෙති.

මනා රූ සපුවකින් යුතුව සිටි තරුණයන් මතට ඇබ්බැහි වීම නිසා වැහැරුණු මුහුණින් හා යටට ගිලුණු ඇසින් ද නහර ඉල්පිණු ගතින් ද යුතුව අතිශය අප්‍රසන්න තත්වයට පත්ව ඇති අයුරු දැකගත හැකිය. ඔවුන්ට එම ස්වභාවය උදාකර වූයේ මත්ද්‍රව්‍යයි. අප ද ඒ-වාට ගොදුරු වුවහොත් අපට අත්වන ඉරණම ද එයම ය. බොහෝ අනතුරුවලට හා අපරාධවලට ද මත් වතුර හේතු වී ඇත.

මිනිසාට සුවිශේෂී මොළයක් ලැබී තිබෙන්නේ අසන දකින සිදුවන දේ ගැන බුද්ධිමත්ව සිතා බැලීමට ය. එබැවින් ඉහත සඳහන් කරුණු ගැන මැනවින් සිතා බලා නව යොවුන් වියේ සිට ම අප කළයුත්තේ සියලුම ආකාරයේ මත්ද්‍රව්‍යවලින් වැළකී සිටීම ය. රස බැලීමට හෝ ඒවා ගත්විට සිදුවන්නේ කුමක්දැයි දැන ගැනීමේ ආශාවෙන් හෝ හුදු විනෝදය පිණිස හෝ මත්වතුර, මත්ද්‍රව්‍යයක්, දුම්වැටියක් කිසි දිනෙක භාවිත නොකිරීමට අප වගබලා ගත යුතුය.

සුරා පානය නොකරන ඇතැම්හු අනුන්ට සුරාවෙන් සංග්‍රහ කරති. ''මා නොබීවාට බොන අයට දෙන්න එපෑ යැ'යි'' සිතීම අනුවණකමේ ලක්ෂණයකි. දුම්වැටියෙන් අනුන්ට සංග්‍රහ කරන්නා මිතුරකු නොව හතුරෙකි. වායු දූෂණයට ද අනුබල දෙන්නකි. තමන්ගේ අතින් නොදුන්නත්, කෙනෙකු මත් වතුර බොන විට, දුම්වැටි උරන විට එහි වරද පෙන්වා නොදී, එයින් වළක්වා ගැනීමට උත්සාහ නොකර, ඔහුගේ ක්‍රියාව අනුමත කිරීම හෝ එයට අනුබල දීම ද නොකළයුත්තකි. එබැවින් බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ මතින් වැළකීමේදී පහත සඳහන් අංශ තුන ගැන ම අවධානය යොමු කළයුතු බව ය.

1. තමන් මත්ද්‍රව්‍ය භාවිත නොකිරීම.
2. අනුන් ලවා භාවිත නොකරවීම.
3. භාවිත කරන්නන්ගේ එම ක්‍රියාව අනුමත නොකිරීම හා ඊට අනුබල නොදීම.

මෙම අංශ තුන තවත් ආකාරයකට ද ඉදිරිපත් කර තිබේ. ඒ මෙසේය.

1. තමන් මතින් වැළකීම.
2. අනුන් මතින් වැළක්වීම.
3. මතින් වැළකීමේ අනුසස් කියාදීම.

මත්ද්‍රව්‍ය නිසා පිරිහෙන මිනිසුන් දැක දැක අපිත් එයට ගොදුරු වන්නෙමුද? තවත් අය ගොදුරු කරවන්නෙමුද? ගොදුරුවන්නන්ට අනුබල දෙන්නෙමුද? නැතහොත් ඔවුන් එයින් මුදා ගැනීමට ක්‍රියාමාර්ග ගන්නෙමුද? මෙම ප්‍රශ්නවලට බුද්ධිමත් පිළිතුරු සපයා ගතයුත්තේ අපම ය.

අපි සත්පුරුෂයන් පමණක් නොවී වඩාත් සත්පුරුෂයන් විය යුතුමෙමු. වැරදි වැඩ නොකිරීම සත්පුරුෂකමකි. අනුන් ද වරදින් ම ගැනීම වඩාත් සත්පුරුෂකමකි. වැරදි වැඩ කිරීම අසත්පුරුෂකමයි අනුන් ද වැරදිවල යෙදවීම සහ ඔවුන්ට අනුග්‍රහ දැක්වීම වඩාත් අසත්පුරුෂකමකි.

මත්ද්‍රව්‍ය නිෂ්පාදනය කරන්නන්ට හා ඒවා ප්‍රවාහනය කරන්නන්ට, බෙදා හරින්නන්ට ආධාර අනුබල දීම ද, ඔවුන්ට නීතියේ රැහැනින් මිදීමට උදව් උපකාර කිරීම ද බලවත් සමාජ අපරාධයක් බව අප තේරුම් ගතයුතු කරුණකි. පුද්ගලයාටත් සමාජයටත් මතින් සිදුවන හානිය හොඳින් හැදිනගෙන ඒවායින් වැළකීමටත් කිසිවකුට ඒවා නොදීමට හා අනුබල නොදීමටත් අදිටන් කර ගනිමු. එසේ ම තමන් මතින් වැළැකී අනුන් ද වළක්වාලන, වැළකීමේ ආනිසංශ ද කියාදෙන සමාජ නියමුවන්වීමට අධිෂ්ඨාන කර ගනිමු.

**ක්‍රියාකාරකම්**

1. මත්ද්‍රව්‍ය භාවිතයේ ආදීනව 5 ක් ලියන්න.
2. මතින් වැළකීමේ ආනිසංශ 2 ක් සටහන් කර එයින් එකක් අගයමින් කෙටි ඡේදයක් ලියන්න.
3. මත්ද්‍රව්‍ය පැතිර යෑම වැළැක්වීමට ඔබට ගත හැකි ක්‍රියාමාර්ග තුනක් හඳුන්වා දෙන්න.

**පුහුණුවට**

මත්වන දෙය කිසිදු විට මම නොගන්නෙමි
අන්කිසිවකු හට ද ඒවා නොදෙන්නෙමි
ගත්තොත් යමකු අනුමත නොමකරන්නෙමි
තුන් අයුරින්ම මම මත පිටු දකින්නෙමි

මම වැළකෙමි සදා මත්වන සියලු දෙයින්
හැකි හැමවිට මුදාලමි අන් අය ද එයින්
ඇති අනුහස කියාදෙමි වැළකුමෙහි මතින්
මෙම පිළිවෙත පුරා මත පිටු දකිමි නිතින්

# 17. පාඩම

## අනුන්ට උපකාර කරමු

දහම් පාසලේ 9 ශ්‍රේණියේ ඉගෙනුම ලබන අප අද දහම් පාසල පැමිණියේ වියළි ආහාර, ඇඳුම් පැලඳුම්, සබන්, බෙහෙත්, ඇඳ ඇතිරිලි, ආදී ද්‍රව්‍ය රැගෙනය. ඒවා රැගෙන ආවේ පසුගිය සතියේ තීරණය කරගත් පරිදි විහාරස්ථානය අසල වූ වැඩිහිටි නිවාසයේ වැඩිහිටියන්ට ලබා දීමටය.

ප්‍රධානාචාර්ය ස්වාමීන් වහන්සේගේ සහ පන්ති භාර ගුරුතුමියගේ උපදෙස් පරිදි සියලු ද්‍රව්‍ය ඇසුරුම් කළේ පන්තියේ අප විසින්මය. අනතුරුව ඒවා රැගෙන ප්‍රධානාචාර්ය ස්වාමීන් වහන්සේත් පන්ති භාර ගුරුතුමියත් තවත් ගුරු පියවරු දෙදෙනෙකු ද සමඟ අපි වැඩිහිටි නිවාසයට ගියෙමු.

එහිදී අපි ගෙවල්, මිදුල් අතපතු ගා පිරිසිදු කළෙමු. අනතුරුව වැඩිහිටියන්ගේ කිළිටි ඇඳුම් පැලඳුම් ලබාගෙන සෝදා අව්වට දැමුවෙමු. එහි වූ බුදු මැදුර අභියස වැඩිහිටියන් ද සමග අපි සියලු දෙනා මල් පහන් පූජා කළෙමු. අප රැගෙන ගිය ද්‍රව්‍ය පරිත්‍යාග කිරීමට පෙර වැඩිහිටියන්ට ප්‍රධානාචාර්ය ස්වාමීන් වහන්සේ අනුශාසනාවක් ද පැවැත්වූහ. එහි සියලු කටයුතු නිමාකොට දහම් පාසලට පැමිණි අපි සිදුකළ උතුම් ක්‍රියාව ගැන ඉමහත් සතුටට පත්වුණෙමු. එවන් පරිත්‍යාගයක් සිදුකළේ පන්සලේ නායක ස්වාමීන් වහන්සේ පසුගිය සතියේ දහම් පාසලේ ශිෂ්‍ය සමිතියේ කළ අනුශාසනාව ඇසීමෙනි. එම අනුශාසනාවේ සාරාංශය මෙසේය.

අනුන්ට උදව් උපකාර කිරීම උතුම් ගුණයකි. බුදු දහමේ එය සඳහන් වන්නේ දානය නමිනි. එය ආකාර දෙකකි.

1. පූජා බුද්ධියෙන් දීම
2. අනුග්‍රහ බුද්ධියෙන් දීම

පූජා බුද්ධියෙන් පරිත්‍යාග කිරීම පින් අපේක්ෂාවෙන් මහා සංඝරත්නයට දන්දීමයි. වැඩිහිටියන්ට, දුගී මගී යාචකයන් ඇතුළු නැතිබැරි පුද්ගලයන්ට කරන පරිත්‍යාගය අනුග්‍රහ බුද්ධියෙන් සිදුකෙරේ.

අප මහා බෝසතාණන් වහන්සේ ද බුදුවීමට පෙර ආත්මවල පටන් දානය නමින් පාරමිතාවක් පිරූහ. පෙරුම් පුරණ සෑම ආත්මයකම පරිත්‍යාගශීලී ගුණයෙන් ක්‍රියාකළ සේක. උන් වහන්සේ මහා සාගරයේ ජලයට වඩා ලේ දන් දුන්හ. මහ පොළොවේ පස්වලට වඩා තම මස් දන් දුන්හ. මහමේරු පර්වතය තරම් හිස් දන් දුන් බව සඳහන් වේ. අහසේ තරුවලටත් වඩා ඇස් දන් දී ඇත. එමෙන්ම තම රාජ්‍යය, දරුවන්, ගෙවල් දොරවල්, ඇඳ පුටු මේස, ආහාර ඇඳුම් පැලඳුම් දන් දී ඇත. බෝසත් සිරිත ආදර්ශයට ගනිමින් ලෝභය, ද්වේෂය, මෝහය යන අකුසල චේතනා දුරුකොට අලෝභය (පරිත්‍යාගය) අද්වේෂය (මෛත්‍රිය) අමෝහය (නුවණ) යන කුසල් චේතනා මුල්කර ගනිමින් දන් දීමට හා අනුන්ට පරිත්‍යාග කිරීමට අපි පුරුදු වෙමු.

මෙලොව ජීවත්වන අප කවුරු තුළත් ලෝභය, ද්වේෂය මෝහය ඇත. එම නිසා අනුන්ට යමක් දීමට කැමති නැත. බුදුරදුන්ගේ ධර්මය තේරුම්ගත් කල්හි ලෝභය දුරුවී පරිත්‍යාග චේතනා ඇතිවේ. ද්වේෂය නැති වී මෛත්‍රී සහගත සිතුවිලි පහළ වේ. අනුවණකම් දුරු වී නුවණ වර්ධනය වෙයි. හාමුදුරුවන්ට අපි පින් සලකාගෙන යම් යම් දේවල් පූජා කරන්නෙමු. එහෙත් සමාජයේ ජීවත්වන නැති බැරි අසරණයන්ට ආහාර පාන ඇඳුම් පැලඳුම් මිල මුදල් බෙහෙත් වර්ග පොත්පත් ලබාදෙන්නේ ඔවුන්ට අනුග්‍රහයක් ලෙසය. දෙන පුද්ගලයාටත් ලබා ගන්නා පුද්ගලයාටත් සිතේ සතුට ඇතිවෙයි. අනුන්ට උපකාර නොකරන පුද්ගලයා තුළ ඇත්තේ ද්වේෂය හා මෝහයයි. ඉන් ඔහු මානසිකව පීඩා විඳියි. ලෝභය ඇතැම්විට එම ධනය සොර සතුරන්ගෙන් හා ගිනි ගැනීම් ජල ගැලීම් ආදි ස්වාභාවික විපත් නිසා විනාශයට පත්විය හැකිය.

දත්වාච භුත්වාච යථානුභාවං
අනින්දිතෝ සග්ගමුපේති ඨානං

තම වස්තුව පරිභෝජනය කිරීම හා අනුන්ට දීම කළ යුතුය. එබඳු තැනැත්තා අනුන්ගේ නින්දාවට ලක් නොවෙයි. ප්‍රශංසාවට ලක්වෙයි. දෙව්ලොව උපදියි. යනුවෙන් බුද්ධ දේශනාවේ සඳහන් වේ.

අනුන්ට අගහිඟකමක් ඇති වූ විට උපකාර කරන්නා සත්පුරුෂයෙකි. රෝගීන්ට බෙහෙත් ලබාදීම, ලේ අවශ්‍ය අයෙකුට ලේ පරිත්‍යාග කිරීම, වකුගඩු ආබාධ අයට වකුගඩු ලබාදීම, හදිසි සැත්කමක් කිරීමේදී මුදලින් ආධාර කිරීම, පාරමාරු වීමට නොහැකිව සිටින වැඩිහිටියකුට පාර මාරුවීමට උදව් කිරීම, බස් රියේදී, දුම්රියේදී හාමුදුරුනමකට, ආබාධිතයෙකුට හෝ ගැබිනි මාතාවකට අසුන පරිත්‍යාග කිරීම උතුම් මානුෂික ගුණාංගයන්ය.

අපට අනුන්ට උදව් උපකාර කිරීමට සිදුවන අවස්ථා,

1. දුප්පත් හා අසරණ අයට උදව් උපකාර කිරීම.
2. මාපිය දූදරු නෑයන්ට පිහිටවීම.
3. අසල්වැසියන්ට උපකාර කිරීම.
4. විපත් වූවන්ට පිහිට වීම.
5. පොදු කටයුතුවල දී උදව් කිරීම.

**1. දුප්පත් හා අසරණ අයට උදව් උපකාර කිරීම.**

දුප්පත් අය යනු නොයෙක් අගහිඟකම් ඇතිව ජීවත්වන පිරිස්ය. ඔවුහු විවිධ දුෂ්කරතා මධ්‍යයේ ජීවත් වෙති. මග තොට බස්රිය දුම්රිය ආදී විවිධ ස්ථානවල ද එබඳු පිරිස් සිටිනු දැකිය හැකිය. ඔවුන් අසරණ තත්වයට පත්වූ අයුරු අප හමුවට පැමිණ ප්‍රකාශ කරති. එවිට අප සතු මුදලක් හෝ ආහාර ටිකක් දීම උතුම් ගුණයකි. අප නිවෙස්වලට ද යාචකයන් පැමිණ මුදල් හෝ ආහාර පාන ඉල්ලා සිටින අවස්ථා තිබේ. එහිදී ආහාර ටිකක් හෝ මුදලක් දීම සඳහා අපි සිත යොමු කරමු.

වැඩිහිටි නිවාස, ළමා නිවාස ආදියේ සිටින්නේ කිසිවකුගෙන් හවහරණක් නැති පිරිසකි. එමෙන්ම නියගය, ගංවතුර, සුනාමි ආදි

ස්වාභාවික විපත්වලින් ද රෝගාතුරවීමෙන් ද සොර සතුරන්ගේ ග්‍රහණයට ලක්වීමෙන් ද දිළිඳු බවට පත්වේ. ඔවුනට ආහාරපාන, ඇඳුම් පැලඳුම්, මිල මුදල් ගෘහ භාණ්ඩ ආදියෙන් උපකාර කිරීම මෙන්ම නිවාස නැති පවුල්වලට නිවාස ඉදිකරදීම ද උසස් මනුෂ්‍ය ගුණාංගයකි.

2. මාපිය දූදරු නෑයන්ට පිහිටවීම.

අප හදාවඩාගත් මව්පියන්ට උපකාර කිරීම උතුම් සත්පුරුෂ ගුණාංගයකි. ඔවුහු වයසට ගිය පසු අසරණවෙති. ආහාර පාන ඇඳුම් පැලඳුම් මිල මුදල් නිවාස පහසුකම් සලසා දීම අවශ්‍යය. එමෙන්ම නෑවීම, ආහාර කවා පොවා උපස්ථාන කිරීම ද දරුවන් කළයුතු කාර්යයන්ය. එලෙස දෙමව්පියන්ට අප උදව් උපකාර කරනුයේ කළගුණ සැලකීමක් හා යුතුකමක් ලෙසිනි. දෙමව්පියන් දරුවන් බිහිකළ දා පටන් කරන උදව් උපකාර හා යුතුකම් රාශියකි. ඔවුන්ට කළගුණ දක්වා උදව් උපකාර කිරීම දරුවන්ගේ යුතුකමකි.

තම ඤාතීන්ගේ නිවෙස්වල පැවැත්වෙන උත්සව පිංකම් ආදියට සහභාගිවීම ද අත්‍යාවශ්‍ය වූ විටෙක මිල මුදල් හා උපකරණවලින් උදව් කිරීම, ශ්‍රමයෙන් උදව් කිරීම ද සත්පුරුෂ යුතුකමකි.

3. අසල්වැසියන්ට උපකාර කිරීම.

අසල්වැසියන් යනු අප අවට නිවෙස්වල සිටින පිරිස්ය. දුකේදීත් සැපේදීත් අප ළග සිටිනුයේ ඔවුන්ය. එම නිසා ඔවුන් සමග සුහදත්වය වර්ධනය කර ගැනීම ඉතා වැදගත්ය. අපට විපතක් ගැටලුවක් වූ විට ඔවුන්ගේ සහයෝගය අවශ්‍ය වේ. ඔවුන්ගේ නිවෙස්වල පැවැත්වෙන උත්සවවලට සහභාගිවීම සහ ඒවා සංවිධානය කර ගැනීමට සහයෝගය දීම අපේ යුතුකමකි. ඔවුන්ට විපතක් වූ විටෙක එහි ගොස් අවශ්‍ය උපකාර කළ යුතුය. අසල්වැසියන්ට ස්වාභාවික විපත්, ලෙඩරෝග, මුදල් අගහිඟකම් ඇති වන අවස්ථා ඇත. එවිට ඔවුන්ට උපකාර කිරීමට නොපැකිළිව ඉදිරිපත් වීමෙන් අසල්වැසියන් සමඟ සුහදත්වය වර්ධනය වේ. අපට විපත් සිදු වූ අවස්ථාවලදී ද ඔවුන්ගේ

උදව් උපකාර නොඅඩුව ලැබීමට අප කරන උපකාර හේතුවේ.

**4. විපත් වූවන්ට පිහිටවීම.**

විපත් කවර මොහොතේ සිදුවේදැයි කිව නොහැකිය. ස්වාභාවික විපත් මෙන්ම අපගේ නොසැලකිල්ල නිසා ද විපත් සිදුවේ. ජලයෙන් ගින්නෙන් සොර සතුරන්ගෙන් උපද්‍රව පැමිණිය හැකිය. ගංවතුර විපත්, සුනාමි විපත්, නායයෑම්, ගිනි ගැනීම් ආදිය නිසා මිනිසුන්ට ඉමහත් විපත් සිදුවෙයි. එවන් අවස්ථාවලදී අප ඔවුන්ගේ අවශ්‍යතා සොයා බලා උපකාර කිරීම ඉතා වැදගත් මානව ගුණාංගයකි. රිය අනතුරු, පැහැර ගෙනයෑම්, මුදල් වංචා කිරීම්, ලෙඩ රෝගවලට ලක්වීම් නිසා නෑයන් හිතමිතුරන් අසල්වැසියන් හා වෙනත් පුද්ගලයන් පීඩා විඳින අවස්ථාවලදී මිල මුදල්වලින් ශ්‍රමයෙන් හෝ විවිධ උපකරණ ලබාදීමෙන් සහාය විය හැකිය.

ලේ දන්දීම, වකුගඩු පරිත්‍යාග කිරීම, යම් හේතුන් නිසා දෑත් දෙපා අහිමි වූවන්ට රෝද පුටු , කිහිලිකරු ලබාදීම ය. වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීමේදී ඔවුන්ට මුදල් පරිත්‍යාග කිරීම උතුම් ක්‍රියාවන්ය. අසල්වැසි නිවෙසක හෝ දුපත් නිවසක සිදුවන මරණයකදී ශ්‍රමයෙන් මෙන්ම මිල මුදලින් ද උපකාර කළ හැකිය. විපතේ දී උපකාර කිරීම උතුම් මානුෂීය ගුණාංගයක් බව බුදුරදුන් දේශනා කොට ඇත.

**5. පොදු කටයුතුවලදී උදව් කිරීම.**

පොදු කටයුතු යනු සියලු දෙනා එක්ව සාමූහිකව සිදුකරන ක්‍රියාවන්ය. ළිං පොකුණු වැව් පාලම් මංමාවත් සකස් කරදීම සඳහා ගමේ සියලු දෙනා එක්ව ශ්‍රමදාන සිදුකරන අවස්ථාවේදි අප ද ඊට සහාය දැක්විය යුතුය. එය අන්‍යෝන්‍ය සුහදතාව වර්ධනය වීමට ද හේතුවේ. ගමේ සියලු දෙනා එක්ව දුප්පත් පවුලකට නිවසක් ඉදිකරදීම, ගමේ පන්සලේ පැවැත්වෙන ආගමික සාමාජික උත්සව වලදී ඊට සහභාගිවීම සහ උපකාර කිරීම, ගමේ පැවැත්වෙන සුභසාධක සංගම් මරණාධාර සමිති වැඩිහිටි සමිති යෞවන සමිති ළමා සමාජ ආදිය සඳහා අපගෙන් ඉටුවිය යුතු යම් උපකාරයක්

ඇත්නම් එයට සහාය දැක්වීම උතුම් ගුණාංගයකි.

**ක්‍රියාකාරකම්**

1. දන්දීමේ ප්‍රභේද දෙක නම් කරන්න.
2. බෝසතුන් පෙර භවයන්හිදී අනුන්ට උපකාර කර ඇති අයුරු නිදසුන් දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න.
3. අප අනුන්ට උපකාර කළ යුත්තේ කුමන සිතුවිලි මූල්කර ගෙනද?
4. පහත සඳහන් මාතෘකා යටතේ අනුන්ට කළ හැකි උපකාර 4 බැගින් ලියන්න.

   දුප්පත් හා අසරණ අයට උපකාර කිරීම.
   මව්පියන්ට හා නෑයන්ට පිහිටවීම.
   අසල්වැසියන්ට උපකාර කිරීම.
   විපත් වූවන්ට පිහිටවීම.
   පොදු කටයුතුවල දී උපකාර කිරීම

5. ඔබ මීට පෙර අනුන්ට උපකාර කර ඇති අවස්ථා දෙකක් විස්තර කරන්න.

**පැවරුම**

ඔබේ පන්තිභාර ගුරුතුමා / ගුරුතුමිය සමඟ සාකච්ඡා කර අනුන්ට උපකාර කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කොට වාර්තාවක් සකසා දහම් පාසලේ ප්‍රධානාචාර්ය ස්වාමීන් වහන්සේට ලබා දෙන්න.

**පුහුණුවට**

නැණ නැති දනා සම්පත් රැස් කර ගනිති
නැණ ඇති දනා සම්පත් හැමටම බෙදති
නැණ ගුණ විහිදුවා කෙලෙසුන් සුන් කරති
නැණ ගුණ පුබුදුවා සිත සුවපත් කෙරෙති

## 18. පාඩම

# මෙත් සුතුරෙන් ගුණදම් තුනක්

දහම් පාසලේ 9 ශ්‍රේණියේ ඉගෙනුම ලබන අපි පසුගිය පුර පසළොස්වක පෝයදා පන්සලේ සිල් සමාදන් වුණෙමු. එදින උදෑසන ධර්ම සාකච්ඡාවට නියමිත කාලය උදාවිය. ඒ සඳහා බෝමළුවට ගිය අපි සුදු වැලි තලාව මත හිඳගත්තෙමු. රාහුල හාමුදුරුවෝ එතැනට වැඩම කොට ධර්ම සාකච්ඡාව ආරම්භ කළහ.

''ඔය පුංචි උපාසක උපාසිකාවෝ දන්නවද කරණීයමෙත්ත සූත්‍රය ගැන?"

''එහෙමයි හාමුදුරුවන්නේ, ඒ සූත්‍රය අපට කට පාඩම්. අපි හැමදාම ගෙදර බුදුන් වඳින වෙලාවට කියනවා."

''හොඳයි, ඒ සූත්‍රයේ පුද්ගලයාගේ චරිතය දියුණුකර ගැනීමට හේතුවන ගුණධර්ම පහළොවක් තියෙනවා. ඒ ගැන අහලා තියෙනවද?"

"හාමුදුරුවනේ අපි දහම් පාසලේ 6, 7, 8 පන්ති වලදී මුල් දොළහ ගැන ඉගෙනගෙන තියෙනවා."

''එහෙනම් ඉතිරි ගුණධර්ම තුන ගැන අද අපි සාකච්ඡා කරමු. ඒ ගුණ ධර්ම මෙහෙමයි."

- අප්පගබ්භ - නැන්පත් ගතිපැවතුම්වලින් යුක්තවීම.
- කුලේසු අනනුගිද්ධ - කුලයන් කෙරෙහි ඇලුම් නොකිරීම.
- න ච ඛුද්දං සමාචරේ කිඤ්චි යේන විඤ්ඤූ පරේ උපවදෙය්‍යුං
  - නුවණැත්තන් දොස් කියන වරදක් නොකරන්නෙකුවීම.

**1. අප්පගබ්භ** - ප්‍රගල්භභාවයෙන් හෙවත් ගොරෝසු ගතිපැවතුම් වලින් තොරවීමයි.

අනුන්ට හිරිහැර නොවන ලෙස තමන්ගේ කායික හා මානසික පැවතුම් පවත්වා ගැනීම මින් අදහස් කෙරේ.

දෙමව්පියන්, ගුරුවරුන්, වැඩිහිටියන්, මිතුරන් ආදි කවර කෙනෙකු ඉදිරියේ වුවද සංවරව හැසිරීම යහපත් ගුණයකි. වෙනත් පුද්ගලයන් සිටින ස්ථානයක ගමන් කිරීමේදීත් ඔවුන් සමඟ වැඩ කිරීමේදීත් අපගේ අත් පා හා ශරීරය ඔවුන්ට හිරිහැරයක් නොවන ලෙස තබාගත යුතුය. හැමවිටකම අපගේ කථා බහ, කරන වැඩ, ගමන් බිමන්, හැසිරෙන ආකාරය ආදියෙන් අන් අය අපහසුතාවට පත්නොවන්නේ නම් එසේ එයින් අන්‍යෝන්‍ය සුහදතාව ගොඩනැගේ.

2. කුලේන්සු අනනුගිද්ධ -
කුලයන් කෙරෙහි ඇලුම් නොකිරීම මින් අදහස් වේ. මෙහි කුලයන් යනුවෙන් අදහස් වන්නේ දායක පවුල්ය. මේ ගුණය විශේෂයෙන්ම භික්ෂූන් වහන්සේ උදෙසා දේශනා කරන ලද්දකි. භික්ෂූන් වහන්සේට මෙන්ම අපට ද එම ගුණයෙන් යුතුව ක්‍රියා කිරීමෙන් යහපත උදාකර ගත හැක. යම් තැනකට ගොස් තම අවශ්‍යතාව ඉටුකරගෙන එහි ඇලී ගැලී නොසිට ආපසු පැමිණීමෙන් අනවශ්‍ය කරදරවලට මැදිහත්වීමෙන් වැළකීමට හැකියාව ලැබේ.

3. න ච ඛුද්දං සමාචරේ කිඤ්චි යේන විඤ්ඤූ පරේ උපවදෙය්‍යුං -
නුවණැති පුද්ගලයන් විසින් දොස් කීමට හේතුවන කිසිදු වරදක් නොකළ යුතු බව

වැරැද්ද කුමක් වුවද අපට දඬුවම් විඳීමටත් නින්දා අපහාස ලැබීමටත් එය හේතු විය හැකිය. මුලින් කුඩා වැරදි සිදුකරන පුද්ගලයා පසුව මහ වැරදි කිරීමට පෙළඹෙනු ඇත. එමගින් නීතියෙන් දඬුවම් ලබා බන්ධනාගාර ගත වීමට ද ඉඩ තිබේ. එනිසා කුඩා වැරැද්දක් හෝ නොකිරීමට ළමා වියේ සිට අදිටන් කරගැනීම අවශ්‍යය.

ඉහත ගුණාංග තුන අනුව ක්‍රියා කිරීමෙන් අපට යහපත් ප්‍රතිඵල ලැබේ. අන් අයගේ ප්‍රශංසාවට ලක්වේ. එම ගුණ අනුව ක්‍රියා කොට ජීවිතය ආලෝකවත් කර ගැනීමට අපි උත්සාහ කරමු.

## ක්‍රියාකාරකම්

1. කරණීය මෙත්ත සූත්‍රයේ පුද්ගල චරිතය දියුණු කර ගැනීමට අදාළ ගුණාංග කීයක් සඳහන්වේ ද?
2. මෙම පාඩමෙහිදී ඉගෙනගත් ගුණාංග තුන නම් කර විස්තර කරන්න.
3. දී ඇති උදාහරණ සැලකිල්ලට ගෙන තවත් කරුණු දෙක බැගින් ලියා වගුව සම්පූර්ණ කරන්න.

| | අප්පගබ්භ | කුලේසු අනනුගිද්ධ | න ච ඛුද්දං සමාචරේ කිඤ්චියේන විඤ්ඤූ පරේ උපවදෙය්‍යුං |
|---|---|---|---|
| 1 | වැඩිහිටියන් ඉදිරියේ පාදයක් මත පාදයක් දමාගෙන නොසිටීම. | මිතුරකුගේ ගෙදර පැය ගණනක් නිකරුණේ කතා කරමින් නොසිටීම. | සතුන්ට හිංසා නොකිරීම. |
| 2 | ................................ ................................ | ................................ ................................ | ................................ ................................ |
| 3 | ................................ ................................ | ................................ ................................ | ................................ ................................ |

## 19. පාඩම

## පටිච්ච සමුප්පාදය

බුදු දහමේ මූලික ඉගැන්වීම පටිච්ච සමුප්පාදයයි. බුදුරජාණන් වහන්සේ බුද්ධත්වයෙන් පළමු සතියේ දී අනුලෝම පටිලෝම වශයෙන් මෙය මෙනෙහි කළ බව සඳහන් වේ. බුදුවරයෙකු ලොව පහළ වූවත් නැතත් පටිච්ච සමුප්පාද ධර්මය ලොව පවතී. එය සදාතනික ධර්මතාවකි. බුදුවරු මෙය අවබෝධ කරගෙන සමාජයට ඉදිරිපත් කරති.

පටිච්ච සමුප්පාදය යනු හේතුඵල දහමයි. මේ පිළිබඳ බුදුරදුන් ලොව පහළ වීමට පෙර සිටම විවිධ මත පැවතුණි. ඒ පිළිබඳ නිවැරදි ඉගැන්වීමක් සිදු කළේ බුදුරජාණන් වහන්සේය. ලොව පැවැත්ම සිදු වන්නේ අන්‍යෝන්‍ය සබඳතාවන් අනුවයි. එක් දෙයක් ඇතිවීමට තවත් හේතු කිහිපයක් බලපායි. සෑම පුද්ගලයෙකුටම, වස්තුවකටම, සිද්ධියකටම හට ගැනීමට හා පැවැත්මට හේතු රාශියක් බලපා ඇත. තනි හේතුවකින් හෝ එක් ක්‍රියාවකින් පමණක් ලොව කිසිවක් නොපවතී. **පටිච්ච සමුප්පාදයෙන් පැහැදිලි වන්නේ හේතු රාශියක් තුළින් ලොව පුද්ගලයා සහ වස්තු හට ගැනීමත් පැවැත්මත් සිදුවන බවයි.**

පහත සඳහන් සරල නිදසුන් දෙස බලමු.

1. ගස
2. දක්ෂ ළමයා
3. අදක්ෂ ළමයා

ගසක් හට ගනුයේ බීජ, පස, ජලය, පොහොර, හිරු එළිය යන සාධක හේතුවීමෙනි. දක්ෂ සිදුවෙකු ඇතිවීමට හේතු සාධක වන්නේ ගුරුවරුන්ට කීකරුබව, ගුරු උපදෙස් පිළිපැදීම, උනන්දුව, විෂය වැඩ අතපසු නොකර සිදුකිරීම, යන කරුණුය. අලසකම, ගුරුවරුන්ට අකීකරුකම, විෂය වැඩ අතපසු කිරීම, ගුරු උපදෙස් නොපිළිපැදීම යන හේතු නිසා පන්තියක අදක්ෂ ළමයෙක් බිහිවේ.

බුදු දහමේ පටිච්ච සමුප්පාදය මගින් යමක් හට ගැනීමට හා පැවැත්මට හේතු රාශියක් බලපාන බව දැක්වේ. එමෙන්ම හේතු නැති කිරීමෙන් ඵල හට නොගන්නා බව ද දක්වා ඇත. පටිච්ච සමුප්පාද න්‍යාය කෙටියෙන් මෙසේ ය.

ඉමස්මිං සති ඉදං හෝති.
(මෙය ඇති කල්හි මෙය වේ.)

ඉමස්ස උප්පාද ඉදං උප්පජ්ජති
(මෙය ඉපදීමෙන් මෙය උපදී)

ඉමස්මිං අසති ඉදං නහෝති
(මෙය නැති කල්හි මෙය නොවේ.)

ඉමස්ස නිරෝධා ඉදං නිරුජ්ඣති
(මෙය නැති වීමෙන් මෙය නිරුද්ධවේ.)

ඒ අනුව ඕනෑම ඵලයක් හට ගැනීමට හේතු රාශියක් බලපාන බවත් හේතු නැති කල ඵල හට ගැනීමක් සිදු නොවන බවත් පැහැදිලිය. එය සංකේත මගින් පහත අයුරින් වටහා ගනිමු.

| | | | |
|---|---|---|---|
| A | ඇති කල්හි | B | වෙයි |
| A | ඉපදීමෙන් | B | උපදී |
| A | නැති කල්හී | B | නොවේ |
| A | නිරුද්ධ වීමෙන් | B | නිරුද්ධ වෙයි |

නිදසුනක් ලෙස අපි A බීජයක් යැයි ගනිමු. B යනු පැළයක් යැයි ද සිතමු. ඒ අනුව B හටගනුයේ A නිසාය. A නැත්නම් B ඇති නොවේ. සෑම සිදුවීමකටම හේතු තිබේ. එමෙන් ම ප්‍රතිඵලවලට ද හේතු තිබේ. බුදු දහම පුරාම ඇත්තේ ගැටලු හා ප්‍රතිඵල වලට හේතු පැහැදිලි කිරීමකි.

උපතිස්ස පරිබ්‍රාජකයා අස්සජි තෙරුන් වෙත ගොස් බුදු දහම යනු කුමක්දැයි විමසීය. එවිට අස්සජි හිමියෝ,
යේ ධම්මා හේතුප්පභවා - තේසං හේතුං තථාගතෝ ආහ
තේසං ච යෝ නිරෝධෝ - ඒවං වාදී මහා සමණෝ

යන ගාථාව දේශනා කළහ. එහි අර්ථය වන්නේ හේතුවකින් හටගන්නා යම් ඵලයක් වේද එම හේතුවත් ඒවායේ පැවැත්මත් බුදුරදුන් දේශනා කරන බවයි.

බුදු දහමේ පටිච්ච සමුප්පාද ධර්මතාව තුළින්,

1. පුද්ගල සන්තානගත දුක
2. සමාජගත දුක

යන දෙඅංශය විග්‍රහ කොට ඇත. බුදු දහම ගැඹුරු ලෙස දක්වා ඇත්තේ පුද්ගල සන්තානගත දුකට හේතු විග්‍රහ කිරීමයි.

සම්බුදුරදුන් සම්බුද්ධත්වයට පත්වී පළමු සතියේදී බෝධිමූලයේ වැඩ සිටිමින් පටිච්ච සමුප්පාදය මුල සිට අගටත් අග සිට මුලටත් මෙනෙහි කළසේක. එය පුද්ගල සන්තානගත දුක විග්‍රහ කරන ද්වාදසාකාර හෙවත් අංග දොළහකින් යුතු පටිච්ච සමුප්පාදයි. ඒ අනුව සංසාර පැවැත්මට මූලිකම හේතුව අවිද්‍යාව හෙවත් චතුරාර්ය සත්‍ය නොදැනීමයි.

| | | |
|---|---|---|
| 1. | අවිජ්ජා | - චතුරාර්ය සත්‍යය පිළිබඳ නොදැනීම |
| 2. | සංඛාර | - තිදොරින් කරන පිං පව් |
| 3. | විඤ්ඤාණ | - මව් කුස තුළ පිළිසිඳ ගන්නා සිත |
| 4. | නාම රූප | - රූප, සහ වේදනා, සඤ්ඤා, චේතනා, ඵස්ස, මනසිකාර යන චෛතසික |
| 5. | සළායතන | - ඇස, කන, නාසය, දිව, කය සහ මන යන ආයතන සය |
| 6. | ඵස්ස | - ඉහත ආයතන හයට රූප, ශබ්ද, ගන්ධ, රස, පොට්ඨබ්බ, ධර්ම යන අරමුණුත් ඒ සමගම ඇතිවන විඤ්ඤාණයත් එකට හැපීමයි |
| 7. | වේදනා | - පය තුළින් ඇතිවෙන සැප, දුක හෝ මධ්‍යස්ථ වේදනා |
| 8. | තණ්හා | - විඳීම (වේදනා) නිසා රූපාදියට ඇලුම් කිරීමය. |

9. උපාදාන - තණ්හාව හේතුවෙන් ඇතිවන දැඩිව අල්ලා ගැනීම
10. භව - උපාදානය නිසා කරන කර්ම හේතුවෙන් භවයකට වෙන්වීම
11. ජාති - කර්ම නිසා මිනිස්, තිරිසන්, දේව ආදි වශයෙන් ලබන උපත
12. ජරා මරණ - උපත ලැබීම හේතුවෙන් වයසට යාම ලෙඩවීම මරණය ආදි දුක් ඇතිවීම

මේ අනුලෝම වශයෙන් දැක්වීමයි. එකක නැතිවීමෙන් අනෙකක් නැතිවීම දැක්වෙන ක්‍රමය පටිලෝම පටිච්ච සමුප්පාදයයි.

**ක්‍රියාකාරකම්**

1. පටිච්ච පමුපාදයෙන් පැහැදිලි වන්නේ කුමක් ගැනද?
2. පටිච්ච සමුප්පාදයේ අංග 12 නම් කර තේරුම් ලියන්න.
3. බුදුරදුන් පටිච්ච සමුප්පාදය මෙනෙහි කළේ කුමන සතියේද?
4. පුද්ගල සන්තාන දුකට මූලික හේතුව කුමක්ද?
5. පච්ච සමුප්පාදය ඉගෙනීමේ ඇති ප්‍රයෝජන 4 ක් සඳහන් කරන්න.
6. පටිච්ච සමුප්පාද චක්‍රය ඇඳ සත්වයා සසර ගමන් කරන අයුරු පැහැදිලි කරන්න.

**පුහුණුවට**

යේ ධම්මා හේතුප්පභවා
තේසං හේතුං තථාගතෝ ආහ
තේසංච යෝ නිරෝධෝ
ඒවං වාදි මහා සමණෝ

## 20. පාඩම

# භාවනාවේ ප්‍රභේද හා බෞද්ධ භාවනාවේ සුවිශේෂත්වය

වෙනදා මෙන් එදින ද වංගීස හිමියන් අනඳ තෙරුන් වහන්සේ සමඟ පිඬුසිඟා වැඩියේ සැවැත් නුවරය. අලුත පැවිදි වූ වංගීස හිමියන්ගේ සිත් ස්ත්‍රී අරමුණක් නිසා රාගයට බරවිය. රාග ගින්නෙන් සිත දැවෙන්නට විය. වහා සිහිය උපදවා ගත් ඒ හිමියෝ අනඳ තෙරුන් ඇමතුහ. "මා කාමරාගයෙන් දැවෙනව ස්වාමීනි, මගේ සිත දැවෙනව. එය නිවාගන්නට මට උදව් වෙන්න ස්වාමීනි" යි කීහ. වංගීස හිමියනි, තම සිතට නැගුණු ස්ත්‍රී අරමුණ සුන්දරයි. ශුභයි. කියලා ඔබ සිහිකළා. ඒකයි ඔබේ සිත රාගයෙන් ගිනිගත්තෙ. වහාම ඒ අරමුණ පිළිකුල් වශයෙන් අශුභ වශයෙන් සිහිකරන්න. අශුභ වශයෙන් සිත වඩන්න " යනුවෙන් අනඳ හිමියෝ වදාළහ.

පිඬුසිඟා වඩිද්දීම ඒ හිමියෝ අශුභ භාවනාවට සිත යොමුකළහ. අශුභ අරමුණක සිත වැඩි දියුණු කළහ. පුදුමයකි, රාගයෙන් ගිනිගත් වංගීස හිමියන්ගේ සිත ඒ දහම් අමා වතුරෙන් නිවී සැනසුණි. ඒ අමාවතුර නම් භාවනාව අනුගමනය කිරීම යි.

භාවනාව යනු වැඩීමය. දියුණු කිරීමය. වංගීස හිමියන් මෙන් අශුභ ආදි කුසල අරමුණක සිත වැඩිදියුණු කරගැනීමය.

### භාවනාවේ ප්‍රභේද

සමථ, විපස්සනා යනුවෙන් භාවනාවේ ප්‍රධාන ප්‍රභේද දෙකකි. සමථ භාවනාවට චිත්ත භාවනා, සමාධි භාවනා යන නම් ද යෙදේ. කාමච්ඡන්දාදී නිවරණ පහ තාවකාලිකව සංසිඳුවන හා සමථයට පත්කරන බැවින් "සමථ භාවනා" යන නම යොදනු ලැබේ. විපස්සනාව නම් විශේෂ දැකීමයි. එනම් අනිත්‍ය, දුක්ඛ, අනාත්ම වශයෙන් දැකීම ය. එසේ දැකීමෙන් ප්‍රඥාව දියුණුවන නිසා එයට ප්‍රඥා භාවනාව යයි කියනු ලැබේ.

## සමථ භාවනා

සමථ භාවනාව වැඩීමෙන් ධ්‍යාන උපදවා ගත හැකිය. ප්‍රථම ධ්‍යානය, ද්විතීය ධ්‍යානය, තෘතීය ධ්‍යානය, චතුර්ථ ධ්‍යානය යනුවෙන් රූපාවචර ධ්‍යාන හතරකි. ආකාසානඤ්චායතන විඤ්ඤාණඤ්චායතනය, ආකිඤ්චඤ්ඤායතනය, නේව සඤ්ඤා නාසඤ්ඤායතනය යනුවෙන් අරූපාවචර ධ්‍යාන හතරකි. රූපාවචර ධ්‍යාන හතරත් අරූපාවචර ධ්‍යාන හතරත් යන අට හඳුන්වන්නේ අෂ්ට සමාපත්ති හෙවත් අටසමවත් යනුවෙනි.

සුමේධ තාපසතුමාට නියත විවරණ දී වදාළ දීපංකර බුදුරජාණන් වහන්සේ හමුවන විට එතුමා පංච අභිඥා අෂ්ට සමාපත්ති උපදවා ගෙන සිටියේය. සිදුහත් අප මහ බෝසතාණන් වහන්සේ මහාභිනිෂ්ක්‍රමණය කළ පසු නිවන් සොයමින් කිං කුසල ගවේසීව ආළාර කාලාම තවුසාණන් වෙත වැඩම කොට ආකිඤ්චඤ්ඤායතනය උපදවා ගත්හ. එම ධ්‍යානයෙන් නොපිරිහී මිය ගිය හොත් බඹලොව උපදී, උපන්නොත් පසුව මරණය ද උරුම වෙයි. ජාති, මරණ ඇති තැන මා සොයන නිවන නැත. මෙසේ සිත උන්වහන්සේ එතැනින් ඉවත්ව උද්දකරාම පුත්ත තවුසාණන් වෙතට වැඩම කළහ. එහිදි උපදෙස් ලබා නේව සඤ්ඤා නාසඤ්ඤායතන ධ්‍යානය උපදවා ගත්හ. එයින් ද ජාති මරණ නිම නොවන බව තේරුම් ගෙන එතැනින් ද ඉවත්වූහ.

නිවන් ලබාගත හැකි විපස්සනා භාවනාව ඒ වනවිට කිසිවකු විසින් සොයා ගෙන නොතිබුණි. එහෙයින් සිදුවූයේ නිවන් සොයා ගැනීම තමන් වහන්සේට ම භාරවීමය. මේ වන විට නිවන් සොයා ඇරඹූ ගමනට හයවන වසර ගෙවෙමින් තිබුණි. උන් වහන්සේ දුෂ්කර ක්‍රියාව අත්හළහ. කය ශක්තිමත් කරගත්හ. ආනාපාන සති භාවනාව වැඩූහ. චතුර්ථ ධ්‍යානය උපදවා ගත්හ. එයම පදනම් කොට විදසුන් වැඩූහ. සම්මා සම්බුද්ධ බව ලැබූහ.

## භාවනාවට සුදුසු අරමුණු

භාවනා අරමුණු යන්නට කර්මස්ථාන යන නම ද භාවිත කෙරේ. සමථ භාවනාවට කර්ම ස්ථාන හතළිහකි. කොටස් වශයෙන් හතකි.

ඒ දසකසිණ, දස අසුභ, දස අනුස්සති. සතර අප්පමඤ්ඤා, සතර ආරුප්ප, ආහාරේ පටික්කූලසඤ්ඤා, චතුධාතුවවත්ථාන වශයෙනි.

1. දස කසිණ

1. පඨවි කසිණ
2. ආපෝ කසිණ
3. තේජෝ කසිණ
4. වායෝ කසිණ
5. නීල කසිණ
6. පීත කසිණ
7. ලෝහිත කසිණ
8. ඕදාත කසිණ
9. ආලෝක කසිණ
10. ආකාස කසිණ

2. දස අසුභ

1. උද්ධුමාතක
2. විනීලක
3. විපුබ්බක
4. විච්ඡිද්දක
5. වික්ඛායිතක
6. වික්ඛිත්තක
7. හතවික්ඛිත්තක
8. ලෝහිතක
9. පුලවක
10. අට්ඨික

3. දස අනුස්සති

1. බුද්ධානුස්සති
2. ධම්මානුස්සති
3. සංඝානුස්සති
4. සීලානුස්සති
5. චාගානුස්සති

6. දේවතානුස්සති
7. මරණසති
8. කායගතාසති
9. ආනාපානසති
10. උපසමානුස්සති

4. සතර අප්පමඤ්ඤා (බ්‍රහ්ම විහාර හතර)
1. මෙත්තා
2. කරුණා
3. මුදිතා
4. උපෙක්ඛා

5. සතර ආරුප්ප
1. ආකාසානඤ්චායතන
2. විඤ්ඤාණඤ්චායතන
3. ආකිඤ්චඤ්ඤායතන
4. නේව සඤ්ඤා නාසඤ්ඤායතන

6. ආහාරේ පටික්කුලසඤ්ඤාව
ආහාර ගැන පිළිකුල් සඤ්ඤාව.

7. චතුධාතුවවත්ථාන
සිරුරෙහි ඇති පඨවි, ආපෝ, තේජෝ, වායෝ යන ධාතු හතර ගැන විමසා බැලීම.

අෂ්ට සමාපත්තිවලින් ලැබෙන අනුසස්

අටසමවත් උපදවා ගැනීමෙන් අනුසස් පහක් ලැබේ.

1. මේ ජීවිතයේදීම සුවවිඳිය හැකිවීම.
2. විපස්සනා වැඩිය හැකිවීම.
3. අභිඤ්ඤා පහ ලැබිය හැකිවීම.
4. සුගතියෙහි උපත ලද හැකිවීම.
5. නිරෝධ සමාපත්ති සුව විඳිය හැකිවීම.

විපස්සනා භාවනාව

නාම රූප ධර්ම, තිලකුණු වශයෙන් මෙනෙහි කිරීම විදසුන් වැඩීමය. නිදසුනක් මගින් මෙය පැහැදිලි කර ගනිමු.

මට සුදු පැහැති ලස්සන දත් පෙළක් ඇත. සිනාසෙන විට හොඳින් පෙනෙන ඉදිරිපස දතක් දැන් කැඩී ගොස්ය. ලොව ඇති සියල්ලටම වෙනස්වීම උරුමය. එකසේ නොපවතී. ඇතිව නැතිවේ. එහෙයින් ලොව ඇති සියල්ල නිත්‍ය නොවේ. අනිත්‍යය. මගේ සුදු පැහැ දත කැඩීමද අනිත්‍යයට පත්වීමකි. දත හොඳින් තිබිය දී මා සිනාසුනේ මහත් සතුටිනි. එහෙත් දත නැති නිසා මට දැන් සතුටින් සිනාසිය නොහැකිය. සිනාසෙන විට දැන් දැනෙන්නේ දුකකි. මගේ සතුට දුකක් බවට පත්වූයේ අනිත්‍යය ලක්ෂණය නිසාය. දිරා යන දතට එසේ වන්නට එපා යයි මා කරන පැතුම දුක දතට නොදැනේ. මගේ ඉල්ලීමට මගේ අණට දත කීකරු නොවීමෙන් පැහැදිලි වන්නේ දත මගේ වසඟයට පත් වී නැති බවයි. එහෙයින් දත අනාත්මය.

මගේ සිරුරෙහි ඇති ඇස් කන් නාසාදී අවයව සියල්ලත් අනිත්‍යය. වේදනා සඤ්ඤා ආදී චෛතසිකත් සිතත් අනිත්‍යය, දුක්ඛය. අනාත්මය. අන් සියලු දෙනාගේ නාම රූපත් ලොව ඇති සියල්ලත් අනිත්‍යය, දුක්ඛ, අනාත්මය, තිලකුණු, තිලක්ඛණ, ත්‍රිලක්ෂණ යයි කියනු ලබන්නේ මේ ලක්ෂණ තුනටයි. සියලු දේවල ඇති මේ ත්‍රිලක්ෂණය නුවණින් සිහිකරමින් කරන භාවනාව හැඳින්වෙන්නේ විදර්ශනා භාවනාව යනුවෙනි.

හේතූන්ගෙන් හටගත් පණ ඇති පණ නැති සියල්ල සංස්කාරය සංස්කාරවල නියම ස්වභාවය විදසුන් වැඩිමෙන් අවබෝධ වන විට ස්ත්‍රී පුරුෂ, ධන ධාන්‍ය, යාන වාහන, ඇඳුම් පැළඳුම් ආදී සියල්ල සතුට පිණිස නොපවතින බව වැටහෙයි. එවිට ඒවා ගැන කලකිරෙයි. කලකිරීමෙන් ඒවා ගැන ඇලීම නැතිවෙයි. ඇලීම, බැඳීම නැතිවිට ඒවායින් ඉවත්වීම මිදීම සිදුවෙයි. මේ මිදීම යනු රාගාදී සියලු කෙලෙසුන්ගෙන් මිදීමයි. රහත්වීමයි.

බුදු දහම නැති කාලවලද සමථ භාවනාව මගින් පංච අභිඤ්ඤා (පංච අභිඥා) අෂ්ට සමාපත්ති ලැබිය හැකි බව අපි දනිමු. විදර්ශනා භාවනාව ලැබෙන්නේ බුදුසසුන පවතින කාලයක පමණි.

මේ අනුව බෞද්ධ භාවනාවේ සුවිශේෂත්වය වන්නේ විදර්ශනා භාවනාවයි, එමගින් මග ඵල ලබා නිවන් අවබෝධ කරගත හැකිය.

**ක්‍රියාකාරකම්**

1. සමථ භාවනාවේ හා විදර්ශනා භාවනාවේ වෙනස කෙටියෙන් පැහැදිලි කරන්න.
2. සතර අප්පමඤ්ඤා නම් කරන්න.

**පුහුණුවට**

සඤ්ඤාය විපරීයේසා
චිත්තං තේ පරිඩය්හති
නිමිත්තං පරිවජ්ජේහි
සුභං රාගූපසංහිතං

ඔබේ සිත රාගයෙන් දැවෙන්නේ
අරමුණු වැරදියට හැඳිනගත් නිසාය.
එම හැඳිනීම වෙනස් කරගන්න.
අශුභ වශයෙන් බලන්න.
රාගය සංසිඳුවා ගැනීම යහපත්ය.

# 21. පාඩම

## වසල ගති දුරලමු

අතීතයේ පැවති සමාජ සම්මතයන් හේතුවෙන් මිනිස් සමාජය විවිධ වර්ගීකරණයන්ට ලක්ව පැවතුනි. කථා කරන භාෂාව, අදහන ආගම, ශරීරයේ වර්ණය, කරන රැකියාව ආදිය පදනම් කරගෙන ගස් වර්ගීකරණයට ලක්විය. බුදුරජාණන් වහන්සේ ලොවට ධර්මය දේශනා කරමින් මෙම බෙදීම්වල නිසරු හා අනුචණ බව පෙන්වා දුන්හ. එකල මිනිසුන් උපත අනුව උස් පහත් ලෙස වර්ග කොට තිබුණි. පරම්පරාවෙන් උසස් යැයි සම්මත පිරිස කුලයෙන් උසස් හෙවත් කුලීන ලෙසත්, පරම්පරාවෙන් පහත් යැයි සම්මත පිරිස් කුලයෙන් පහත් හෙවත් කුලහීන ලෙසත් වර්ග කෙරිණි. මෙය බමුණු දහම අනුව කරන ලද බෙදීමකි.

බුදු දහම සියලු මිනිස් ප්‍රජාව සමානාත්මතාවෙන් සලකන දහමකි. සමාජයේ යහපත් ක්‍රියා කරන ගුණ ධර්ම පුරවන පුද්ගලයා සමාජයේ ශ්‍රේෂ්ඨයෙකු වන බවත් අයහපත් ක්‍රියා කරන දුර්ගුණවලින් යුතු පුද්ගලයා පහත් අයෙකු බවත් බුදු දහමේ පිළිගැනීමයි.

බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර ජේතවනාරාමයේ වැඩ සිටින සමයේ දිනක් එම නගරයේ ගෙපිළිවෙළින් පිඬුසිගා වැඩියහ. එම නුවර අග්ගික භාරද්වාජ නමින් බමුණකු විසූ අතර හෙතෙම එම අවස්ථාවේ ගිනි දල්වා යාගහෝම කරමින් සිටියේය. බුදුරදුන් තම නිවසට පිඬු පිණිස වඩිනු දුටු ඔහු කෝපයට පත්ව '' මුඩු මහණ ඔහි සිටුව, පව්ටු ශ්‍රමණය ඔහි සිටුව, වසලය ඔහි සිටුව" යනුවෙන් බුදුරදුන්ට නින්දා කරන්නට විය. එවිට බුදුරජාණන් වහන්සේ ඔහු අමතා" බමුණ, වසලයා යනු කවරෙක්ද වසලයකු වන්නේ කවර කරුණු වලින්ද කියා ඔබ දන්නෙහිදැයි " විමසූහ. එවිට බමුණා එය නොදන්නා බව පවසා වසලයකු බවට පත්කෙරෙන කරුණු දේශනා කරන ලෙස ආරාධනා කළේය. වසලයෙකු වීමට හේතු වන කරුණු තිස් තුනක් බුදුරදුන් පැහැදිලි කරදුන් සේක. එම කරුණු ඇතුළත් සූත්‍රය වසල සූත්‍රය නමින් හැඳින්වෙයි.

පුද්ගලයෙකු සමාජයේ දී හා නිවසේදී වසලයෙකු වන්නේ කෙසේදැයි මෙම සූත්‍රයෙන් මනාව විස්තර වෙයි.

නජච්චා වසලෝ හෝති - නජච්චා හෝති බ්‍රාහ්මණෝ
කම්මනා වසලෝ හෝති - කම්මනා හෝති බ්‍රාහ්මණෝ

යන ගාථාව අනුව කිසිවෙක් උපතින් වසලයෙකු නොවේ. උපතින් බමුණකු ද නොවේ. කරන ක්‍රියාව අනුව වසලයෙක් වෙයි. කරන ක්‍රියාව අනුව බ්‍රාහ්මණයෙක් ද වෙයි.

වසල සූත්‍රයේ සඳහන් වසල ගති තිස් තුන කොටස් තුනකට බෙදා දැක්විය හැකිය.

1. තම අධ්‍යාත්මය පිරිහෙන වසල ගති
2. සමාජය පීඩාවට පත්වන වසල ගති
3. යුතුකම් පැහැර හැරෙන වසල ගති යනුවෙනි.

තම අධ්‍යාත්මය පිරිහෙන වසල ගති

1. නිතර අධික තරහ යාම (කෝධනෝ)
2. වෛර කිරීම (උපනාහී)
3. අනුන්ගේ ගුණ යටපත් කිරීම (ගුණමකු බව) (පාපමක්ඛී)
4. මිථ්‍යා අදහස් ඇති බව (විපන්න දිට්ඨී)
5. නැති ගුණ අනුන්ට පෙන්වීම (මායාවී)
6. තමා කළ වරද සැඟවීම (පටිච්ඡන්න කම්මන්තෝ)
7. තමා උසස් කර දක්වා අනුන් පහත් කොට දැක්වීම (අත්තුක්කංසන පරවම්භන)
8. අනුන් කෝපයට පත්කිරීම (රෝසකෝ)
9. අනුන්ට කිසිවක් නොදීම (කදරියෝ)
10. පාපකාරී අදහස් ඇති බව (පාපිච්ඡෝ)
11. මසුරුකම (මච්ඡරී)
12. කපටිකම (සඨෝ)
13. වැරදි කිරීමට ලැජ්ජා නැතිකම (අහිරිකෝ)
14. වැරදි කිරීමට බිය නැතිකම (අනොත්තාපී)
15. රහත් නොවී රහත් වූවෙකු ලෙස පෙනී සිටීම (අනරහා සන්තෝ අරහං පටිජානාති)

### සමාජය පීඩාවට පත්වන වසල ගති

1. දයාවෙන් තොරව හිංසාවේ යෙදීම (පාණේ දයා නත්ථි)
2. ගම් නියම්ගම් පැහැරීම (පරිරුන්ධති)
3. අනුන් සතු දේ සොරකම් කිරීම (අදින්නං ආදියති)
4. ණය ගෙන නොගෙවා මග හැරීම (ඉණමාදාය පලායති)
5. මංකොල්ලකෑම (පන්ථස්මිං වජතං ජනං හන්ත්වා)
6. බොරු සාක්ෂි දීම (සක්කි පුට්ඨෝ මුසා බෲති)
7. නෑ හිත මිතුරන්ට ද්‍රෝහි වී ඔවුන්ගේ භාර්යාවන් වරදට පෙළඹවීම (දාරේසු පති දිස්සති)
8. වැඩිහිටි ඥාතීන්ට පරුෂ වචනයෙන් බැණවැදීම (හන්ති රෝසේති වාචාය)
9. අනුන් නොමග යැවීමට වැරදි උපදෙස් දීම (අනත්ථමනුසාසති)
10. බොරු කියා පැවිදි උතුමන් රැවටීම (මුසාවාදේන වඤ්චේති)
11. යාචකයන් බොරුවෙන් රැවටීම (මුසාවාදේන වඤ්චේති)
12. බොරු කියා අනුන් මුළාකොට ලාභ ප්‍රයෝජන ගැනීම (කිඤ්චික්ඛං නිජිගිංසානෝ)
13. බුදුරදුන්ට අගෞරව කිරීම (බුද්ධ පරිභාසති)
14. බුදුරදුන්ගේ ශ්‍රාවකයන්ට නින්දා කිරීම (සාවකං පරිභාසති)
15. ගිහියන්ට හා පැවිද්දන්ට නින්දා කිරීම (පරිබ්බාජං ගහට්ඨං පටිභාසති)

### යුතුකම් පැහැර හැරෙන වසල ගති

1. මහලු මව්පියන්ට නොසලකා හැරීම (මාතරං පිතරං පහූසන්තෝ නභරති)
2. අනුන්ගේ සංග්‍රහ ලබා ඔවුන් තම නිවසට ආ පසු ඔවුන්ට සංග්‍රහ නොකිරීම (ආගතං න පටිපූජේති)
3. ආහාර ගන්නා වේලාවට තම නිවසට පැමිණෙන පැවිදි උතුමන්ට සංග්‍රහ නොකර බැණ වැදීම
   (භත්ත කාලේ උපට්ඨිතේ රෝසේති වාචා න දේති)

ඉහත වසල ගති අනුගමනය කරන්නා ඉතා ඉක්මණින් සමාජයේ පරිහානියට පත්වෙයි. සමාජයේ සෙසු අයගේ නින්දා අපහාසයන්ට පත්වෙයි. මෙලොව පරිහානියට පත්ව මියගොස් දුගතියේ උපත

ලැබීමට ද හේතුවෙයි. එම නිසා මෙම දුර්වලතා තම ජීවිතයෙන් දුරු කර නුවණින් යුතුව ක්‍රියා කොට මෙලොව කීර්තිමත්ව ගෞරවාන්විතව ජීවත් වීමට, හොඳ ගති සිරිත් අනුගමනය කිරීමට හුරු පුරුදු වෙමු.

## ක්‍රියාකාරකම්

1. අතීතයේ සමාජ වර්ගීකරණයට බලපෑ හේතු මොනවාද?
2. බුදුරදුන් වසල සූත්‍රය දේශනා කිරීමට හේතු වූ සිදුවීම ලියන්න.
3. නජච්චා වසලෝ හෝති ..... යන ගාථාව සම්පූර්ණ කොට එහි තේරුම ලියන්න.
4. ජාති, කුල සහ දේශපාලන භේද දුරු කිරීමට ඔබ කරන යෝජනා එක් කරුණකට 4 බැගින් 12 ක් ලියන්න.

## පුහුණුවට

යෝ මාතරංවා පිතරංවා - ජිණ්ණකං ගත යොබ්බනං
පහූසන්තෝ න භරති - තං ජඤ්ඤා වසලෝ ඉති

## පැවරුම

මෙහි සඳහන් ඒ ඒ වසල ගති සඳහන්වන වසල සූත්‍ර ගාථා සොයා වෙන්කර ලියා දක්වන්න.

## 22. පාඩම

### දැහැමිව ධනය උපයමු

බෞද්ධයාගේ අරමුණ නිවන් දැකීමය. නිවන් අරමුණ ඇතිව ක්‍රියා කළ හැක්කේ සාර්ථක ජීවිතයක් ගත කරන්නකුටය. ජීවිතය සාර්ථක කර ගැනීම සඳහා සපයා ගත යුතු දෑ බොහෝය. ඒවා සපයා ගත හැක්කේ ධනය ඇත්නම් පමණි. මේ නිසා ධනය උපයා ගත යුතු යහපත් පිළිවෙත බුදුරජාණන් වහන්සේ ගිහි මිනිසුනට කළ දේශනා බොහෝමයකදී පෙන්වා දුන් සේක.

කාමභෝගී ජීවිත ගත කරන ගිහි මිනිසුන්ට දිළිඳුබව දුකකැයි ඉණ සූත්‍රයෙහි දී වදාළහ. තරුණ කල යහපත් ජීවිතයක් ගත කරමින් ධනය සපයා නොගත හොත් වයසක කාලයේදී ජලය නැති මසුන් නැති විලක් ළඟ තැවෙන මහලු කොස්වා ලිහිණියකු මෙන් පසුතැවීමට සිදුවන බව ධම්මපද ගාථාවකින් කියවේ. ධාර්මික ලෙස සොයා සපයා ගත් ධනයක් ඇති තැනැත්තාට ම පවුල් ජීවිතයක් ඇරඹිය හැකි බව සිගාල නම් වූ තරුණයාට වදාළහ.

මෙසේ සාර්ථක ජීවිතයක් සඳහා ධනය අවශ්‍ය බව ද, ධනය ධාර්මික ව උපයා ගත යුතු බව ද බුදු දහම අවධාරණයෙන් කියා සිටියි. ධනය ධාර්මික වීම සඳහා හේතුවන කරුණු කිහිපයක් ද පෙන්වා දී තිබේ. ධාර්මිකව ධනය උපයා ගන්නා ආකාරය ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ ඇතුළත් උට්ඨාන සම්පදා හෙවත් උත්සාහ සම්පත්තිය පිළිබඳ විස්තරයෙන් පැහැදිලි වෙයි. අනුගමනය කිරීමට සුදුසු ධාර්මික රැකියා වර්ග කිහිපයක් ද එහි සඳහන් වේ. එනම්,

1. කෘෂිකර්මය
2. වෙළෙඳාම
3. ගවයන් රැකබලා ගැනීම
4. ආරක්ෂක සේවය
5. රාජ්‍ය සේවය
6. ශිල්ප කර්මාන්ත වේ.

මේ රැකියා මාර්ග ධාර්මික වන්නේ කෙසේද? බෞද්ධයා ආරක්ෂා කළ යුතු නිත්‍ය සදාචාර ප්‍රතිපත්ති පහක් ඇත. පන්සිල් නමින් හැඳින්වෙන මේවා බෞද්ධයා විසින් පමණක් නොව යහපත් ජීවිතයක් ගතකරන කවරකු විසින් වුවද අනුගමනය කළ ප්‍රතිපත්තීන් ය. ඒ පිළිවෙත් රැකෙන නිසා ඉහත සඳහන් රැකියා ධාර්මික ය.

වෙළෙඳාම ගැන විස්තර කිරීමේදී බෞද්ධයා විසින් නොකළයුතු වෙළෙඳාම් පහක් පෙන්වා දී තිබේ. එනම්,

1. සත්ත වණිජ්ජා - සතුන් වෙළෙඳාම
2. සත්ථ වණිජ්ජා - අවි ආයුධ වෙළෙඳාම
3. මංස වණිජ්ජා - මස් වෙළෙඳාම
4. මජ්ජ වණිජ්ජා - මද්‍යසාර වෙළෙඳාම
5. විස වණිජ්ජා - වස විස වර්ග වෙළෙඳාම

මෙයින් සතුන්, අවි ආයුධ, මස් හා විස වර්ග වෙළෙඳාම නුසුදුසු වන්නේ ප්‍රාණඝාතයට, සත්ව හිංසාවට ඒවා හේතුවන හෙයිනි. පළමුවන ශික්ෂා පදය ඒවා මගින් කැඩෙන හෙයිනි. මජ්ජ හෙවත් මත්පැන්, මත් ද්‍රව්‍ය ඇතුළු සියලු මද්‍යසාර නුසුදුසු වන්නේ ඒවා භාවිත කිරීම නිසා මිනිසාගේ සිහි විකල් වී ඔහු ප්‍රමාදයට පත්වන නිසාය. එසේම එමගින් පස්වන ශික්ෂා පදය කැඩෙන නිසාය.

වෙළෙඳාමේ දී පමණක් නොව අනෙකුත් කවර රැකියාවකදී වුවද පන්සිල් රැකෙන බව සස්පව් නොසිදු වන බව එහි ධාර්මිකත්වයට එක හේතුවකි. මූලික සදාචාර ප්‍රතිපත්ති පහ කැඩෙන රැකියාව අධාර්මික ය. ඒ වැරදි ප්‍රතිපත්ති පහ නම්,

සතුන් මැරීම හා සතුනට හිංසා කිරීම,
සොරකම් කිරීම,
දුරාචාරයෙහි යෙදීම හෙවත් වැරදි කාමසේවනය.
බොරුකීම හා
මද්‍යසාර භාවිතය යි.

ධාර්මික රැකියාවක් වුවද සාහසික ක්‍රියා අනුගමනය කරමින් කරනවිට අධාර්මික රැකියාවක් බවට පත්වේ. එළවළු වෙළෙඳාම ධාර්මික රැකියාවකි. එහෙත් හොර තරාදිවලින් කිරා, හොරට මැනීම විකිණීම අධාර්මිකය. වෙළෙන්දා පාරිභෝගිකයා රවටන ක්‍රම රාශියකි. නොවටිනා දෑ වටිනා ලෙස පෙන්වීම, පාරිභෝගිකයා ට නුසුදුසු ද්‍රව්‍ය විකිණීම, බාල දෑ මිශ්‍ර කිරීම ආදී වූ අනේකවිධ සැහැසිකම් කරන බව ප්‍රකටය. වෙළෙඳාම පමණක් නොව අනෙකුත් ධාර්මික රැකියාවලදී වුව ද කරන සැහැසිකම් කොතෙකුත් දැක ගත හැකිය. ඒවා සියල්ල අධාර්මික ක්‍රියාය.

ධාර්මික ධනෝපායන මාර්ගයක් වීම සඳහා පෙන්වා දී ඇති තවත් ප්‍රධාන ලක්ෂණයක් වන්නේ උත්සාහයෙන් ශ්‍රමය වැය කර ධනය ලබා ගැනීමයි. ශ්‍රමය දෙයාකාරය. ශාරීරික ශ්‍රමය සහ මානසික ශ්‍රමය යනුවෙනි. ''උට්ඨාන විරියාධිගතේහි බාහා බලපරිචිතේහි සේදා වක්ඛිත්තේහි" යනුවෙන් ශාරීරික ශ්‍රමය වැය කිරීම දැක්වෙයි. උට්ඨාන වීර්යයෙන් යුක්තව, දෑතේ මහන්සියෙන්, දහදිය වගුරා ධනය සොයා ගැනීම එයින් කියවෙයි. මානසික ශ්‍රමය ගැන ද සඳහන් වේ. ''දක්ඛෝ හෝති අනලසෝ තත්‍රූපාය වීමංසාය සමන්නාගතෝ අලං කාතුං අලං සංවිධාතුං" යන විග්‍රහයෙහි දක්ඛෝ හෝති යනු ද වියයුතු බවය. ධනෝපායනයෙහි දක්ෂ බව ශාරීරික මෙන්ම මානසිකව ද විය හැකිය. අනලසෝ යනු අලස නැතිව කටයුතු කිරීමය. සිගාලකට වදාළේ

යෝධ සීතඤ්ච උණ්හඤ්ච - තිණා භීයෝ න මඤ්ඤති
කරං පුරිස කිච්චානි - සෝ සුඛා න විනායති

යනුවෙන් සීතෝෂ්ණාදිය තණපතක් තරමටවත් නොසලකා කළයුතු ක්‍රියාවන් කරන පුද්ගලයා සැපෙන් පහ නොවන බවයි. අනලස් බව ද ශාරීරික හා මානසික දෙයාකාරයෙන් ම විය හැකිය. එහෙත් ''තත්‍රූපාය වීමංසාය සමන්නාගතෝ" යනුවෙන් කියවෙන විමසා බලා කටයුතු කිරීම මානසික ශ්‍රමය වැය කිරීම ගැනම අවධාරණය කෙරෙන්නකි.

වැදගත් වන්නේ ශ්‍රමය කායික ද මානසික ද යන්න නොවේ. ඉබේ ලැබෙන තෙක් නොසිට, අනුන්ගෙන් යැපීමට නොසිතා, තමාගේ වෙහෙස මහන්සියෙන් ලබා ගන්නා ධනයම ධාර්මික වන බවයි වටහා ගත යුත්තේ.

සිගාලක සිටුපුතුට කරන ලද අනුශාසනයෙහි දී බුදුහාමුදුරුවෝ ධාර්මිකව ධනය සැපයීම මී මැස්සා මලෙන් රොන් ගැනීමට උපමා කර වදාළ සේක. ඒ උපමාවෙන් අවධාරණය වන කරුණු ගණනාවක් තිබේ. මල් පැණි ලබා ගන්නා විට මීමැස්සා මලේ පෙති වලටවත්, වර්ණයටවත්, සුවඳටවත් කිසිදු හානියක් නොකරයි. මලින් මලට පියැඹීමේදී මල් රොන් තැවරී පරාග පෝෂණය වෙයි. එමගින් මල් ගසේ පැවැත්මට ද උපකාරයක් වේ. මේ අයුරින් ම මිනිසා ද සමාජයට හෙවත් අනෙක් මිනිසුන්ටවත්, පරිසරයටවත් කිසිදු හානියක් නොකර ධනය රැස්කර ගත යුතුය. ඒ ලබා ගන්නා ධනය තමාගේත්, සමාජයේ යහපත සඳහාම යොදා ගතයුතුය. මී මැස්සා නිහඬව දෙන මේ පණිවුඩය තේරුම් ගැනීමට තරම් අප බුද්ධිමත් විය යුතුය.

**ක්‍රියාකාරකම්**

1. ක්‍රියාවක් ධාර්මික වීම සඳහා හේතුවන ප්‍රධාන කරුණු තුනක් මේ පාඩමෙහි පෙන්වා දී තිබේ. ඒ මොනවාද?
2. වර්තමාන සමාජයේ කෙරෙන අධාර්මික ක්‍රියා හතරක් නම් කොට ඒවා අධාර්මික වීමට හේතු දක්වන්න.
3. ධනය සැපයීමේදී මී මැස්සාගේ ඉරියව්ව අනුගමනය කිරීමට කීමෙන් අවධාරණය වන කරුණු මොනවාද?

**පුහුණුවට**

අදමින් ලත් ඉසුරු නොපවතී සොරුන් සෙවූ දනමෙන්
දහමින් ලත් ඉසුරු සැපත් එ සුරිඳු ලත් ඉසුරු වැනි
කිඳුකින් සව් ඉසුරු මදව ලැබෙතත් නුවණ ඇත්තෝ
අනුන් නසා ලබන ඉසුරු සලකත් වසුරු අයුරින්

# 23. පාඩම

## පන්සලෙන් සිදුවන සේවා

අතීතයේ පටන් පන්සලෙන් ගමට සිදුවූයේ මහඟු සේවාවකි. පන්සලේ වැඩ සිටින ස්වාමීන් වහන්සේලා ගමේ ජනතාවගේ යහපත වෙනුවෙන් නිරතුරුවම කටයුතු කරති. අනුබුදු මිහිඳු මහ රහතන් වහන්සේ ලක්දිවට වැඩම කොට ලක්වැසියාට දහම් අවබෝධකර දීමෙන් පසු බුදු දහමට අනුව ක්‍රියා කරන සමාජයක් මෙරට බිහිවිය. ඒ අනුව ලංකාවේ සෑම ගමකම වෙහෙර විහාර ඉදි කෙරිණි. ජනතාවට මග පෙන්වන්නෙකු ලෙසත් ග්‍රාමීය නායකයෙකු ලෙසත් ගමේ පන්සලේ හාමුදුරුවෝ ක්‍රියා කරන්නට වූහ. පන්සලේ හාමුදුරුවරු ජනතාවගේ

1. ආර්ථික දියුණුව
2. ආධ්‍යාත්මික දියුණුව

යන අංශ දෙකටම මග පෙන්වන්නෝ වෙති. ගැමි ජනතාව වෙනුවෙන් දිවා රෑ නොබලා ක්‍රියා කරන උන් වහන්සේලා දරුවන්ට අකුරු කියවීම, ඉගැන්වීම, මංගල හා අවමංගල උත්සවවලදී ආගමික වතාවත් ඉටු කිරීම, නැති බැරි අසරණ පිරිසට උපකාර කිරීම වැනි ක්‍රියාවන් මෙන්ම බෝධි පූජා පැවැත්වීම, බුද්ධ පූජා පැවැත්වීම, පිරිත් දේශනා කිරීම ආදි ආගමික කටයුතු ද නොපිරිහෙලා ඉටු කරති. පන්සලේ දී මෙන්ම නිවෙස්වලට වැඩම කොට සිදු කරන ආගමික වතාවත් තුළින් බෞද්ධයෝ ඉමහත් ආශිර්වාද ලබති.

පැරණි රජ දරුවෝ ද භික්ෂූන් වහන්සේ ඇසුරු කළහ. රාජ්‍ය නායකයින් මෙන්ම රටේ ජනතාව ද භික්ෂූන් වහන්සේගේ අවවාද අනුශාසනා අනුව ක්‍රියා කොට ඇත. පෙර ලක්වැසි බෞද්ධයෝ අකුරු කියවීම, ලිවීම, වෛද්‍ය ශාස්ත්‍රය, ජෝතිශ්ශාස්ත්‍රය, ගණිතය, පාලි, සිංහල ආදී විෂයයන් ද පන්සලෙන් උගත්හ. අප රට බටහිර ජාතීන්ගේ පාලනයට යටත් වීමත් සමග ගම හා පන්සල අතර ඇති

සබඳතාව ක්‍රමයෙන් තුරන් වන්නට විය. එහෙත් බටහිර ජාතීන්ගේ බාධා මධ්‍යයේ ගමේ පන්සලේ හාමුදුරුවරු ජනතාවට සේවය කළහ.

විදේශ ආධිපත්‍යයෙන් රට මුදවා ගැනීම සඳහා ද මහා සංඝ රත්නයෙන් විශාල සේවයක් සිදුවී ඇත. නිදහස ලැබූ පසු නැවතත් ජාතික හා ශාසනික වශයෙන් උන්වහන්සේගෙන් සමාජයට මහඟු මෙහෙයක් ඉටුවෙයි.

පුද්ගලයෙකු උපතේ සිට මරණය දක්වා ජීවිතයේ වැදගත් සෑම අවස්ථාවකදීම භික්ෂූන් වහන්සේලා වැඩම කරවා පිරිත් හා ධර්ම දේශනා පවත්වා ආශිර්වාද ලබා ගැනීමට අතීතයේ මෙන්ම වර්තමානයේදී ද බෞද්ධයෝ ඉමහත් කැමැත්තක් දක්වති.

බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලදැයි දැක්වෙන

> ගිහීනමුපකරොන්තානං
> නිච්චමාමිස දානතෝ
> කරෝථ ධම්මදානේන
> තේසං පච්චුපකාරකං

යන ගාථා ධර්මය අනුව ගිහි ජනතාව මහා සංඝරත්නයට නිතර සිව් පසයෙන් උපකාර කරති. එයට ප්‍රත්‍යුපකාර වශයෙන් භික්ෂූන් වහන්සේලා ධර්ම දානයෙන් ඔවුන්ට සංග්‍රහ කරති. මහා සංඝ රත්නයේ එම වගකීම අතීත යුගයේ මෙන්ම වර්තමාන යුගයේද ඉටු වේ.

බුදුරදුන් සිඟාලෝවාද සූත්‍රයේදී මහා සංඝරත්නයෙන් ගිහි දායකයන් සඳහා ඉටුවිය යුතු යුතුකම් 06 ක් දක්වා ඇත.

1. පවින් වැළැක්වීම.
2. යහපතෙහි යෙදවීම.
3. යහපත් සිතින් ආශිර්වාද කිරීම.
4. නොදත් ධර්ම කරුණු කියාදීම.
5. දත් කරුණු මැනවින් පෙහෙළි කිරීම.
6. සග සැපතට මග කියා දීම.

යනු එම යුතුකම් හයයි. වර්තමානයේදී එම යුතුකම්වලටත් වඩා සේවා රැසක් ගමේ පන්සලේ ස්වාමීන් වහන්සේලාගෙන් ඉටුවෙයි.

නූතන යුගයේ ගමේ පන්සලෙන් සිදුවන සේවා අතර පහත සඳහන් ඒවා ද වෙයි.

1. ධර්ම දේශනා පැවැත්වීම.
2. සඟසතු දානවලට වැඩම කිරීම.
3. විවිධ අවස්ථාවල නිවෙස්වලට වැඩමවා ආශිර්වාද කිරීම.
4. අවමගුල් උත්සවයන්හි ආගමික වතාවත් ඉටුකිරීම.
5. රෝගීන්ට ආශිර්වාද කිරීම හා පිහිටවීම.
6. භාවනා වැඩසටහන් පැවැත්වීම.
7. පන්සලේ විවිධ පිංකම් පැවැත්වීම.
8. පෙරහර වැනි සංස්කෘතික උත්සව පැවැත්වීම.
9. දහම් පාසල් පැවැත්වීම.
10. ළදරු පාසල් පවත්වාගෙන යාම.
11. අසරණ අයට උපකාර කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
12. පුහුණු පාඨමාලා පැවැත්වීම.
13. විවිධ සමිති හා සංවිධාන මෙහෙයවීම.
14. හෙළ වෙදකම හා ජ්‍යොතිෂ කටයුතු.

භික්ෂූන් වහන්සේ ගමේ ජනතාව සුමඟට යොමු කිරීම සඳහා විහාරස්ථානයේදී හෝ නිවෙස් ඇතුළු විවිධ ස්ථානවලට වැඩම කොට ධර්ම දේශනා පවත්වති. මිය ගිය අය වෙනුවෙන් හත් දවස, තුන් මාසය, අවුරුද්ද වශයෙන් පවත්වන දානමය පිංකම් වලට වැඩම කොට ආශිර්වාද කිරීම සිරිතකි. ගමේ නිවසක දරුවෙකුගේ ඉඳුල් කටගෑම, අකුරු කියවීම, උපන්දින සැමරීම, නව නිවෙස් ඉදිකිරීමට මුල්ගල් තැබීම, නව නිවෙස් ඉදිකොට ගෙවැදීම, නව ව්‍යාපාර ආරම්භ කිරීම, විදෙස් ගතවීම් ආදි අවස්ථාවලදී ආගමික වතාවත් ඉටුකොට සෙත් පිරිත් දේශනා කොට ආශිර්වාද කරන්නේ පන්සලේ ස්වාමීන් වහන්සේය. පන්සලේ හාමුදුරුවරු තම දායකයෙකුට කරදරයක්, උපද්‍රවයක් වු විට දී නිවසටම වඩමවා පිහිට වෙති. එමෙන්ම ගමේ දායකයෙකුගේ හෝ හිතවත් අයෙකුගේ අවමඟුලක් වූ විට එම අවස්ථාවට වැඩමවා දුක නැති කිරීමට ධර්මය දේශනා කිරීම, මතකවස්ත්‍ර පූජා කරවීම ආදි ආගමික වතාවත් ඉටුකරති.

රෝගීන් සුවපත් කිරීම සඳහා නිවසට හෝ රෝහලට වැඩම කොට ආශිර්වාද කිරීම උදව් උපකාර කිරීම භික්ෂූන් වහන්සේ සිදු

කරති. පන්සලේ හා වෙනත් ස්ථානවල පොහොය දිනයේ මෙන්ම වෙනත් දිනවලදී භාවනා වැඩසටහන් පැවැත්වීම ගමේ ජනතාවගේ මානසික සුවය ඇති කිරීමට හේතුවේ.

මහා සංඝරත්නය දිනපතාම ගිහි දායකයන්ට ආශිර්වාද පතා බුද්ධ පූජා, බෝධි පූජා, ගිලන්පස පූජා, මල් පහන් පූජා, සෙත් පිරිත් දේශනා පවත්වති. වෙසක්, පොසොන්, ඇසළ ආදී පිංකම් මෙන්ම අවුරුද්දේ මාසික වශයෙන් පොහොය පිංකම් සංවිධානය කෙරේ කඨින පිංකම, සර්වඥධාතු ප්‍රදර්ශනය, අලුත් සහල් පූජා, කුල දරුවන් පැවිදි කිරීම් ආදී පිංකම් ද පැවැත්වේ. බොහෝ විහාරස්ථානවල හෙළ සංස්කෘතික අංගවලින් යුතු පෙරහර පැවැත්වීම්, තොරණ ඉදිකිරීම්, වෙසක් පහන් කූඩු ප්‍රදර්ශන ද දක්නට ඇත.

ගමේ පන්සලේ ස්වාමීන් වහන්සේගේ මගපෙන්වීම යටතේ සිදුකරන දහම් පාසල් අධ්‍යාපනය යහපත් බොදු දරු පිරිසක් බිහිකිරීම සඳහා සිදුකරන උතුම් සේවාවකි. කුඩා කල පටන් ධර්ම ඥානය ලබා ගැනීම සඳහාත් යහපත් සිරිත් විරිත් පුරුදු පුහුණු වීම සඳහාත් දහම් පාසල් අධ්‍යාපනය උපකාරී වේ.

ළදරු පාසල හෙවත් පූර්ව ළමා විය සංවර්ධන මධ්‍යස්ථානය පන්සල මුල්කරගෙන පැවැත්වෙයි. ඒ තුළින් කුඩා කල පටන් දරුවන් ආගමික පරිසරයක හැදුණු වැඩුණු හොඳ දරු පිරිසක් බවට පත්වේ. සමාජ අභිවෘද්ධිය සඳහා වැඩිහිටි සමිති, තරුණ සමිති, ධර්ම විජය සමාජ, ග්‍රාම සංවර්ධන සමිති, පරෝපකාර සමිති, කුළගත සමිති, සුභසාධක සමිති ආදිය පැවැත්වන්නේ ද පන්සල මුල්කරගෙනය. ඊට අමතරව තරුණ තරුණියන්ගේ රැකියා වියුක්තියට පිළියම් ලෙස වෘත්තීය පුහුණුව ලබාදීමේ වැඩසටහන් ද ඇතැම් විහාරස්ථාන මුල්කරගෙන ක්‍රියාත්මක වේ.

දිළිඳු ගැමියන්, ආපදාවන්ට පත්වූවන්, ආර්ථික අපහසුතා ඇති දුදරුවන් හා විවිධ විපත්වලින් අසරණවූවන් වෙනුවෙන් භික්ෂූන් වහන්සේගේ මූලිකත්වයෙන් උදව් උපකාර කිරීමේ වැඩසටහන් ද පැවැත්වෙයි. නිවෙස්වලට අවශ්‍ය උපකරණ හා ඇඳුම් පැලඳුම් ලබාදීම, වියළි ආහාර ද්‍රව්‍ය පිරිනැමීම, දරුවන්ට පාසල් උපකරණ, ඇඳුම් පැලඳුම් පිරිනැමීම ආදී කටයුතුවල දී ප්‍රමුඛත්වය ගෙන ක්‍රියාකරනුයේ ද පන්සලේ ස්වාමීන් වහන්සේය.

හෙළ වෙදකම, ජ්‍යොතිශ්ශාස්ත්‍රය ආදී අපේ පාරම්පරික උරුමයන් ද රැකගැනීමට පන්සලේ ස්වාමීන් වහන්සේගෙන් ඉටුවන්නේ මහඟු සේවාවකි.

මෙලෙස වර්තමානයේ මහා සංඝරත්නය සමාජ සේවකයන්, ප්‍රජා නායකයන් ලෙස ජනතාවට මග පෙන්වන උතුම් පිරිසක් බවට පත්ව ඇත. පන්සල ආගමික, ශාසනික, සංස්කෘතික හා සමාජ සේවා මධ්‍යස්ථානයක් පමණක් නොව තාක්ෂණික ඥානය ලබා ගැනීමට මග පෙන්වන ආයතනයක් ලෙස ද හැඳින්විය හැකිය. මේ අනුව පන්සලෙන් සුවිසල් සේවාවක් වත්මන් සමාජයට සිදුවන බව පැහැදිලි වෙයි.

**ක්‍රියාකාරකම්**

1. පන්සලේ හාමුදුරුවරුන් ජනතාවගේ දියුණුව සලසන අංශ දෙක නම් කරන්න.
2. ගම හා පන්සල අතර සබඳතා තුරන් වූයේ කුමන කාලයේදීද?
3. ගිහීනමුප කරොන්තානං යන ගාථාවේ අර්ථය පැහැදිලි කරන්න.
4. සිගාලෝවාද සූත්‍රයේ සඳහන් පරිදි මහා සංඝරතනයෙන් ගිහියන්ට ඉටුවන යුතුකම් හය ලියන්න.
5. පන්සලෙන් සිදුවන සේවා ලැයිස්තුගත කරන්න.
6. ගම හා පන්සල අතර සබඳතා ගොඩනැංවීමට ඔබ කරන යෝජනා 10 ක් ලියන්න.
7. උපතේ සිට මරණය දක්වා භික්ෂූන් වහන්සේ ඔබට පිහිට වන අවස්ථා 8 ක් සඳහන් කරන්න.

**පුහුණුවට**

ගමේ පන්සල
අපේ පන්සල
අපේකම රැක්කා
අපේ දානෙදි අපේ මරණෙදී
අපේ ළඟ සිටියා

අපේ ගම්වල අපේ දරුවන්

සසුන්ගත කරවා
නිවන් පුරවැද නිවී සැනසෙන
මාවතේ යැව්වා
අපේ ජාතිය අපේ ආගම
අපේ බව කිව්වා
අපේ දෙසබස අපේ පන්සල
නිසාවෙන් රැකුණා

රචනය - පූජ්‍ය රඹුකන සිද්ධාර්ථ හිමි

# 24. පාඩම
## පාලි 03
### සඟ ගුණ පාඨය

අ) සුපටිපන්නෝ භගවතෝ සාවකසංඝෝ,
උජුපටිපන්නෝ භගවතෝ සාවකසංඝෝ
ඤාය පටිපන්නෝ භගවතෝ සාවකසංඝෝ
සාමීචි පටිපන්නෝ භගවතෝ සාවකසංඝෝ
යදිදං චත්තාරි පුරිසයුගානි අට්ඨ පුරිස පුග්ගලා
ඒස භගවතෝ සාවක සංඝෝ
ආහුණෙය්‍යෝ පාහුණෙය්‍යෝ දක්ඛිණෙය්‍යෝ
අඤ්ජලිකරණීයෝ අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං
ලෝකස්සා'ති.

ඉහත සඟ ගුණ පාඨය ශබ්ද නගා නිවැරදිව කියවීම අවශ්‍ය වේ. ඊට පසුව පදයෙන් පදයට අර්ථය කියන්නට සහ ලියන්නට හැකි වන පරිදි අර්ථාවබෝධය ලැබිය යුතු ය. අර්ථාවබෝධය සඳහා පද පිළිවෙළ දැනගතයුතු වේ.

#### ආ) සංඝගුණ පාඨයේ පද පිළිවෙළ හැඳින ගනිමු

භගවතෝ සාවකසංඝෝ සුපටිපන්නෝ භගවතෝ, සාවකසංඝෝ උජුපටිපන්නෝ, භගවතෝ සාවකසංඝෝ ඤායපටිපන්නෝ, භගවතෝ සාවකසංඝෝ සාමීචිපටිපන්නෝ, යදිදං චත්තාරි පුරිසයුගානි අට්ඨ පුරිසපුග්ගලා ඒස භගවතෝ සාවකසංඝෝ ආහුණෙය්‍යෝ පාහුණෙය්‍යෝ දක්ඛිණෙය්‍යෝ අඤ්ජලිකරණීයෝ ලෝකස්ස අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ඉති.

එහි තේරුම දැන ගනිමු.

භාග්‍යවත් බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවක සංඝතෙමේ,
I. මනා පිළිවෙතට පිළිපන් නිසා සුපටිපන්න නම් වේ.
II. ඍජු පිළිවෙතට පිළිපන් නිසා උජුපටිපන්න නම් වේ.

III. නිවන් පිණිස උපාය මාර්ගයට පිළිපත් නිසා ඤායපටිපන්න නම් වේ.

IV. සිව් පසයෙන් සංග්‍රහ ලැබීමට සුදුසු නිසා සාමීචිපටිපන්න නම් වේ.

**චත්තාරි පුරිසයුගානි**

පුරුෂ යුගල හතරකි. එනම්,

1. සෝවන් මගට පැමිණි
   සෝවන් ඵලයට පැමිණි
2. සකදාගාමී මගට පැමිණි
   සකදාගාමී ඵලයට පැමිණි
3. අනාගාමී මගට පැමිණි
   අනාගාමී ඵලයට පැමිණි
4. අරහත් මගට පැමිණි
   අරහත් ඵලයට පැමිණි

5. දුර සිට වුවද රැගෙන විත් සිව්පසයෙන් පිදීමට සුදුසු වන හෙයින් ආහුණෙය්‍ය නම් වේ.
6. ආගන්තුකයන් සඳහා පිළියෙල කරන ලද ආහාරපාන ආදිය පිළිගැන්වීමට සුදුසු වන හෙයින් පාහුණෙය්‍ය නම් වේ.
7. පරලොව කර්ම ඵල සලකා දෙනු ලබන සිව්පසය පිළිගැන්වීමට සුදුසු වන හෙයින් දක්ඛිණෙය්‍ය නම් වේ.
8. දොහොත් මුදුන් දී වැඳීමට සුදුසු වන හෙයින් අඤ්ජලිකරණීය නම් වේ.
9. ලෝකවාසී ජනතාවගේ උතුම් පින්කුඹුර හෙයින් ලෝකස්සඅනුත්තර පුඤ්ඤක්ඛෙත්ත නම් වේ.

**ඇ) පාලි වචනවල තේරුම දැන ගනිමු.**

| | | |
|---|---|---|
| සුපටිපන්නෝ | - | මනා පිළිවෙතට පැමිණි |
| භගවතෝ | - | භාග්‍යවතුන් වහන්සේගේ |
| සාවක සංඝෝ | - | ශ්‍රාවක සංඝයා වහන්සේ |
| උජුපටිපන්නෝ | - | ඍජු පිළිවෙතට පැමිණි |
| ඤායපටිපන්නෝ | - | නිවන් පිණිස උපාය මාර්ගයට පැමිණි |
| සාමීචිපටිපන්නෝ | - | සිව්පසයෙන් සංග්‍රහ ලැබීමට සුදුසු හෙයින් |
| යදිදං | - | යම් මේ |
| චත්තාරි පුරිසයුගානි | - | පුරුෂ යුගල සතර |
| අට්ඨ පුරිසපුග්ගලා | - | පුද්ගලයන් වශයෙන් අට දෙනෙක් |

ඒස ( ඒසෝ ) - ඒ
ආහුණෙය්‍යයෝ - කැඳවා පිළිගැන්වීමට සුදුසු සංග්‍රහයක් ලැබීමට සුදුසු
පාහුණෙය්‍යයෝ - ආගන්තුකයන් සඳහා පිළියෙල කරන ලද ආහාරපාන ආදිය පිළිගැන්වීමට සුදුසු
දක්ඛිණෙය්‍යයෝ - පරලොව කර්මඵල සලකා දෙනු ලබන ප්‍රත්‍ය පිළිගැනීමට සුදුසු
අඤ්ජලිකරණීයයෝ - දොහොත් මුදුන් දී වැඳීමට සුදුසු
අනුත්තරං - නිරුත්තර වූ
පුඤ්ඤක්ඛෙත්තං - පින් කෙත, පින් කුඹුර
ලෝකස්ස - ලෝකවාසීන්ගේ
ඉති - යනුයි.

## ඉ) සරල පාලි වාක්‍ය ගොඩනගන්නට ඉගෙන ගනිමු.

සඟ ගුණ පාඨය ඇසුරෙන් සරල වාක්‍ය ගොඩනැගිය හැකිය. පහත සඳහන් වගු තුළ ඇති පද ගැලපීමෙන් වාක්‍ය රටා දෙකක් නිර්මාණය කරමු.

වගුව I වාක්‍ය රටාව I

| | | | |
|---|---|---|---|
| තස්ස (ඒ) | භගවතෝ | සාවක සංඝෝ | සුපටිපන්නෝ |
| | | | උජුපටිපන්නෝ |
| | | | ඤායපටිපන්නෝ |
| | | | සාමීචිපටිපන්නෝ |
| | | | ආහුණෙය්‍යයෝ |
| | | | පාහුණෙය්‍යයෝ |
| | | | දක්ඛිණෙය්‍යයෝ |
| | | | අඤ්ජලිකරණීයයෝ |
| | | | අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං |

වගුව II වාක්‍ය රටාව II

| | | |
|---|---|---|
| සුපටිපන්නෝ | භගවතො | සාවක සංඝො |
| උජුපටිපන්නෝ | | |
| ඤායපටිපන්නෝ | | |
| සාමීචිපටිපන්නෝ | | |
| ආහුණෙය්‍යයෝ | | |
| පාහුණෙය්‍යයෝ | | |
| දක්ඛිණෙය්‍යයෝ | | |
| අඤ්ජලිකරණීයයෝ | | |
| අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං | | |

ඊ) ක්‍රියාකාරකම්

1. සඟ ගුණ පාඨය නිවැරදිව කියන්න.
2. ඉහත වගු ඇසුරෙන් සරල පාලි වාක්‍ය 10 ක් ගොඩනගන්න.
3. මේවා සිංහලට නගන්න.

   I. තස්ස භගවතෝ සාවක සංඝෝ උජුපටිපන්නෝ
   II. ආහුණෙය්‍යයෝ භගවතෝ සාවක සංඝෝ
   III. චත්තාරි පුරිසයුගානි අට්ඨ පුරිසපුග්ගලා
   IV. භගවතෝ ඒසෝ සාවකසංඝෝ අඤ්ජලිකරණීයයෝ

4. වරහන් තුළින් සුදුසු පද තෝරාගෙන හිස්තැන් පුරවන්න.
   (සාවක සංඝෝ, සුපටිපන්නෝ, භගවතෝ, ඒසෝ, පාහුණෙය්‍යයෝ)

   I. .................................................. සාවක සංඝෝ උජුපටිපන්නෝ.
   II. භගවතෝ සාවක සංඝෝ ..................................................
   III. භගවතෝ ..................................................සාමීචිපටින්නෝ
   IV. ඒසෝ භගවතෝ .................................................. ආහුණෙය්‍යයෝ
   V. ඒසෝ ........................... සාවක සංඝෝ ..................................
   VI. ............................... භගවතෝ ...................... අඤ්ජලිකරණීයෝ

05. පාලියට නගන්න.

I. ඒ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ අරහං නම් වන සේක.
II. බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද සද්ධර්ම ස්වාක්ඛාත ය.

III. බුද්ධරජාණන් වහන්සේගේ ශ්‍රාවක සංඝයා සුපටිපන්න ය.
IV. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝයා පුරුෂ යුගල සතරකි.
V. ශ්‍රාවක සංඝයා පුරුෂ පුද්ගලයන් ( වශයෙන් ) අට දෙනෙකි.

# 25. පාඩම
# පාලි 04

## සඟසතු කිරීමේ වාක්‍ය හා බුදුරදුන් කමාකරවා ගැනීමේ ගාථාව

අ) ඉමං භික්ඛං සපරික්ඛාරං භික්ඛු සංඝස්ස දේම
ඉමං මතකවත්ථං භික්ඛු සංඝස්ස දේම

කායේන වාචා චිත්තේන - පමාදේන මයා කතං
අච්චයං ඛම මේ භන්තේ - භූරිපඤ්ඤ තථාගත

ඉහත සඳහන් වන්නේ දානය සඟසතු කොට පූජා කිරීමේ හා මතක වස්ත්‍ර සඟසතු කොට පූජා කිරීමේ වාක්‍ය දෙකත් බුද්ධ රත්නය කමා කරවා ගැනීමේ ගාථාව ය. එම වාක්‍ය දෙකත් ගාථාවත් තෙවරක් ශබ්ද නගා නිවැරදිව කියවීම අවශ්‍ය වේ. එය බෞද්ධ සම්ප්‍රදාය යි. ඊට පසුව පදයෙන් පදය අර්ථය කියන්නට සහ ලියන්නට හැකි වන පරිදි අර්ථාවබෝධය ලැබිය යුතු වේ. අර්ථාවබෝධය සඳහා ද පද පිළිවෙළ දැනගතයුතු ය.

## ආ) දානය, මතකවස්ත්‍ර පූජා කිරීමේ වාක්‍යයේ හා කමා කරවා ගැනීමේ ගාථාවේ පද පිළිවෙළ

- දානය සගසතු කොට පූජා කිරීමේ වාක්‍යයේ පද පිළිවෙළ
(මයං) සපරික්ඛාරං ඉමං භික්ඛං භික්ඛුසංඝස්ස දේම
- මතක වස්ත්‍ර සඟසතු කොට පූජා කිරීමේ වාක්‍යයේ පද
පිළිවෙළ (මයං) ඉමං මතකවත්ථං භික්ඛුසංඝස්ස දේම
- බුද්ධ රත්නය කමා කර ගැනීමේ ගාථාවේ පද පිළිවෙළ
භන්තේ, භූරිපඤ්ඤ තථාගත, කායේන වාචා චිත්තේන,
පමාදේන මයා අච්චයං කතං මේ ඛම

## ඇ) ඒවායෙහි තේරුම දැන ගනිමු.

(අපි) පිරිකර සහිත මේ දානය ( භික්ෂාව) භික්ෂු සංඝයා
වහන්සේට දෙමු. ( පිළිගන්වමු.)
(අපි) මේ මතක වස්ත්‍රය භික්ෂු සංඝයා වහන්සේට දෙමු.
(පිළිගන්වමු.)

ස්වාමීනි, මහත් නුවණ ඇති තථාගතයන් වහන්ස, මා විසින් කයින්, වචනයෙන්, සිතින් ප්‍රමාදය කරන කොට (වැරදි) කරන ලදී. මට කමා කරන්න.

## ඇ) පාලි වචනවල තේරුම දැන ගනිමු.

ඉමං - මේ
භික්ඛං - දානය (භික්ෂාව)
සපරික්ඛාරං - (ස + පරික්ඛාරං) පිරිකර සහිත
භික්ඛුසංඝස්ස - භික්ෂු සංඝයා වහන්සේට
දේම - දෙමු
මතකවත්ථං - මතක වස්ත්‍රය (මියගිය අය වෙනුවෙන් පූජා කරන වස්ත්‍රය)
කායේන - කයින්
වාචා(ය) - වචනයෙන්
චිත්තේන - සිතින්
පමාදේන - ප්‍රමාදය කරන කොට
මයා - මා විසින්
කතං - කරන ලදී
අච්චයං - වරද, අපරාධය
ඛම - ඉවසන්න, සමාව දෙන්න
මේ - මට
භන්තේ - ස්වාමීනි
භූරිපඤ්ඤ - මහත් නුවණ ඇති
තථාගත - - තථාගතයන් වහන්ස, බුදුරජාණන් වහන්ස

## ඉ) සරල පාලි වාක්‍ය ගොඩනගන්න ඉගෙන ගනිමු.

දානය හා මතකවස්ත්‍ර පූජා කිරීමේ වාක්‍ය ඇසුරෙන් හා බුද්ධ රත්නය කමා කරවා ගැනීමේ ගාථාව ඇසුරෙන් සරල පාලි වාක්‍ය ගොඩනැගිය හැකිය. පහත සඳහන් වගුවල ඇති පද ගැලපීමෙන් සරල වාක්‍ය ගොඩ නගමු.

### වගුව I වාක්‍ය රටාව I

| | | | | |
|---|---|---|---|---|
| අහං | ඉමං | ගිලාන පච්චයං<br>ගිලාන පච්චය භෙසජ්ජං<br>පායාසං | භික්ඛුසංඝස්ස | දේමි |
| මයං | | අට්ඨපරික්ඛාරං<br>කඨින චීවරං<br>තාම්බූලදානං | | දේම |

## වගුව II වාක්‍ය රටාව II

| | | | |
|---|---|---|---|
| අච්චයං | ඛම | මේ | භන්තේ |
| | | | ධම්ම |
| | | | සංඝ |
| දීඝං | පස්ස | | පුත්ත |
| පාඨං | පඨ | හේ | සිස්ස |
| ධම්මං | භාස | | සමණ |
| සුඛං | ජීව | | තාත |

### ඊ) ක්‍රියාකාරකම්

1. දානය හා මතකවස්ත්‍ර පූජා කිරීමේ වාක්‍ය නිවැරදිව කියන්න.
2. බුද්ධ රත්නය කමා කරවා ගැනීමේ ගාථාව ඇසුරින් සරල වාක්‍ය තුනක් ලියන්න.
3. ඉහත වගු ඇසුරෙන් සරල පාලි වාක්‍ය 10 ක් ගොඩනගන්න.
4. පහත සඳහන් පාලි වාක්‍ය සිංහලට නගන්න.
   - I. සෝ ඉමං ගිලාන පච්චය භෙසජ්ජං භික්ඛුසංඝස්ස දේති.
   - II. භන්තේ මේ ඛම.
   - III. ත්වං ඉමං අට්ඨපරික්ඛාරං භික්ඛුසංඝස්ස දේහි.
   - IV. තාත, දීඝං පස්ස, මා රස්සං.
   - V. තේ ඉමං කඨින චීවරං භික්ඛු සංඝස්ස දෙන්ති.

### අලුත් වචන

අහං - මම
මයං - අපි
ගිලාන පච්චය භේසජ්ජං - ගිලන්පස හා බෙහෙත්
තාම්බූලදානං - දැහැත්
පායාසං - කිරිබත්
කඨිනචීවරං - කඨින සිවුර
අට්ඨපරික්ඛාරං - අටපිරිකර
දීඝං - දුර, දිග
රස්සං - ළඟ, කෙටි
මා - එපා
දේමි - දෙමි
දේම - දෙමු
ඛම - ඉවසන්න, කමාකරන්න
පස්ස - බලන්න, දකින්න

| | | |
|---|---|---|
| පඨ | - | පාඩම් කරන්න |
| භාස | - | කියන්න, දේශනා කරන්න |
| ජීව | - | ජීවත්වන්න |
| භෝ | - | පින්වත්, එම්බා |
| පුත්ත | - | පුත්‍රය |
| සිස්ස | - | ශිෂ්‍යය |
| සමණ | - | ශ්‍රමණයන් වහන්ස |
| තාත | - | දරුව |

# 26. පාඩම

# අභිධර්මය 1

## රූප

මං බුද්ධ රූපයක් ඇන්දා ලස්සන ද බලන්න රූපා
ඔව් පවිත්‍රා, මේක නම් හරිම ලස්සනයි.
ඔයාගේ පොත අස්සේ තියෙන මේ ඡායාරූපය කාගෙද යමුනා?
යනුවෙන් රූපා ඇසුවාය.

මේ අතර එදිනට නියමිත අභිධර්ම පාඩම ඉගැන්වීමට පන්තියට පැමිණෙන ස්වාමීන් වහන්සේට මේ තිදෙනා රූප ගැන කතා කරන බව වැටහුණි.

රූපල, දැන් කතාකරමින් හිටියේ රූප ගැන නේද?
එහෙමයි.

රූපා, පවිත්‍රා, යමුනා කියන නම් දන්නේ මුල් අකුරු තුනෙන් කියවෙන්නෙත් රූපය කියල. බුද්ධ රූපය, ඡායා රූපය වගේම තවත් රූප තියනවා. අද අපේ පාඩමේ නමත් රූප, අපි දැන් ඒ රූප ගැන ඉගෙනගනිමු.

බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර දෙව්රම් වෙහෙරෙහි වැඩ ඉන්න වෙලාවක රූපය කියන්නේ ඇයි ? කියන ප්‍රශ්නය අහල ඒකට පිළිතුරක් දුන්නා. බිඳෙන නිසා, වෙනස්වන නිසා රූප කියනවා.

සීතලෙන් බිඳෙනව
උණුසුමෙන් බිඳෙනව
කුසගින්නෙන් බිඳෙනව
පිපාසයෙන් බිඳෙනව
මැසි මදුරුවන් දෂ්ට කිරීමෙන් බිඳෙනව
වාතයෙන්, අව්වෙන් බිඳෙනව
සර්පයන් ස්පර්ශවීමෙන් බිඳෙනව

මෙසේ බිඳෙන නිසා රූප කියනව. උදාහරණයක් ගෙන බලමු. සීතලට පෙඟී ඇති පාන් කැබැල්ලක් අව්වට දැමූ විට කරවෙනව. මේ පෙඟීමත්, කරවීමත් දෙකම බිඳීමක් වෙනස්වීමක්.

සැවැත්නුවරදී තවත් වරෙක රූපය කුමක්ද යන ප්‍රශ්නයට පිළිතුරු දෙන බුදුරජාණන් වහන්සේ රූපය හඳුන්වා ඇත්තේ සතර මහා භූත හා ඒ මහා භූත ඇසුරු කොට පවතින උපාදාය රූප යනුවෙනි.
මහා භූත රූප

1. පඨවි ධාතුව
2. ආපෝ ධාතුව
3. තේජෝ ධාතුව
4. වායෝ ධාතුව

මේවාට මහා භූත රූප යන නම යෙදී ඇත්තේ මහ පොළොව, පර්වත, ගංගා ආදී වශයෙන් විශාලව පහළවන නිසාය.

**1. පඨවි ධාතුව**

යම්කිසි වස්තුවක් අතගා බලන විට දැනෙන තද ගතිය පඨවි ධාතුවය. ලී කැබැල්ලක ඇති තද ගතියත් කුඩා දරුවකුගේ සිරුරෙහි ඇති මොළොක් ගතියත් පඨවි ධාතුවය. මේ දෙකෙහි වෙනස වන්නේ තද ගතියෙහි අඩු වැඩි බව පමණි.

**2. ආපෝ ධාතුව**

ඇලෙන බැඳෙන වැගිරෙන ගතිය ආපෝ ධාතුවයි. පිටි ටිකකට වතුර ස්වල්පයක් දමා අනාගත් විට පිටි සියල්ල එකට බැඳී පවතී. විසිරෙන්නට නොදී අල්ලා ගැනීම ආපෝ ධාතුවේ ස්වභාවයය. වතුර, තෙල්, ආදියෙහි ආපෝ ධාතුව බහුලය. එම නිසා ඒවා වැගිරෙයි. බත්, වරකා ආදියෙහි ආපෝ ධාතුව අඩුය.

**3. තේජෝ ධාතුව**

උණුසුම් බව තේජෝ ධාතුවයි. උණුසුම අඩු වීමෙන් ඇතිවන සිසිලසත් තේජෝ ධාතුවටම අයත්ය. අප ගන්නා ආහාර පැසවන්නේ මේ තේජෝ ධාතුව නිසාය. ගින්නෙහි තේජෝ ධාතුව අධිකව පවතී.

4. වායෝ ධාතුව

පිම්බෙන, පාවෙන, සැලෙන, තල්ලුකරන, ස්වභාවය වායෝ ධාතුවය. සුළඟෙහි වායෝ ධාතුව බහුලව ඇත. ඕනෑම දෙයක මේ සතර මහා භූත ඇතත් එයින් එකක් බහුලව පවතී.

උපාදාය රූප

මහා භූත රූප ඇසුරු කොට පවතින රූප උපාදාය රූප යනුවෙන් හඳුන්වන බව මුලදී සඳහන් කර ඇත. මේ රූප ගණනින් විසි හතරකි. ඒවා කොටස් නවයකට බෙදේ.

■ පසාද රූප පහ

රූප, ශබ්ද, ගන්ධ, රස, ඵොට්ඨබ්බ යන මේවා ලබාගැනීමට උපකාරී වන එකිනෙකට වෙනස් ස්වභාවයෙන් පිහිටා ඇති ඔපමට්ටම් බවෙන් යුක්ත වූ රූප පහකි.

1. චක්ඛුප් - පසාද රූපය

රූප දැකීමට හැකි අයුරින් ඇසෙහි පිහිටා ඇති ඉතා කුඩා ඔපමට්ටම් ගතිය චක්ඛු-පසාද රූපය යි.

2. සෝතප් - පසාද රූපය

ශබ්දය ඇසීමට හැකි අයුරින් කන් සිදුර තුළ පිහිටා ඇති ඔපමට්ටම් ගතිය සෝතප්- පසාද රූපයයි.

3. ඝානප් - පසාද රූපය

ගඳ සුවඳ දැන ගැනීමට උපකාර වන අයුරින් නාස් කුහරය තුළ පිහිටා ඇති ඔපමට්ටම් ගතිය ඝානප් පසාද රූපයයි.

4. ජිව්හාප් - පසාද රූපය

කන බොන ආහාර පානාදියෙහි රස දැන ගැනිමට හැකි වන අයුරින් දිවෙහි පිහිටා ඇති ඔපමට්ටම ගතිය ජිව්හාප් - පසාද රූපයයි

5. කායප් - පසාද රූපය

ස්පර්ශය දැන ගැනීමට හැකි අයුරින් සිරුරෙහි පැතිරී පවතින ඔපමට්ටම් ගතිය කායප්- පසාද රූපය යි. කෙස්, ලොම්, නිය, වියලි සම ආදියෙහි එය නැත.

■ ගෝචර රූප හතර

ගණනින් හතරකි. මේවාට විෂය රූප යන නම ද යෙදේ. ඒවා නම්, රූප, ශබ්ද, ගන්ධ, රස යන හතරය.

චක්ඛුප් - පසාද රූපයට වර්ණ ගොදුරු වෙයි.
සෝතප් - පසාද රූපයට ශබ්දය ගොදුරු වෙයි.
ඝානප් - පසාද රූපයට ගන්ධය ගොදුරු වෙයි.
ජිව්හාප් - පසාද රූපයට රසය ගොදුරු වෙයි.
කායප් - පසාද රූපයට ඵොට්ඨබ්බය ගොදුරු වෙයි.

එහෙත් ඵොට්ඨබ්බය වෙනම රූපයක් ලෙස නොසැලකෙයි.

■ භාව රූප දෙක

1. ස්ත්‍රී භාව රූප 2. පුරුෂ භාව රූප

ශරීරයක ස්ත්‍රී ස්වභාවය ඇති කරවන රූපය ස්ත්‍රී භාවරූපයයි. පුරුෂ භාවය ඇතිකරවන රූපය පුරුෂ භාවරූපයයි. මේවා ඉන්ද්‍රිය රූප යනුවෙන් ද හැඳින්වේ.

■ හදය වත්ථු රූපය

සිත් ඇතිවීමට ස්ථානවන රූපය හදය වත්ථු රූපය යි.

■ ජීවිතින්ද්‍රිය රූපය

කර්ම, චිත්ත, ඍතු, ආහාර යන හේතු හතරෙන් ශරීරයක රූපය හටගනී. මෙයින් කර්මයෙන් හටගන්නා රූප, කාලයක් පවත්වා ගැනීමට හැකි වන අයුරින් පවතින බලය, ශක්තිය මේ ජීවිතින්ද්‍රිය රූපය යි.

■ ආහාර රූපය

ඒ ඒ සත්ත්වයන් ගනු ලබන ආහාරවල ශරීරය පවත්වා ගැනීමට අවශ්‍ය සාරයක් ඕජාවක් ඇත. ශරීරය දිගින් දිගට පවතින්නේ මේ ඕජාව නිසාය. එම ඕජාව ආහාර රූපය නම් වේ.

මෙතෙක් ඉදිරිපත් කළ රූප දහ අට කර්ම, චිත්ත ඍතු, ආහාර යන හේතු ප්‍රත්‍යවලින් උපදී. එහෙයින් ඒ රූපවලට නිෂ්පන්න රූපයයි ද කියනු ලැබේ. ස්වභාව රූප යනු ද මේවාය.

■ විකාර රූප තුන

1. ලහුතා : රූපවල සැහැල්ලු බව ලහුතා නම් වේ.
2. මුදුතා : රූපවල මොළොක් බව මුදුතා නම් වේ.
3. කම්මඤ්ඤතා : යම් ක්‍රියාවක් කිරීමට රූපවල ඇති යෝග්‍ය බව කර්මයට සුදුසු බව කම්මඤ්ඤතා නම් වේ.

■ විඤ්ඤත්ති රූප දෙක

1. කාය විඤ්ඤත්ති
2. වචී විඤ්ඤත්ති

විඤ්ඤත්ති යනු හැඟවීමයි. කයින් යමක් හඟවන විට ක්‍රියාත්මක වන්නේ කාය විඤ්ඤත්ති රූපයයි. වචනයෙන් යමක් හඟවන විට ක්‍රියාත්මක වන්නේ වචී විඤ්ඤත්ති රූපයයි.

■ ලක්ෂණ රූප හතර

උපචය : පළමුවරට රූප ඉපදීම උපචය යි.
සන්තති : උපන් රූපය බිඳී ගිය විට නැවත රූපයක් හටගනී. මෙසේ බිඳී යන රූප වෙනුවට නැවත නැවත රූප ඉපදීම සන්තතිය යි. රූප පරම්පරාවයි.
ජරතා : රූප දිරායාම ජරතා නම් වේ.
අනිච්චතා : රූප විනාශවීම අනිච්චතා නම් වේ.

මෙම රූප දහය කර්ම, චිත්ත, ඍතු, ආහාර යන හේතු ප්‍රත්‍යයන්ගේ නොහට ගන්නා හෙයින් අනිෂ්පන්න රූප යනුවෙන් හඳුන්වනු ලැබේ.

■ පරිච්ඡේද රූප

පරිච්ඡේද නම් රූප වෙන් කරන ස්වභාවයයි. රූප කලාපයකින් රූප කලාපයක් වෙන් කෙරෙන්නේ පරිච්ඡේද රූපයෙනි. මෙයට ආකාශ රූපය යන නම ද යෙදේ.

රූප 28

නිෂ්පන්න රූප 18

මහා භූත රූප 4

1. පඨවි
2. ආපෝ
3. තේජෝ
4. වායෝ

ප්‍රසාද රූප 5

5. චක්ඛුප් - පසාද
6. සෝතප් - පසාද
7. ඝානප් - පසාද
8. ජිව්හාප් - පසාද
9. කායප් - පසාද

ගෝචර රූප 4

10. රූප
11. සද්ද
12. ගන්ධ
13. රස

භාව රූප 2

14. ඉත්ථී භාව
15. පුරිසභාව

16. හදය රූප 1
17. ජීවිත රූප 1
18. ආහාර රූප 1

අනිෂ්පන්න රූප 10

1. ආකාශ රූප 1

විඤ්ඤත්ති රූප 2

2. කාය විඤ්ඤත්ති
3. වචී විඤ්ඤත්ති

විකාර රූප 3

4. ලහුතා
5. මුදුතා
6. කම්මඤ්ඤතා

ලක්ෂණ රූප 4

7. උපචය
8. සන්තති
9. ජරතා
10. අනිච්චතා

ක්‍රියාකාරකම්

1. අයිස් කැටයක පඨවි ධාතුව බහුලව ඇත. එය දිය වූ පසු බහුලව ඇත්තේ කුමන ධාතුව ද?

2. උණු වතුරෙහි තේජෝ ධාතුව බහුලව ඇත. සිසිල් ජලයෙහි බහුලව ඇත්තේ කුමන ධාතුව ද?

3. ලීයකට තට්ටු කළ විට ශබ්දයක් ඇති වේ.

I. එම ලීයේ බහුලව ඇති ධාතුව කුමක් ද?

II. එයින් හටගත් ශබ්දය අයත් වන්නේ මහාභූත රූප, උපාදාය රූප, පසාද රූප, ගෝචර රූප, යන මේවායින් කුමන කොටස් දෙකට ද?

පුහුණුවට

භූතප්පසාද විසයා භාවෝ හදයම්ච්චචි
ජීවිතාහාර රූපේති අට්ඨාරසවිධං තථා
පරිච්ඡේදෝච විඤ්ඤත්ති විකාරෝ ලක්ඛණානිච
අනිෂ්ඵන්නා දසචේති අට්ඨවීස විධං භවේ.

(අභිධර්මාර්ථ සංග්‍රහය)

## 27. පාඩම

### බුදු ගුණ සුවඳ

ඉතිපිසො පාඨයෙහි ඇතුළත් බුදු ගුණ ගණනාවක් ගැන අපි 6, 7, 8 ශ්‍රේණිවලදී ඉගෙන ගතිමු. මේ පාඩමෙහි සාකච්ඡා කෙරෙනුයේ සම්මා සම්බුද්ධ, විජ්ජාචරණ සම්පන්න, ලෝකවිදූ යන බුදු ගුණ තුන සම්බන්ධවයි.

**සම්මා සම්බුද්ධො**

බුදු ගුණ කවියට නැගූ වීදාගම මෛත්‍රේය ස්වාමිපාදයාණන් වහන්සේ ''බුදුගුණ අලංකාරය'' නම් වූ කාව්‍ය ග්‍රන්ථයෙහි සම්මා සම්බුද්ධ ගුණය විස්තර කළේ මේ අයුරිනි.

තුන් කල්හි ම පැවැ ති
පදරුත් සියල් ලොවැ ඇ ති
අතැඹුලසෙ දැනග ති
එයින් සම්මා සම්බුදුන යෙ ති

අතීත, අනාගත, වර්තමාන යන තුනට ම අයත් ව ලෝකයෙහි පවතින සියලු පදාර්ථයන් අතෙහි ඇති ඇඹුලක් (නෙල්ලි ගෙඩියක්) මෙන් තමන් වහන්සේ විසින් ම මනාව දැනගත් නිසා ''සම්මා සම්බුද්ධ''යි කියනු ලැබේ.

මේ කවියේ "පදරුත්" යන්නෙන් අදහස් වන්නේ පදයන් හි හෙවත් වචනවල අර්ථය, වචන හෙවත් භාෂාවෙහි මතුපිට අර්ථයක් පමණ-ක් නොව ගැඹුරු පරම අර්ථයක් ද ඇත. එය පරම අර්ථය හෙවත් පරම සත්‍යය යි. ඒ සත්‍යය බුදු දහමේ චතුරාර්ය සත්‍යය නමින් හැඳින් වේ. චතුරාර්ය සත්‍යයත් සම්මුති සත්‍යයත් අවබෝධ කරගත් නිසා සම්මා සම්බුද්ධය යන්න කවියේ අර්ථයයි.

වරක් සේල නම් වූ බ්‍රාහ්මණයාට බුදුරජාණන් වහන්සේ මෙසේ වදාළහ.

අභිඤ්ඤෙය්‍යං අභිඤ්ඤාතං
භාවේතබ්බං ච භාවිතං
පහාතබ්බං පහීනං මේ
තස්මා බුද්ධෝස්මි බ්‍රාහ්මණ

බමුණ මම, සුවිශේෂ වශයෙන් දැනගත යුතු දේ සුවිශේෂ වශයෙන් ම දැන ගතිමි. වැඩිය යුතු දේ වැඩුවෙමි. ප්‍රහාණය කළ යුතු දේ ප්‍රහාණය කෙළෙමි. එනිසා මා බුදුවරයෙකුයැයි දැනගන්න.

මෙහි අභිඤ්ඤාවෙන් දැනගත යුතු දේ නම් චතුරාර්ය සත්‍යයයි වැඩිය යුතු දේ නම් ආර්ය අෂ්ටාංගික මාර්ගයයි. ප්‍රහාණය කළ යුතු දේ නම් අවිද්‍යාව හා තණ්හාවයි. මේවා සමුදය සත්‍යයට අයත් කරුණුය.

සම්මා සම්බුද්ධ යන වචනයෙහි සම්මා යන්නෙන් දැන ගත යුතු සියලු දේ මැනවින් දැනගත් බව ද, සං යන්නෙන් තමන් වහන්සේ විසින්ම දැනගත් බව ද, බුද්ධ යන්නෙන් අවබෝධ කරගත් බව ද කියැවේ. (මෙසේ දැනගත යුතු සියලු දේ තමන් වහන්සේ විසින් ම මැනවින් අවබෝධ කර ගත් නිසා සම්මා සම්බුද්ධ නම් වන සේක.)

**විජ්ජාචරණ සම්පන්නෝ**

බුදුරජාණන් වහන්සේ විද්‍යාවෙන් ද චරණයෙන් ද යුක්ත නිසා විජ්ජාචරණ සම්පන්න යැයි කියනු ලැබේ. මේ බුදුගුණය බුදුගුණ අලංකාරයෙහි විස්තර වන්නේ මෙලෙසිනි.

විද්දැ නැණ අට ද
පසලොස් සරණ ගුණය ද
ඇතියෙන් එමුනි සඳ
පිරුණු විජ්ජාචරණ නම් ලද

**විජ්ජා** හෙවත් විද්‍යා යනු උසස් නුවණයි. චරණ යනු යහපත් හැසිරීම් රටාවයි.

විද්‍යාවන් තුනක් ලෙසින් ද අටක් ලෙසින් ද දක්වා තිබේ. ත්‍රිවිද්‍යා නම්,

1. පුබ්බේ නිවාසානුස්සති ඤාණය.
2. දිබ්බචක්ඛු ඤාණය හා
3. ආසවක්ඛය ඤාණය යි.

අෂ්ට විද්‍යා නම්, මේ ඥාණ තුන ද ඇතුළත්ව තවත් ඥාණ පහකින් සමන්විත ඥාණ අටකි. ඒවා මෙසේය.

1. විපස්සනා ඥාණය - ධර්මයන් අනිත්‍ය, දුක්ඛ, අනාත්ත යන ත්‍රිවිධාකාරයෙන් දැකීමේ ඥාණයයි.

2. මනෝමය ඉද්ධි ඥාණය - තම ශරීරය වැනි ශරීරයක් මවා දැක්වීමට සමත් ඥාණයයි.

3. ඉද්ධි විධ ඥාණය - විවිධ සෘද්ධීන් හෙවත් විශ්මය ඇති කරන දේ කිරීමට සමත් ඥාණයයි.

4. දිබ්බසෝත ඥාණය - දුර වූ ද ළඟ වූ ද සියලු ශබ්ද ඇසීමට සමත් ඥාණයයි.

5. පරචිත්ත විජානන ඥාණය - අනුන්ගේ සිත් දැන ගැනීමට හැකි ඥාණයයි.

6. පුබ්බේ නිවාසානුස්සති ඥාණය - පෙර විසූ ආත්ම භාවයන් පිළිබඳ තොරතුරු දැන ගත හැකි ඥාණයයි.

7. දිබ්බ චක්ඛු ඥාණය - දිවැස යි. එනම් චුති උප්පත්ති දැකීමේ ඥාණයයි. මෙය චුතූපපාත ඥාණය නමින් ද හැඳින්වේ.

8. ආසවක්ඛය ඥාණය - ආසව නම් කෙලෙස් ය. සියලු කෙලෙස් නැසීම පිළිබඳ දැනීමේ ඥාණයයි.

බුදුරජාණන් වහන්සේ මේ ඥාණයන්ගෙන් හෙවත් විද්‍යාවන් ගෙන් මෙන් ම චරණ ධර්ම පහළොවකින් ද සමන්විත වූ සේක. ඒ පහළොස් චරණ ධර්ම මේවාය.

1. ප්‍රාතිමෝක්ෂ සංවර ශීලය - සිල් පද සමාදන්ව ඒවා රැක ගැනීමෙන් සංවර වීමය.

2. ඉන්ද්‍රිය සංවර ශීලය - ඇස, කන, නාසය, දිව, සම ( සිරුර ) යන ඉන්ද්‍රියන් සංවර කර ගැනීමයි.

3. භෝජනේ මත්තඤ්ඤුතා - ආහාර ගැනීමේදී පමණ දැනීමයි.

4. ජාගරියානුයෝගය - ඵලසමවත්හි යෙදීමේදී නිදිවර්ජිතව සිටීමයි.

5. සද්ධා - ශ්‍රද්ධාවයි.

6. හිරි - පව්කම් කෙරෙහි ඇති ලජ්ජා සහගත බවයි.

7. ඔත්තප්ප - පව්කම් සඳහා ඇති බියයි.

8. බහුස්සුත - දහම පිළිබඳව ඇති මනා අවබෝධයයි.

9. විරිය - කුසල් දහම් හි ඇති උත්සාහයයි.
10. සති - සියලු චර්යාවන්හි සිහියෙන් යුක්ත බවයි.
11. පසද්ධා - විදර්ශනා ප්‍රඥාවයි.
12. ප්‍රථම ධ්‍යානය
13. ද්විතීය ධ්‍යානය
14. තෘතීය ධ්‍යානය
15. චතුර්ථ ධ්‍යානය යන පසළොවයි.

## ලෝකවිදූ

බුදුරජාණන් වහන්සේ ලෝකය පිළිබඳ ව දතයුතු සියලු ආකාරයෙන් ලෝකය අවබෝධ කරගත් නිසා ලෝකවිදූ නම් වෙති. බුදුගුණ අලංකාරය එම බුදුගුණය විස්තර කරන කවිය මෙයයි.

තුන් ලොව තතු ලෙස ට
දැනගෙන නොදත් මෙලොව ට
දෙසුයෙන් නියම කො ට
ලෝකවිදූ යැයි කියති මුනිඳු ට

ලෝකය ත්‍රිවිධය. 1. සංස්කාර ලෝකය
2. සත්ව ලෝකය හා
3. අවකාශ ලෝකය යනුවෙනි.

මෙහි සංස්කාර, ස්කන්ධ, ආයතන, ධාතු ආදී වශයෙන් බෙදා දක්වා ඇති ධර්ම සමූහයයි. මේවා අවබෝධ කරගත් බුදුරජාණන් වහන්සේ ලෝකයාට ද ඒවා දේශනා කළ සේක.

සත්ව ලෝකය ද තුන් ආකාරයකින් බෙදා දැක්වේ. ඒ මෙසේය.
1. කාම ලෝකය
2. රූප ලෝකය සහ
3. අරූප ලෝකය යි.

මෙම ලෝකයෙහි වෙසෙන සත්වයන්ගේ දක්නට ලැබෙන රාගාදි කෙලෙස්වල අඩුපාඩුකම් ආදිය බුදුරජාණන් වහන්සේ මැනවින් අවබෝධ කරගෙන අන්‍යයන්ට ද දෙසූ සේක. අනෙක අවකාශ ලෝකය වනාහි භෞතික ලෝකයයි. හිරු හඳ තාරකා, පොළොව, මුහුද, පර්වත, ගංගා, ගස්වැල්, සතුන්, මිනිසුන් සහිත ලෝකයයි.

මේ ත්‍රිවිධ ලෝකය පිළිබඳව ම බුදුරජාණන් වහන්සේ මැනවින් දැනගත් නිසා ලෝකවිදූ නම් වූ සේක.

**ක්‍රියාකාරකම්**

1. සම්මා සම්බුද්ධ ගුණයට ඇතුළත්ව කියන ලද "දත යුතු සියලු දේ" යන්නෙන් අදහස් කළේ මොනවාද ?
2. ත්‍රිවිද්‍යා විස්තර කරන්න.
3. ස්කන්ධ ලෝකය පිළිබඳව හැඳින්වීමක් කරන්න.

**පුහුණුවට**

අභිඤ්ඤෙය්‍යං අභිඤ්ඤාතං යන ගාථාව පාඩම් කරගන්න.

## 28. පාඩම

# පැවිදි පඬි මිණි පහන්

කලින් කලට යුගකාරක මහතෙරවරුන් ලක් බුදු සසුන තුළ බිහිවීම රට දැය සමය රැකගැනීමට හේතුවිය. එලෙස යුග මෙහෙවර ඉටුකළ නාහිමිවරුන් කිහිප නමක් පිළිබඳ පසුගිය ශ්‍රේණිවලදී අපි උගත්තෙමු. එම චරිත කතා අපේ ජීවිත හැඩගසා ගැනීමට මහඟු පිටිවහලකි. බෞද්ධයන් ලෙස රට දැය සමයට හානිදායක අවස්ථාවලදී ක්‍රියාකළයුතු ආකාරය පිළිබඳ මෙම චරිත මග පෙන්වයි. එනිසා මෙම ශ්‍රේණියේදී අවධානය යොමු කරන නාහිමිවරු තෙනමකි. අතිපූජ්‍ය පැළෑණේ සිරි වජිරඤාණ මහ නාහිමි, අතිපූජ්‍ය කළුකොඳයාවේ පඤ්ඤාසේඛර මහ නාහිමි, අතිපූජ්‍ය බද්දේගම විමලවංස අනුනාහිමි එම තෙනමයි. අපි එම නාහිමිවරුන්ගේ චරිතාපදානයන් පිළිබඳ සොයා බලමු.

### අතිපූජ්‍ය පැළෑණේ සිරි වජිරඤාණ මහ නාහිමියෝ



අපේ දහම් පාසලේ ජනවාරි මාසයේ ශිෂ්‍ය සමිතියේදී විහාරාධිපති නායක හාමුදුරුවන් වහන්සේ අනුශාසනාව ආරම්භ කළේ පහත කවි තුන ගායනා කරමිනි.

බුදුරුවනට බැති දැරුවෝ
දරුවනට රුති කැරුවෝ
සඟරුවනට ගැති යුරුවෝ
වෙති හොඳ සිංහල දරුවෝ

මව් පියනට පෙම් කරුවෝ
ගුරුවරුනට කී කරුවෝ
වැඩිමලුනට ගරු සරුවෝ
වෙති හොඳ සිංහල දරුවෝ

වීරිය දිරි ගුණ දැරුවෝ
කාරිය කරනට සූරුවෝ
සූරිය සරි තෙද ගරුවෝ
ආරිය සිංහල දරුවෝ

ඉන් අනතුරුව මෙම කවි පංතියේ රචකයා වූ අතිපූජ්‍ය පැළෑණ සිරි වජිරඤාණ මහනායක මාහිමියන් පිළිබඳ විස්තරයක් කළහ. උන්වහන්සේ උපන්නේ 1878 නොවැම්බර් 25 වැනි දින දකුණු පළාතේ වැලිගම පැළෑණ නමැති ග්‍රාමයේය. පියා වූයේ දොන් ආදිරියස් කුඩාවේ පණ්ඩිත ගුණවර්ධන හෙවත් කුඩාවේ පඬිතුමාය. දෝන ගිමාරා සේරසිංහ මව වූවාය. අකුරු ඉගෙනීමට අත්පොත තැබුවේ තම පියා ය. මූලික අධ්‍යාපනය ලැබුවේ නිවස අසල සිංහල පාසලෙනි. ජෝන් ලොක් නම් මිරිස්ස ද්විභාෂා පාසලේ ප්‍රධානාචාර්යවරයාගෙන් ඉංග්‍රීසි භාෂාව හැදෑරීය. වයස අවුරුදු දොළහ සපුරන විට දී මුහුණු පෑවේ කණගාටු දායක සිදුවීමකට ය. එනම් තම දිවිමඟ එළිය කළ පියාණන්ගේ අභාවයයි. මේ අවස්ථාවේදී දරුවාගේ පැවිදි වාසනා ගුණ සලකා බලා පැවිදි කිරීම සඳහා මොහු ශාසනයට භාරදෙනු ලබන්නේ සිය මව විසින්ය. ඒ අනුව මාතර කඹුරුගමුවේ දේවගිරි විහාරාධිපති අතිගරු වේරගම්පිට සිරි රේවත ලොකු හාමුදුරුවන් වහන්සේගේ ආචාර්යත්වයෙන් පැවිදි බව ලබන්නේ 1893 ජූලි මස 30 දිනය. පැළෑණේ වජිරඤාණ යනු උන්වහන්සේට හිමි වූ පැවිදි නාමයයි.

පැවිද්ද ලැබූ මුල් වසර කිහිපයේදී උගතමනා බණ දහම් හැදෑරුවේ ගුරුදේවයන් වෙතිනි. වැඩිදුර අධ්‍යාපනය සඳහා 1897 වර්ෂයේ ඇතුළත් වූයේ විද්‍යෝදය මහ පිරිවෙනට ය. තම පියාණන්ගේ සමීපතම මිතුරෙකු වූ අතිපූජ්‍ය හික්කඩුවේ ශ්‍රී සුමංගල නායක මාහිමිපාණන්ගේ සමීපයේ ධර්ම ශාස්ත්‍ර හැදෑරීමට අවස්ථාව මේ නිසා උදාවිණි. ඉතා දක්ෂ ලෙසත් විනීත ශිෂ්‍යයෙකු ලෙසත් ඉගෙනීම් කටයුතුවල නිරත වූ වජිරඤාණ පොඩි හාමුදුරුවෝ වසර තුනක් වැනි කෙටි කාලයක් තුළ එනම් වර්ෂ 1900 දී පිරිවෙන් අධ්‍යාපනය නිම කළේ පිරිවෙනේ දක්ෂතම ශිෂ්‍යයාට හිමි ස්‍යාමරාජ ත්‍යාගය ද දිනාගනිමිනි. මෙම සිද්ධිය විද්‍යෝදය පිරිවෙනේ මෙතෙක් නොසිඳ පවතින වාර්තාවකි. එම වර්ෂයේදීම මාතර නිල්වලා නදී උදකුක්ඛේප සීමා මාලකයේදී උපසම්පදාව ලබාගත්හ.

උපසම්පදාවෙන් පසු ශාසනික කාර්යභාරය වෙත යොමු වූ උන්වහන්සේ ඉටුකළ ප්‍රමුඛ කාර්යය බම්බලපිටියේ වජිරරාමය නම් විහාරස්ථානය ගොඩනැඟීමයි. සමිති ශාලාවක ඇරඹූ මෙම විහාරස්ථානය දේශීය හා විදේශීය ධර්ම ප්‍රචාරක කටයුතුවල කේන්ද්‍රස්ථානය විය. වර්තමානයේ දී ද සම්භාවනාවට පත් විහාරස්ථානයකි. තම නිකාය වූ අමරපුර ශ්‍රී ධර්මරක්ෂිත නිකායට හා සම්බුද්ධ ශාසනයට ඉටුකළ මෙහෙවර නිසාම සිය නිකායේ මහානායක ධුරයට ළාබාල අවධියේම පත්වීම ද සුවිශේෂ සිද්ධියකි.

තම ජීවිත කාලය තුළ උන්වහන්සේ ක්‍රියාකළ ආකාරය විමසිලිමත්ව සලකා බලන විට අපේ ජීවිතවලට ද එක්කර ගතහැකි ආදර්ශ රාශියක් පවතින බව අවධාරණය කළ විහාරාධිපති නාහිමියෝ ඒවා එකින් එක ගෙන හැර දැක්වූහ.

- ශිෂ්‍යයෙකු ලෙස කටයුතු කරන විට තම ගුරුවරුන්ට ඉතා භක්තිවන්තව කටයුතු කිරීම.
- තැන් තැන්වල රැස්වී නිකරුණේ කතාබහ කරමින් කාලය අපතේ නොයවා හැකිතාක් නිශ්ශබ්දව තම කටයුතු සිදුකිරීම.
- තමා අතින් සුළු වරදක් හෝ නොවන ලෙසට පැවිදි බව රැකගැනීමට ක්‍රියාකිරීම.
- තමා පුරුදු පුහුණු කළ යහපත් පිළිවෙත්වලට අන් අය උසුළු විසුළු කරමින් බාධා කළත් තම පුරුදු අත්නොහැර ඉතා ඕනෑකමින් රැකගැනීම.
- කුමන තරාතිරමක අයෙකුට වුවද වරද වරදක් ලෙස පෙන්වා දීමට පසුබට නොවීම.
- සාකච්ඡා කර විසඳිය යුතු කරුණු අඬබෙර ගසා ප්‍රසිද්ධ නොකළ යුතුය. යන හැඟීම නිසා සමහර අවස්ථාවල වරදක් දුටුවත් නිහඬව සිටීම.
- මනා සැලසුමක් ඇතිව පිළිවෙළකට සියලු කටයුතු සිදුකිරීම.
- තමා හමුවට පැමිණෙන ලොකු කුඩා ඕනෑම තරාතිරමක අයෙකු සමඟ වුවද පැහැදෙන ආකාරයට පිළිසඳර කථාවෙහි යෙදීම.

මෙම ජීවිතාදර්ශවලට අමතරව ගිහි සමාජයේත්, පැවිදි සමාජයේත් උන්වහන්සේ සදානුස්මරණීය වන ප්‍රධාන වන ප්‍රධාන කරුණු

දෙකකට අපේ අවධානය යොමුකරමින් විහාරාධිපති නාහිමියෝ සිය අනුශාසනාවේදී එම කරුණු පැහැදිලි කළහ.

එකල ධර්මදේශනා පැවැත්වීමේ සම්ප්‍රදාය වූයේ පැය තුන හතරක් හෝ මුළු රාත්‍රියක් වශයෙන් දිගු වෙලාවක් පැවැත්වීමය. මේ වෙනුවට පැයකට සීමාවන වෙලාවක් ධර්මදේශනාව පැවැත්වීමේ නව සම්ප්‍රදායක් උන්වහන්සේ බිහිකළහ. ගුවන් විදුලිය මගින් ධර්ම දේශනා පැවැත් වූ පළමු දේශකයාණෝ ද උන්වහන්සේය.

උන් වහන්සේගේ ලේඛන කුසලතාව හා කවිත්වය බෙහෙවින් අගය කළ යුතුය. මේ හැකියාව සැමවිටම යොදා ගත්තේ ළමයින් හා වැඩිහිටියන් යහමඟට ගැනීමට ය. තම අනුශාසනාව ආරම්භයේදී ඉදිරිපත් කළ කවි පංතිය නැවත සිහිපත් කළ විහාරාධිපති නාහිමියෝ බොදු දරුවෙකු වීමට ක්‍රියාකරන ආකාරය පැහැදිලි කළහ. ළමයින් සඳහාම පවත්වාගෙන ගිය සඟරාව නම් කර තිබුණේ ''බෞද්ධ ළමයා'' යන නමින්ය. ගුණ නැණ දෙකෙන් සහ වීරත්වයෙන් යුතු දරු පිරිසක් බිහිකිරීම ඉන් අදහස් කළ බව මෙහි අන්තර්ගතයෙන් පැහැදිලිය. ඊට අමතරව උන්වහන්සේ ලියූ ලිපි ලේඛන තුළින් ද මේ අදහස තහවුරු වන ආකාරය පෙන්වා දුන් විහාරාධිපති නාහිමියන් සිය අනුශාසනාව අවසන් කළේ මෙසේය.

සේවාවන් රැසක් ඉටුකළ පැළෑණේ සිරි වජිරඥාණ මහා නාහිමිපාණන් අපවත් වූයේ 1955 වර්ෂයේ දෙසැම්බර් 21 වන දිනයේදී ය. මෙය සමස්ත ශ්‍රී ලංකාවටම බලවත් පාඩුවකි. මේ නිසා අපි අතිගරු මහ නාහිමියන් පෙන්වා දුන් ආකාරයට හොඳ බොදු දරුවන් වීමට ක්‍රියා කරමු. එය මහ නාහිමියන්ට දක්වන උසස්ම උපහාරය යි.

අනතුරුව ප්‍රකාශ කළේ රට ජාතිය ආගම වෙනුවෙන් උදාර සේවාවන් සිදුකළ වියත් පැවිදි පඬිරුවන් පිළිබඳ අප සොයා බැලි යුතු බවයි. ඒ අනුව මෙවැනි සේවාවන් සිදුකළ අතිපූජ්‍ය කළුකොඳයාවේ ශ්‍රී පඤ්ඤාසේඛර මහ නාහිමියන් පිළිබඳ තොරතුරු මීළඟ සම්කී වාරයේදී කථාවක් පැවැත්වීමට සූදානම් වන ලෙස අප දැනුවක් කෙරිණි.

# අතිපූජ්‍ය කළුකොඳයාවේ ශ්‍රී ප්‍රඥාශේඛර මහ නාහිමියෝ



පෙබරවාරි මාසයේ ශිෂ්‍ය සමිතියේදී විශේෂ කථාවක් පැවැත්වීමට අවස්ථාවක් ලබාදෙන ලෙස ඉල්ලීමක් කළේ දහම් පාසලේ අවසාන ශ්‍රේණියේ ඉගෙනුම ලබන ධනංජය සිසුවාය. ඒ සඳහා අවස්ථාව ලැබුණි. ඔහු එම කථාව අරඹමින් මෙසේ පැවසීය.

පසුගිය සමිති වාරයේදී විහාරාධිපති නාහිමියන් දැනුම් දුන් ආකාරයට අනුව අතිපූජ්‍ය කළුකොඳයාවේ ශ්‍රී ප්‍රඥාශේඛර මහ නාහිමිය-න් පිළිබඳ තොරතුරු ඔබට ඉදිරිපත් කිරීමටයි මා සූදානම් වන්නේ.

1895 දෙසැම්බර් මස 30 වැනි දින උන්වහන්සේ උපන්නේ සියනෑ කෝරළයේ කළුකොඳයාව නම් ග්‍රාමයේය. පියා ලියනගේ දොන් රොමානිස් අප්පුහාමි වූ අතර මව වූයේ මලවි පතිරණගේ දෝන දොච්චෝ හාමිනා මාතාවයි. මූලික අධ්‍යාපනය ලැබුනේ දෙකටන පාසලෙනි. නවගමුවේ සුගතබිම්බාරාමයේදී 1911 පෙබරවාරි 23 දින පැවිදි වූ උන්වහන්සේගේ ආචාර්යවරයා වූයේ අතිපූජ්‍ය කටුවාවල ශ්‍රී සුමනතිස්ස මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේය. කළුකොඳයාවේ ශ්‍රී ප්‍රඥාශේඛර යනු පැවිදි නාමයයි.

මුලික බණ දහම් හා වත්පිළිවෙත් හැදරුවේ සිය ගුරුහිමියන් සමීපයේය. 1916 දී උපසම්පදාව ලබා වැඩිදුර අධ්‍යාපනය සඳහා විද්‍යෝදය පිරිවෙනට ඇතුලත් වූහ. ඉගෙනීමේ කටයුතු සිදු කළේ ඉතා ඕනෑකමින් අධිෂ්ඨානශීලීව ගුරු සිසු දෙපිරිසගේ ම සිත් දිනාග, නිමිති. ඒ නිසාම පිරිවෙනේ විශිෂ්ටතම ශිෂ්‍යයාට හිමිවන ස්‍යාම රාජ ත්‍යාගය අවසාන විභාගයේදී දිනාගැනීමට හැකිවිය.

තමා උගත් පිරිවෙනෙහිම ආචාර්යවරයෙකු ලෙස අධ්‍යාපන සේවයට එක් වූ උන්වහන්සේ ගුරු සිසු දෙපාර්ශ්වයේ සිත් දිනාගත් විශිෂ්ට ගුරුවරයෙකි. ඉතා කෙටිකලකින් පරිවේණාධිපති ධූරයට පත්වන්නේ

ද මේ නිසාමය. පසුකලෙක විද්‍යෝදය පිරිවෙන විශ්ව විද්‍යාලයක් බවට පත්කරන අවස්ථාවේදී එහි සේවයට එක් වී විවිධ තනතුරු දරමින් සිදුකළ ධර්ම ශාස්ත්‍රීය සේවය අතිමහත්ය. පිරිවෙන් හා විශ්ව විද්‍යාල අධ්‍යාපනය වෙනුවෙන් වසර පනස් තුනකට අධික කාලයක් සිදුකළ සේවය නිසාම අපවත් වන තුරුම විද්‍යෝදය පිරිවෙනේ සම්මාන පරිවේණාධිපති ධූරය දැරූහ.

ප්‍රඥාශේඛර නාහිමියන්ගේ නිකාය හා ශාසනික සේවය පිළිබඳ ධනංජය ශිෂ්‍යයා ඉදිරිපත් කළ අදහස් මෙසේය.

- කල්‍යාණි සාමග්‍රී ධර්ම මහා සංඝ සභාවේ අනුනායක ධූරය හා මහානායක ධූරය දැරීම.
- මංගල ධර්ම කීර්ති ශ්‍රී ආගම චක්‍රවර්ති වැනි ගෞරව සම්මුති නාම රාශියකින් පිදුම් ලැබීම.
- 2500 බුද්ධ ජයන්තිය වෙනුවෙන් රජය මගින් පිහිටුවන ලද ආගමික කටයුතු කාරක සභාවේ සභාපති තනතුර දැරීම.
- 1957 වර්ෂයේදී බුද්ධ ශාසන කොමිෂන් සභාවේ සභාපති තනතුර දැරීම.
- 1969 වර්ෂයේදී ලෝක බෞද්ධ මහා සම්මේලනයේ සභාපති තනතුර දැරීම.

බුදු දහම ප්‍රචලිතව පැවති සියමය, බුරුමය, කාම්බෝජය, ලාඕසය, වියට්නාමය වැනි රටවලට වැඩම කළ උන්වහන්සේ ඒ ඒ රටවල ක්‍රියාත්මක බෞද්ධ පාලන ක්‍රම පිළිබඳ අධ්‍යයනයන්හි නිරත වූහ. අපේ රටේ බෞද්ධ කටයුතු ක්‍රමවත්ව සංවිධානාත්මකව සැලැස්මකට අනුව මෙහෙයවීම සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ ඇතුළත් වාර්තාවක් රජයට ඉදිරිපත් කරන්නේ මෙම අධ්‍යයනවල ප්‍රතිඵලයක් ලෙසට ය.

උන්වහන්සේ ප්‍රකට ග්‍රන්ථ කර්තෘවරයෙකි. ගරුභණ්ඩ විනිශ්චය, බුත්සරණ ගැටපද විවරණය, ග්‍රාම ප්‍රතිසංස්කරණය හා අපරාධ මර්දනය. ශ්‍රී ප්‍රඥාශේඛර චරිතාපදානය උන්වහන්සේ රචනා කළ ග්‍රන්ථයන් ය. සිංහල බෝධිවංශය, කංඛාවිතරණී පිටපොත, පාචිත්තිය පාලි ආදී පුරාණ ග්‍රන්ථ කිහිපයක් සංශෝධනය කර ඇත. පුවත්පත් සඟරා ඉතිහාසය නම් ග්‍රන්ථ මාලාව සම්පාදනය කිරීම සිංහල සාහිත්‍යය විෂයෙහි සිදුකළ විශිෂ්ටතම සේවයයි.

වර්තමානයේදී පවා උන්වහන්සේ පිළිබඳ සාකච්ඡා කරනවිට අවධාරණය කරන සුවිශේෂී ලක්ෂණයකි. පාලි, සංස්කෘත, සිංහල ආදී භාෂාවන්හි ඇතුළත් වචන නිවැරදිව උච්චාරණය කිරීම.

ශාසනික, ආගමික, අධ්‍යාපනික හා ශාස්ත්‍රීය වශයෙන් සිදුකළ සේවයට අමතරව ජාතික වශයෙන් ද නිරත වූයේ ක්‍රියාකාරී භූමිකාවකය.

- ඇස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතා සමග එක් වී සිංහල මහා සභාව පිහිටුවීමට පුරෝගාමීවීම.
- සිංහල මහා සභාවේ ආගමික අංශයේ නායකත්වය දැරීම.
- ග්‍රාම සංවර්ධනය හා අපරාධ මර්දනය සඳහා ක්‍රියාකිරීම.
- මතින් තොර රටක් සඳහා මතින් තොර සමාජයක් බිහිකිරීමට පිහිටුවන ලද අමද්‍යප ව්‍යාපාරය සඳහා කැපවී ක්‍රියාකිරීම.

මෙලෙස උදාරතර සේවාවන් රාශියක් සිදුකළ උන්වහන්සේ අපවත්වූයේ 1977 නොවැම්බර් 27 වෙනිදාය. එම අපවත්වීම බුද්ධ ශාසනයටත් සමස්ත රටවැසියාටත් දැරිය නොහැකි පාඩුවක් ලෙස අවධාරනය කළ ධනංජය ශිෂ්‍යයා ප්‍රකාශ කළේ උන්වහන්සේගේ චරිතාදර්ශ අපගේ ජීවිතයට එකතුකර ගැනීම අපගේ යුතුකමක් ද විශේෂයෙන්ම උන්වහන්සේ සිය ජීවිතයේ අවසාන භාගයේදී කැපවී ක්‍රියාකළ මතින් තොර රටක් බිහිකිරීමට, බොදු දරුවන් ලෙස අධිෂ්ඨාන කර ගනිමු යැයි ඉල්ලමින් ධනංජය ශිෂ්‍යයා සිය කථාව නිමා කළේ ය.

# අතිපූජ්‍ය බද්දේගම විමලවංශ අනුනාහිමියෝ



මාර්තු මාසයේ ශිෂ්‍ය සමිතියේ අනුශාසනාව පැවැත්වූයේ දහම් පාසලේ ප්‍රධානාචාර්ය ධම්මරතන පොඩි හාමුදුරුවන් වහන්සේය. පසුගිය අවස්ථා දෙකකදී රට දැය සමයට සේවාවන් ඉටුකළ නාහිමිවරු දෙනමක් පිළිබඳ දැනුමක් ලද බව සිහිපත් කළ අතර මෙවර හඳුන්වා දෙන්නේ ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකා-යයේ අනුනායක ධුරය හෙබ වූ අතිපූජ්‍ය බද්දේගම විමලවංස හිමිපාණන් වහන්සේ පිළිබඳ යැයි ප්‍රකාශ කරමින් අනුශාසනය ආරම්භ කළහ.

හිත්ති අප්පුහාමි පණ්ඩිත කෝරාළ හා පොඩි හාමිනේ වැලිවිට යන දෙදෙනා මාපියන් කොට උන්වහන්සේ 1913 දෙසැම්බර් 8 වෙනිදා උපත ලැබුවේ දකුණු පළාතේ බද්දේගම ග්‍රාමයේදී ය. මූලික අධ්‍යාපනය ලැබුවේ වේරගොඩ රජයේ පාසලෙනි. කොළඹට පැමිණි පසු වැලියන් සමාගමේ පාසලට ඇතුලත් වූයේ ඉංග්‍රිසි අධ්‍යාපනය ලැබීම සඳහාය. මරදාන ඕඩේ පන්සලේ විහාරාධිපති පූජ්‍ය මැදදූවේ විපුලසේනාසභ මාහිමියන්ගේ ශිෂ්‍යයෙකු ලෙස පැවිදි වන විට වයස අවුරුදු විස්සකි. උපසම්පදාව ලබන්නේ පැවිදි වී වසර තුනක් ඉක්මවන විටදීය. 1945 වර්ෂයේදී පණ්ඩිත උපාධිය ලබාගත්තේ විද්‍යෝදය පිරිවෙනේ සහ ගම්පොල වනවාස පිරිවෙන්නේ අධ්‍යාපනය ලැබීමෙන් අනතුරුව ය.

ජරාවාසව පැවති ඕඩේ පන්සලේ විහාරාධිපති ධුරයට පත්වන්නේ සිය ගුරු හිමියන්ගේ අපවත්වීමෙන් පසුවය. මහල් පහකින් යුතු සංඝාවාසයක් සහ අටමුනි සෑය ලෙස නම්කළ වන්දනා ස්ථානයක් ද අයත් වන පරිදි විහාරාංගවලින් සම්පූර්ණ වූ විහාරස්ථානයක් බවට මෙම ස්ථානය සංවර්ධනය කළේ ඉතා කෙටි කලෙකිනි.

විහාරස්ථානයේ දියුණුවට මෙලෙස ක්‍රියාකරන අතරම අධ්‍යාපනික වශයෙන් සිදුකළ කාර්ය රාශියකි.

- ශ්‍රී ලංකා විද්‍යාලය නමින් පිරිවෙනක් ආරම්භ කර දේශීයව හා විදේශීයව සම්මානයට පාත්‍ර වූ බුද්ධිමතුන් රාශියක් බිහිකිරීම.
- කාලීන අවශ්‍යතාවන්ට අනුව සාම්ප්‍රදායික අධ්‍යාපන තුළ ද වෙනස්කම් සිදුවීම අවශ්‍ය නිසා 1947 වර්ෂයේදී පිරිවෙන්වල හා පාසල්වල දෙමළ භාෂාව ඉගැන්විය යුතු බවට රජයට යෝජනා කිරීම.
- තම පිරිවෙනේ දෙමළ භාෂාව ඉගැන්වීම ආරම්භ කිරීම සහ දෙමළ ව්‍යාකරණ පොතක් ලියා ප්‍රසිද්ධ කිරීම.
- 1943 වර්ෂයේදී මාතලේ කයිකාවල ශ්‍රී සුදර්ශන විද්‍යාලය නමින් පිරිවෙනක් පිහිටුවීම.
- 1952 දී පරිවේණාධිපති සංගමය පිහිටුවා පිරිවෙන් අධ්‍යාපනය රැකගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.
- විද්‍යෝදය, විද්‍යාලංකාර විශ්ව විද්‍යාල දෙකෙහි පමණක් නොව පේරාදෙණිය විශ්ව විද්‍යාලයේද සම්මානිත ආරාධිත දේශකයෙකු ලෙස ක්‍රියා කිරීම.

භාෂා සාහිත්‍යයට සිදුකළ සේවය උන්වහන්සේ ලියා ඇති පොත්පත් රාශිය තුළින් පිළිබිඹුවේ. ඒවා විවිධ ක්ෂේත්‍ර යටතේ ලියා ඇත.

අපේ සංස්කෘතිය
සිහල රීතිය
සිංහල ග්‍රන්ථවංසය
සිංහල ග්‍රන්ථ විචාරය
සිංහල භාෂා පරිණාමය
සෙල්ලිපි සමාජය
ථූපවංශ සංග්‍රහය
බෞද්ධ සාහිත්‍යය
ජිනචරිත ව්‍යාඛ්‍යාව
පාලි රචනා 1, 2
සංඛ්‍යා ශබ්දකෝෂය ,

දර්ශනවාද සංග්‍රහය
බෞද්ධ දරුවා 1, 2, 3
බෞද්ධ චාරිත්‍ර විධි
කල්පනාව
ආණ්ඩුව හා මිෂනාරී බලය
භික්ෂුවගේ අනාගතය
පූජක වැඩ
සැරියුත් මුගලන් චරිත
දෙමළ ව්‍යාකරණ
බාලාවබෝධිනී

එම පොත් අතර දැකිය හැකිය.

විදේශ ධර්ම දූත සේවය ද උන්වහන්සේගේ සුවිශේෂ කාර්යයකි. ඒ ඒ රටවලට උචිත පරිදි භාෂා ඥාණයෙන් හා ධර්මඥානයෙන් යුතුව ධර්ම දූතයන් වහන්සේලා පුහුණු කළ යුතු බව උන්වහන්සේගේ අදහසයි. මේ සඳහා ජාත්‍යන්තර මහා මහින්ද ධර්මදූත සංගමය පිහිට වූ අතර පුහුණුවීම් කාලය වසර හතරකි. මෙලෙස විධිමත් ධර්මදූත සේවාවක් සිදුකළ නිසාම ඉන්දියාවේ හා නේපාලයේ පමණක් තම අධිපතිත්වය යටතේ විහාරස්ථාන හතක් පමණ පිහිටු වූහ.

ජාතික වශයෙන් සිදුකළ සේවාවන් අතර,

- 1956 වර්ෂයේදී සඟ වෙද ගුරු ගොවි කම්කරු පංච මහා බලවේගය පිහිටුවීමට මූලිකවීම.
- සිංහල ජාතික සංගමය පිහිටුවීම.
- ත්‍රෛනිකායික සංඝ සභාව පිහිටුවා තුන් නිකාය ඒකරාශී කිරීම.
- සබරගමු පළාත මොරවක් කෝරළය හා පොළොන්නරු දිස්ත්‍රික්කයේ දිඹුලාගල ආදී ප්‍රදේශවල පාසල් පිහිටුවීමට ක්‍රියාකිරීම ආදිය වේ. ජාතික ආගමික හා අධ්‍යාපනික වශයෙන් දරන ලද තනතුරු රාශියකි.
- බුද්ධශාසන උත්තරීතර මණ්ඩලයේ සාමාජික.
- අධ්‍යාපන අමාත්‍යාංශයේ අධ්‍යාපන උපදේශක මණ්ඩලයේ සභාපති.
- පාලි හා බෞද්ධ විශ්ව විද්‍යාලයේ පාලක මණ්ඩල සාමාජික, ආදිය ඒ අතරින් කිහිපයකි.

සිංහල ජාතියට සිංහල භාෂාවට බෞද්ධාගමට යම් එරෙහිවීමක් සිදුවන ඕනෑම අවස්ථාවකදී පෙරමුණට පැමිණීම උන්වහන්සේ සතු වූ සුවිශේෂ ලක්ෂණයකි. මේ නිසාම අභීත සිංහ රාජයෙකු ලෙස සමාජයේ සම්භාවනාවට පත්වූහ.

ගුරුවරයෙකු, පඬිවරයෙකු, ධර්මදූතයෙකු, දේශමාමයෙකු හා පරිත්‍යාගශීලී සමාජ සේවකයෙකු ලෙස රට දැය සමයට අපරිමිත සේවයක් කළ අනු නාහිමියන් අපවත් වූයේ 1993 ජනවාරි 17 වෙනිදාය. ශ්‍රී ලංකාවට පමණක් නොව ජාත්‍යන්තරයට ද බලවත් පාඩුවක් මෙමගින් සිදුවිය. මේ නිසා බොදු දරුවන් ලෙස අපි උන්වහන්සේගේ ජීවිතයෙන් ගතහැකි ආදර්ශ අපේ ජීවිත ශක්තිමත්,

කර ගැනීම සඳහා යොදා ගැනීමට අදිටන් කරගනිමු යැයි පවසමින් ප්‍රධානාචාර්ය හිමියෝ සිය අනුශාසනාව නිමා කළහ.

## ක්‍රියාකාරකම්

1. පැළෑණේ ශ්‍රී වජිරඥාන මහ නාහිමියන්ගේ ජීවිතයෙන් ගතහැකි ආදර්ශ පහක් ලියන්න.
2. කළුකොඳයාවේ ශ්‍රී ප්‍රඥාශේඛර මහ නාහිමියන් රචනා කළ ග්‍රන්ථ හතරක් නම් කරන්න.
3. බද්දේගම විමලවංස අනුනාහිමියන් අධ්‍යාපනික දියුණුවට සිදුකළ කාර්යයන් හතරක් ලියන්න.

## පැවරුම

1. නිකරුනේ කතා කරමින් කාලය අපතේ නොයවා නිශ්ශබ්දව තම කාර්යය සිදුකිරීම පැළෑණේ ශ්‍රී වජිරඥාන මහ නාහිමියන්ගේ චරිත ලක්ෂණයකි. **කාලය අපතේ නොහරිමු** යන මාතෘකාව යටතේ ශිෂ්‍ය ජීවිතයට අදාළ කරගනිමින් රචනාවක් ලියන්න.

2. මෙම පාඩමේ සඳහන් කවි පංතිය කට පාඩම් කර ශිෂ්‍ය සමිතියේ දී ගායනා කරන්න.

# 29. පාඩම

## ශ්‍රේෂ්ඨ බෞද්ධ අධිරාජයා

අපේ අසල්වැසි රට වූ ඉන්දියාවේ හෙවත් භාරතයේ ඉතිහාසයට අවධානය යොමු කරන විට එහි රාජ නාමාවලියේ වර්තමානය දක්වාම නොමැකෙන ලෙස සිය නාමය සනිටුහන් කළ ශ්‍රේෂ්ඨ නරපතියෙකු ලෙස ධර්මාශෝක අධිරාජයා හැඳින්විය හැකිය.

චන්ද්‍රගුප්ත රජතුමාගෙන් ක්‍රි.පූ. 322 දී ඇරඹෙන මෞර්ය රාජ වංශයේ තුන්වන රජතුමා වන්නේ ධර්මාශෝක අධිරාජයාය. එතුමාගේ පියා වූයේ මෞර්ය රාජ වංශයේ දෙවන රජතුමා වූ බින්දුසාර රජතුමාය. ආජීවක දායිකාවක වූ ධර්මා දේවිය එතුමාගේ මව වූවාය. අශෝක රජතුමා පිළිබඳ තොරතුරු දීපවංශ, මහාවංශ යන වංශ කථා දෙකෙහි හා සමන්තපාසාදිකා විනය අටුවාවෙහි ද ඇතුළත් වේ. පසුකාලීන බොහෝ පොත් පත්වල ද තොරතුරු ඇතුළත් වී ඇත. මෙම තොරතුරුවලට අනුව කුඩා කල අශෝක යනුවෙන් හැඳින් වූ ඔහු සිය සොහොයුරන් ඝාතනය කළ නිසා "චණ්ඩාශෝක'' ලෙස හඳුන්වා ඇත.

එකල රජවරුන්ගේ සිරිත වූයේ තම ශක්තිය බලය පෙන්වා කුඩා රාජ්‍ය තමන් සතු කරගැනීමයි. ඒ අනුව අශෝක රජතුමා ද කාලිංග රාජ්‍යය තම අණසකට යටත් කරගැනීමට ක්‍රියා කළේය. රණශූරයෙකු වූ අශෝක රජතුමා කාලිංග යුද්ධයට ප්‍රවේශ වූයේ ම විජයග්‍රහණය ලබාගැනීමේ පරම බලාපොරොත්තුවෙන් යුතුවය. කාලිංග යුද්ධය ජයගත් නමුත් සංග්‍රාමයේ බිහිසුණු බව නිසා පසුව ඇතිවන පසුතැවිල්ල අශෝක රජතුමාට ද නොඅඩුව දැනුනි. ඒ බව එතුමා පසුකාලයේ පිහිට වූ සෙල්ලිපිවලින් පැහැදිලිවේ.

එතුමාගේ මෙම පසුතැවිල්ල සමනය කරගැනීමට උපකාර වී ඇත්තේ නිග්‍රෝධ සාමණේරයන් වහන්සේ බව අපගේ වංශකතාවල ද සඳහන් වේ. කාලිංග යුද්ධයෙන් පසුව සිදුවූ විනාශය පිළිබඳ කම්පාවට පත් රජතුමා භික්ෂූන් වහන්සේ ඇසුරට පත්විය. බුදු දහම

පිළිබඳව ගැඹුරින් කරුණු සොයා බැලීමට හෙතෙම යොමු වීය. බුදු දහම හැදෑරීමට ඔහු තුළ පැවති පෙළඹීම කොපමණ ද යන්න, ඔහුගේම සෙල් ලිපි තුළින් පැහැදිලි වේ.

ඔහු එක් සෙල් ලිපියක තමා ප්‍රිය කරන බුදුරදුන්ගේ දේශනා මොනවාද යන්න සටහන් කර ඇත. එමෙන්ම බොහෝ භික්ෂූන්ට ද උපාසක උපාසිකාවන්ට ද මේ ධර්ම කොටස් අසන්නට හා මෙනෙහි කරන්නට යොමු වන මෙන් ඉල්ලීමක් කර තිබේ.

රණශූරත්වයෙන් හා ආයුධ බලයෙන් මිනිසුන් විනාශ කර භූමිය අත්පත් කරගැනීමේ දික් විජය ප්‍රතිපත්තිය අත්හැර දැමීය. තවද ආගමික ඉගැන්වීම් පදනම් කරගෙන මිනිස් සමාජය යහපත් සමාජයක් බවට පත්කර තම ධාර්මික බලය පතුරුවා රාජ්‍යයන් තම දැහැමි පිළිවෙතට අවනත කරගැනීමේ ධර්ම විජය ප්‍රතිපත්තියට යොමුවීය. චණ්ඩාශෝක ධර්මාශෝක වූයේ මේ හේතුව නිසාය. අද දක්වාම භාරතීය ඉතිහාසය තුළ අසහාය අධිරාජයා ලෙස එම නාමය නොමැකී පවතියි.

රාජ්‍ය පාලකයෙකු ලෙස ක්‍රියා කළ ආකාරය හා බෞද්ධයෙකු ලෙස ක්‍රියා කළ ආකාරය යන දෙඅංශයෙන් එතුමාගේ චරිතය දෙස බලා අපට ද මාර්ගෝපදේශ ලබාගත හැකිය. රාජ්‍ය පාලකයෙකු ලෙස ධර්මාශෝක රජතුමාගේ ක්‍රියාපිළිවෙත් දෙස විමසා බලනවිට පහත ලක්ෂණ හඳුනාගත හැකිය.

- තමාට හෝ රාජ්‍යයට එල්ලවන ඕනෑම තර්ජනයකදී එය රැකගැනීමට දිවිහිමියෙන් කටයුතු කිරීම.
- රාජ්‍ය පාලනයේ උපක්‍රමයක් ලෙස යුද්ධයෙහි නිරත වූවත් තමා ලත් ජයග්‍රහණය පිළිබඳව මානව දයාවෙන් යුතුව ආපසු හැරී බැලීම.
- මානව සංහතියට සිදු වූ විනාශකාරී තත්වයන් පිළිබඳව යථාවාදීව සොයා බලා එම මිනිසුන් සුවපත් කිරීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීම.
- නැවත විනාශකාරී යුද්ධ ඇතිවීම වැළැක්වීමට ගත හැකි සාධාරණ ක්‍රියාමාර්ග ගැනීමට යොමුවීම.

මේ අන්දමට ධර්මාශෝක රජතුමා ක්‍රියා කළේ බුදු දහමින් ලද ආභාසය නිසාය. එතුමා බුදුරජාණන් වහන්සේ දේශනා කළ පාලකයෙකු සතු වියයුතු ගුණාංග වූ සතර සංග්‍රහ වස්තු, සප්ත අපරිහානිය ධර්ම, දස සක්විති වත් ආදී බෞද්ධ සදුපදේශයන් අනුගමනය කළ බව ඓතිහාසික තොරතුරුවලින් සනාථ වේ.

බුදු දහමට අනුව ජීවිතය පවත්වාගෙන ගිය අයෙකු ලෙස ධර්මාශෝක අධිරාජයාගේ චරිතයෙන් බෞද්ධයන්ට ආදර්ශ රාශියක් ගත හැකිය.

- අන්ධානුකරණයෙන් පිළිගන්නවා වෙනුවට බුදු සමයේ මූලික පදනම සොයා බලා විමසා හරිහැටි අවබෝධ කරගෙන ධර්මයේ කරුණු පිළිගැනීම.
- ධර්මය පිළිබඳ කරුණු මහා සංසරත්නයෙන් විමසීම හා නිරතුරුව මහා සංඝරත්නය ඇසුරු කිරීම.
- තමා උගත් දෙය අන් අයට ද දැනගැනීම සඳහා දේශනා පැවැත්වීම හා ඒ සඳහා ධර්ම මහාමාත්‍යවරුන් පත්කිරීම.
- බෞද්ධ පූජනීය සිද්ධස්ථාන මතු පරපුරට ද නිවැරදිව හඳුනාගත හැකි පරිදි ඒ ස්ථාන පිළිබඳ විස්තර ඇතුළත් ටැම් ලිපි සැකසීම හා ඒවා ආරක්ෂා කිරීම.
- මිනිසුන්ට පමණක් නොව ගහ කොළ සතා සිවුපාවාට පවා ජීවත්වීමේ අයිතිය තහවුරු කිරීම හා ඒවා රැකගැනීමට අන්අය පෙළඹවීම.
- තමා පිළිගත් ආගම දහම පමණක් නොව අන් ආගමිකයන්ට හා ඔවුන්ගේ ක්‍රියාකාරකම්වලට බාධා නොකිරීම හා ඒවාට අවශ්‍ය විට පහසුකම් සපයා දීම.

බුදු දහමට හිතැති අධිරාජයෙකු ලෙස ඔහු අතින් බුද්ධ ශාසනය වෙනුවෙන් සිදු වූ අතිවිශිෂ්ට සේවාව වන්නේ තුන්වන ධර්ම සංගායනාව පැවැත්වීම සඳහා දායකත්වය දැක්වීමයි. මෙම සංගායනාව සිදුවූයේ මොග්ගලී පුත්ත තිස්ස මහ රහතන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් විනයධර, ධර්මධර මහ තෙරවරුන් දහසකගේ සහභාගිත්වයෙනි. මෙහිදී ශාසන විරෝධී අදහස් දැරූ භික්ෂූන් සසුනින් බැහැර කර ශාසන ශෝධනය සිදුකෙරිනි. එසේ

පිරිසිදු බවට පත්කළා වූ සම්බුදු සසුන නිර්මලව පවත්වාගෙන යාමට රජතුමාගෙන් ලැබෙන්නේ නොමද අනුග්‍රහයකි. තම පුත්‍රයා වූ මිහිඳු කුමරු හා දියණිය වූ සංඝමිත්තා කුමරිය පැවිදි කිරීම එම අනුග්‍රහය පිළිබිඹු වන්නකි. මෙතුමාගේ සුවිශේෂී අනුග්‍රහය වූයේ රටවල් නවයක් සඳහා ධර්මදූත පිරිස් යොමුකරවීමය. එමගින් බෞද්ධයෙක් ලෙස දේශ දේශාන්තරවල පවා තම කීර්ති නාමය සනිටුහන් කරගැනීමට සමත් විය. දඹදිව පුරා පූජනීය ස්ථාන රාශියක් ඉදිකිරීම මගින් බුදු සසුනේ ව්‍යාප්තියට උදාර කාර්යභාරයක් සිදුකර ඇත.

මානව දයාවෙන් පිරිපුන් දැහැමි පාලකයෙකු ලෙසත් බුදු සසුන කෙරෙහි ශ්‍රද්ධාවෙන් ක්‍රියා කළ මහෝපාසකයෙකු ලෙසත් මෙතුමාගේ සේවය සදානුස්මරණීය වේ.

## ක්‍රියාකාරකම්

1. බුදු සසුනේ දියුණුවට හා ව්‍යාප්තියට අදාළව ධර්මාශෝක රජතුමාගෙන් සිදු වූ සේවාවන් 05 නම් කරන්න.
2. ධර්මාශෝක රජතුමාගේ චරිත කථාවේ ඇතුළත් තොරතුරු ඇසුරෙන් පහත වගුව සම්පූර්ණ කරන්න.

| රාජ්‍ය පාලකයෙකු ලෙස එතුමාගෙන් ගත හැකි ආදර්ශ | බෞද්ධයෙකු ලෙස එතුමාගෙන් ගත හැකි ආදර්ශ |
|---|---|
| | |

# 30. පාඩම

## දිවි මගට දැහැමි උපදෙස්

බුදුරජාණන් වහන්සේ විවිධ අවස්ථාවලදී ගිහි පැවිදි සැමගේ ජීවිත අර්ථවත් කර ගැනීම සඳහා ආදර්ශවත් ගාථා දේශනා කොට ඇත. එසේ දේශනා කළ ගාථා රැසක් ධම්ම පදය නම් ග්‍රන්ථයේ සහ ජාතක පාලි නම් ග්‍රන්ථයේ දැක්වෙයි. එම ගාථා අපගේ ජීවිත සාර්ථක කරගැනීමට මහගු උපදෙස් රැසක් ගෙන එයි. දහම් පාසල් දරුවන් වශයෙන් අපි වැරදි ක්‍රියාවන්ගෙන් වැළකී නිවැරදි ක්‍රියාවල යෙදිය යුතුය. ඒ නිසා මෙම ගාථාවල එන උපදෙස් අපි තේරුම් ගෙන ක්‍රියාවට නගමු.

1. අසාරේ සාර මතිනෝ
   සාරේ චාසාර දස්සිනෝ
   තේ සාරං නාධිගච්ඡන්ති
   මිච්ඡා සංකප්ප ගෝචරා

   **(ධම්ම පදය, යමක වග්ගය 11 ගාථාව)**

නිසරු දේ සරු ලෙසත්, සරු දෙය නිසරු ලෙසත් දකින වැරදි කල්පනාවල යෙදුනු අය සරු දේ නොලබති.

නිසරු දෙය සරු කොට
රැගෙන සරු දෙය ඉවතට
දමන මිසදිටු හට
නොහැක යාමට සාර දහමට

2. සාරංච සාරතෝ ඤත්වා
   අසාරංච අසාරතෝ
   තේ සාරං අධිගච්ඡන්ති
   සම්මා සංකප්ප ගෝචරා

   **(ධම්ම පදය, යමක වග්ගය 12 ගාථාව )**

සරු දේ සරු ලෙසත්, නිසරු දේ නිසරු ලෙසත් සලකන යහපත් කල්පනාවෙහි යෙදුනු අය සරු දෙයක්ම ලබති.

ඉහත දැක්වූ ගාථා දෙක අතරින් මුල් ගාථාවෙන් පැහැදිලි වන්නේ නිසරු දෙය සරු වශයෙන් ද, සරු දෙය නිසරු වශයෙන්ද, වටහා ගැනීමෙන් පුද්ගලයාට යහපත සලසා ගත නොහැකි බවයි. ප්‍රාණඝාතය, සොරකම, මංකොල්ලකෑම, වැරදි කාම සේවනය බොරු කීම, කේලාම් කීම, හිස් වචන කීම, පරුෂ වචන කීම, මත් වතුර හා දුම් පානය, නිසරු වූ දුශ්චරිත ක්‍රියාවන්ය. ඒවා සුචරිත හෙවත් යහපත් ක්‍රියා ලෙස යමෙක් සිතා ක්‍රියා කරන්නේ නම් එය අනුවණකමකි. ඉන් ඔහු සමාජ අපකීර්තියට මෙන්ම මෙලොව පරලොව පරිහානියට ද පත්වෙයි. එමෙන් ම වත්මන් නාට්‍ය හා චිත්‍රපට බැලීමට ලොල් වීම, සූදුව, අසභ්‍ය පුවත්පත් භාවිතය. අනවශ්‍ය ලෙස ජංගම දුරකථන භාවිත කිරීම ද නිසරු ක්‍රියාවන්ය. ඒ තුළින් අතිමහත් ලෙස මුදල් වියදම් කිරීමට සිදුවෙයි. ඉන් ඔහුගේ ආර්ථික ශක්තිය පරිහානියට පත්වෙයි. එබඳු නිසරු ක්‍රියාවන්ට යොමු වී ඇති අය ඉන් වැළකීමට උත්සාහ කළ යුතුය.

නිවැරදි ක්‍රියා වැරදි ලෙස දකින පුද්ගලයා අවිහිංසාව, පරිත්‍යාගය, සත්‍යවාදී වීම, දුරදක්නා නුවණින් ක්‍රියා කිරීම, පාපකාරී ක්‍රියාවෙන් වැළකී සිටීම ආදී යහපත් ගති පැවතුම් ඇලුම් නොකරයි. එබඳු යහපත් ක්‍රියා ඔවුන් දකිනුයේ අයහපත් දෙයක් ලෙසිනි. ඒ නිසා තමාටත් සමාජයටත් දියුණුව කරා යාමට ඇති යහමාර්ගය ඔවුහු ප්‍රතික්ෂේප කරති.

අධ්‍යාපනය ලබන ඇතැම් දරුවෝ ද දුශ්චරිත ක්‍රියාවන්ට යොමුවී සිටිති. සතුන්ට හිංසා කරති. වෙනත් ළමයින්ට හිංසා කරති. අනෙකාගේ දේ සොරා ගනිති. බොරු කියති. අනුන් රවටති. මේ තුළින් ඔවුන්ගේ ජීවිත අභාග්‍ය සම්පන්න බවට පත්වෙයි. දියුණුවක් ලබා ගැනීමට නොහැකිව අනාගතයේ විවිධ දුක් පීඩාවන්ට මුහුණපෑමට සිදුවෙයි.

දෙවැනි ගාථාවෙන් පැහැදිලි වන්නේ සරු දෙය සරු ලෙසත් නිසරු දේ නිසරු ලෙසත් පිළිගෙන ක්‍රියා කිරීමෙන් තමන්ට යහපත සැලසෙන බවයි. නුවණින් යුතු පුද්ගලයෝ කිසි විටෙකත් තමන්ට හෝ අනුන්ට අයහපතක් වන දෙයක් නොකරති. එවන් දරුවෝ

තමාගේත් සමාජයේත් යහපැවැත්මට හේතුවන දන්දීම, සිල්රැකීම, මව්පියන්ට සැලකීම, ගුරුවරුන්ට සැලකීම, වැඩිහිටියන්ට ගරු බුහුමන් දැක්වීම, කාරුණික වීම, සත්‍ය කතා කිරීම මෙන්ම ගුවන්විදුලිය රූපවාහිනිය, දූරකථනය, සිනමාව, පුවත්පත් ආදිය අර්ථවත් දේ සඳහා භාවිත කිරීම තුළින් මෙලොව දියුණුව සලසා ගනිති. පාපයන්ගේ විපාක හඳුනාගෙන පුණ්‍ය ක්‍රියාවල යෙදීමෙන් මෙලොව සහ පරලොව ජීවිතය සැපවත් කරගත හැකිය. එම නිසා යහපත් දේ නුවණින් දැක සාරධර්ම අගයන පුද්ගලයන් වීමට අපි උත්සාහ ගත යුතු වෙමු. එය අපගේ දියුණුවට මගකි. පාසල් අධ්‍යාපනය මෙන්ම දහම් අධ්‍යාපනය තුළින් ද අපට පෙන්වා දෙන්නේ සාරවත් යහපත් අනාගතයට මගයි. එම මගෙහි ගමන්කොට ජීවිතයෙහි සතුට සැනසීම උදාකර ගැනීමට උත්සාහ කරමු.

3. දූරංගමං ඒකචරං
අසරීරං ගුහාසයං
යේ චිත්තං සඤ්ඤමෙස්සන්ති
මොක්ඛන්ති මාර බන්ධනා
(ධම්ම පදය, චිත්ත වග්ග 3 ගාථාව)

දුර ගමන් යන, තනිව හැසිරෙන, ශරීරයක් නැති, හදවත නැමති ගුහාවෙහි වාසය කරන සිත යමෙක් සංවර කර ගනී ද ඔවුහු මාර බන්ධනයෙන් මිදෙති.

නිතරම දුරගමන් යයි බැහැ නවතන්න
තනිවම වසයි සිරුරක් නැහැ දැකගන්න
ගුහාවක වසන මේ සිත රැකගන්න
වුවහොත් සමත් හැක මරබැම් සිඳලන්න

ඉහත ගාථා ධර්මයෙන් කියවෙනුයේ සිතෙහි ස්වභාවය පිළිබඳවයි. අපගේ සිත මොහොතින් මොහොත වෙනස් වෙයි. යම් ක්‍රියාවක් සිදු කිරීමේදී එම ක්‍රියාවෙන් යහපත් ප්‍රතිඵල ලබා ගත හැකි වන්නේ සිත මනාව පිහිටුවාගෙන ක්‍රියා කිරීමෙන් පමණි. වෙනත් දේ පිළිබඳ සිහිපත් වන විට එහි ප්‍රතිඵල නෙලා ගත නොහැකිය. පොතක පාඩමක් කියවන විට සිත වෙනත් කරුණු කෙරෙහි යොමු වුවහොත් එම පාඩමෙහි කරුණු තේරුම් ගැනීමට නොහැකි වෙයි.

ගුරුතුමා පන්තියේ ඉගැන්වීමෙහි යෙදෙන විට එම කරුණු ඔබේ සිතට හොඳින් ධාරණය වන්නේ සිත ඒ උගන්වන කරුණු කෙරෙහි යොමු කරගෙන සිටීමෙන් පමණි. එම නිසා ඔබ ඉගෙන ගැනීම, පාඩම් කිරීම ආදී සෑම කරුණකදීම මනාව සිත පිහිටුවාගෙන ක්‍රියා කිරීමෙන් පමණක් ඉන් ප්‍රතිඵල ලබා ගත හැකිවෙයි. එසේ නොවී සිත විවිධ වූ අරමුණු කරා අයාලේ යාමට ඉඩ දුනහොත් ඔබ බලාපොරොත්තු වන ප්‍රතිඵල නෙලා ගත නොහැකි වනු ඇත. එබැවින් යහපත් අරමුණුවල සිත පිහිටුවාගෙන සිටීමට හැකි වනසේ විවිධ භාවනා ක්‍රම මගින් සිත දියුණු කිරීමට අපි පුරුදුවෙමු.

4. අලසෝ ගිහි කාමභෝගී න සාධු
අසඤ්ඤතෝ පබ්බජිතෙර න සාධූ
රාජා න සාධූ අනිසම්මකාරී
යෝ පණ්ඩිතෝ කෝධනෝ තං න සාධු

( ජාතක පාළි - රථලට්ඨි ජාතකය )

අලසකම්න් යුතු කාමයට ගිජු වූ ගිහියා යහපත් නොවේ. අසංවර පැවිද්දා යහපත් නොවේ. විමසා නොබලා කටයුතු කරන පාලකයා සුදුසු නොවේ. පඬිවරුන්ගේ කිපෙන බව යහපත් නොවේ.

| | |
|---|---|
| ගිහි දිවියට කම්මැලිකම | සුදුසු නොවේ |
| පැවිදි බවට අසංවරය | සුදුසු නොවේ |
| රජවරුනට අනුවණකම | සුදුසු නොවේ |
| පඬිවරුනට කිපෙනා බව | සුදුසු නොවේ |

අපි ජීවත් වන මේ සමාජයේ විවිධ තරාතිරමේ පුද්ගලයන් ජීවත් වන බව දනිමු. අපගේ මෙන්ම ඔවුන්ගේ ජීවිත යහපත් වීමට අවශ්‍ය ගුණධර්ම මොනවාදැයි විමසා බැලීම ඉතා වැදගත් ය. ගිහි ජීවිතයක් ගත කරන අප කම්මැලිව සිටියහොත් කිසිදු දියුණුවක් ලබා ගැනීමට නොහැකි වෙයි. සමාජයේ පරිහානියටම පත්වෙනු ඇත. ඒ නිසා උත්සාහයෙන් ක්‍රියා කොට දියුණු වීමට අදිටන් කර ගනිමු. එමෙන්ම පැවිදි ජීවිතයේ උසස් ප්‍රතිඵල ලබා ගත හැකි වන්නේ සංවරව ක්‍රියා කිරීමෙනි. අසංවරව ක්‍රියා කිරීමෙන් අනුන්ගේ දෝෂ දර්ශනයට ලක්වෙයි. රටක් පාලනය කරන රජ නුවණින් යුතු වූ කල්හි රට වැසියාට සාධාරණයත්වය ඉටුවෙයි. ජනතා සුභසිද්ධිය සැලසෙයි.

එසේ නොවූ විට රජුත් රටවැසියාත් පරිහානියට පත්වෙයි. තව ද ඉගෙනගත් නුවණැති අය කරුණාවෙන්, මෛත්‍රියෙන් හා ඉවසීමෙන් ක්‍රියා කළ යුතුය. එවිට රටවැසියන්ගේ ගෞරවය, හිමි වෙයි. වෛරය, ක්‍රෝධය, ඊර්ෂ්‍යාව වැනි නපුරු සිතුවිලි ඇති වූ විට විවිධ දූෂිත හා අයුතු වැඩ කිරීමට පෙළඹෙයි. අයුතු වැඩ කිරීමෙන් තමා පරිහානියට පත්වෙන අතරම ජනතාවගේ අපකීර්තියට ද ලක්වෙයි. ඒ නිසා පැවිදි අයෙකු, ගිහියෙකු, රජෙකු හෝ පඬිවරයෙකු වැඩ කිරීමේදී අනුන්ගේ ප්‍රසාදය ඇතිවන අයුරින් ක්‍රියා කළ යුතුය. අපකීර්තියට ලක්වන කිසිදු වචනයක් ප්‍රකාශ නොකළ යුතුය. කිසිදු ක්‍රියාවක් ද නොකළ යුතුය. සමාජයේ සෙසු ජනයාට ආදර්ශවත් ලෙස ක්‍රියා කළ යුතුය.

5. යෝ වේ කතඤ්ඤූ කතවේදි ධීරෝ
කල්‍යාණ මිත්තෝ දළ්හ භත්තීච හෝති
දුක්ඛිතස්ස සක්කච්ච කරෝති කිච්චං
තථාවිධං සප්පුරිසං වදන්ති
**(ජාතක පාලි - සරභංග ජාතකය)**

යමෙක් අනුන් විසින් තමාට කළ උපකාර දනී ද, උපකාර කළ අයට ප්‍රති උපකාර කෙරේ ද, නුවණැත්තෙක් මෙන්ම කළණ මිතුරෙක් වේද, මිතුරන්ට මහත් භක්ති ඇත්තේද, දුකට පත් මිතුරා වෙනුවෙන් කළ යුතු දේ මනාව කෙරේද, එබඳු තැනැත්තේ සත්පුරුෂයා යැයි පණ්ඩිතයෝ කියති.

තමනට උපකාර කරන අයට කරන උපකාරය
නියම මිතුරු දමකි ඒක කරමු අපිත් උපකාරය
පිහිට වෙලා දුක් දුරලා සුවය ගෙනෙන උපකාරය
නුවණැති දන තුටු කරනා හොඳ ගතියකි උපකාරය

අනුන්ට උදව් උපකාර කිරීම සහ තමන්ට උපකාර කළ අයට කළගුණ සැලකීම උතුම් ගුණයකි. නිවසේ, පන්සලේ, පාසල් පන්ති කාමරයේ හෝ වෙනත් කවර තැනකදී හෝ අප අනුන් සමඟ කටයුතු කිරීමේදී අනුන්ට උදව් උපකාර කිරීම සත්පුරුෂ ගතියකි. නුවණැති පුද්ගලයා තමන්ට උපකාර කළ අයෙකු කිසිවිටෙකත් අමතක නොකරයි. ඔවුන්ට හැකි සෑම අයුරකින්ම උපකාර කරයි. ඒ තුළින් මිත්‍රත්වයක්ද ගොඩනගා ගනියි. තමාට උපකාර කරන මිතුරා

විපතට පත් වූ විට ඔහුට උදව් කළ යුතුයි. දුකින් මුදවා ජීවිතය සැපවත් කිරීමට සත් පුරුෂයන් වශයෙන් අප ඔවුන්ට උපකාර කිරීම යුතුකමකි. යහපත් ගතිගුණ ඇති මිතුරන් සමග සුහදත්වයෙන් ක්‍රියා කිරීම අපගේ ජීවිත සාර්ථකත්වයට වෙසෙසින්ම හේතුවෙයි.

**ක්‍රියාකාරකම්**

1. මිනිස් ජීවිතයට අවශ්‍ය උපදේශ ඇතුළත් උපදේශ ග්‍රන්ථ තුනක් නම් කරන්න.
2. මෙම පාඩමේ ඇතුළත් ගාථා 3 ක් තෝරාගෙන ඉන් ඔබේ ජීවිතයට ගතහැකි ආදර්ශ තුන බැගින් ලියා දක්වන්න.
3. "අලසෝ ගිහි කාමභෝගි න සාධු " යනාදී ගාථාවේ දැක්වෙන උපදේශ තුළින් ඔබේ ජීවිතය සාර්ථක කර ගත හැකි අයුරු පැහැදිලි කරන්න.
4. මෙහි සඳහන් ගාථාවල ඇති ආදර්ශ වගුගත කරන්න.

පුහුණුවට

| | |
|---|---|
| කැමති අය | සැපතට |
| අනුන් නොහෙළති | විපතට |
| පරලොව එම | අයට |
| දෙව් මිනිස් සැප ලැබෙයි | හැම විට |

# 31. පාඩම

## රතන සූත්‍රයෙන් හෙළිවන තෙරුවන් ගුණ

රතන සූත්‍රය නම් පාඩමේදී ඔබ එහි ගාථා සහ අර්ථ ඉගෙනගෙන ඇත. මේ පාඩමේදී ඉගැන්වෙන්නේ එම සූත්‍රයේ සඳහන් තෙරුවන් ගුණ පිළිබඳවයි.

1. බුද්ධ රත්නය
2. ධර්ම රත්නය
3. සංඝ රත්නය

යන තෙරුවන් ගුණ සිහි කිරීමෙන් අපට ද සෙතක් ශාන්තියක් යහපතක් උදාකර ගත හැකිය.

බුද්ධ හා ධම්ම යන දෙරත්නයේ ගුණයන්ට වඩා සංඝ රත්නයේ ගුණ වැඩියෙන් විස්තර කර තිබීම මෙම සූත්‍රයේ දක්නට ලැබෙන විශේෂත්වයකි.

### බුද්ධ රත්නයේ ගුණ

1. බුදුරජාණන් වහන්සේ ලෝකයේ ඇති උතුම්ම වස්තුවකි.
2. ගිම්හාන කාලයේ පළමු මාසයේ වන ලැහැබක පිපෙන චමත්කාර මල් වැනි දහමක් දේශනා කළ බුදුරජාණන් වහන්සේ ශ්‍රේෂ්ඨ රත්නයකි.
3. උතුම් වූ උතුම් බව දන්නාවූ උතුම් බව දෙන්නා වූ උතුම් බවට පමුණුවන දහමක් දේශනා කළ බැවින් සම්බුදුරදුන් උතුම් වස්තුවකි.

### ධම්ම රත්නයේ ගුණ

1. සම්බුදු දහමේ ආර්ය මාර්ගයේ ඇති සමාධියට වඩා උසස් සමාධියක් නැත.
2. බුදුරදුන් හඳුන්වා දෙන ලද නිර්වාණයට සමාන වෙනත් දහමක් නොමැත.

සංඝ රත්නයේ ගුණ

1. අෂ්ටාර්ය පුද්ගල මහා සංඝරත්නයට දෙන දානය මහත්ඵල මහානිසංස වේ. එය මහා සංඝරත්නයේ උතුම් ගුණයකි.

2. මහා සංඝරත්නය නිවන් සුවයට පැමිණ එම නිවන් සුව අත්විඳීම මහා සංඝරත්නයේ උතුම් ගුණයකි.

3. චතුරාර්ය සත්‍යය අවබෝධ කළ මහා සංඝ රත්නය ඉන්ද්‍රඛීලයක් සේ කිසිවකින් කම්පා නොවේ. එය මහා සංඝරත්නයේ උතුම් ගුණයකි.

4. සෝවන් වූ ආර්ය ශ්‍රාවකයා භවයේ උපත ලබනුයේ උපරිම වශයෙන් ආත්මභාව හතකි. අටවන භවයක ඉපදීමක් නැත. මහා සංඝරත්නයේ උතුම් ගුණයකි.

5. සෝවන් වීමත් සමග සක්කාය දිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බත පරාමාස යන සංයෝජන බිඳී යන අතර අපායෙන් මිදුණේ වේ. එසේම මව මැරීම, පියා මැරීම ආදිය ද නොකරයි. එය මහා සංඝරත්නයේ උතුම් ගුණයකි.

6. සෝවන් වූ ආර්ය ශ්‍රාවකයා තුන් දොරින් කරන පාප කර්ම නොසඟවයි. එය මහා සංඝරත්නයේ උතුම් ගුණයකි.

7. රහතන් වහන්සේලා පෙර කර්ම අවසන් කර ඇත. අලුත් කර්ම රැස් කිරීමක් නැත. මතු භවය පිළිබඳ ඇල්මක් නැත. සියලු කර්ම බීජ ක්ෂය කළ උන් වහන්සේ පහන නිවී ගියාක් මෙන් නිවීයති. එය රහතන් වහන්සේලාගේ උසස්ම ලක්ෂණයකි.

ක්‍රියාකාරකම්

1. බුද්ධ රත්නය ශ්‍රේෂ්ඨ වන්නේ කුමක් නිසා ද?
2. ධර්ම රත්නය උතුම් වීමට හේතු මොනවාදැයි දක්වන්න.

3. මහා සංඝරත්නයේ ඇති විශේෂ ගුණාංග 6 ක් මෙම පාඩමෙන් සොයා ලියන්න.
4. මෙම පාඩමෙහි තෙරුවන් ගුණ පිළිබඳ ගුරුතුමා සමඟ සාකච්ඡා කරන්න.

පුහුණුවට

| | |
|---|---|
| බුදු දම් සඟ කියන මේ තෙරුවන් | සරණ |
| සතහට පිහිට වනු ඇත නිති සිහි | කරන |
| දුක් බිය නසා ලැබ ගන්නට පිළි | සරණ |
| තෙරුවන් සරණ යමු එය වෙයි රැක | වරණ |

# 32. පාඩම

## පුනර්භවය

පෙර එක්තරා පුරුෂයකුට භාර්යාවන් දෙදෙනෙක් සිටියහ. මුලින් කැඳවාගෙන ආ බිරිඳට දරුවන් සිටියේ නැත. තවත් බිරිඳක් කැඳවාගෙන ආවේ එබැවිනි. එම දෙවන බිරිඳගේ කුස පිළිසිඳ ගත් දරුවන් දෙදෙනකුම මෝරන්නට පෙර විනාශ වූයේ පළමු බිරිඳ එම ගැබිණියට විස සහිත ආහාර කැවූ බැවිනි. ඒ නිසාම තෙවන වර දරු ගැබක් හටගත් බව දෙවන බිරිඳ පළමු බිරිඳට නොකීවාය. වැඩුණු ගැබ දුටු පළමු බිරිඳ එම ගැබිණියට යළිත් විස දුන්නේ දරු ගැබ විනාශ කිරීම සඳහාය. එයින් සිදුවූයේ දරු ගැබ පමණක් නොව ගැබිණිය වූ දෙවන බිරිඳ ද මිය යෑමයි. ඇය මිය ගියේ " මාත් උඹේ දරුවන් විනාශ කරනවා " යන දරුණු සිතිවිල්ල සිත තුළ රඳවාගෙනය. ඇය බැළලියක වී උපන්නාය. කළ අපරාධය නිසා කිපුණු ස්වාමි පුරුෂයා පළමු බිරිඳට දැඩි දඬුවම් දුන්නේ ය. ඒ හේතුවෙන් ඇය ද මිය ගොස් කිකිළියක ව උපන්නාය.

කිකිළිය දමන බිත්තර කෑ බැළලිය අන්තිමේදී කිකිළිය ද ගොදුරු කරගත්තාය. වෛර සිතින් මිය ගිය කිකිළිය දිවි දෙනක් ව උපන් අතර බැළලිය මිය ගොස් උපන්නේ මුව දෙනක ලෙසය. මුව දෙනගේ පැටවු ද මුව දෙන ද දිවි දෙනගේ ගොදුරු වූහ. මිය ගිය මුවදෙන යක්ෂණියක්ව උපන් අතර දිවිදෙන උපන්නේ මිනිස් කාන්තාවක ලෙසය. ඒ අපේ බුදුරජාණන් වහන්සේ වැඩ සිටි කාලයේය. යක්ෂණිය දරුවා ගොදුරු කර ගැනීමට එළවද්දී කාන්තාව දරුවා රැගෙන දිවගියේ බුදුරජාණන් වහන්සේ වෙතය. බුදු බණ අසා දෙදෙනාම වෛරය සංසිඳවා ගත්හ.

මෙම කතා පුවතට අනුව පළමු බිරිඳ අනුපිළිවෙළින් කිකිළිය → දිවි දෙන → මිනිස් කාන්තාව වශයෙන් වෙනස් ජීවිතවලට පත් වූ අතර දෙවන බිරිඳ බැළලිය → මුවදෙන → යක්ෂණිය යන ජීවිතවලට

පත්වූවාය. මෙසේ එක් ජීවිතයක බිඳී යෑමෙන් හෙවත් මරණයෙන් පසුව තවත් ජීවිතයකට පත්වීම හඳුන්වන්නේ පුනර්භවය කියාය. මිනිසකු මරණයට පත් වී ඇතැම් විට මිනිසකුව හෝ ප්‍රේතයකුව හා උපත ලැබිය හැකිය. දෙව්ලොවින් චුත වන දෙවියා ඇතැම් විට තිරිසන් සතකුව ද ඇතැම් විට මිනිසකුව ද ඉපදීමට ඉඩ ඇත. කවර ජීවිත තත්වයකට පත් වූවත්, මුල් ජීවිතය පදනම් කරගෙන අලුත් ජීවිතය ඇතිවන නිසා එය පුනර්භවයක්, නැවත වීමක් ලෙස හැඳින්වෙයි. සසර අප්‍රමාණ වාර ගණනක් අපි පුනර්භවය ලබා ඇත්තෙමු. සියලු කෙලෙසුන් නසා රහත් වන තුරුම මෙය සිදුවේ. බුදු, පසේබුදු, මහරහතන් වහන්සේලාට පුනර්භවයක් නැත. ඒ සියලු කෙලෙසුන්ගෙන් මිදී ඇති බැවිනි.

බෝසතාණන් වහන්සේ (සිදුහත් කුමරු) බුදු වන ආත්මභාවයේ උපන් ගමන් ම ප්‍රකාශ කළේ, "මේ අන්තිම උපතයි. තව දුරටත් පුනර්භ-වයක් නැත" කියාය.

### අයමන්තිමා ජාති - නත්ථිදානි පුනබ්භවෝ

බුදුරජාණන් වහන්සේ පඤ්චවග්ගිය භික්ෂූන්ට දේශනා කළේ අංග සම්පූර්ණ වශයෙන් චතුරාර්ය සත්‍යය අවබෝධ කර බුදුවීමත් සමඟ ම තමන් වහන්සේට "මේ අන්තිම උපතයි. පුනර්භවයක් තව දුරටත් නොවේ." යන ඥාන දර්ශනය පහළ වූ බවයි. එම සටහන්වලින් ද පැහැදිලි වන්නේ "ජාති " හෙවත් ඉපදීම යළි යළිත් සිදුවීම පුනර්භවය නමින් හැඳින්වෙන බවයි.

ඉහත සඳහන් ක්‍රියාවලිය හැඳින්වීමට ඇතැම් විට පුනරුත්පත්තිය යන වචනය ද භාවිත වේ. වර්තමානයෙහි පුනරුත්පත්ති, පුනර්භවය යන වචන දෙක සමාන තේරුමෙන් භාවිත වුනත් ඒ දෙකින් කියැවෙන දෙයෙහි සියුම් වෙනසක් ඇත. පුනරුත්පත්ති යන වචනය භාවිත කරන්නේ ආත්මවාදීන් ය. ආත්මවාදීන් ලෙස හැඳින්වෙන්නේ වෙනස්වන, කැඩෙන බිඳෙන මේ ශරීර කූඩුව තුළ වෙනස් නොවන, කැඩීමට බිඳීමට නොහැකි ස්ථිර යම් ශක්තියක් තවත් ආත්මයක් ඇතැයි පිළිගත් අයයි. ඔවුන්ගේ ඉගැන්වීම වූයේ වර්තමාන ශරීර කූඩුව දිරාගිය විට ආත්මය කිසිදු වෙනසක් නොවී අලුත්

ශරීර කුඩුවකට ඇතුළත් වන බවය. එසේ වීම ඔවුන් හැඳින්වූයේ පුනරුත්පත්ති කියාය. එසේ වෙනස් නොවන ආත්ම නම් තත්වයක් ඇතැයි බුදුරජාණන් වහන්සේ දේශනා කර නැත. දේශනා කර නැත්තේ එබඳු ආත්ම නම් තත්වයක් නැති නිසාමය. ආත්මයක් නැති විට ඔවුන් කියන විදියේ පුනරුත්පත්තියක් ද නැත. එබැවින් බුදු දහමේ සඳහන් වන්නේ '' පුනර්භවය '' යන්නයි. වර්තමාන ජීවිතය ක්‍රියාත්මක වන සිත් වැලෙහි අවසාන ම සිත ඇසුරු කරගෙන අලුත් සිත් පරපුරක් ආරම්භ වේ. එය සිදුවන්නේ අලුත් රූප කායක් ඇසුරු කරගෙනය.

ඉහත සඳහන් කළ කතා පුවතේ දෙවන බිරිඳගේත් බැළලියගේ ස්වභාවය එකිනෙකට වෙනස් ය. නමුත් බැළලිය තුළ ක්‍රියාත්මක වන සිත් පරපුර දෙවන බිරිඳගේ ජීවිතය තුළ ක්‍රියාත්මක වුණ සිත් පරපුරේම ඉදිරි අවස්ථාවකි. අර කාන්තාව තුළ පැවැති සිතම නොවෙනස්ව බළල් ශරීරයට ඇතුළත් වුණා නොවේ. පැවැති සිත් පරපුර ඇසුරෙන් අලුත් සිත් පරපුරක් ක්‍රියාත්මක වීම ඇරඹීමයි සිදුවුණේ. පුනර්භවය නම් එයයි. එය හරියට පිදුරු ගොඩක තිබුණ ගිනිදැල් ඇසුරෙන් දර ගොඩක ගිනිදැල් හටගන්නා මෙනි. පිදුරු ගොඩෙහි තිබුණු ගිනි දැල්ලම දර ගොඩට ගියේ නැත. දරගොඩේ ගිනිදැල් ඇතිවූයේ පිදුරු ගොඩේ ගිනිදැල් ඇසුරෙනි. ආත්මභාව දෙකක සිත් පරපුර සම්බන්ධ වන්නේ ද ඒ ආකාරයෙනි.

මරණයෙන් පසුව ඇතැම් අය සුගතියෙහි ඉපදීමටත් ඇතැම් අය දුගතියෙහි ඉපදීමටත් හේතු මොනවාද? මේ බුදුරජාණන් වහන්සේගෙන් විමසූ පැනයකි. පිළිතුර වූයේ අකුසල් කරන අය දුගතිගාමී වන බවත් කුසල් කරන අය සුගතිගාමී වන බවත් ය. එයින් කියැවෙන්නේ අපගේ ක්‍රියා කලාපය අනුව පුනර්භවය සිදුවන බවයි.

ඇතැම් ආගම්වල උගන්වන්නේ මරණින් පසු එක් වරක් පමණක් උපදින බවය. එසේ උපදින්නේ එක්කෝ ස්වර්ගයෙහි ය. නැත්නම් අපායෙහි ය. අපාගත වූ තැනැත්තා සදාකාලිකව ම අපායෙහිය. ස්වර්ගයට ගිය තැනැත්තා හැමදාම ස්වර්ගයේ ය. බුදු දහමේ එබඳු ඉගැන්වීමක් නැත.

සමහරුන්ගේ මතය වන්නේ මරණින් පසු යළි උපතක් නොවන බවය. වර්තමාන ජීවිතයට පෙර ද උපතක් නොවූ බව හා මේ ජීවිතයේ මරණයෙන් සියල්ල කෙළවර වන බවය. ඒ සියලු මත බැහැර කරන බෞද්ධ වූ අපි පුනර්භවයක් ඇතැයි පිළිගනිමු. අප එසේ පිළිගැනීමට එක් හේතුවක් වන්නේ අපේ ශාස්තෘ වූ බුදුරජාණන් වහන්සේ පුනර්භවයක් ඇති බව දේශනා කර තිබීමය. මෝහනයට පත් කරනු ලැබූවන් විසින් තම අතීත ජීවිත පිළිබඳ හෙළිකරන ලද තොරතුරු සත්‍ය වී තිබීම තවත් හේතුවකි. ස්වයං මෝහනයට පත් වූ, එනම් තමාම කෘත්‍රිම නින්දකට වැටුණු අය විසින් හෙළි කරනු ලැබූ තොරතුරුවලින් ද පුනර්භවයක් ඇති බව තහවුරු වී තිබේ. තම පෙර භවය පිළිබඳ තොරතුරු කියන කුඩා ළමයින්ගේ එම ප්‍රකාශ තහවුරු වී තිබීම ද පුනර්භවයක් ඇති බව පිළිගැනීමට සාධකයක් වී තිබේ. සමහර ළමුන් තුළ අසාමාන්‍ය දක්ෂතා දක්නට ලැබෙන්නේ පෙර භවයන්හි ගොඩනැගුණු දක්ෂතා නිසාය යන්න පිළිගැනීමකි.

**ක්‍රියාකාරකම්**

1. පුනර්භවය යනු කුමක්දැයි වාචිකව පැහැදිලි කරන්න.
2. පුනර්භවය, පුනරුත්පත්ති යන දෙකෙහි වෙනස පැහැදිලි කරමින් වාක්‍ය හතරක් ලියන්න.
3. පුනර්භවයක් ඇති බව පිළිගන්නේ කුමන සාධක පදනම් කරගෙනදැයි කියන්න.
4. පුනර්භවය පිළිගැනීම නිසා අපරාධ අඩුවන ආකාරය ගැන ගුරුතුමා සමඟ සාකච්ඡා කර එම කරුණු ලියා දක්වන්න.

**පුහුණුවට**

| | |
|---|---|
| ඇතත් නැතත් පරලොව සුදනෙනි | මහත |
| හලොත් යෙහෙකි පව්කම් නොතබාම | සිත |
| නැතත් එපරලොව ඉන් වන අවැඩ | නැත |
| ඇතොත් නැතැයි පව්කළ හට වෙයි | විපත |

**පැවරුම**

පුවත්පත්වලින් පුනර්භවය ගැන කියැවෙන කතා පුවත් එකතු කර ගොනුවක් පිළියෙල කර ප්‍රධානාචාර්ය ස්වාමීන් වහන්සේට ඉදිරිපත් කරන්න.

# 33. පාඩම

## කාලයෙන් ඵල ලබමු - පව්ටු මිතුරන් ඇසුරු නොකරමු

අපේ දහම් පාසලේ 9 ශ්‍රේණියේ ඉගෙනුම ලබන අකිල ඉගෙනුමට මෙන්ම බාහිර ක්‍රියාකාරකම්වලට ද දක්ෂ ශිෂ්‍යයෙකි. ඔහු දහම් පාසලේ සියලු ගුරුවරුන්ගේ ප්‍රශංසාවට ද ලක්ව සිටී. පසුගිය වසරේ දහම් පාසලේ හොඳම ළමයා ලෙස තේරුණේ ද ඔහුය. මේ සතියේ දහම් පාසලේ උදෑසන රැස්වීමේ ඔහු පැවැත්වූ කතාව සියලු දෙනාටම වැදගත් වූවකි. එම කතාවේ මාතෘකාව වුයේ "කාලයෙන ඵල ලබමු. පව්ටු මිතුරන් ඇසුරු නොකරමු" යන්නයි. අපේ ජීවිතය ඉතා කෙටිය. තණ අග පිණි බිඳුවක් වැනිය. එවැනි වූ ජීවිතයේ උපරිම ඵල ලබා ගනිමු. යන අදහස එම කතාව ඇසූ අප කාගෙත් සිත් තුළ ඇති විය. අකිල සිසුවා පැවැත් වූ හරවත් කතාව නැවතත් අපි මතකයට නගා ගනිමු.

කාලයේ වටිනාකම අපට මූලින්ම දේශනා කළේ බුදුරජාණන් වහන්සේය. දවස කොටස් පහකට බෙදා ලෝ සතුන්ගේ යහපත වෙනුවෙන් ක්‍රියාකළ උන්වහන්සේ කාලයෙන් උපරිම ප්‍රයෝජන ලබාගත් සේක. බුදු සිරිත ආදර්ශයට ගනිමින් කාලයෙන් ඵල නෙලා ගැනීමට අපට හැකිය. කාල සටහනක් අනුව ක්‍රියා කිරීම ඒ අනුව ඉතා වැදගත් වේ.

උදෑසන අවදිවීම, මුව කට සේදීම, ආගමික වතාවත් කිරීම, භාවනා කිරීම, දෙමව්පියන්ට උදව් කිරීම, පාසලේ වැඩ කිරීම, පාඩම් කටයුතු කිරීම,, පාසල් යාම, දහම් පාසල් යාම, ව්‍යායාම කිරීම ආදී කටයුතුවල නිරත වීමට කුඩා කල පටන් හුරු පුරුදු වීම අපගේ යහපතට හේතු වේ.

ඇතැම්හු කාලසටහනක් අනුව වැඩ නොකිරීම නිසා රන් හා සමාන කාලය නිකරුණේ අනවශ්‍ය දෙයට වැය කරති. රූපවාහිනිය, මුහුණු පොත, ජංගම දුරකථනය, අන්තර් ජාලය ආදියට අනවශ්‍ය

ලෙස කාලය වැය කරනු දක්නට ඇත. එමෙන්ම බස් නැවතුම්පොළ දුම්රිය ස්ථානය, මග තොටේ, යහළු යෙහෙළියන්ගේ නිවෙස්වල රැඳෙමින් අසෝබන ලෙස ද, අන්‍යයන්ට හිරිහැර වන ලෙස ද හැසිරීම සුදුසු නොවේ. ඒ තුළින් අන්‍යයන්ගේ සැකකිරීමටත් කරදර හිරිහැරවලටත්, අභූත චෝදනාවලටත් ලක් වේ. ඇතැම් අය තමන්ට නොගැළපෙන චිත්‍රපට, නාට්‍ය, සංගීත ප්‍රසංග, ක්‍රීඩා නැරඹීමට හුරුපුරුදුවීම නිසා ද වටිනා කාලය නාස්ති කරති.

නිකරුනේ ගමන් බිමන් යාම ද සුදුසු නොවේ. එයින් කාලය වැයවීම පමණක් නොව තම මිල මුදල්ද වියදම් වෙයි. අන්‍යයන්ට කරදර හිරිහැර වීමට එය හේතු විය හැකිය. ඒ තුළින් තමා සැකයට ලක් වුවහොත් වැරදි චෝදනාවන්ට ලක්වී සිරගත වීමට පවා සිදු වේ. තමා සමාජයේ අපකීර්තියටත් පරිහානියටත් පත්වෙනු ඇත. අධ්‍යාපන කටයුතු අඩාල වීමටත් ජීවත්වීමට සුදුසු රැකියාවක් සොයා ගැනීමට නොහැකි වීමටත් එය හේතු වේ.

නිකරුනේ කාලය වැය කරන්නා ලඟට පාප මිත්‍රයෝ ද එකතු වෙති. එය දුශ්චරිත ක්‍රියාවන්ට ඇබ්බැහි වීමට මාර්ගයකි. පාප මිත්‍රයන් යනු දුසිරිතෙන් යුතු පුද්ගලයන්ය. ඔවුන්ගේ ඇසුරට පත්වන පුද්ගලයා ද එම තත්වයටම පත්වේ.

බරණැස් නුවර මහාධන නම් සිටුවරයාගේ පුත්‍රයාට අසූ කෝටියක් ධනය විය. ඔහු හා විවාහ වූ සිටු කුමරියට ද ඒ හා සමානම ධනයක් තිබුණි. එහෙත් දෙදෙනාම උගත්හු නො වූහ. පාප මිත්‍රයන්ගේ ඇසුරට පත් වී ඒ තුළින් සුරාවට ද සූදුවට ද වෙනත් වැරදි ක්‍රියාවන්ට ද යොමු වී සියලු ධනය විනාශ කරගත්හ. අන්තිමේ මහ මඟ සිඟා කෑමට ද මේ දෙදෙනාට සිදුවිය. එවන් විපතක් සිදුවූයේ පාප මිත්‍ර සේවනය නිසාය.

සිගාලෝවාද සූත්‍රයේ පාප මිත්‍ර සේවනයේ ආදීනව හයක් දැක්වේ.

1. සූදුකරුවෙකු වීම.
2. සල්ලාලයෙකු වීම.
3. සුරාවට ලොල් වීම.
4. රහස්‍ය වැඩවල යෙදෙන්නෙකු වීම.
5. අපරාධකරුවෙකු වීම.
6. අනුන් රවටන්නෙකු වීම.

සූදුවට ඇබ්බැහි වූ පුද්ගලයෙකු ඇසුරු කිරීමෙන් තමන් ද සූදුකරුවෙකු බවට පත්වෙයි. සල්ලාලයෙකු ඇසුරු කිරීම තමන් ද නිරායාසයෙන් එබඳු පුද්ගලයෙකු වීමට හැකියාව ඇත. සුරාපානයට ලොල් වූ පුද්ගලයා නිතරම අනෙකා ද එයට හවුල් කර ගැනීමට සිතයි. එම නිසා එවන් පුද්ගලයෙකු ඇසුරු කිරීමෙන් තමන් ද එම අබ්බැහිවීමට පත්වේ. ඒ තුළින් තම ධනය විනාශ වී යයි. විවිධ කායික රෝගයන්ට ද ගොදුරු වෙයි. කපටි වංචාකාරයන්ගේ ඇසුර ලැබීමෙන් තමන් විවිධ රැවටීම්වලට ලක්වෙයි. ඒ තුළින් තම ධන සම්පත් විනාශ වෙයි. තමන් ද ඒ අනුව යමින් අනුන්ට හානිකරන වංචාකාරී පුද්ගලයෙකු බවට ද පත්විය හැකිය. මුදල් දේපොළ, වංචා කරන පුද්ගලයන්ගේ ඇසුර තුළින් තමන් ද එවැනි වැඩ කිරීමට පෙළඹෙයි. නීතියෙන් දඬුවම් විඳීමට ද එය හේතු වේ. එමෙන්ම සත්ව ඝාතන සිදු කරන, මිනී මරන, සොරකම් කරන, කාම මිථ්‍යාචාරයේ යෙදෙන, බොරු කියන දරුණු අපරාධ කරුවන් ඇසුරට යොමු වුවහොත් තමා ද එවන් අපරාධ කරුවෙකු බවට පත්වනු නියතය. එබඳු තත්වයකට පත් වූ පසු සමාජයෙන් ලැබෙන නින්දා අපහාස අපමණය. කවර මොහොතක හෝ නීතියේ රැහැනට ද හසුවනු ඇත. ඒතුළින් තම වටිනා ජීවිතය අවාසනාවන්ත බවට පත් වේ.

ඉහතින් සඳහන් කළ සූදුකරුවන් සල්ලාලයන් සුරා ලෝලීන් රහස්‍ය වැඩවල යෙදෙන්නන් අනුන් රවටන්නන් අපරාධකරුවන් යනු පව්ටු මිත්‍රයන් හෙවත් සමාජයේ දූෂිත පුද්ගලයෝය. එබඳු පුද්ගලයන් අසුරු කිරීම සමාජයේ නින්දාවට අපහාසයට හා පරිහානියට හේතුවකි. ඔවුන්ගෙන් ඈත් වී සත්පුරුෂයන් ඇසුරු කිරීම දියුණුවට හේතුවේ.

යහපත් මිත්‍රයා යනු යහපත් දෙයක් සිතන, යහපත් වචන කථා කරන, යහපත් ක්‍රියාවල නියුතු පුද්ගලයාය. ඔහුගෙන් අනුන්ට රැකවරණය දියුණුව සැලසේ. එම නිසා අපි යහපත් ක්‍රියාවල නියුතු වී කාලයෙන් උපරිම ඵල ලබමු. පාප මිත්‍ර සේවනයෙන් වළකිමු. මිනිස් ජීවිතයෙන් උසස් ප්‍රතිඵල නෙළා ගනිමු.

**ක්‍රියාකාරකම්**

1. කාලයෙන් උපරිම ප්‍රයෝජන ගැනීමට බුදුරදුන් ක්‍රියාකළ ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.
2. ඇතැමුන් නිකරුණේ කාලය ගත කරන අවස්ථා 5 ක් නම් කරන්න.
3. කාලයෙන් නිසිඵල ලැබීමට කළ යුතු ක්‍රියා 5 ක් සඳහන් කරන්න.
4. පාප මිත්‍ර සේවනයේ ආදීනව 6 ක් ලියා දක්වන්න.

**පුහුණුවට**

න භජේ පාපකේ මිත්තේ
න භජේ පුරිසාධමේ
භජේථ මිත්තේ කල්‍යාණේ
භජේථ පුරිසුත්තමේ -ධම්මපද-

පවිටු දනා ඇසුරින් ඔබ වෙන් වන්න
අධම සමාජෙන් සදහට සමු ගන්න
කලණ මිතුරු ඇසුරට සැම විට යන්න
උතුම් දනන් සමගින් පෙරටම යන්න

අසේවනා ච බාලානං - පණ්ඩිතානං ච සේවනා
පූජාච පූජනීයානං - ඒතං මංගලමුත්තමං
-මහා මංගල සූත්‍රය-

අනුවණයන් ඇසුරු නොකිරීම
නුවණැත්තන් ඇසුරු කිරීම
පිදිය යුත්තන් පිදීම
උතුම් මංගල කරුණු වේ

# 34. පාඩම

## චාගානුස්සති භාවනාව හැඳින ගනිමු

"සීලානුස්සති භාවනාවේ යෙදෙමු" යන්න පසුගිය වසරේ දහම් පාසල් පෙළ පොතේ තිබුණු පාඩම් මාතෘකාවකි. එම පාඩම අවසානයේ සටහන් වූ පැවරුම ක්‍රියාවට නැඟුණේ නම් පහත සඳහන් කරුණු දසය අභ්‍යාස පොතෙහි ලියැවී තිබිය යුතුය.

1. බුද්ධානුස්සති
2. ධම්මානුස්සති
3. සංඝානුස්සති
4. සීලානුස්සති
5. චාගානුස්සති
6. දේවතානුස්සති
7. මරණසති
8. කායගතාසති
9. ආනාපානසති
10. උපසමානුස්සති

මෙම දහය ම එක වචනයකින් හැඳින්වෙන්නේ දස අනුස්සති කියා ය. අනුස්සති දහය යන්න එහි තේරුම යි. ඒ භාවනා කර්මස්ථාන හතළිහ අතුරින් දසයකි. මීට පෙරත් ඉගෙනගත් පරිදි අනුස්සති නම් නැවත නැවත සිහි කිරීම ය. බුදුගුණ නැවත නැවත සිහි කිරීම බුද්ධානුස්සතිය යි. දහම් ගුණ නැවත නැවත සිහි කිරීම ධම්මානුස්සති නම් වන අතර සංඝානුස්සති නම් සඟ ගුණ නැවත නැවත සිහි කිරීම ය. තම සිල්වත්කමේ පිරිසිදු බව සහ සම්පූර්ණත්වය සිහි කිරීම සීලානුස්සතිය යි. පිරිසිදු සිතින් තමන් කළ පරිත්‍යාග සහ ඒවායින් සැලසෙන සෙත යළි යළිත් සිහි කිරීම චාගානුස්සති නම් වන අතර දේවානුස්සතිය නම් මිනිසුන් දේවත්වයට පත් කෙරෙන ශ්‍රද්ධා සීල ආදී උතුම් ගුණධර්ම තමන්ව තුළ ද ඇති බව සිහි කිරීම ය. මරණය පිළිබඳ මෙනෙහි කිරීම මරණානුස්සතිය යි. කායගතාසතිය නම් ශරීරයෙහි කෙස්, ලොම්, නිය, දත් ආදියෙහි ස්වභාවය මෙනෙහි කිරීම ය. ආශ්වාස ප්‍රාශ්වාස දෙස සිහිනුවණින් බැලීම ආනාපානසතිය යි. උපසමානුස්සතිය නම් රාග, දෝස, මද, මාන ආදී කෙලෙස් සංසිඳවීමෙන් සිතෙහි ඇතිවන සංසුන්බව සුවදායකත්වය නැවත නැවත මෙනෙහි කිරීම යි.

දසවිධ අනුස්සති අතරින් මෙහි සාකච්ඡා වන්නේ චාගානුස්සති ගැනය. මුලදී ද සඳහන් කරන ලද පරිදි චාගානුස්සතිය නම් පිරිසිදු සිතින් තමන් කළ දාන පින්කම්, පරිත්‍යාග පිළිබඳව සහ ඒවායේ අනුසස් පිළිබඳව යළි යළිත් සිහි කිරීම ය. චාගානුස්සති භාවනාව නමින් එය හැඳින් වේ.

මෙම භාවනාව කළ හැකි වන්නේ අන් අයගේ සුව පහසුව සඳහා තම කාලය ශ්‍රමය ධනය කැප කරන අයකුට ය. තම නිවසට ස්වාමීන් වහන්සේ නමක් පිඬුසිගා වැඩම කිරීම හෝ යාචකයකු පැමිණීම හෝ තමන්ට ශ්‍රමදානයකට ආරාධනා කරනු ලැබීම හෝ කරදරයක්, අපහසුතාවක් ලෙස සිතෙන අයකුට චාගානුපස්සති භාවනාවේ යෙදිය නොහැකිය. මෙම භාවනාව තෝරා ගන්නා තැනැත්තා අනුන්ගේ සුව පහසුව වෙනුවෙන් තමාගේ සුව පහසුව අත් හැරීමට සූදානම් අයකු විය යුතුය.

දානයක් දියයුත්තේ, පරිත්‍යාගයක් කළ යුත්තේ, පිහිටක් විය යුත්තේ තමන්ගේ ප්‍රසිද්ධිය තමන්ගේ කීර්තිය සඳහා නොවේ. දානය, පරිත්‍යාගය පිහිට ලබන්නට සැලසෙන ප්‍රයෝජනය ගැන සලකාගෙන ය. එසේ ම ආධ්‍යාත්මිකව තමන් ට සැලසෙන සෙත පිළිබඳව මෙනෙහි කරමිනි. භාවනාවේදී අවධානය යොමු වන්නේ ආධ්‍යාත්මිකව ලැබෙන එම ආනිසංස කෙරෙහි ය.

**චාගානුස්සතිය වඩන අයුරු**

**පළමු පියවර - අධිෂ්ඨානය** — 'මේ වේලාවේ සිට ප්‍රතිග්‍රාහකයකු (දෙන දේ පිළිගන්නා අයකු) හමු වූවහොත් මට ලැබුණු ආහාරයෙන් ඉතා සුළු ප්‍රමාණයක් හෝ නොදී අනුභව නො කරමි.'

**දෙවන පියවර** — සුදුසු ප්‍රතිග්‍රාහකයකුට ඉතා පිරිසිදු සිතින් දානයක් දීම, පරිත්‍යාගයක් කිරීම.

**තෙවන පියවර** — නිහඬ නිසල පරිසරයක සන්සුන්ව තැන්පත්ව හිඳගෙන දානයෙහි, පරිත්‍යාගයෙහි ආනිසංශ හෙවත්

දානයෙන් සැලසෙන සෙත පිළිබඳව මෙනෙහි කිරීම, එය පහත සඳහන් පරිදි කළ හැකිය.

(ආ) ' දානය පණ්ඩිතයන් විසින්, සත්පුරුෂයන් විසින්, අගය කරන ලද්දකැ'යි බුදුරජාණන් වහන්සේ දේශනා කර ඇත. දන් දෙන තැනැත්තා ජනප්‍රිය වන බවද, බොහෝ දෙනෙකු ඔහුගේ ඇසුරට පත්වන බවද, ඔහුට ඕනෑම පිරිසක් මැදට නොබියව පැමිණිය හැකි බව ද, දේශනා කර තිබේ. එබැවින් මට මෙසේ දානයක් පිරිනැමීමට ලැබීම ඉමහත් භාග්‍යයකි,

(ආ) 'මසුරුමලින් කිලිටි වූ සමාජයක මසුරුමල දුරු කරන අයකු වීමේ හැකියාව මට ලැබීම මහත් භාග්‍යයකි.'

(ඇ) 'දුන් දේ පිළිබඳව කිසිදු ඇලීමකින් තොරව, මුළු සිතින් ම එය අත් හැරීමට ලැබීම භාග්‍යයකි.'

(ඇ) 'නිතරම දන්දීමට සැරසුණු පිරිසිදු අත් දෙකක් ඇතිව ජීවත්වීමට ලැබීම මහත්ම භාග්‍යයකි.'

(ඉ) 'ඕනෑම අයෙකුට මගෙන් යමක් ඉල්ලීමට සුදුසු තත්ත්වයට පත්වීමට ලැබීම මගේ භාග්‍යයකි.'

(ඊ) 'මට ලැබුණු ඉතා සුළු දෙයක් වුව ද අන් අයට ද බෙදා දී අනුභව කරන තරමට පරිත්‍යාගශීලී සිතක් මට තිබීම අතිශය භාග්‍යයකි,'

මෙහි සඳහන් කළේ දානයක් ඇසුරු කරගෙන චාගානුපස්සතිය වඩන අයුරු ය. ඉහත සඳහන් වාක්‍ය අතරින් තමන්ට පහසු එකක් තෝරා ගැනීම සුදුසු ය. ආහාර පමණක් නොව ඕනෑම දහම් පරිත්‍යාගයක් ඇසුරෙන් මේ ආකාරයට සිතිවිලි පහළ කර ගනිමින් චාගානුපස්සතිය වැඩිය හැකිය.

මෙම භාවනාවේ යෙදෙන්නා තුළ රාගාදි සිතිවිලි යටපත් වී සිත සැහැල්ලු වේ. රැස් කිරීමට වඩා අත්හැරීමට, සිත වඩ වඩාත් පෙළඹේ. මෙත් මුදිතා කරුණා සහගත සිතිවිලිවලින් පෝෂණය

වූ යිතක් ඇති වේ. ඕනෑම ආලාභයක් විඳ දරා ගැනීමේ මානසික ශක්තිය වර්ධනය වේ. සුහදශීලී සමාජ වාතාවරණයකට ද පසුබිම සකස් වේ.

**ක්‍රියාකාරකම්**

1. ඔබ වෙත යාචකයකු පැමිණ යමක් ඉල්ලා සිටීම ඔබේ භාග්‍යයක් ලෙස සැලකිය යුත්තේ ඇයිදැයි පැහැදිලි කරමින් ඡේදයක් ලියන්න.
2. ශ්‍රමදානයක යෙදී ඒ ඇසුරෙන් චාගානුපස්සතිය වැඩිය හැකි ආකාරය ලියා දක්වන්න.

**පුහුණුවට**

දදං පියෝ හෝති භජන්ති නං බහූං
කිත්තිං ච පප්පෝති යසෝභිවඩ්ඪති
අමංකුභූතෝ පරිසං විගහති
විසාරදෝ හෝති නරෝ අමච්ඡරී

දන් දෙන අයකු රුචි වෙයි බොහොම දෙනෙකුට
නන්දන සපැමිණෙති ඔහු සමඟ ඇසුරට
ඉන් ලැබ හෙතෙම කිතුගොස යසස මොනවට
ලංවෙයි පැමිණ නොබියව පිරිස අතරට

# 35. පාඩම

## පොළොන්නරුවේ අපේ උරුමය

අනුරාධපුර ශ්‍රී ලංකාවේ පළමු රාජධානියයි. එහි ඇති සංස්කෘතික දායාද පිළබඳව 8 වන ශ්‍රේණියේදී ඉගෙන ගත්තෙමු. විදේශීය ආක්‍රමණ අනුරාධපුර රාජධානිය පවත්වා ගැනීමට බාධක ඇති කළේය. මේනිසා හෙළ රජවරුන් පොළොන්නරුව අගනුවර පිහිටවූයේ රාජ්‍යත්වය රැකගැනීමටය.

පුලතිසිපුරවරය අගනගරය කොට පිහිට වූ පොළොන්නරු රාජධානිය ශ්‍රී ලංකාවේ දෙවන රාජධානියයි. ආරම්භක වකවානුවේදී රජතුමාට සිදුවූයේ ආක්‍රමණිකයන් ගෙන් රාජධානියට එල්ලවන ප්‍රහාර මර්දනය කිරීමට සේනා සංවිධානය කිරීම, රටවැසියන්ගේ ජන ජීවිතය අඩාල වීමට බලපාන බාධක මැඩපැවැත්වීම වැනි කාර්යයන්ට ප්‍රමුඛත්වය දීමටය. මේ නිසා සංස්කෘතික දායාද උරුම වූයේ අල්ප වශයෙනි. බොහෝ සංස්කෘතික අංග ගොඩනැගෙන්නේ මහා පරාක්‍රමබාහු රජතුමාගේ යුගයේ හා ඉන් පසුවය.

- සුප්‍රසිද්ධ විහාර ආරාම හා ගෘහ නිර්මාණ
- ප්‍රධාන ස්තූප
- ප්‍රතිමා
- කැටයම් මූර්ති හා සුවිශේෂ කලා නිර්මාණ
- වාරි කර්මාන්ත

යන අංග යටතේ මෙම දායාද දැක්විය හැකිය.

### සුප්‍රසිද්ධ විහාර ආරාම හා ගෘහනිර්මාණ

පොළොන්නරු රාජධානියේ විවිධ ස්ථානවල රජවරුන් ඉදිකළ විහාර ආරාම හා ගොඩනැගිලි රාශියකි. වර්තමානයේදී පවා බොහෝ දෙනාගේ අවධානයට යොමු වී ඇති ප්‍රසිද්ධ ස්ථාන හතරකට අප අවධානය යොමු කරමු.

1. පොළොන්නරු ගල් විහාරය ඇතුළු පෙදෙස

2. සෝමාවතී සෑ රඳුන් වැඩසිටින පුදබිම

3. මැදිරිගිරිය වටදාගෙය ආශ්‍රිත ආරාම සංකීර්ණය

4. දූම්රක්ගල හෙවත් දිඹුලාගල ආරණ්‍ය සේනාසන පුදබිම.

යනු එම ස්ථානයි.



ගල් විහාර පරිශ්‍රය

1 ගල් විහාරය

පොළොන්නරුව ගල් විහාරය ආශ්‍රිත ප්‍රදේශය ඇතුළු නුවර, පිට නුවර හා පූජනීය පෙදෙස වශයෙන් කොටස් තුනකි. ඇතුළු නුවරට අයත් ප්‍රදේශයේ පිහිටා ඇත්තේ වෛජයන්ති ප්‍රාසාදය නම් වූ පරාක්‍රමබාහු රජමාළිගා සංකීර්ණය රාජවෛශ්‍යා භුජංග මණ්ඩපය නම් වූ රාජසභා මන්දිරය ආදියයි. පූජනීය පෙදෙස තුළ ථූපාරාම විහාරය, වටදාගෙය සහ හැටදාගෙය, අටදාගෙය නම් වූ දළදා මන්දිරය, පබළු වෙහෙර හා මැණික් වෙහෙර නම් වූ ස්තූප දෙක ද ශිව දේවාල දෙකක් සහ සත් මහල් ප්‍රාසාදය නම් වූ සුවිශේෂ වූ ගොඩනැල්ල ද නිමවා ඇත. සත් මහල් ප්‍රාසාදය විශේෂිත ආකෘතියකට අනුව නිමැවූ ස්තූපයක් බව සමහරු අදහස් කරති. මෙම පෙදෙසට අයත් නිශ්ශංක ලතා මණ්ඩපය එහි ඇති කැටයම් නිසාම වැඩි දෙනාගේ අවධානයට යොමු වූ නිර්මාණයකි.

පිටනුවරට අයත් ප්‍රදේශයේ පූජනීය ස්මාරක රාශියකි. භික්ෂූන් වහන්සේලා දහස් ගණනක් වාසය කළ ආලාහන පිරිවෙන් සංකීර්ණය මෙම කොටසට අයත් ය. භික්ෂූන් වහන්සේලා පොහෝ පවුරුණු

කර්ම සිදුකළ බද්ධසීමා ප්‍රසාදය, ලංකාතිලක පිළිමගෙය, තිවංක පිළිම ගෙය, ගිලන්හල හා භික්ෂූන් වැඩ සිටි කුටි රාශියක් හා ජල පරිහරණය සඳහා ඉදිකළ පොකුණු කිහිපයක් ද මෙහි දක්නට ඇත. පොළොන්නරු රාජධානියේ පිහිටි විශාලම ස්තූපය වූ රන්කොත් වෙහෙර හා කිරි වෙහෙර පිට නුවරට අයත් ය. දෙමළ මහා සෑය ආකෘතිමය වශයෙන් වෙනස් ස්තූපයකි. පිටනුවරට අයත් වැදගත්ම ස්ථානය ගල් විහාරයයි. මහා පරාක්‍රමබාහු රජතුමා විසින් ඉදිකරවන ලද මෙම විහාරය උත්තරාරාමය ලෙස ද හැඳින්වේ. පරාක්‍රමබාහු රජ සමයේදී සංඝ සාමග්‍රිය ඇතිකරමින් ශාසනශෝධනයක් සිදුකර පිහිට වූ ශාසන කතිකාවත පිහිටුවා ඇත්තේ ද මෙම ස්ථානයේය. එය හැඳින්වෙන්නේ පොළොන්නරු කතිකාවත යන නමිනි.

බුද්ධ ප්‍රතිමා තුනක් මෙහි නිර්මාණය කර ඇත්තේ පිහිටි ගලෙනි. මෙය ප්‍රතිමා නිර්මාණයේ සුවිශේෂී අවස්ථාවකි. මෙයින් එක් ප්‍රතිමාවක් සැතපෙන පිළිමයක් වන අතර එය පිරිනිවන් පානා අවස්ථාව පෙන්නුම් කරයි. එම ප්‍රතිමාවේ ශීර්ෂය අසල ඇත්තේ හිටි පිළිමයකි. මේ පිළිබඳ අදහස් විවිධය. සමහරු එය ආනන්ද හිමියන්ගේ ප්‍රතිමාවක් ලෙස හඳුන්වති. මහාචාර්ය සෙනරත් පරණවිතාන ශූරීන්ගේ අදහස වන්නේ එය ද බුදු පිළිමයක් බවය. පද්මාසනයක් මත නිර්මාණය කර තිබීම හේතුව ලෙස දක්වයි. පරදුක්ඛ දුක්ඛිත මුද්‍රාව මෙහි නිරූපිත බව ඔහුගේ අදහසයි. ඉතා සියුම් කැටයම්වලින් යුක්තව පිහිටි ගල ඇතුළට හාරා සකසන ලද කුටියෙහි පවතින බුද්ධ ප්‍රතිමාව ද සුවිශේෂී එකකි. මෙම කුටිය හැඳින්වෙන්නේ විද්‍යාධාර ගුහාව යනුවෙනි. මෙම ප්‍රතිමා දෙපස බිත්තිවල චිත්‍ර නිර්මාණය කර තිබූ බවට සාක්ෂි ඇත.

**2 සෝමාවතී පූදබිම.**

වර්තමානයේදී ප්‍රතිසංස්කරණය කරන ලද ස්තූපයක් සහිත සෝමාවතී සෑ රඳුන් වැඩසිටින පූද බිම ද අතීතයේ විශාල භික්ෂූන් වහන්සේ පිරිසකට වාසස්ථානය වූ ආරාම සංකීර්ණයකි. මෙම පූදබිම වටා පිහිටි වනගත ප්‍රදේශය තුළ විවිධාකාරයේ ආරාම ගොඩනැගිලි පැවති බවට නටබුන් හමුවේ. මෙම දාගැබ තුළ බුදුරජාණන් වහන්සේගේ දකුණු දළදා වහන්සේ තැන්පත් කර ඇති බව පිළිගත් මතයකි.



පොළොන්නරු වටදාගෙය

3 මැදිරිගිරිය ආරාම සංකීර්ණය

පොළොන්නරු නගරයේ සිට කි.මී. 35 කට අධික දුරකින් මැදිරිගිරිය වටදාගෙය ආශ්‍රිත විහාර සංකීර්ණය පිහිටා ඇත. මෙය ලංකාවේ වටදාගෙවල් අතර විශේෂිත නිර්මාණයකි. සෝපාන පථයක් සහිත එකම වටදාගෙය මෙය වන අතර මේ සඳහා දකුණු ඉන්දීය ගෘහනිර්මාණ ශිල්පය බලපා ඇතැයි විශ්වාස කෙරේ. විහාර ආරාම මළුපෙත්මං ගිලන් හල් හා නාන පොකුණු ආදියෙන් සමලංකෘතය. කුඩා කුඩා කුටි රාශියක් පැවති බව නටඹුන්වලින් තහවුරු වේ. කුටි හෙවත් මැදිරි පැවතුන බැවින් මැදිරිගිරිය යන නාමය ලැබුණු බවට අදහසක් ඇත.

4 දිඹුලාගල

පොළොන්නරුවේ සිට නැගෙනහිර දිසාවට කි.මී. 30 ක් පමණ ගියවිට දිඹුලාගල ආරණ්‍ය සේනාසන පුදබිම හමුවේ. ග්‍රාමවාසීව වැඩ විසූ භික්ෂූන් රාජ්‍යයේ විටින් විට ඇති වූ අවුල් වියවුල් නිසා ආරණ්‍ය වාසයට යොමු වී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස වනගතව පැවිදි දම් සපුරමින් සිටි භික්ෂූන් වහන්සේලා රාශියක් වැඩසිටි ස්ථානයක් ලෙස විද්වත්හු මෙම ස්ථානය හඳුන්වති. කටාරම් කොටන ලද ලෙන් රැසකින් සමන්විත මේ භූමියේ ප්‍රධාන කුටිය තුළ නිර්මාණය කර ඇත්තේ බුදු මැදුරකි. පොළොන්නරු අවධියේදී ශාසනයේ ප්‍රධානම තනතුර වූ මහාස්වාමි තනතුර දරා ඇත්තේ

මෙම ස්ථානයට සම්බන්ධ භික්ෂූන් වහන්සේ නමකි. ඉතිහාස ග්‍රන්ථවල මෙම ස්ථානය හඳුන්වා ඇත්තේ ධූමරක්ඛ පබ්බත හෙවත් දුම්රක්ගල නමින් ය.

පොළොන්නරු ගෘහ නිර්මාණ අතර සුවිශේෂී නිර්මාණයකි ශිව දේවාලය. තනිකර කලුගලින් සකස් කර ඇති මෙම ගොඩනැගිලි විශේෂය ගෙඩිගේ සම්ප්‍රදාය අනුගමනය කරමින් ගොඩනංවා ඇත. මෙවැනි ප්‍රකට ශිව දේවාල තුනක් පොළොන්නරු පුදබිම තුළ ඇත.

## ප්‍රධාන ස්තූප

ප්‍රධාන ස්තූප රාශියක් අනුරාධපුර රාජධානියේදී දැකගත හැකිය. නමුත් පොළොන්නරුවේදී දක්නට ඇති ස්තූප සංඛ්‍යාව සීමිතය. අනුරාධපුර ස්තූප අතර විශාල හා මධ්‍යම පරිමානයේ ස්තූප දක්නට තිබේ. ඒ හා සමානව බලන කල පොළොන්නරුවේ විශාල ස්තූපය ලෙස දැකිය හැක්කේ රන්කොත් වෙහෙර පමණි. මධ්‍යම ප්‍රමාණයේ ස්තූප ලෙස මැණික් වෙහෙර, පබළු වෙහෙර හා කිරි වෙහෙර දැක්විය හැකිය. අනුරාධපුර වකවානුවේදී දක්නට තිබූ ස්තූප අංගවල වෙනසක් තිබූ බවට සාක්ෂි නොමැත. දෙමළ මහා සෑය විශේෂිතය. මෙය මහල් දෙකක් ලෙස සකසා ඇති නිසා දෙමහල් මහා සෑය ලෙස උච්චාරණය කරන බවට අදහසක් පවතියි. කුඩා ස්තූපයක් මැදි කොට ගෘහයක් නිර්මාණය කරමින් සකසන ලද වටදාගෙවල් දෙකක් පුරාවස්තු අතර දක්නට ඇත.

## ප්‍රතිමා

අනුරාධපුර ප්‍රතිමාවලට වඩා වෙනස් ලක්ෂණ කිහිපයක් පොළොන්නරුවේ ප්‍රතිමා නිර්මාණයේ ඇතුළත්වේ. ප්‍රතිමා අතර ගල්විහාර ප්‍රතිමා විශේෂිතය. ඒවා පිළිබඳ මීට පෙර දැක්විය. අනුරාධපුර වකවානුවේදී කළුගල් ආශ්‍රිතව ප්‍රතිමා නෙළීම කෙරිණි. පොළොන්නරුවේදී ශෛලමය ප්‍රතිමා නිර්මාණය කෙරුණේ පිහිටි ගලේය. පසුකාලීනව ප්‍රතිමා සඳහා ගඩොල් හා හුණු බදාම යොදාගෙන තිබේ. ලංකාතිලක ප්‍රතිමාව, ථූපාරාම විහාරයේ ප්‍රතිමාව මේ සඳහා උදාහරණය. තිවංක පිළිම ගෙය තුළ වැඩ සිටින ප්‍රතිමාව නිර්මාණය කර ඇත්තේ ස්ථාන තුනකින් වක් වූ ආකාරයටය. මෙය

හින්දු ආගමේ දේවරූප නිර්මාණ ලක්ෂණයක් ලෙස සැලකේ. බුද්ධ ප්‍රතිමා පමණක් නොව වෙනත් ප්‍රතිමාවන් ද නිර්මාණය කර ඇත. ඒ අතරින් වැඩිදෙනාගේ අවධානය යොමු වී ඇත්තේ පරාක්‍රම සමුද්‍රය ඉස්මත්තේ පිහිටි පරාක්‍රමබාහු ප්‍රතිමාවටයි. මෙ පිළිබඳ විවිධ අදහස් පවතියි. වියගසක් අතින් ගත් පරාක්‍රමබාහු රජතුමාගේ ප්‍රතිමාවක් ලෙස සමහරු අදහස් දක්වති. ධර්මග්‍රන්ථ පොත්ගුල් විහාරයට වැඩමකරවූ අවස්ථාව නිරූපිතයැයි සමහරු පවසති. පුලස්ති ඍෂිවරයාගේ ප්‍රතිමාවක් ලෙසද සමහරු හඳුන්වති. මේ අතරින් වඩාත් ප්‍රචලිතව ඇත්තේ පරාක්‍රමබාහු රජතුමාගේ ප්‍රතිමාවක් බවය.

පොලොන්නරු කැටයම්වල විශේෂත්වය වන්නේ හින්දු ආගමික බලපෑමයි. සඳකඩ පහණ නම් වූ නිර්මාණය තුළින් ගවයාගේ රූපය ඉවත් කර ඇත. ගවයා හින්දූන්ගේ පූජනීය වස්තුවකි. අලංකාර ලියවැල් ආදී කැටයම්වලින් යුතු ස්ථානයකි, නිශ්ශංක ලතා මණ්ඩපය. ඒ තුළින් සියුම් කැටයම් කිරීමේ ලාංකීය කලාකරුවන්ගේ කුසලතාව පිළිබිඹුවේ. කළුගලින් කරන ලද විශේෂිත නිර්මාණයකි නෙළුම් පොකුණ. මෙය නිර්මාණය කර ඇත්තේ පිපුණා වූ නෙළුම් මලක හැඩයෙනි. තිවංක පිළිම ගෙය ආසන්නයේ පිහිටා ඇත. පොළොන්නරු වකවානුවේ චිත්‍ර කලාව පිළිබඳ අවධානය යොමුකරන විට වැදගත් ස්ථානයකි තිවංක පිළිම ගෙය. ජාතක කතා බුද්ධ චරිතයේ සිදුවීම් ආදිය මෙම චිත්‍රවලට පදනම් වී ඇත. ලාලිත්‍යයෙන් යුතු රේඛා භාවිතයෙන් චිත්‍ර නිර්මිතය. මෙයට අමතරව දිඹුලාගල විහාරය ආසන්නයේ ඇති පුල්ලිගොඩ ලෙන් විහාරය ද ඉපැරණි චිත්‍ර සඳහා ප්‍රසිද්ධය. බදාම භාවිතයෙන් සිදුකරන ලද සියුම් නිර්මාණ රාශියක් තිවංක පිළිමගෙය වටා දක්නට ඇත. මේ නිර්මාණවලින් ද හින්දු ආභාසය ප්‍රකටවේ.

### වාරි කර්මාන්තය

කෘෂි කර්මාන්තයේ ස්වර්ණමය යුගය පොළොන්නරු රාජධානි සමයයි. එකල ශ්‍රී ලංකාව හඳුන්වා ඇත්තේ පෙරදිග ධාන්‍යාගාරය යන නමිනි. එම තත්වයට අප රට පත් කළේ මහා පරාක්‍රමබාහු රජතුමාය. ''අහසින් වැටෙන එක දියබිඳකදු ප්‍රයෝජනයට නොගෙන නිකරුනේ මහා සමුද්‍රයට ගලා යාමට ඉඩ නොදෙමි''. යන අධිෂ්ඨානයෙන් ක්‍රියාකළ අයෙකි. ජලය ප්‍රයෝජනයට ගැනීම

සඳහා මහවැව් ආදී වාරිකර්මාන්ත රාශියක් සකසා ඇත. වෙන් වෙන් වශයෙන් සමීපව පිහිටි වැව් පහක් එක් කොට ඒතාක් ඉතිහාසයේ නොතිබුණු ආකාරයේ විශාල ජලාශයක් ඉදිකරවීය. එය පරාක්‍රම සමුද්‍රයයි. මහවැලි ගංගාවේ අතු ගංගාවක් වූ අඹන්ගඟ හරහ අංගම්මැඩිල්ල යන ස්ථානයේදී වේල්ලක් ඉදිකර එම ගංගාවේ ජලය ඇල මාර්ගයෙන් පරාක්‍රම සමුද්‍රයට යොමුකර ඇත. තවද මේ වාරි ව්‍යාපාරය දියුණු කරමින් ගිරිතලේ වැව, මින්නේරිය වැව හා කවුඩුලු වැව වැනි විශාල වැව් නිමවා තිබේ. කවුඩුලු වැව, මහසෙන් රජතුමාගේ නැගනිය වූ බිසෝ බණ්ඩාර දෙවියන්ගේ නිර්මාණයකි. ග්‍රාමීය මට්ටමේ කුඩා වැව් රාජ්‍යයකි. ඒ ඒ ප්‍රදේශවල ග්‍රාම නාමයන් මගින් ද මේ බව තහවුරු වේ.

මේ අනුව ශ්‍රී ලංකාවේ දෙවන රාජධානිය වූ පොළොන්නරුව තුළ සංස්කෘතික උරුමයන් රාශියකි. එම උරුමයන් මගින් ඒ වකවානුවේ පැවති සමාජ ආර්ථික හා ආගමික තත්වයන් පිළිබිඹු වේ. ජාතික සමගිය ආගමික සංහිඳියාව කෘෂි ආර්ථික රටාව ආදී අංශ පිළිබඳ අවබෝධයක් මෙමගින් ලබාගත හැකිය. එබැවින් මෙම සංස්කෘතික දායාද තුළින් අනාගත පරපුරටද අතීත මුතුන් මිත්තන්ගේ ජීවන රටාව හඳුනාගැනීමට අවස්ථාව උදාකර දීම අපේ යුතුකමකි. මේ සඳහා මෙම සංස්කෘතික දායාදයන්ට හානි නොකර රැකගැනීමට අපි කැපවෙමු.

**ක්‍රියාකාරකම්**

1. පොළොන්නරු වකවානුවේ පැවති ප්‍රසිද්ධ විහාර ආරාම තුනක් නම් කරන්න.
2. තිවංක පිළිමගෙයි ඇති විශේෂිත ලක්ෂණ තුනක් දක්වන්න.
3. පොළොන්නරු කැටයම් කලාව සඳහා හින්දු ආභාසය බලපා ඇත. මෙය සනාථ කිරීමට ඉදිරිපත් කළ හැකි සාක්ෂි මොනවාද?
4. පොළොන්නරුවේ ඇති ප්‍රධාන වැව් තුනක් නම් කරන්න.
5. ගල් විහාරයෙහි පිහිටි හිටි පිළිමය සම්බන්ධව පවතින විවිධ අදහස් මොනවාද?

## 36. පාඩම

# දැහැමි පාලනයට බොදු පිළිවෙත් දෙකක්

බුදු දහම මෙලොව, පරලොව යන දෙලොව දියුණුවට මග පෙන්වා දෙන දහමකි. පුද්ගල දියුණුවට මෙන්ම සමාජ දියුණුවට ද හේතු වන ඉගැන්වීම් බුදු දහමේ සඳහන් වෙයි. සමාජයක් දියුණු වීමේ එම රටේ පාලකයන්ගේ පාලන ප්‍රතිපත්ති බෙහෙවින් බලපායි. රාජ්‍ය නායකයාගේ පාලන ප්‍රතිපත්ති යහපත් වූ විට එම රට සහ සමාජ දියුණු වේ. දැහැමි පිළිවෙත්, සමාජ ආචාර ධර්ම ආගමික වත් පිළිවෙත් ආදී ප්‍රතිපත්තිවලට ගරු කරමින් රට පාලනය කරන කල්හි එම රට දියුණු වේ. යහපත් ප්‍රතිපත්ති පසෙක ලා අත්තනෝමතිකව, අධාර්මිකව හා වත් පිළිවෙත් ගරු නොකරමින් පාලනය ගෙන යන්නේ නම් එම රටත් සමාජයත් පරිහානියට පත්වේ.

බුදුරජාණන් වහන්සේ විසින් රාජ්‍ය නායකයෙකු අනුගමනය කළ යුතු ප්‍රතිපත්ති සමූහයක් දේශනා කොට ඇත. ඒ අතර,

1. දස රාජ ධර්ම හා
2. සප්ත අපරිහානීය ධර්ම

සුවිශේෂ වේ.

සාමය, සමගිය, සමානාත්මතාව, සදාචාරය, නිවහල් බව හා දැහැමි බව තම රට තුළ උදා කිරීමට මෙම ප්‍රතිපත්ති බෙහෙවින් හේතු වේ. ඒවායින් දස රාජ ධර්ම පළමුව හඳුනා ගනිමු.

1. දානය
2. සීලය
3. පරිත්‍යාගය
4. ඍජු බව
5. මෘදු බව
6. තපස
7. අක්‍රෝධය
8. අවිහිංසාව
9. ඉවසීම
10. අවිරෝධතාව

යනු දස රාජ ධර්මයි.

## පුහුණුවට

සෝමාවතී සැරදුත් වදින ගාථාව පාඩම් කර පන්තිය ඉදිරියේ ගායනය කරන්න.

සම්බුද්ධ රාජ  මුඛ පංකජ ධම්මරේණු
එස්සං මනුඤ්ඤසිතරංසි විරෝචමානං
බ්‍රහ්මාමරා සුරනරේහි සුපූජිතං තං
වන්දාමහං සුගත දක්ඛිණ දන්ත ධාතුං

7. අක්‍රෝධය — රටවැසියන් තම දරුවන් ලෙස සලකා ඔවුන් කෙරෙහි මෛත්‍රියෙන් ක්‍රියා කිරීම අක්‍රෝධයයි. කිසි විට ජනතාව කෙරෙහි කෝපයෙන් ජනතා සිත් රිදවීම සුදුසු නොවේ.

8. අවිහිංසාව — රටවැසියාට හිංසා පීඩා කිරීමෙන් වැළකී ක්‍රියා කිරීම අවිහිංසාවයි. ජනතාව පීඩාවට පත්වන ලෙස ක්‍රියා නොකිරීමයි.

9. ඉවසීම — මහජනතාවගෙන් සහ තම නිලධාරීන්ගෙන් සිදුවන සුළු වැරදි ගැන ඉක්මන් තීරණ නොගෙන ඉවසීමෙන් ක්‍රියා කිරීමට රාජ්‍ය නායකයා වග බලා ගත යුතුය. බුද්ධිමත්ව සිතාමතා ඉවසීමෙන් කටයුතු කිරීම රටේ විපත් වළක්වා ගැනීමට ද හේතු වේ.

10. අවිරෝධතා — රට වැසියන් සමඟ ගැටුම් ඇති කර නොගැනීම අවිරෝධතාවයි. ජනතාවගේ ඉල්ලීම් වලට එරෙහි නොවී සාධාරණ ඉල්ලීම් ලබා දීමටත් ඔවුන් සමඟ සුහදව කටයුතු කිරීමටත් පාලකයාට හැකියාව තිබිය යුතුය.

මෙම දසරාජ ධර්ම අනුගමනය කිරීම සාමය, සමගිය, සදාචාරය ගොඩ නැඟී යහපත් සමාජයක් රට තුළ බිහිවීමට හේතුවෙයි.

## II අපරිහානීය ධර්ම

මීළඟට සප්ත අපරිහානීය ධර්ම පිළිබඳ අවධානය යොමු කරමු. බුදුරදුන් වජ්ජි රජවරුන්ට මේවා හඳුන්වා දී ඇත. දැහැමි සමාජයක් බිහි කර ගැනීමට සප්ත අපරිහානීය ධර්ම බෙහෙවින් ඉවහල් වෙයි.

1. නිතර එක්රැස්වීම.
2. සමගියෙන් රැස්ව, සමගියෙන් ක්‍රියා කොට, සමගියෙන් විසිර යාම.

7. අක්‍රෝධය — රටවැසියන් තම දරුවන් ලෙස සලකා ඔවුන් කෙරෙහි මෛත්‍රියෙන් ක්‍රියා කිරීම අක්‍රෝධයයි. කිසි විට ජනතාව කෙරෙහි කෝපයෙන් ජනතා සිත් රිදවීම සුදුසු නොවේ.

8. අවිහිංසාව — රටවැසියාට හිංසා පීඩා කිරීමෙන් වැළකී ක්‍රියා කිරීම අවිහිංසාවයි. ජනතාව පීඩාවට පත්වන ලෙස ක්‍රියා නොකිරීමයි.

9. ඉවසීම — මහජනතාවගෙන් සහ තම නිලධාරීන්ගෙන් සිදුවන සුළු වැරදි ගැන ඉක්මන් තීරණ නොගෙන ඉවසීමෙන් ක්‍රියා කිරීමට රාජ්‍ය නායකයා වග බලා ගත යුතුය. බුද්ධිමත්ව සිතාමතා ඉවසීමෙන් කටයුතු කිරීම රටේ විපත් වළක්වා ගැනීමට ද හේතු වේ.

10. අවිරෝධතා — රට වැසියන් සමග ගැටුම් ඇති කර නොගැනීම අවිරෝධතාවයි. ජනතාවගේ ඉල්ලීම් වලට එරෙහි නොවී සාධාරණ ඉල්ලීම් ලබා දීමටත් ඔවුන් සමඟ සුහදව කටයුතු කිරීමටත් පාලකයාට හැකියාව තිබිය යුතුය.

මෙම දසරාජ ධර්ම අනුගමනය කිරීම සාමය, සමගිය, සදාචාරය ගොඩ නැගී යහපත් සමාජයක් රට තුළ බිහිවීමට හේතුවෙයි.

## II අපරිහානීය ධර්ම

මීළඟට සප්ත අපරිහානීය ධර්ම පිළිබඳ අවධානය යොමු කරමු. බුදුරදුන් වජ්ජි රජවරුන්ට මේවා හඳුන්වා දී ඇත. දැහැමි සමාජයක් බිහි කර ගැනීමට සප්ත අපරිහානීය ධර්ම බෙහෙවින් ඉවහල් වෙයි.

1. නිතර එක්රැස්වීම.
2. සමගියෙන් රැස්ව, සමගියෙන් ක්‍රියා කොට, සමගියෙන් විසිර යාම.

3. නොපැනවූ නීති නොපැනවීම, පැනවූ නීති කඩ නොකිරීම.
4. වැඩිහිටියන්ට ගරු කිරීම.
5. කුල කුමරියන්ට ආරක්ෂාව සැලසීම.
6. රාජ්‍යයේ ඇති පූජනීය ස්ථාන ආරක්ෂා කිරීම හා නඩත්තු කිරීම.
7. රාජධානියට පැමිණෙන හා එහි වෙසෙන පූජ්‍ය පක්ෂයට සංග්‍රහ කිරීම හා ආරක්ෂා කිරීම.

නිතර රැස්වීම යනු පාලක පක්ෂයේ නියෝජිතයන් රටේ මහජනතාවට බලපා ඇති ගැටලු සාකච්ඡා කිරීමට එක්රැස් වීමයි. දෙවෙනි කරුණින් පැහැදිලි වන්නේ පාලක පක්ෂයේ සියලු දෙනාම භේදයකින් තොරව සමඟියෙන් රැස් වී රටේ ජනතාව මුහුණ පා ඇති ප්‍රශ්න සාකච්ඡා කොට ඊට විසඳුම් සොයා සමඟියෙන් ම විසිර යා යුතු බවයි. තුන් වෙනි කරුණෙන් පැහැදිලි වන්නේ පාලක පක්ෂය කලින් සාමූහිකව නොපැන වූ නීති නොපනවා සාමූහිකව සම්මත කරගෙන තිබෙන නීතිරීති ක්‍රියාත්මක කළ යුතු බවයි. නීති ගරුක සමාජයක් බිහිකිරීමට එය ප්‍රබල හේතුවකි. සිව්වෙනි කරුණෙන් පාලකයින් රටේ අත්දැකීම් බහුල වැඩිහිටියන්ගේ උපදෙස්වලට ඇහුම් කන් දී ඒ අනුව පාලනය සකස් කර ගත යුතු බව දැක්වේ. පස් වෙනි කරුණ රාජ්‍යයේ කුල කුමරියන් ආරක්ෂා කළ යුතු බව දක්වා ඇත. ස්ත්‍රීන්ට විවිධ කරදර හිරිහැර හෝ බලහත්කාරකම් නොකොට ඔවුන් ආරක්ෂා කර ගැනීම රාජ්‍ය පාලකයින්ගේ වගකීමකි. හය වෙනුව දක්වා ඇත්තේ රටේ පූජනීය ස්ථාන කවර ආගමකට අයත් වුවද ආරක්ෂා කර ගැනීම රාජ්‍ය නායකයින්ගේ වගකීමක් බවයි. පූජනීය ස්ථාන නගා සිටුවීම රටේ සදාචාර වර්ධනයට ද මහගු පිටුවහලක් වේ. සත්වෙනි කාරණය පූජ්‍ය පක්ෂයේ උතුමන්ට සංග්‍රහ කිරීම, උන් වහන්සේලාගේ උපදෙස් පිළිපැදීම රාජ්‍ය නායකයින් ඔවුන්ගේ වගකීමක් කර ගත යුතු බවයි. පූජ්‍ය පක්ෂය පරාර්ථ චර්යාව මුල් කොටගෙන උදාර සේවයක් කරන උතුමන් පිරිසකි. එවැනි උතුමන් රාජධානියකට සම්පතකි. ආශිර්වාදයකි.

මෙම සප්ත අපරිහානිය ධර්ම අනුගමනය කිරීම දැහැමි රාජ්‍ය පාලනයකට බෙහෙවින් ඉවහල් වන අතර කවර ආයතනයක වුවද ප්‍රගතියට හේතු වේ. දස රාජ ධර්ම හා සප්ත අපරිහානිය ධර්ම

ගැඹුරින් විමසා බලන විට පැහැදිලි වන්නේ රටක සමාජයක සදාචාරය හා සෞභාග්‍යය ඇති වීමට ඒවා බොහෝ සෙයින් බලපාන බවයි.

## ක්‍රියාකාරකම්

1. දස රාජ ධර්ම නම් කරන්න.
2. සප්ත අපරිහානීය ධර්ම පිළිවෙළින් ලියන්න.
3. සප්ත අපරිහානීය ධර්ම ධාර්මික සමාජයක් බිහිවීමට හේතු වන අයුරු ඔබ කැමති කරුණු දෙකක් ගෙන විස්තර කරන්න.
4. රටක යහපත හෝ අයහපත ඇතිවීමට බලපාන හේතු වගු ගත කරන්න.

## පුහුණුවට

දානං සීලං පරිච්චාගං
අජ්ජවං මද්දවං තපං
අක්කෝධං අවිහිංසංච
ඛන්තිංච අවිරෝධනං

# 37. පාඩම
## පාලි 05
## දෙවියන්ට පින්දීමේ ගාථා

(අ) එත්තාවතා ච අම්හේහි - සම්භතං පුඤ්ඤ සම්පාදං
සබ්බේ දේවා අනුමෝදන්තු - සබ්බ සම්පත්ති සිද්ධියා

ආකාසට්ඨා ච භුම්මට්ඨා - දේවා නාගා මහිද්ධිකා
පුඤ්ඤං තං අනුමෝදිත්වා - චිරං රක්ඛන්තු සාසනං

ඉහත සඳහන් වන්නේ දෙවියන්ට පින්දීමේ ගාථා දෙකකි. ඒවා තෙවරක් කියා පින්දීම බෞද්ධ සම්ප්‍රදාය යි. එම ගාථා නිවැරදිව ශබ්ද නගා කීම අවශ්‍ය වේ. ඊට පසුව පදයෙන් පදයට අර්ථය කියන්නට සහ ලියන්නට හැකි වන පරිදි අර්ථාවබෝධය ලැබිය යුතු වේ. අර්ථාවබෝධය සඳහා පද පිළිවෙළ අනුව මෙසේ අර්ථය දැනගතයුතු ය.

(ආ) දෙවියන්ට පින්දීමේ ගාථාවන්හි පද පිළිවෙළ හැඳින ගනිමු.

අම්හේහි එත්තාවතා පුඤ්ඤ සම්පදං සම්භතං ච, සබ්බ සම්පත්ති සිද්ධියා සබ්බේ දේවා අනුමෝදන්තු
ආකාසට්ඨා ච භුම්මට්ඨා ච මහිද්ධිකා දේවා නාගා තං පුඤ්ඤං අනුමෝදිත්වා සාසනං චිර රක්ඛන්තු

(ඇ) ඒවායෙහි තේරුම දැන ගනිමු.

අප විසින් මෙපමණකින් (යම්) පුණ්‍ය සම්පත්තියක් රැස්කර ගන්නා ලද්දේ ද සියලු සම්පත් සිද්ධ කර ගැනීම සඳහා සියලු දෙවියෝ (ඒ පින) අනුමෝදන් වෙත්වා.

අහසෙහි වසන්නා වූ ද පොළොවෙහි වසන්නා වූ ද මහානුභාව සම්පන්න (මහත් සෘද්ධි ඇති ) දෙවියෝ ද නාගයෝ ද ඒ පින අනුමෝදන් වී සම්බුද්ධ සාසනය බොහෝ කලක් ආරක්ෂා කරත්වා.

ඇ) පාලි වචනවල තේරුම දැන ගනිමු.

| | | |
|---|---|---|
| එත්තාවතා | - | මෙපමණකින් |
| ච | - | ද |
| අම්හේහි | - | අප විසින් |
| සම්භතං | - | රැස් කරන ලද |
| පුඤ්ඤ සම්පදං | - | පින් රැස |
| සබ්බේ | - | සියලු |
| දේවා | - | දෙවියෝ |
| අනුමෝදන්තු | - | අනුමෝදන් වෙත්වා |
| සබ්බ | - | සියලු |
| සම්පත්ති සිද්ධියා | - | සම්පත් සිද්ධකර ගැනීම සඳහා |
| ආකාසට්ඨා | - | අහසෙහි වාසය කරන්නා වූ |
| භුම්මට්ඨා | - | පොළොවෙහි වාසය කරන්නා වූ |
| දේවා | - | දෙවියෝ |
| නාගා | - | නාගයෝ |
| මහිද්ධිකා | - | මහානුභාව සම්පන්න (මහත් සෘද්ධි ඇති) |
| තං | - | ඒ |
| පුඤ්ඤං | - | පින |
| අනුමෝදිත්වා | - | අනුමෝදන් වී |
| චිරං | - | බොහෝ කල් |
| සාසනං | - | සම්බුද්ධ ශාසනය |
| රක්ඛන්තු | - | ආරක්ෂා කරත්වා |

ඉ) සරල පාලි වාක්‍ය ගොඩනගන්නට ඉගෙන ගනිමු.

දෙවියන්ට පින්දීමේ ගාථා දෙක ඇසුරෙන් සරල පාලි වාක්‍ය ගොඩනැගිය හැකිය. පහත සඳහන් වගු දෙකේ ඇති පාලි වචන ගැලපීමෙන් වාක්‍ය රටා ගොඩනගන්නට ඉගෙන ගනිමු.

වගුව I වාක්‍ය රටාව I

| | | | | |
|---|---|---|---|---|
| සබ්බේ | දේවා | තං | පුඤ්ඤසම්පදං | අනුමෝදන්තු |
| | නාගා | | | |
| | භූතා | | | |
| | සත්තා | | | |

වගුව II වාක්‍ය රටාව II

| | | | |
|---|---|---|---|
| මහිද්ධිකා දේවා | ලෝකසාසනං | චිරං | රක්ඛන්තු |
| | සාසනං | | |
| | දේසනං | | |
| | මං පරං | | |

| | | |
|---|---|---|
| මහිද්ධිකා දේවා | සිවං පදං | පාපුණන්තු |

**(ඊ) ක්‍රියාකාරකම්**

1. දෙවියන්ට පින්දී මේ ගාථා දෙක නිවැරදි පද බෙදීමෙන් හා නිවැරදි උච්චාරණයෙන් කියන්න.
2. ඉහත වගු දෙක ඇසුරින් පාලි වාක්‍ය 5 ක් ගොඩනගන්න.
3. සිංහලට නගන්න.

I. සබ්බේ දේවා ඉමං ලෝකසාසනං චිරං රක්ඛන්තු.
II. සබ්බේ භූතා තං පුඤ්ඤසම්පදං අනුමෝදන්තු.
III. සබ්බේ සත්තා සිවං පදං පාපුණන්තු.

අලුත් වචන

| | | |
|---|---|---|
| සත්තා | - | සත්වයෝ |
| භූතා | - | භූතයෝ |
| දේසනං | - | සද්ධර්ම දේශනය |
| ලෝකසාසනං | - | ලෝක හා ශාසනය |
| මං | - | මා |
| පරං | - | අනුන් |
| සිවංපදං | - | නිවනට |
| පාපුණන්තු | - | පැමිණෙත්වා |

# 38. පාඩම
## පාලි 06
## ආශිර්වාද ගාථා

(අ) අභිවාදනසීලිස්ස - නිච්චං වද්ධාපචායිනෝ
චත්තාරෝ ධම්මා වඩ්ඪන්ති - ආයු වණ්ණෝ සුඛං බලං

ආයුරාරෝග්‍ය සම්පත්ති - සග්ග සම්පත්ති මේවච
අථෝ නිබ්බාන සම්පත්ති - ඉමිනා තේ සමිජ්ඣතු

ඉහත සඳහන් වන්නේ සිල්වත්, ගුණවත් ගිහි පැවිදි උතුමන්ට, වැඩිහිටියන්ට වඳින අවස්ථාවලදී ඔවුන් විසින් වඳින තැනැත්තාට ආශිර්වාද පිණිස කියනු ලබන ප්‍රසිද්ධ ගාථා දෙකකි. මේවා ශබ්ද නගා නිවැරදිව කියවීම අවශ්‍ය වේ. ඊට පසුව පදයෙන් පදයට අර්ථය කියන්නට සහ ලියන්නට හැකි වන පරිදි අර්ථාවබෝධය ලැබිය යුතු වේ. අර්ථාවබෝධය සඳහා පද පිළිවෙළ දැනගතයුතු ය.

**(ආ) ආශිර්වාද කිරීමේ ගාථාවන්හි පද පිළිවෙළ හැඳින ගනිමු.**

නිච්චං අභිවාදනසීලිස්ස වද්ධාපචායිනෝ ආයු වණ්ණෝ සුඛං බලං චත්තාරෝ ධම්මා වඩ්ඪන්ති.

ඉමිනා ආයු ආරෝග්‍ය සම්පත්ති ( ච ) සබ්බ සම්පත්තිං
ඒව ච අථෝ නිබ්බාන සම්පත්ති ච තේ සමිජ්ඣතු

**(ඇ) ඒවායෙහි තේරුම දැන ගනිමු.**

නිතර (මනාකොට සිල්වතුන්ට) වඳින තැනැත්තාගේ, වැඩිහිටියන්ට පුදන තැනැත්තාගේ ආයුෂය, ශරීර පැහැය (වර්ණය), ශරීර සැපය, ශරීර බලය යන සතර ධර්මයෝ වැඩෙති.

මෙයින් ආයුෂය, නීරෝගිබව යන සම්පත් (ද) දෙව් මිනිස් සම්පත්ති ද අනතුරුව නිවන් සම්පත්තිය (ද) ඔබට ලැබේවා (ඉටුවේවා, සමෘද්ධ වේවා)

### (ඈ) පාලි වචනවල තේරුම දැන ගනිමු.

| | | |
|---|---|---|
| අභිවාදනසීලිස්ස | - | (සිල්වතුන්ට) වඳින තැනැත්තාගේ |
| නිච්චං | - | නිතර |
| වද්ධාපචායිනෝ | - | වැඩිහිටියන්ට පුදන තැනැත්තාගේ |
| ආයු | - | ආයුෂ |
| වණ්ණ | - | (ශරීර) පැහැය (වර්ණය) |
| සුඛං | - | (ශරීර) සැපය |
| බලං | - | (ශරීර) බලය (යන) |
| චත්තාරෝ ධම්මා | - | සතර ධර්මයෝ |
| වඩ්ඪන්ති | - | වැඩෙති |
| ආයුරාරෝග්‍ය | - | (ආයු + ආරෝග්‍ය - ආයුරාරෝග්‍ය) ආයුෂය හා නීරෝගී බව යන |
| සම්පත්ති | - | සම්පත් |
| සග්ග | - | දෙව් මිනිස් |
| සම්පත්ති මේව | - | (සම්පත්තිං + ඒව - සම්පත්තිමේව) සම්පත්ම |
| ච | - | ද |
| අථෝ | - | අනතුරුව |
| නිබ්බාන සම්පත්ති | - | නිවන් සම්පත්තිය ද |
| ඉමිනා | - | මෙයින් |
| තේ | - | ඔබට |
| සමිජ්ඣතු | - | ලැබේවා (ඉටුවේවා, සමෘද්ධ වේවා) |

### (ඉ) සරල පාලි වාක්‍ය ගොඩනගන්නට ඉගෙන ගනිමු.

වැඩිහිටියන්ට වැඳීමේ දී එම වැඩිහිටියන් විසින් ආශිර්වාද කෙරෙන ඉහත ගාථා දෙක ඇසුරෙන් සරල පාලි වාක්‍ය ගොඩනැගිය හැකිය. [illegible] දෙක ඇසුරෙන් පාලි වචන ගලපා වාක්‍ය රටා ගොඩනගන්නට ඉගෙන ගනිමු.

වගුව I වාක්‍ය රටාව I

| | | | |
|---|---|---|---|
| නිච්චං | අභිවාදනසීලිස්ස | ආයු | වඩ්ඪන්ති |
| | | වණ්ණෝ | |
| | වද්ධාපචායිනෝ | සුඛං | |
| | | බලං | |

වගුව II වාක්‍ය රටාව II

| | | | |
|---|---|---|---|
| ඉමිනා | තේ | ආයු සම්පත්තිං | ධඤ්ඤ |
| | | ආරෝග්‍ය සම්පත්තිං | |
| | තුම්හාකං | ධන සම්පත්තිං | |
| | | භෝග සම්පත්තිං | |
| | | ධඤ්ඤ සම්පත්තිං | |

| | | | |
|---|---|---|---|
| | | පරිවාර සම්පත්ති සමිජ්ඣන්තු | |

**(ඊ) ක්‍රියාකාරකම්**

1. ආශිර්වාද කිරීමේ ගාථා දෙක නිවැරදි පද බෙදීමෙන් හා නිවැරදි උච්චාරණයෙන් කියන්න.
2. ගාථා දෙක ඇසුරින් සරල සිංහල වාක්‍ය තුනක් ලියන්න.
3. ඉහත වගු දෙක ඇසුරින් පාලි වාක්‍ය 5 ක් ගොඩනගන්න.
4. මේවා සිංහලට නගන්න.

I. නිච්චං අභිවාදනසීලිස්ස ආයු වඩ්ඪති.
II. නිච්චං වද්ධාපචායිනෝ බලං වඩ්ඪති.
III. ඉමිනා තේ ආරෝග්‍ය සම්පත්ති සමිජ්ඣතු.
IV. ඉමිනා තුම්හාකං නිබ්බාන සම්පත්ති සමිජ්ඣතු.

අලුත් වචන

| | | |
|---|---|---|
| තුම්හාකං | - | ඔබට |
| ධන | - | ධනය |
| භෝග | - | පරිභරණය කරන සම්පත් |
| ධඤ්ඤ | - | ධාන්‍ය |
| පරිවාර | - | පිරිවර |

# 39. පාඩම

# අභිධර්මය 2

## නිබ්බාන

නිර්වාණ, නිබ්බාන, නිවන යනු සමාන අරුත් ඇති වචනය. මෙහි නිවන හැඳින්වීම සඳහා යොදා ඇති වචන රාශියකි. එයින් කීපයක් මෙසේය.

**අජාත**

සංඛත ධර්මවල ඉපදීමක් ඇති හෙයින් ඒවා ජාත ය.

නිවන සංඛත නොවන නිසා ඉපදීමක් නැති හෙයින් අජාත ය.

**අකත**

හේතුන්ගෙන් කරන ලද්දකත නම් වේ.

හේතුගෙන් නොකරන ලද නිවන අකත නම් වේ.

**අසංඛත**

හේතුන්ගෙන් කරන ලද සියල්ල සංඛතය.

හේතුන්ගෙන් නොකරන ලද නිසා නිවන අසංඛත ය.

දර ගොඩක් නිදසුනක් ලෙස විමසා බැලීමෙන් නිවන ගැන යන්තමින් හෝ වැටහීමක් ඇති කරගත හැකිය. දර ගොඩක් ගසා එයට ගිනි දැල් වූ විට දර තිබෙන තාක් ගිනිගෙන නිවීයයි. සිසිල් වෙයි. එසේම සත්වයා රාගාදී කෙලෙස් වලින් ගිනිගනී. රාගාදිය සම්පූර්ණයෙන් ම නැති කළ විට එම ගින්න සිසිල් වෙයි.

අප සිදුහත් බෝසතාණන් වහන්සේ ගයාවෙහි ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ සෙවනෙහි නැඟෙනහිරට මුහුණලා වැඩ සිටි රාත්‍රි පෙරයම් කාලයෙහි ත්‍රිවිද්‍යාවට අයත් පුබ්බේ නිවාසානුස්සති ඤාණය ලබාගත්හ. රාත්‍රි මධ්‍යම යාමයෙහි චුතුපපාතඤාණය වූ දෙවන විද්‍යාව උපදවා ගත්හ. පශ්චිම යාමයෙහි ආසවක්ඛය ඤාණය හෙවත් අර්හත් මාර්ග ඤාණය උපදවා ගැනීමෙන් ත්‍රිවිද්‍යාව සම්පූර්ණ කළහ.

අර්හත් මාර්ග ඥාණය ඉපදීමත් සමග රාග, දෝස, මෝහ, ජරා, ව්‍යාධි, මරණ, සෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස, උපායාස යන එකොළොසක් පමණ වූ ගින්නෙන් දැවෙමින් තිබූ සිත නිවී ගියේ ය. සිසිල් වූයේය. මෙසේ සම්මා සම්බුද්ධත්වයට පත් බුදුරජාණන් වහන්සේ " සීතිභූතෝස්මි නිබ්බුතෝ " යනුවෙන් මම සිසිල් වූයෙමි. නිවුනේ වෙමි යි වදාළහ.

බුදුවීම, රහත්වීම යනු රූප, වේදනා, සඥ්ඥා, සංඛාර විඥ්ඥාණ යන ස්කන්ධ පහ ඉතිරිව තිබියදී කෙලෙස් දුරුකර නිවීයාමයි. ක්ලේෂ පරිනිර්වාණය යනු එයයි. " පරිනිබ්බුතෝ සෝ භගවා පරිනිබ්බානාය, ධම්මං දේසේති " " කෙලෙස් පිරිනිවීමට පත් භාග්‍යවතුන් වහන්සේ කෙලෙස් පිරිනිවීම පිණිස දහම් දෙසති " යනුවෙන් දක්වා ඇත්තේ එයයි.

ස්කන්ධ පහට උපාදි යන වචනය යෙදේ. සේස යනු ඉතිරියයි. උපාදි සේස යන්නෙන් පංචස්කන්ධය ඉතිරිව ඇත යන අදහස ගෙනදේ. ස යන්නෙහි සහිත යන අර්ථය ඇත. නිබ්බාන යනු නිවනයි. ධාතු යන්නෙහි ස්වභාවය දරන යන අර්ථය ඇත. ස උපාදි සේස නිබ්බාන ධාතු යන්නෙන් අදහස් වන්නේ ජීවත්ව සිටියදී කෙලෙස් දුරු කොට නිවන් දැකීමයි.

බුදුරජාණන් වහන්සේ හතළිස් පස් වසරක් වැඩසිටි කුසිනාරා නුවර මල්ල රජදරුවන්ගේ සල් උයනෙහි සල් ගස් දෙකක් අතර උතුරට හිස දමා සැතපී පිළිවෙළින් ප්‍රථම ධ්‍යානාදී රූපාවචර ධ්‍යාන හතරටත් ඉන්පසු පිළිවෙළින් ආකාසානඥ්චායතනය ආදී අරූපාවචර ධ්‍යාන හතරටත් නව වෙනුව නිරෝධ සමාපත්තියටත් සම වැදුනහ. අනතුරුව පටිලෝම ක්‍රමයට ප්‍රථම ධ්‍යානය තෙක් සම වැදුනහ. එයින් නැගිට හෙවත් සිත මුදා දෙවන, තෙවන, සිවුවන ධ්‍යානවලට සමවැදුනහ. චතුර්ථ ධ්‍යානයෙන් නැගිටීමත් සමග බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පා වදාළහ. කලුරිය කළහ.

ජීවත්ව සිටියදී කුසගින්න, පිපාසය, ලේ අතීසාරය වැළඳීම ආදියෙන් ඇති වූ කායික දුක් වේදනාවන් ද මෙ පිරිනිවීමෙන් නැතිවිය. ස්කන්ධ බිඳීයාමෙන් ඇති වූ මේ පිරිනිවීම හඳුන්වන්නේ ස්කන්ධ පරිනිර්වාණය යනුවෙනි. පංචස්කන්ධ සංඛ්‍යාත උපාදිය

නැවත හටනොගන්නා පරිදි සිදුවූ පිරිනිවීම (නැඋපාදිසේස, අන්උපාදිසේස - අනුපාදිසේස) අනුපාදිසේස පරිනිබ්බාන ධාතු යනුවෙන් හඳුන්නු ලැබේ.

ස උපාදිසේස පරිනිබ්බාන ධාතුවත් අනුපාදිසේස පරිනිබ්බාන ධාතුවත් දෙකම බුදු, පසේබුදු, රහත් යන සියලු දෙනා වහන්සේට ම පොදුය. සාධාරණය.

ක්‍රියාකාරකම්

1. නිබ්බාන ධාතු දෙකෙහි වෙනස පැහැදිලි කරන්න.
2. බුදුරජාණන් වහන්සේ බරණැස් සිටුවරයාට කළ ධර්ම දේශනාව අසා යස කුල පුත්‍රයා රහත් විය. මෙම රහත්වීම කුමන නිර්වාණ ධාතුවට අයත් වේද?
3. දාරුචීරිය ගිහියෙකු වශයෙන් සිටියදීම මහමගදී බුදුරජාණන් වහසේගේ බණ අසා රහත් වූ අතර සුළු වේලාවකින් එළදෙනක විසින් අනින ලදුව මිය ගියේය. එම මිය යාම කුමන නිර්වාණ ධාතුවකට අයත් වේද ?

පුහුණුවට

අහං හි අරහා ලෝකේ
අහං සත්ථා අනුත්තරෝ
ඒකෝම්හි සම්මා සම්බුද්ධෝ
සීතිභූතෝස්මි නිබ්බුතෝ
(මහාවග්ගපාළි )

මම වනාහි ලෝකයෙහි රහතන් වහන්සේ වෙමි.
මම නිරුත්තර වූ ශාස්තෘ වෙමි.
මම එකම සම්‍යක් සම්බුද්ධ වෙමි.
මම සියලු කෙලෙස් ගිනි නිවාදැමීමෙන් සිහිල් වූයේ වෙමි. නිවුනේ වෙමි.

නැවත හටනොගන්නා පරිදි සිදුවූ පිරිනිවීම (නැඋපාදිසේස, අත්උපාදිසේස - අනුපාදිසේස) අනුපාදිසේස පරිනිබ්බාන ධාතු යනුවෙන් හඳුන්නු ලැබේ.

ස උපාදිසේස පරිනිබ්බාන ධාතුවත් අනුපාදිසේස පරිනිබ්බාන ධාතුවත් දෙකම බුදු, පසේබුදු, රහත් යන සියලු දෙනා වහන්සේට ම පොදුය. සාධාරණය.

ක්‍රියාකාරකම්

1. නිබ්බාන ධාතු දෙකෙහි වෙනස පැහැදිලි කරන්න.
2. බුදුරජාණන් වහන්සේ බරණැස් සිටුවරයාට කළ ධර්ම දේශනාව අසා යස කුල පුත්‍රයා රහත් විය. මෙම රහත්වීම කුමන නිර්වාණ ධාතුවට අයත් වේද?
3. දාරුචීරිය ගිහියෙකු වශයෙන් සිටියදීම මහමගදී බුදුරජාණන් වහසේගේ බණ අසා රහත් වූ අතර සුළු වේලාවකින් එළදෙනක විසින් අනින ලදුව මිය ගියේය. එම මිය යාම කුමන නිර්වාණ ධාතුවකට අයත් වේද ?

පුහුණුවට

අහං හි අරහා ලෝකේ
අහං සත්ථා අනුත්තරෝ
ඒකෝම්හි සම්මා සම්බුද්ධෝ
සීතිභූතෝස්මි නිබ්බුතෝ
(මහාවග්ගපාළි )

මම වනාහි ලෝකයෙහි රහතන් වහන්සේ වෙමි.
මම නිරුත්ත වූ ශාස්තෘ වෙමි.
මම එකම සම්‍යක් සම්බුද්ධ වෙමි.
මම සියලු කෙලෙස් ගිනි නිවාදැමීමෙන් සිහිල් වූයේ වෙමි. නිවුනේ වෙමි.

දහම් පාසල් සිසුන් සඳහා
නොමිලයේ
බෙදාදීම පිණිසයි

ඩිපිස්කෑන් සිකියුර් ප්‍රින්ට් සොලූෂන්ස් (පුද්ගලික) සමාගම